# කළුතර සංවර්ධන සැලැස්ම
# 2019 - 2030

පළමු වෙළුම



නාගරික සංවර්ධන අධිකාරිය
2019 ජූලි



# කළුතර සංවර්ධන සැලැස්ම

## 2019–2030

වෙළුම I

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

නාගරික සංවර්ධන අධිකාරිය

# කළුතර සංවර්ධන සැලැස්ම 2019 – 2030 - පළමු වෙළුම

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2019

සියළුම හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදාහැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම හෝ බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශනය

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
06 වන, 07 වන හා 09 වන මහල් , "සෙත්සිරිපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
දුරකථන අංකය - +94112873637
වෙබ් අඩවිය - www.uda.gov.lk
ඊ මේල් - info@uda.gov.lk

ප්‍රකාශනය - 2019 ජූලි

කළුතර සංවර්ධන සැලැස්ම 2019-2030 ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමු වෙළුම හා දෙවැනි වෙළුම වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ. මෙහි පළමු වෙළුම අනු කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමුවන කොටස හා දෙවන කොටස වශයෙන් සඳහන් කර ඇත. මෙහි එන පළමු වෙළුමේ පළමුවන කොටස මඟින් සංවර්ධන සැලැස්ම හැඳින්වීම, පසුබිම් අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පිළිබඳ සඳහන් කරන අතර එහි දෙවන කොටස මඟින් සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණු හා පරමාර්ථ, සංකල්පිත සැලැස්ම, සංවර්ධන උපායමාර්ගික සැලසුම් අන්තර්ගත කර ඇත. සංවර්ධන සැලැස්මෙහි දෙවැනි වෙළුම වෙනම ප්‍රකාශනයක් ලෙස සකස් කර ඇති අතර එහි 2019 - 2030 කාල පරිච්ඡේදය සඳහා බලපවත්වන සැලසුම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ රෙගුලාසි හා කලාපීකරණ රෙගුලාසි අන්තර්ගත කර ඇත.

**කළුතර සංවර්ධන සැලැස්ම 2019- 2030 නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශයේ කළුතර දිස්ත්‍රික් කාර්යාලය විසින් සකස් කර ඇති අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන්ගේ හා සම්පත් දායකයන්ගේ උපදෙස් හා මඟපෙන්වීම පෙරදැරි කරගෙන සිදු කර ඇත.**

**අධීක්ෂණ කටයුතු**

ආචාර්ය ජගත් මුණසිංහ ***සභාපති - නා.සං.අධි.***, ඉංජිනේරු එස්. එස්. පි. රත්නායක ***අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී කේ. ඒ. ඩි. චන්ද්‍රදාස ***හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී ඩී.එම්. බි. රණතුංග ***අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි.***, එම්. පී. රණතුංග ***නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී ජනක් රණවීර ***අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් හා පරේය්ෂණ හා සංවර්ධන අංශය) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී ලලිත් විජේරත්න ***හිටපු අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් අංශය) - නා.සං.අධි.***, වයි. ඒ. පී. කේ. ගුණතිලක ***අධ්‍යක්ෂ (බස්නාහිර පලාත් අංශය) - නා.සං.අධි.***

**සැලසුම් කණ්ඩායම**

නගර නිර්මාණ ශිල්පී බී.ඒ. ආර්. අජිත් කුමාර මයා ***නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම් (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී එම්. හේමන්ති මිය ***හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම් (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) නා.සං.අධි.***, චමින්ද්‍රා හෙට්ටිආරච්චි මිය ***සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, තනූජා ඉඹුලාගොඩ මිය ***සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, ඉමාලී හේරත් මිය ***සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, ඒ. පී. ඩී. ඩී. රත්නායක මෙනෙවිය ***සහකාර සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, පී. ඩි. එස්. කුලසූරිය මෙනෙවිය ***සහකාර සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, සී. එල්. ජයසේකර මෙනෙවිය ***සහකාර සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය, කළුතර දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී එස්. ඩී. යු. ජයම්පත් මයා ***සහකාර සැලසුම් නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන අංශය) - නා.සං.අධි.***

**සහය කණ්ඩායම්**

*පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අධි.*
*භූගෝලීය හා තොරතුරු පද්ධති අංශය - නා.සං.අධි.*
*පර්යේෂණ හා සංවර්ධන අංශය - නා.සං.අධි.*

# ප්‍රණාමය

මෙම නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම ප්‍රධාන වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ කළුතර දිස්ත්‍රික් කාර්යාලය හා බස්නාහිර පළාත් අංශය ඒකාබද්ධව සිදු කෙරුණු අතර පුරා වසර එක හමාරකට ආසන්න කාලයක් තුළ සිදු කළ මෙම සැලසුම් ක්‍රියාවලිය සඳහා නන් අයුරින් සහය වූ පිරිස විශාලය.

ප්‍රථමයෙන්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය  පාඨලී චම්පික රණවක මැතිදුන් ලබා දුන් මගපෙන්වීම හා සහයෝගය සඳහා අපගේ ස්තූතිය පුද කර සිටිමු. එසේම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් දෙනු ලැබූ උපදෙස් හා උපකාර ද කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

මෙම සැලැස්ම සැකසිමේදී දායක වූ කළුතර නගර සභාවේ සහ කළුතර ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමන්ලාට ද සභාවේ අනෙකුත් සාමාජිකයන් හා සියලුම කාර්ය මණ්ඩලයට ද අපගේ විශේෂ ස්තූතිය මෙයින් පළකර සිටිමු.

කළුතර නගර සංවර්ධන සැකස්ම සකස් කිරීමට අදහස්, යෝජනා ලබා දුන් සියලුම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන්ට ද පොදු ජනතාව ද මෙම අවස්ථාවේදී කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

නව සැලසුම් උපක්‍රම හඳුන්වා දෙමින් හා අවශ්‍ය උපදසේ ලබා දෙමින් සම්පූර්ණ සැලසුම් ක්‍රියාවලියම පූර්ණව අධීක්ෂණය කළ හා අපව දිරිමත් කළ නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති ආචාර්ය ජගත් මුණසිංහ මැතිතුමාට සහ අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු එස්.එස්.පී. රත්නායක මැතිතුමාට සහ හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කේ.ඒ.ඩී. චන්ද්‍රදාස මැතිතුමාට අපගේ ගෞරවණීය ස්තූතිය පුද කර සිටිමු.

එසේම නාගරික සංවර්ධන අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඩී.එම්.බී. රණතුංග මහතා සහ සියලුම කාර්ය මණ්ඩලය විසින් ලබා දුන් නොමසුරු සහයෝගය ද කෘතවේදීව සිහිපත් කළ යුතුය. විශේෂයෙන්ම බස්නාහිර පළාත් හිටපු අධ්‍යක්ෂ ජනක් රණවීර මහතාගේ සහ සංවර්ධන සැලසුම් අංශයේ හිටපු අධ්‍යක්ෂ ලලිත් විජේරත්න මහතාගේ දායකත්වය ද සිහිපත් කළ යුතුය.

සංවර්ධන සැලසුමේ විවිධ කටයුතු සඳහා නන් අයුරින් සහය වූ සංවර්ධන සැලසුම් අංශය, පර්යේෂණ හා සංවර්ධන අංශය, භූගෝලීය තොරතුරු පද්ධති අංශය, පරිසර හා භූ දර්ශන අංශය ආදී සියලුම අංශයන් අප වෙත ලබා දුන් සහයෝගය මෙම සැලැස්ම සාර්ථකව සැකසීමට මහෝපකාරී වූ බව ද අවසාන වශයෙන් සිහිපත් කළ යුතුය.

මීට අමතරව මෙම සංවර්ධන සැලැස්ම වඩාත් සාර්ථක කරගැනීමේදී නිර්මාණාත්මකව පිටු සකස් කිරීම සඳහා සහය වූ මූනියැක් ආයතනයට සහ නන් අයුරින් සහය පල කල සියළුම මහත්ම මහත්මීන් හට ස්තූතිය පුද කර සිටිමු.

# ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර පසුගිය වසර 40 පුරාවටම නාගරික සංවර්ධන අධිකාරිය නාගරික ප්‍රදේශවල සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා දායකත්වය සපයනු ලබයි. මෙම මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය තම ගමන් මගෙහි නවත් එක් සන්ධිස්ථානයක් පසුකරමින් පුළුල් සංවර්ධන සැලසුම් බස්නාහිර කලාපයේ සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීම සඳහා කටයුතු කොට ඇත.

කළුතර නගර සභා බලප්‍රදේශය හා කළුතර ප්‍රාදේශිය සභා බලප්‍රදේශය යන පළාත් පාලන ආයතන ද්විත්ත්වයෙන් සමන්විත කළුතර ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශය සඳහා සකස් කරන ලද මෙම සංවර්ධන සැලැස්ම 2019 – 2030 වකවානුව සඳහා සකස් කරනු ලැබූවකි. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන කේන්ද්‍රස්ථානය වන කළුතර නගරය මේ වන විට භෞතික සංවර්ධනය අතින් සීඝ්‍ර දියුණුවක් අත්කර ගෙන සිටී. මේ සමඟම මෙම සංවර්ධනය කළුතර ප්‍රාදේශිය සභා බලප්‍රදේශය වෙතද සීඝ්‍රයෙන් පැතිරී යන අයුරු දැකගත හැක. මෙම තත්ත්වය යටතේ සමස්ත කළුතර ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශයම අයත් වන සේ මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇති අතර මෙමඟින් කළුතර ප්‍රදේශිය සභා බලප්‍රදේශය ප්‍රථම වරට නාගරික සංවර්ධන සැලැස්මක නියාමනය ලබයි. මෙම සංවර්ධන සැලැස්ම මඟින් කළුතර ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශය ආර්ථික, සාමාජීය, පාරිසරික හා භෞතික යන අංශයන් හි තිරසාර සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපාය  මාර්ගික  ව්‍යාපෘති රැසක් ද හඳුනාගෙන තිබේ. ඒ අනුව මෙම සංවර්ධන සැලැස්ම තුළින් අපේක්ෂා කරනු ලබන්නේ කළුතර ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශය (කළුතර නගර සභා බලප්‍රදේශය හා කළුතර ප්‍රාදේශිය සභා බලප්‍රදේශය) සඳහා තිරසර සංවර්ධනයක් ගොඩනැගීමයි.

මාගේ අවබෝධය අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් යොදා ගනිමින්  විශිෂ්ඨ තාක්ෂණික ක්‍රමවේදයන් හා නවෝත්පාදිත ප්‍රවේශයන්ද ලැබී ඇත. ඒ අනුව, සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කණ්ඩායම හා නොයෙක් ආකාරයේ මෙම කාර්ය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කරමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය එක සමාන අයුරින් මෙම කාර්ය උදෙසා යෙදවීම තුලින් කළුතර සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට මග සැලසෙනු ඇත.

පාඨලී චම්පික රණවක
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

# ගරු සභාපතිතුමාගේ පණිවිඩය



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමණාකරනය කිරීමේ වගකීමද එසේම පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ [I]) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත. කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය සඳහා සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා බලාත්මක කිරීම, එම විධිවිධාන යටතේ සිදු කර ඇත. කළුතර ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය කළුතර ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශය හා ඒ අවට ප්‍රදේශයන්හි භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන කළුතර සංවර්ධන සැලැස්ම අවසන් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිත-යන්ගෙන් සැදි විෂම බලාපොරොත්තුවලින් අපවිත්‍ර වූ කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේ අවශ්‍ය පද්ධති, මෙවලම්, හා ක්‍රමෝපායන් තුළින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණ දීමටත්, අවිනිශ්චිතභාවයට ඔරොත්තු දීම තුළින් කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය නිරිතදිග වෙරළ තීරයේ අග්‍ර නැවතුම්පළක් බවට පත් කිරීමට අධිෂ්ඨාන කොට ගෙන සිටියි.

මෙම පුළුල් කාර්ය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

ආචාර්යය ජගත් මුණසිංහ
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය

# පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ පණිවිඩය





නාගරික සංවර්ධන අධිකාරිය විසින් කළුතර නගර සභා බලප්‍රදේශය හා කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සඳහා සකස් කරන ලද ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම සඳහා සුභාශිංසන එක් කරනුයේ ඉතා සතුටිනි. කළුතර නගර සභා බලප්‍රදේශය හා කළුතර ප්‍රාදේශිය සභා බලප්‍රදේශය යන පළාත් පාලන ආයතන ද්විත්ත්වයෙන් සමන්විත කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය ඉතා රමණීය භූමි දර්ශනයකින් සමන්විත ප්‍රදේශයකි. සමනල කන්දේ සිට ගලා බසිනා කළු ගංඟාව මහ සයුරට එක්වන කළු ගඟ තීර්තයත් ඒ අසළ වැඩ සිටින ශ්වේතවර්ණ කළුතර මහා සෑයත් කළුතර නගරයටම ආවේණික වූ භූමි දර්ශනයක් නිර්මාණය කර ඇත. අතීතයේ සිටම ඉතා දියුණු නාගරික ලක්ෂණයන්ගෙන් සමන්විත වූ කළුතර නගරය වර්තමානය වනවිට සීඝ්‍ර නාගරික සංවර්ධනයක් අත් කර ගනිමින් සිටී.

වර්තමානය වන විට කළුතර නගරය වටා සිදුවන සීඝ්‍ර වාණිජ දියුණුවත්, විශේෂයෙන්ම කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ සිදුවන නේවාසික ජනගහන වර්ධනයත් සැලකිල්ලට ගෙන සමස්ත කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ සීඝ්‍ර සංවර්ධනයක් ඇති කර ගැනීමත්, එම සංවර්ධනය තිරසාර ලෙස කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවයත් අප විසින් හඳුනාගෙන තිබුණි.

නාගරික සංවර්ධන අධිකාරිය මඟින් 2019 – 2030 වර්ෂය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම තුළින් සමස්ත කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ නාගරික සංවර්ධනය තිරසාර අන්දමින් කළමනාකරණය කරමින් නාගරික සංවර්ධනය ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා අවශ්‍ය උපායමාර්ගික ව්‍යපෘතීන් රැසක් ද මෙම සැලැස්ම තුළින් හඳුනාගෙන තිබීම සතුටට කරුණකි. මෙම සංවර්ධන ව්‍යාපෘති තුළින් කළුතර ප්‍රදේශයේ නේවාසික ජනතාවට මෙන්ම නාගරික සේවා ලබා ගන්නා අනෙකුත් ජනතාවට ද ඉතා විශාල සේවාවක් අනාගතයේදී සැලසෙනු ඇත.

අවසාන වශයෙන් මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලු නිලධාරී මහත්ම මහත්මීන් හට කළුතර නගර සභාවේ හා කළුතර ප්‍රාදේශීය සභාවේ දේශපාලන නියෝජිතයන්ගේත්, සමස්ත කළුතර ජනතාවගේත් සුභාශිංසනය පුදකර සිටිමු.

අමීර් නසීර්
සභාපති
කළුතර නගර සභාව

සංජීව ආරියරත්න
සභාපති
කළුතර ප්‍රාදේශීය සභාව

# පූර්විකාව

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කළුතර සංවර්ධන සැලැස්ම 2019–2030 සකස් කරනු ලැබීය. මෙම නගර සංවර්ධන සැලැස්මෙහි සැලසුම් බලප්‍රදේශය ලෙස කළුතර නගර සභා බලප්‍රදේශය හා කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය යන පළාත් පාලන ආයතන ද්විත්ත්වයෙන් සමන්විත කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය ඇතුළත් වේ.

මෙම නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී 2018 වර්ෂයට අදාළ දත්ත පාදක කර ගත් අතර මෙම දත්ත ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන විසින් නිකුත් කරනු ලැබූ දත්ත පාදක කරගනු ලැබූ දත්තයන් වේ. මෙම දත්ත අනුව සිදු කරනු ලැබූ විශ්ලේෂණයන් පාදක කරගනිමින් මෙම සැලැස්ම සකස් කරනු ලැබීය.

මෙම සැලැස්ම 2019 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා බලපැවැත්වෙන පරිදි සකස් කරනු ලැබීය. දත්ත විශ්ලේෂණ තුළින් ලබාගත් තොරතුරු පදනම් කර ගනිමින් මෙම සැලැස්මෙහි දැක්ම ගොඩ නඟන ලදී. එම දැක්ම වෙත ළඟා වීම සඳහා ප්‍රධාන අරමුණු 03 ක්ද ඒ යටතේ පරමාර්ථ 09 ක්ද හඳුනා ගන්නා ලදී. මෙම පරමාර්ථ පදනම් කර ගනිමින් සකස් කරන ලද අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම, ආර්ථික සංවර්ධන උපාය- මාර්ගික සැලැස්ම, තිරසාර පාරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, සංස්කෘතික, ආගමික හා උරුමයන් කළමනාකරණ සැලැස්ම සහ නිවාස සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම යන ප්‍රධාන සැලසුම් 05 කින්ද ඒ යටතේ හඳුනාගත් උපායමාර්ගික ව්‍යාපෘති වලින් ද සමන්විතය.

කළුතර සංවර්ධන සැලැස්ම 2019 – 2030 පළමු වෙළුම හා දෙවන වෙළුම වශයෙන් කොටස් 02කින් සමන්විතය. පළමු වෙළුම, පළමු කොටස හා දෙවන කොටස වශයෙන් කොටස් දෙකක් ලෙස ඉදිරිපත් කර ඇති අතර පළමු කොටස තුළ සංවර්ධන සැලැස්මෙහි පසුබිම, මූලික අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය යන පරිච්ඡේද ද දෙවන කොටස තුළ සංවර්ධන සැලැසුම් රාමුව, SWOT විශ්ලේෂණය හා සැලැස්ම යන පරිච්ඡේද ඇතුළත් වේ.

දෙවන වෙළුම පරිච්ඡේද දෙකකින් යුක්ත වන අතර එය සංවර්ධන කලාප හා කලාපීකරණ රෙගුලාසි යන පරිච්ඡේද ද්විත්ත්වයෙන් සමන්විතය.

# පටුන


ප්‍රණාමය III
ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය IV
ගරු සභාපතිතුමාගේ පණිවිඩය V
පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ පණිවිඩය VI
පූර්විකාව VII
පටුන VIII
පළමු කොටස XI

පරිච්ඡේදය 01 : සංවර්ධන සැලැස්මේ පසුබිම 01

1.1. හැඳින්වීම 02
1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශව කරුවන් 02
1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය 04
1.4. සැලසුම් ක්‍රියාවලිය 07

1.4.1. පසුබිම් අධ්‍යයනය 08
1.4.2. විෂය පථය 08
1.4.3. සංවර්ධන විභවතා හා ගැටළු හදුනාගැනීම 08
1.4.4. ඉදිරි දැක්ම, ඉලක්ක හා අරමුණු සකස් කිරීම 09
1.4.5. සවිස්තරාත්මක විශ්ලේෂණය 09
1.4.6. උපායමාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සකස් කිරීම 10
1.4.7. නීති හා රෙගුලාසි සකස් කිරීම 10
1.4.8. දළ සංවර්ධන සැලැස්ම සම්මුතියකට පත්කර ගැනීම 11
1.4.9. සම්මුතියකට පත්කර ගන්නා ලද සැලැස්ම ඉදිරිපත් කිරීම 11
1.4.10. අනුමැතිය හා ප්‍රකාශයට පත්කිරීම 11

පරිච්ඡේදය 02 : මූලික අධ්‍යයනය 13

2.1. අධ්‍යයන ප්‍රදේශය 14
2.2. සැලසුම් සහ තත්ත්ව සන්දර්භ 14
2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම 25

2.3.1. ක්‍රියාකාරී සීමාව 25
2.3.2. භූගෝලීය සීමාව 25
2.3.3. පරිපාලන සීමාව 25

පරිච්ඡේදය 03 : සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය 30

3.1. ගැටළුව 01 30
3.2. ගැටළුව 02 31
3.3. ගැටළුව 03 32
3.4. ගැටළුව 04 33
3.5. ගැටළුව 05 33

දෙවන කොටස 37
ඇමතිතුමාගේ අනුමැතිය 38
ගැසට් නිවේදනය 39

පරිච්ඡේදය 04 : සංවර්ධන සැලැසුම් රාමුව 41

4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම 42
4.2. දැක්මෙහි ප්‍රකාශනය 42
4.3. සංවර්ධන සැලැස්මේ අරමුණු 43
4.3. සංවර්ධන සැලැස්මේ පරමාර්ථ 44

පරිච්ඡේදය 05 : SWOT විශ්ලේෂණය 44

5.1. සාරාංශගත SWOT විශ්ලේෂණය 45

අරමුණ 01 46
අරමුණ 02 48
අරමුණ 03 50

5.2. විස්තරාත්මක SWOT විශ්ලේෂණය 51

පරිච්ඡේදය 06 : සංවර්ධන සැලැස්ම 75

6.1. සංකල්පිත සැලැස්ම 76
6.2. යෝජිත භූමි පරිහරණය සැලැස්ම 78
6.3. අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම 83

6.3.1. සේවා කළමනාකරණ සැලැස්ම 83
6.3.2. මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම 84
6.3.3. ජල සැපයුම් සැලැස්ම 86
6.3.4. විදුලි සැපයුම් සැලැස්ම 88
6.3.5. මළ හා අපජල කළමනාකරණ සැලැස්ම 89
6.3.6. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම 88

6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 97

6.4.1. ආර්ථික සංවර්ධන සැලැස්ම 97
6.4.2. සංචාරක සංවර්ධන සැලැස්ම 98

6.5. තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 101

6.5.1. පාරිසරික සංරක්ෂණ සැලැස්ම 101
6.5.2. භූ දර්ශන සැලැස්ම 106
6.5.3. ආපදා කළමනාකරණ සැලැස්ම 107
6.5.4. පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම 111
6.5.5. කෘෂිකාර්මික සැලැස්ම 115

6.6. සංස්කෘතික, ආගමික හා උරුමයන් කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම 116

6.6.1. ප්‍රදේශයේ පවතින බෞද්ධ ආගමික ස්ථාන 116
6.6.2. සංස්කෘතිකාංග 116
6.6.3 සංරක්ෂණය කරන ප්‍රදේශ 116

6.7. නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම 117
6.8. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම 122

6.8.1. උපායමාර්ගික ව්‍යාපෘති 128
6.8.2. ආයතනික ව්‍යුහය 155

ඇමුණුම් 163

සිතියම් ලැයිස්තුව 186
වගු ලැයිස්තුව 186
රූප සටහන් ලැයිස්තුව 187
ඇමුණුම් ලැයිස්තුව 188
පරිශීලිත මූලාශ්‍ර 189



# පළමු කොටස

## 01 පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්මේ පසුබිම

## 1.1. හැඳින්වීම

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී. ඒ අනුව 1982 අංක 04 දරණ සංශෝධිත පනත යටතේ නාගරික සංවර්ධන බලප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රදේශයන්හි භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික යන ප්‍රමුඛ අංශයන්ගේ තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් තුළිත සංවර්ධනයක් කරා ළඟා වීමට සංවර්ධන සැලසුම් සකස් කිරීම අධිකාරියේ ප්‍රධානතම කාර්යභාරයක් ලෙස සළකා ඇත. එකී අරමුණෙන් මේ වන විට පිළියෙළ කර ඇති කළුතර සංවර්ධන සැලැස්මේ (2005 – 2020), කාලය ඉකුත්ව පැවතීමත්, වර්තමානයේ ඇති වී තිබෙන භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික වෙනස්කම් ද අන්තර් ග්‍රහණය කිරීමේ අවශ්‍යතාවන් ඇතුළත් කර පුළුල් කරන ලද සැලසුම් බලප්‍රදේශය ද ඇතුළත් කර ගනිමින් කළුතර සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.

ඒ අනුව කළුතර සංවර්ධන සැලැස්ම (2019–2030) ප්‍රධාන වශයෙන් කළුතර නගර සභා බලප්‍රදේශයත් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයත් යන ප්‍රදේශ දෙකම සම්බන්ධ කර ගනිමින් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයම සැලසුම් බලප්‍රදේශය ලෙස සලකමින් සකසනු ලැබීය. මෙම සැලසුම් ප්‍රදේශය නාගරික සංවර්ධන බලප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම පිළිබඳව නෛතික පසුබිම පිළිබඳව සලකා බලන විට කළුතර නගර සභා බලප්‍රදේශය 1979.06.01 දිනැති අංක 38/16 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින්ද කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් 2002.06.07 දිනැති අංක 1239/27 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින්ද, ඉතිරි කොටස 2005. 05. 18 දිනැති අංක 1393 / 06 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින්ද, වෙරළ ඉමේ සිට කි.මි.1 ක ප්‍රදේශය ඇතුළත් වන ප්‍රදේශය 1982.12.17 දිනැති අංක: 223/16 දරණ රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින්ද නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙසට ප්‍රකාශයට පත්කොට ඇත.

නගරයේ පවතින භෞතික, ආර්ථික, සාමාජීය පදනම හා එහි සුවිශේෂී පාරිසරික, සංස්කෘතික, පුරාවිද්‍යාත්මක හා ප්‍රවාහන ක්ෂේත්‍රයන්ගේ වටිනාකම් පාදක කරගනිමින් දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීමට හැකිවන ලෙසත් ප්‍රදේශයේ නේවාසික ජනතාවට මුහුණ පෑමට සිදුවන ජල ගැලීම් හා නාය යෑම් තර්ජන වැනි පීඩාකාරී තත්ත්වයන් උපක්‍රමශීලීව අඩුකර ගනිමින් දෛනික අවශ්‍යතාවයන් ලබා ගැනීම සඳහා නගරයට පැමිණෙන සියළු සංසරණ ජනගහනයටත්, වන්දනාකරුවන්ටත් , සියළුම නේවාසිකයන්ටත් පහසුකම් සපිරි, ජීවත් වීමට සුදුසු, උවදුරුවලින් තොර නවාතැන් පළක් බවට කළුතර නගරය 2030 වර්ෂයේදී පත් කිරීම මෙම සැලැස්මේ අරමුණ විය. ඒ අනුව කළුතර සංවර්ධන සැලැස්ම වසර 11 ක් වැනි කාලසීමාවක් සඳහා ප්‍රාදේශීය මට්ටමේ නගර සංවර්ධන සැලසුමක් ලෙස සම්පාදනය කර ඇත.

## 1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා 2019–2030 දක්වා වන එකොළොස් අවුරුදු නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාළ කටයුතු සිදුකිරීමේදී අධිකාරියේ කාර්ය මණ්ඩලයට අමතරව සැලසුම් ප්‍රදේශයේ සෑම අංශයක්ම නියෝජනය වන පරිදි පාර්ශව හා ආයතන සම්බන්ධ කර ගනිමින් ප්‍රදේශයේ පවතින ගැටළු හා විභවතා හදුනා ගැනීම සඳහා 2017.12.04 වන දින පාර්ශවකරුවන්ගේ සාකච්ඡාවක් පැවැත්විණි. ඒ සඳහා පහත සඳහන් ආයතන නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී විය

### *ප්‍රධාන පාර්ශව ආයතන*

1. *කළුතර නගර සභාව*
2. *කළුතර ප්‍රාදේශීය සභාව*

## අනෙකුත් පාර්ශව ආයතන

1. කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
2. කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
3. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
4. මධ්‍යම පරිසර අධිකාරිය
5. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
6. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
7. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය
8. පළාත් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය
9. කළුතර බෝධිභාරකාර මණ්ඩලය
10. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
11. මාර්ග සංවර්ධන අධිකාරිය
12. මිහිසරු ව්‍යාපෘති කාර්යාලය - කළුතර
13. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
14. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
15. දිස්ත්‍රික් සමුද්‍ර පරිසර අධිකාරිය
16. කටුකුරුන්ද ගුවන් හමුදා කඳවුර
17. දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී කාර්යාලය
18. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය
19. කළුතර උතුර පොලිස් ස්ථානය
20. කළුතර දකුණ පොලිස් ස්ථානය
21. රථවාහන ඇමතුම් අංශය - කළුතර පොලිසිය
22. ලංකා විදුලිබල මණ්ඩලය
23. භූ විද්‍යා හා පතල් කාර්යාංශය
24. ලංකා විදුලි පෞද්ගලික සමාගම
25. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
26. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
27. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
28. ලංකා ගමනා ගමන මණ්ඩලය
29. තැපැල් අධිකාරී කාර්යාලය
30. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
31. ගොවිජන සේවා සහකාර කොමසාරිස් කාර්යාලය
32. අපනයන කෘෂිකර්ම ව්‍යාපෘති නිලධාරී කාර්යාලය
33. කාර්මික සංවර්ධන මණ්ඩලය
34. දිස්ත්‍රික් තක්සේරු නිලධාරී කාර්යාලය
35. දිස්ත්‍රික් ධීවර කාර්යාලය
36. මිනින්දෝරු අධිකාරී කාර්යාලය
37. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
38. පොල්වගා කිරීමේ මණ්ඩලය
39. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
40. පුලර්ටන් කර්මාන්තපුර කාර්යාලය
41. පස්දුන්රට ජාතික ගුරු අභ්‍යාස විදුහල
42. ජාතික සෞඛ්‍ය විද්‍යාතනය
43. ශ්‍රී ලංකා පොලිස් අභ්‍යාස විද්‍යාලය
44. කලාප අධ්‍යයන කාර්යාලය
45. කළුතර කාර්මික විද්‍යාලය

46. ජාතික තරුණ සේවා සභාව
47. කළුතර නාවික හමුදා කඳවුර
48. විශේෂ බලකා පුහුණු මධ්‍යස්ථානය
49. වෙළඳ සංගමය, කළුතර

## සම්පත් දායකයින්

මහාචාර්ය රංගික උමේෂ් හල්වතුර මහතා (සිවිල් ඉංජිනේරු පීඨය – මොරටුව විශ්ව විද්‍යාලය)

## සැලසුම් කණ්ඩායම

කළුතර සංවර්ධන සැලැස්ම සැකසීම සඳහා සහභාගි වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම

1. *වයි. ඒ. ජී. කේ. ගුණතිලක මයා, අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය)*
2. *ජනක් රණවීර මයා, නිටපු අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය)*
3. *බී. ඒ. ආර්. අජිත් කුමාර, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)*
4. *එම්. හේමන්ති මිය, නිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)*
5. ඉමාලි හේරත් මිය, සැලසුම් නිලධාරී, නා. සං. අධි.
6. චමින්ද්‍රා හෙට්ටිආරච්චි මිය, සැලසුම් නිලධාරී, නා.සං.අධි.
7. තනුජා ඉඹුලාගොඩ මිය, සැලසුම් නිලධාරී, නා.සං.අධි.
8. ඒ.ජී. දිනුෂා දමයන්ති රත්නායක මෙනවිය, සහකාර සැලසුම් නිලධාරී , නා.සං.අධි.
9. එස්. ඩී. උදිත ජයම්පත් මයා, සහකාර සැලසුම් නිලධාරී, නා.සං.අධි.
10. ජී. ඩිල්කි ශෂීරා කුලසූරිය මෙනවිය, සහකාර සැලසුම් නිලධාරී, නා.සං.අධි.
11. චතුරිකා ලක්මාලි ජයසේකර මෙනවිය, සහකාර සැලසුම් නිලධාරී, නා.සං.අධි.

මීට අමතරව කළුතර සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා දායක වූ ප්‍රධාන කාර්යාලීය අංශ පහත පරිදි වේ .

1. පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පාරිසරික හා භූ දර්ශන අංශය
3. සංවර්ධන සැලසුම් අංශය
4. භූගෝලීය තොරතුරු පද්ධති අංශය

# 1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය

කළු ගඟ මෝය ආශ්‍රිතව ඉදිවූ කළුතර, කොළඹ සිට ගාල්ල දක්වා දිවෙන A2 ප්‍රධාන මාර්ගයේ කේන්ද්‍රස්ථානයක් ද වේ.

2018–2040 කාල සීමාව සඳහා සකස් කර ඇති ජාතික භෞතික සැලසුමට අනුව කළුතර ප්‍රදේශය එම සැලැස්මේ ආර්ථික කලාපය තුළ ඇති නගරයක් ලෙසත්, වෙරළාශ්‍රිත පාරිසරික සංවේදී කලාපය තුළ පිහිටි නගරයක් ලෙසත් හදුනාගෙන ඇත. එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිළියෙළ කර ඇති බස්නාහිර පළාත් ව්‍යුහ සැලසුමට අනුව (2018 – 2030) අළුත්ගම – මීගමුව දක්වා දිවෙන සංචාරක කලාපයට අයත් නගරයක් ලෙසත් කළුතර ප්‍රදේශය හදුනාගෙන ඇත.

මෙකී හඳුනාගත් ජාතික මට්ටමේ සැලසුම් පාදක කරගනිමින් කළුතර දිස්ත්‍රික්කයම අධ්‍යයන ප්‍රදේශය වශයෙන් සලකා බලන ලද අතර, දිස්ත්‍රික්කය සඳහාම සැලැස්ම සකස් කිරීම ප්‍රායෝගිකව අපහසු වන බැවින් ද කළුතර නගර සභා බලප්‍රදේශය පමණක් ප්‍රමාණාත්මක නොවන බැවින් ද කළුතර නගර සභාව වටා ප්‍රාදේශීය සභාව පිහිටා ඇති බැවින්ද මෙම පළාත් පාලන ආයතන දෙක අතර සෘජු සම්බන්ධතාවයක් ඇති බැවින්ද කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ද අයත් වන පරිදි කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයම ආවරණය වන ලෙස කළුතර සංවර්ධන සැලැස්ම සකස් කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව මෙම සංවර්ධන සැලසුම පිළියෙල කිරීමේදී ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම (සහනදායී නවාතැන්පල – Console Caesura), අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම (ඒකාබද්ධ නවාතැන්පල – Conjoined Caesura), නිවාස සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම (සුවපහසු නවාතැන්පල – Cushy Caesura), තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම (නීලහරිත නවාතැන්පල – Cyan Caesura) හා සංස්කෘතික, ආගමික හා උරුමයන් කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම යනාදී අනුශාංගික සැලසුම් කිහිපයක් තුළින් 2030 වන විට මෙම ප්‍රදේශය තුළ සිදු කිරීමට අපේක්ෂිත භෞතික, සාමාජීය, ආර්ථික හා පාරිසරික අභිවෘද්ධිය පිළිබඳ යෝජනා සකස් කර ඇත.

මෙම සංවර්ධන සැලැස්ම යටතේ සැලසුම් බලප්‍රදේශය කලාප 13 කට කලාපීයකරණය කරන ලදී. එම කලාප සහිත කලාපීයකරණ සැලැස්ම සැකසීමේදී පවතින භූමි පරිහරණ රටාව හා සනත්වය පදනම් කරගන්නා ලදී. යෝජිත කලාප මගින් ප්‍රදේශයේ පවතින ප්‍රමුඛතාවය වැඩි දියුණු කළ යුතු කලාප ප්‍රවර්ධනය කිරීමටත් පාරිසරික සංවේදීතාව හා පාරිසරික උපද්‍රව සහිත ස්ථාන වල ජනගහනයේ විසිරි ව්‍යාප්තියක් ඇතිවන පරිදි සංවර්ධනය පාලනය කිරීමටත් මෙම සැලැස්ම මගින් අපේක්ෂිතය.

ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම කොටස් 02 කින් යුක්ත වේ. එනම්, ආර්ථික සංවර්ධන සැලැස්ම හා සංචාරක සංවර්ධන සැලැස්ම ය. සංචාරක සංවර්ධන සැලැස්ම යටතේ සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන හා සංචාරක ආකර්ෂණය වැඩි කිරීමට විභවතා සහිත ස්ථානයන් සංවර්ධනය කරමින් එම ස්ථාන අතර සම්බන්ධතා වැඩිවන පරිදි කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආර්ථික සංවර්ධනයට ලබාගත හැකි දායකත්වය උපරිම අයුරින් වර්ධනය කිරීම කර ඇත. එහිදී සංචාරක ආකර්ෂණයක් පවතින කළුතර බෝධිය, කැලිඩෝ වෙරළ තීරය , රිච්මන්ඩ් කාසල් යනාදී ස්ථාන වෙත ඇති සංචාරක ආකර්ෂණය වැඩි දියුණු වන සේ එම ස්ථාන දියුණු කිරීම තුළින් වැඩි ආදායමක් ප්‍රදේශයට ලබාදීම අරමුණු කර ඇත. ආර්ථික සංවර්ධන සැලැස්ම යටතේ වන පරිපාලන හා සෞඛ්‍ය ප්‍රවර්ධන සැලැස්ම තුළින් කළුතර නගරය තුළට දෛනික සංක්‍රමණික ජනතාව පැමිණෙන ප්‍රධාන ක්ෂේත්‍රයන් 02 ක් වන පරිපාලන හා සෞඛ්‍ය යන අංශයන්හි සංවර්ධනය තුළින් කළුතර නගරයේ ආර්ථික සංවර්ධනය ලබාගැනීම අපේක්ෂා කෙරේ. මෙහිදී පරිපාලන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන් වෙන වෙනම සංවර්ධනය කිරීම තුළින් සංකේන්ද්‍රීය ආර්ථික සංවර්ධනයක් (Agglomerated Economic Development) අපේක්ෂා කෙරේ.

මෙයට අමතරව අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම හරහා ප්‍රදේශය තුළ දැනට පවතින මහාමාර්ග, අතුරු මාර්ග හා අනෙකුත් යටිතල පහසුකම් යෝජිත සංවර්ධනයට අනුකූළ වන පරිදි සංවර්ධනය කිරීම ද, ඉන් සංවර්ධන කටයුතු සඳහා ප්‍රවේශයක් ඇතිකිරීම ද අපේක්ෂා කරනු ලබයි. මෙහිදී දුම්රිය ස්ථානය හා බස් නැවතුම්පල ඒකාබද්ධ කර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස කළුතර නගරය දියුණු කිරීමට අපේක්ෂිතය. මෙමඟින් නගරයට පැමිණෙන වන්දනාකරුවන්ට, දෛනික සංසරණ ජනගහනයට හා නේවාසික ජනගහනයට අවශ්‍ය පොදු පහසුකම් සැපයීමට ද අපේක්ෂිතය. එසේම මෙමඟින් රටේ ප්‍රධාන වාණිජ මධ්‍යස්ථාන වල සිට කළුතර නගරයට ආයෝජකයින්ට ප්‍රවේශ වීමට ද අවස්ථාව උදාවේ. එමෙන්ම මෙහිදී 2030 වසර වන විට අපේක්ෂිත ජනගහනය සඳහා ජල සැපයුම් සැලැස්ම, විදුලි සහ දත්ත රැහැන් සැලැස්ම, මළ හා අපජල කළමනාකරණ සැලැස්ම හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම පිළිබඳව ද සාකච්ඡා කෙරේ.

නිවාස සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම තුළින් ජලගැලීම්, නායයාම්, වෙරළ ඛාදනය සිදුවන ප්‍රදේශ තුළ හා පාරිසරික සංවේදී කලාප තුළ නේවාසික සනත්වය අඩු කරමින් විසිරි ජනාවාස රටාවක් ඇතිකිරීමටත් සෙසු ප්‍රදේශ තුළ නේවාසික සනත්වය වැඩි කිරීමටත් අවශ්‍ය රෙගුලාසි සකස් කිරීමට අපේක්ෂිතය.

තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම තුළින් සැලසුම් බලප්‍රදේශය සඳහා වන කසළ කළමනාකරණය, තෙත් බිම් ආරක්ෂණය , වෙරළ සංරක්ෂණය සිදුකරන ආකාරය හා 2030 වසර වන විට අපේක්ෂිත ජනගහනය සඳහා අවශ්‍ය විවෘත උද්‍යාන හා විවේක ස්ථාන පිළිබද සැලසුම් හා යෝජනාදිය ද ඉදිරිපත් කර ඇත. මේ අනුව කළුතර සැලසුම් ප්‍රදේශය සඳහා ආර්ථික, සාමාජීය, භෞතික හා පාරිසරික වශයෙන් තුළිත සංවර්ධනයක් ලබාගැනීම අරමුණ වේ.

මෙම සැලසුම සැකසීමේදී ප්‍රදේශයට බලපාන ප්‍රධාන ගැටළු හඳුනා ගැනීමක් සිදු වුවද ඇතැම් ගැටළු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වශයෙන් සෘජුවම මැදිහත් විය නොහැකි බැවින්, එවැනි ගැටළු සම්බන්ධයෙන් සැලසුම් සීමාවන් හඳුනා ගන්නා ලදී. ඒ අනුව ප්‍රදේශයේ ජනගහනයෙන් 56% කට බලපාන පානීය ජලයට ලුණු මිශ්‍රවීමේ ගැටළුව සංවර්ධන සැලසුම හරහා විසදිය යුතු ගැටළුක් ලෙස හඳුනා ගත්තද එම ගැටළුව විසදීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට සෘජුව මැදිහත් වීමක් සිදු කළ නොහැකිය. එසේම කැලිඩෝ වෙරළ තීරය ඛාදනය වීමේ ගැටළුව හඳුනා ගත් නමුත් එම ගැටළුව විසදීම සඳහා ද ප්‍රායෝගිකව මැදිහත්විය නොහැකි වීම ද සැලසුම් සීමාවක් වශයෙන් හඳුන්වා දිය හැකිය. මෙයට අමතරව ජලයෙන් යටවන ප්‍රදේශවල එම උවදුරු අවම කිරීම සඳහා ජල රැඳවුම් පොකුණු ඉදිකිරීමට යෝජනා කළ නමුත්, එම සැලසුම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම හා ශක්‍යතා අධ්‍යයනයන්ගේ පවතින ගැටළුද සැලසුම් සීමාවන් ලෙස දැක්විය හැකිය.



## 1.4. සැලසුම් ක්‍රියාවලිය

| | |
|---|---|
| **පසුබිම් අධ්‍යයනය** | දත්ත රැස් කර ගැනීම (ක්ෂේත්‍ර සමීක්ෂණ, "ගූගල්" සිතියම්, චන්ද්‍රිකා ඡායාරූප හා අනෙකුත් ක්‍රම මගින් ද්විතික දත්ත හා ප්‍රාථමික දත්ත එකතු කර ගන්නා ලදී) |
| **විෂය පථය** | විශ්ලේෂණ ක්‍රම භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කිරීම හා දත්ත ගොනුවක් සකස් කර ගැනීම උදා: Excel, Arc, GIS |
| **සංවර්ධන විභවතා හා ගැටළු හඳුනා ගැනීම** | පාර්ශවකරුවන්ගේ විවිධ මත හරහා හඳුනාගන්නා ලද ගැටළු හා විභවතා තවදුරටත් සැලසුම් මූලධර්මයන්ට අදාළ විවිධ විශ්ලේෂණ ක්‍රම භාවිතයෙන් තහවුරු කරගැනීම. |
| **ඉදිරි දැක්ම, ඉලක්ක හා අරමුණු සකස් කිරීම** | ප්‍රමුඛතා අනුපිළිවෙලට සැකසූ ගැටළු අවධාරණය කරමින් අනාගත දැක්ම, ඉලක්ක හා අරමුණු සකස් කිරීම |
| **සවිස්තරාත්මක විශ්ලේෂණය** | හඳුනාගත් ඉලක්ක වලට අදාළව විභවතා, අවස්ථා, තර්ජන හා බාධක හදුනා ගැනීම මෙන්ම තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ සවිස්තරාත්මක විශ්ලේෂණ සිදු කිරීම. උදා: මාර්ග ජාල සම්බන්ධතා ඇගයීම, සංවර්ධනයේ තීව්‍රතා දර්ශක ඇගයීම, පාරිසරික සංවේදිතා දර්ශක ඇගයීම ආදිය |
| **උපායමාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සකස් කිරීම** | හඳුනාගත් ඉලක්ක කරා ළගා වීමට හැකි වන පරිදි උපායමාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සැකසීම. |
| **නීති හා රෙගුලාසි සකස් කිරීම** | ප්‍රදේශයට අදාළ සංකල්පමය සැලැස්මට අනුව කලාපීය සිතියමක් පිළියෙල කරමින්, සැලැස්ම බලාත්මක කිරීමට අවශ්‍ය නීති හා රෙගුලාසි සකස් කිරීම |
| **කෙටුම්පත් සංවර්ධන සැලැස්ම පාර්ශවකරුවන්ගේ අදහස් සඳහා යොමු කිරීම** | කෙටුම්පත් සංවර්ධන සැලැස්ම පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරමින් ඔවුන්ගේ අදහස් ලබා ගැනීම |
| **පාර්ශවකරුවන්ගේ අදහස් අනුව සැකසූ කෙටුම්පත් සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම** | අවසාන කෙටුම්පත් සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරිම |
| **අනුමැතිය හා ප්‍රකාශය** | සංවර්ධන සැලැස්මේ අනුමැතිය ලබාගැනීම හා ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව ක්‍රියාත්මක කිරීම |

## 1.4.1. පසුබිම් අධ්‍යයනය

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සංවර්ධන සැලැසුම සකස් කිරීමේ ආරම්භක අවධියේදී අවශ්‍ය දත්ත එක් රැස් කරගැනීම සඳහා විවිධ ක්‍රම උපයෝගි කරගත් අතර විවිධ මූලාශ්‍ර ද යොදා ගැනුණි. ප්‍රධාන වශයෙන් ද්විතීක මූලාශ්‍ර හා ප්‍රාථමික මූලාශ්‍ර හරහා දත්ත එක් රැස් කරන ලදී.

ඒ අනුව ජාතික මට්ටමින් , පළාත් මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් කළුතරට හිමි වී ඇති ස්ථානය හා එහි විශේෂතා හදුනා ගැනීම සිදු කරන ලදී. එමෙන්ම ක්ෂේත්‍ර චාරිකා මඟින් ද ප්‍රාථමික දත්ත එකතු කරගන්නා ලදී. මෙහිදී නාගරික සංවර්ධන අධිකාරිය හා වෙනත් ආයතන මඟින් කළුතර නගරය ද සළකමින් සකස් කරන ලද සංවර්ධන සැලසුම් පිළිබඳව අධ්‍යනය යොමු කළ අතර, මූලිකව මහ කොළඹ සැලසුම -1978 (Colombo Master Plan - 1978), මහ කොළඹ ව්‍යුහ සැලසුම -1998 (Colombo Metropolitan Regional Structure Plan - CMRSP - 1998) , කොළඹ මහා නගර සැලසුම -2004 (Colombo Megapolis Plan – CESMA - 2004), ජාතික භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය 2011–2030 (National Physical Plan 2011–2030) නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කරන ලද කළුතර සංවර්ධන සැලැස්ම - 2005-2020 Kalutara Development Plan - (2005-2020), ජාතික භෞතික සැලැස්ම - 2018–2050 (National Physical Plan – 2018–2050) හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කරන ලද යෝජිත බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්ම 2018–2030 (Proposed Western Region Structure Plan 2018–2030) ආදී සැලසුම් කෙරෙහි අවධානය යොමු විය.

තවද ප්‍රදේශයේ පවතින රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් ද ද්විතියික දත්ත එක් රැස් කරන ලදී. ඉන් ආයතන කිහිපයක් ලෙස කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ආදී ආයතන දැක්විය හැකිය.

මෙසේ එක් රැස් කරගත් දත්ත අනුසාරයෙන් ප්‍රදේශයේ ඉතිහාසය,පිහිටීම,භූමි භාවිතයන්,මාර්ග පද්ධතිය හා අනෙකුත් යටිතල පහසුකම්, ආර්ථිකය, සමාජීය වටපිටාව, සංස්කෘතිය ආදී මූලික ක්ෂේත්‍රයන් පිළිබඳව දළ අධ්‍යයනයක යෙදුනි. මෙම සියලු ක්‍රම තුළින් ප්‍රදේශයේ වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක නිරතවීම මෙහිදී සිදු කෙරිණි.

## 1.4.2. විෂය පථය

මෙහිදී ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රවලින් රැස් කරගත් දත්ත මූලික වශයෙන් විවිධ විශ්ලේෂණ ක්‍රම භාවිතයෙන් ඇගයීමට ලක් කරන ලද අතර එම දත්ත භාවිතයේ පහසුව සඳහා දත්ත ගොනුවක් ලෙස සකස් කර ගැණුනි. ඒ ඇසුරෙන් දැනට ප්‍රදේශයේ පවතින ආර්ථික, සාමාජීය, පාරිසරික හා භෞතික ලක්ෂණ තවදුරටත් අධ්‍යයනය කරමින් තහවුරු කරගත් අතර එම තොරතුරු දැක්වෙන භූගෝලීය සිතියම් ද පිළියෙල කෙරුණි.

## 1.4.3. සංවර්ධන විභවතා හා ගැටළු හඳුනා ගැනීම

මේ සඳහා ප්‍රදේශයේ සම්පත් දායකයින්, පාර්ශවකරුවන්, රාජ්‍ය හා පෞද්ගලික අංශය හා අදාළ සමිති සමාගම් සම්බන්ධ කර ගනිමින් පාර්ශවකරුවන්ගේ සහභාගීත්ව සාකච්ඡාව (Stakeholder Meeting) 2017.12.04 වන දින පවත්වන ලදි.

මෙහිදී පාර්ශවකරුවන් කණ්ඩායම් 3 කට වර්ග කෙරුණි. ඒවා වන්නේ

1. *පාරිසරික,කර්මාන්ත හා වාණිජ ක්ෂේත්‍රය නියෝජනය කරන කණ්ඩායම*
2. *පරිපාලන ක්ෂේත්‍රය නියෝජනය කරන කණ්ඩායම*
3. *යටිතල පහසුකම් ක්ෂේත්‍රය නියෝජනය කරන කණ්ඩායම*

ඔවුන්ගේ අදහස් හා විශ්ලේෂණ නිගමනයන්ද සැලකිල්ලට ගනිමින් සංවර්ධන සැලසුම් ප්‍රදේශය තුළ පවතින ගැටළුකාරී තත්ත්වයන් හා සංවර්ධන විභවතා හඳුනාගැනීම සිදු කළ අතර ගැටළු වල පවතින ප්‍රබලතාවය මත ප්‍රමුඛතා අනුපිළිවෙල තීරණය කිරීමද මෙහිදී සිදුවිය. ඒ ඇසුරින් ප්‍රදේශයට සැලසුමක් අවශ්‍ය ඇයිද යන්න තවදුරටත් තහවුරු කර ගත් අතර සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී මූලික අවධානය යොමුවිය යුතු ක්ෂේත්‍ර ද හඳුනාගන්නා ලදි.

## 1.4.4. ඉදිරි දැක්ම, ඉලක්ක හා අරමුණු සකස් කිරීම

ප්‍රමුඛතා අනුපිළිවෙලට සැකසූ ගැටළු වලට මූලික අවධානය යොමු කර එම ගැටළු විසඳා ගතහැකි වන අයුරින් කළුතර නගරයේ සංවර්ධනයට අනාගත දර්ශනයක් සකස් කිරීම මෙහිදී සිදු කළ අතර එයට ළඟා වීමට සංකල්පමය සැලසුමක් පිළියෙල කිරීම මීළඟට සිදුවිය.

තවද අනාගත දැක්මට (Vision) අදාළව ඉලක්ක 03 ක් හඳුනාගත් අතර ඒ එක් එක් ඉලක්ක යටතේ අරමුණු සකස් කරන ලදි. මෙහි මූලික පරමාර්ථය වූයේ කළුතර නගරයේ සංවර්ධන සැලැස්ම ක්‍රමවත්ව කේන්ද්‍රගත කිරීමයි.

එතුළින් "සුසැදි, සුරැකි, සොඳුරු නාගරීකරණයක් කරා" වන නාගරික සංවර්ධන අධිකාරියේ මූලික දැක්ම කළුතර නගරය තුළිනුත් සාක්ෂාත් කිරීමට බලාපොරොත්තු විය.

## 1.4.5. සවිස්තරාත්මක විශ්ලේෂණය

හඳුනාගත් ඉලක්ක තුනට වෙන් වෙන්ව සවිස්තරාත්මක විශ්ලේෂණයන් සිදු කිරීම මෙහිදී මූලිකව සිදු කෙරුණි. එමගින් එක් එක් ඉලක්ක කරා ළඟා වීමට උපයෝගී කරගත හැකි විභවතා (ශක්තීන්), අවස්ථා හා එම ඉලක්ක වලට ඇති දුර්වලතා හා බාධක ද වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට හැකිවූ අතර, ඒවා තවදුරටත් තහවුරු කරගැනීම සඳහා පහත තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ සවිස්තරාත්මක දත්ත විශ්ලේෂණය කිරීමක් සිදුවිය. මෙහිදී යොදා ගත් තාක්ෂණික ක්‍රමවේද පහත දැක්වේ.

1. *සංවර්ධනයේ තීව්‍රතාවය ( Development Pressure)*
2. *පාරිසරික සංවේදිතා ඇගයුම( Environmental Sensitivity Analysis)*
3. *මාර්ග ජාල සම්බන්ධතා ඇගයීම ( Connectivity Analysis)*
4. *අවකාශීය සම්බන්ධතා සමෝධානිත ඇගයුම (Space Syntax)*
5. *මංසන්ධි විශ්ලේෂණ ඇගයුම ( Node Analysis)*

අවසානයේ එම එක් එක් විභවතා, දුර්වලතා, අවස්ථා හා බාධක විද්‍යානුකූලව විශ්ලේෂණය කරන ලදි.

## 1.4.6. උපායමාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සකස් කිරීම

වඩාත් අවධානයට ලක්වූ හඳුනාගත් ගැටළු හා බාධක අවම කර ගනිමින් හා ප්‍රදේශයේ පවතින සම්පත් තිරසාර ලෙස භාවිතා කරමින්, ඉහතදී හඳුනාගත් ඉලක්ක කරා ළඟා වීමට හැකි වන පරිදි උපායමාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සැකසීම මෙහි මූලික අරමුණ විය.

එය පදනම්කර ගනිමින් ප්‍රධාන සැලසුම් 5 ක් සකස් කෙරුණි. ඒවා වන්නේ ,

1. *අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම*
   - *සේවා කළමනාකරණ සැලැස්ම (සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම්)*
   - *මහා මාර්ග හා ප්‍රවාහන සංවර්ධන  සැලැස්ම*
     - *මහා මාර්ග සංවර්ධන සැලැස්ම*
     - *ප්‍රවාහන සංවර්ධන සැලැස්ම*
   - *ජල සැපයුම් සැලැස්ම*
   - *විදුලිබල සැපයුම් සැලැස්ම*
   - *මළ හා අපජල කළමනාකරණ සැලැස්ම*
   - *ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම*

2. *ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම*
   - *ආර්ථික සංවර්ධන සැලැස්ම*
   - *සංචාරක සංවර්ධන සැලැස්ම*

3. *තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම*
   - *පරිසර සංරක්‍ෂණ සැලැස්ම*
   - *භූ දර්ශන කළමනාකරණ සැලැස්ම*
   - *අපදා  කළමනාකරණ සැලැස්ම*
   - *පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම*
   - *කෘෂිකාර්මික සැලැස්ම*

4. *නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම*
5. *සංස්කෘතික, ආගමික හා උරුමයන් කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම*

පසුව ශක්‍යතා වාර්තා අධ්‍යයනය කිරීම මගින් හා විවිධ විශ්ලේෂණ ක්‍රම මගින් ක්‍රියාත්මක කිරීමට සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම ද සිදු කෙරුණි.

## 1.4.7. නීති හා රෙගුලාසි සකස් කිරීම

සංවර්ධන සැලැස්ම බලාත්මක කිරීමට අවශ්‍ය ඉදිකිරීම් සම්බන්ධ නීති රෙගුලාසි හා ඉඩම් පරිහරණයන් සම්බන්ධයෙන් වන නීති රෙගුලාසි සකස් කිරීමත්, සංවර්ධන සැලැස්මේ දැක්ම කරා ළඟා වීමේදී උද්ගත විය හැකි ගැටළු හා දැනට පවතින ගැටළු අවම කර ගැනීමට අවශ්‍ය නීතිමය රාමුවක් සකස් කිරීමත් මෙහි මූලික අරමුණයි.

මේ සඳහා පිළියෙල කරගත් සංකල්පමය සැලැස්මට (Concept Plan) අනුකූළ වන සේ සංවර්ධන සැලැසුම් ප්‍රදේශය මූලික කලාප කිහිපයකට බෙදා වෙන්කර කලාපීය සිතියමක (Zoning Map) පිළියෙල කර ගන්නා ලදි. එහිදී එම එක් එක් කලාප සඳහා ගැළපෙන නීති හා රෙගුලාසි වෙන් වෙන්ව පිළියෙල කෙරුණි.

## 1.4.8. කෙටුම්පත් සංවර්ධන සැලැස්ම පාර්ශවකරුවන්ගේ අදහස් සඳහා යොමු කිරීම

සංවර්ධන සැලැස්ම සකස් කිරීමෙන් පසු එම සැලැස්ම පිලිබඳ අනුගත වන පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ලබාගැනීම තුළින් සම්මුතියකට එළඹීම මෙහිදී අපේක්‍ෂා කෙරුණි.

## 1.4.9. පාර්ශවකරුවන්ගේ අදහස් අනුව සැකසූ කෙටුම්පත් සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම

ලේඛණගත කරන ලද සංවර්ධන සැලැස්ම තවදුරටත් නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා යෝජනා ලබාගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම මෙහිදී අපේක්ෂා කෙරුණි.

## 1.4.10. අනුමැතිය හා ප්‍රකාශයට පත්කිරීම

පාර්ශවකරුවන්ගේ හා ප්‍රධාන සැලසුම් කමිටුවේ අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඒ පිළිබඳ අවධානය යොමු කරමින් සංශෝධිත සැලසුම් සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසු ප්‍රකාශයට පත් කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙහිදී සිදු කරන ලදී.



සැලසුම් ක්‍රියාවලිය

දළ සංවර්ධන සැලැස්ම සම්මුතියකට පත්කර ගැනීම (Consent)

සම්මුතියකට පත්කර ගන්නා ලද සැලැස්ම ඉදිරිපත් කිරීම

අනුමැතිය හා ප්‍රකාශයට පත්කිරීම



# 02 පරිච්ඡේදය



# මූලික අධ්‍යයනය

## 2.1. අධ්‍යයන ප්‍රදේශය

කළුතර සංවර්ධන සැලැස්මට අයත් බලප්‍රදේශය කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන අතර, එහි සීමා නිර්ණය කොට ඇත්තේ කළුතර නගර සභා බලප්‍රදේශයේත්, ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේත් එකතුවෙනි. භූමි ප්‍රමාණයෙන් කළුතර නගර සභා බලප්‍රදේශය ව.කි.මී. 7.85 ක් ද ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ව.කි.මී. 63.85 ක් ද වන අතර සමස්ත කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ව.කි.මී. 71.7 ක භූමි ප්‍රමාණයකට හිමිකම් කියනු ලැබේ.

සිතියම් අංක 2.1 න් දැක්වෙන පරිදි උතුරින් පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද, නැගෙනහිරින් බණ්ඩාරගම හා දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලින්ද, දකුණින් බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද, බටහිරින් ඉන්දියන් සාගරයට ද මායිම් ව පිහිටා ඇති කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය .කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයෙන්ද, මුහුදුබඩ දුම්රිය මාර්ගයෙන්ද ,දර්ශනීය කළු ගඟෙන්ද වටවී පිහිටා ඇත.

## 2.2. සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

කළුතර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී ජාතික හා ප්‍රාදේශීය සබඳතාවයන් සහ පෙර කළුතර මූලික කරගත් සැලසුම් පිළිබද විමසා බැලීම් මූලිකවම සිදු කෙරුණි. එහිදී ශ්‍රී ලංකාවේ මහ කොළඹ සැලසුම -1978 (Colombo Master Plan -1978), මහ කොළඹ ව්‍යුහ සැලසුම -1998 (Colombo Metropolitan Regional Structure Plan- CMRSP -1998), කොළඹ මහා නගර සැලසුම -2004 (Colombo Megapolis Plan – CESMA-2004), ජාතික භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය 2011 – 2030 (National Physical Plan 2011 – 2030) නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කරන ලද කළුතර සංවර්ධන සැලැස්ම - 2005_2020 (Urban Development Authority Plan- (2005-2020)) , ජාතික භෞතික සැලැස්ම -2018 -2050 (National Physical Plan – 2018_2050) හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කරන ලද යෝජිත බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්ම 2018 ( Proposed Western Region Structure Plan - 2018) පිළිබඳව අවධානය යොමු කරන ලදි. එහිදී කළුතර ප්‍රාදේශීය සංවර්ධනයට හිමිව ඇති ප්‍රමුඛතාවයන් හා යෝජනාවන් පහත පරිදි හඳුනාගත හැකිය.

1978 වර්ෂයේ සකස් කරන ලද මහ කොළඹ සැලැස්මෙහි (Colombo Master Plan – 1978) (ඇමුණුම 01) සැලසුම් බලප්‍රදේශය වශයෙන් කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක ද කළුතර දිස්ත්‍රික්කයේ කොටසක් ද ඇතුළත් වේ. මෙම සම්පූර්ණ සැලසුම් බලප්‍රදේශය කලාප දෙකකට බෙදා වෙන්කර ඇත. එවා නම් මධ්‍ය උප කලාපය (Central Sub Region) හා පිටත කලාපය (Outer Region) වේ. ඒ අනුව කළුතර නගරය මෙම පිටත කලාපයට අයත්වේ.

මහ කොළඹ ව්‍යුහ සැලැස්මෙහි -1998 (Colombo Metropolitan Region Structure Plan 1998) (ඇමුණුම 02), බස්නාහිර පළාතේ නාගරික ධූරාවලිය සලකමින් කළුතර නගරය සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන පවතින දෙවන පෙළ නගරයක් හා ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් (Regional Center) ලෙසත් වැඩි වශයෙන් වෙරළ ඛාදනය සිදුවන කලාපයට අයත් ප්‍රදේශයක් ලෙසත් හඳුනාගෙන ඇත.

මූලික විමධ්‍යගත සංකල්පය (Decentralization Concept), උද්‍යාන නගර සංකල්පය (Garden city Concept & Green Finger Concept ) හා ජීවත්වීම, සෙල්ලම් කිරීම හා වැඩකිරීම යන ත්‍රිත්වය මූලික කරගත් සංකල්පය (Live, Play & Work Concept) මූලික කරගනිමින් සකස් කරන ලද කොළඹ මහ නගර සැලසුම -2004 (Colombo Megapolis Plan –CESMA-2004) (ඇමුණුම 03) මඟින් කළුතර නගරය පර්යන්තය තුළ පිහිටි නගරයක් (Outer Ring Town Ship) ලෙසත් ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් (Regional Centre ) ලෙසත් හදුනාගෙන ඇත.




**සිතියම 2.1 :** *කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය (2018)* **මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## 02 පරිච්ඡේදය මූලික අධ්‍යයනය

### සැලසුම් සහ තත්ත්ව සන්දර්භය (Planning and Situational Context)

2011 ඔක්තෝම්බර් මස 07 වන දින අංක 1729/15 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත ජාතික භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තියට 2011-2030(National Physical Plan 2011 – 2030) (ඇමුණුම 04) අනුව අනාගතයේදී මුළු රටම ආවරණය වන පරිදි හඳුනාගත් යෝජිත මහා නාගරික කලාප (Metro Regions) අතරින් කළුතර නගරය යෝජිත බස්නාහිර මහ නගරය තුළ පිහිටි ප්‍රධාන නගරයක් ලෙස හදුනාගෙන ඇති අතර ප්‍රදේශයේ පවතින සුන්දර වෙරළ තීරය පදනම් කර ගනිමින් සාගරය මුල්කරගත් පාරිසරික සංවේදී සංවර්ධනයක් සිදුකළ හැකි ප්‍රදේශයක් ලෙසත්, කටුකුරුන්ද අභ්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධනය කළ හැකි ස්ථානයක් ලෙසත් හදුනාගෙන ඇත. එමෙන්ම මෙහිදී කළුතර වෙරළාශ්‍රිත ප්‍රදේශය ඉතා ඉහළ පාරිසරික සංවේදී කලාපයක් ලෙසත් දැඩි වෙරළ ඛාදනයට ලක්වන ප්‍රදේශයක් ලෙසත් හදුනාගෙන ඇත.

2005-2020 කාල පරාසය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් කළුතර නාගරික බලප්‍රදේශය සඳහා පිළියෙල කළ කලාප 09 යුක්ත සංවර්ධන සැලැස්ම (ඇමුණුම 05) ප්‍රදේශයේ ආර්ථික, සාමාජීය, භෞතික හා පාරිසරික වටිනාකම තුළිත මට්ටමින් පවත්වා ගැනීම සඳහා සකස් කරන ලද අතර එයද දැනට කල් ඉකුත්වීමේ කාලයට ලඟා වී ඇත. එබැවින් පවත්නා තත්වයන්ට හා අවශ්‍යතා වලට ගැළපෙන සේ යාවත්කාලින කළ යුතුව ඇත

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් වර්ෂ 2018 -2050 (ඇමුණුම 06) කාලසීමාව සඳහා සැලැස්මක් සකස් කර ඇති අතර එමගින් කළුතර ප්‍රදේශය ආර්ථික කලාපය තුළ පිහිටි නගරයක් ලෙසත් වෙරළාශ්‍රිත පාරිසරික සංවේදී කලාපය තුළ පිහිටි නගරයක් ලෙසත් හඳුනාගෙන ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කරන ලද යෝජිත බස්නාහිර පළාත් ව්‍යුහ සැලසුම 2018ට (Proposed Western Region Structure Plan 2018) (ඇමුණුම 07) අනුව අළුත්ගම සිට මීගමුව දක්වා දිවෙන සංචාරක කලාපයට අයත්වන නගරයක් ලෙසත් කළුතර හදුනාගෙන ඇත. ඒ අනුව මෙහිදී ද දැනට පවතින සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ විභවතාවයන් පදනම් කර ගනිමින් ප්‍රදේශයේ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය හදුනාගෙන ඇත.

සිතියම් අංක 2.2 හි දැක්වෙන කළුතර නගරය සඳහා වන ජාතික හා කළාපීයකරණ සම්බන්ධතාවයට අනුව කළුතර නගරය කොළඹ වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ පිහිටා ඇති අතර ශ්‍රී ලංකාවේ ප්‍රධාන අග නගරය වන කොළඹට 40Km ක් වැනි ආසන්න දුරකින්ද, අනෙකුත් උප ප්‍රධාන නගර වන පානදුර, බණ්ඩාරගම, හොරණ, නෑබඩ, මතුගම හා බේරුවල යන නගරවලට පිළිවෙලින් 15Km, 17.5km, 28km, 20km, , 23km, 14km යන ඉතා ආසන්න දුරකින් ද පිහිටා ඇත. එමෙන්ම කොළඹ වැල්ලවාය (A2) මාර්ගයට සම්බන්ධ රට අභ්‍යන්තරයට දිවෙන විධිමත් මාර්ග ජාලයකින් ද සමන්විත නගරයක් ලෙස කළුතර – හොරණ, කළුතර-බණ්ඩාරගම, කළුතර-මතුගම, කළුතර-නෑබඩ යන ප්‍රධාන මාර්ග සම්බන්ධ කර ගනිමින් දැනට පවතියි. කළුතර නගරයට ආසන්න 18 km දුරකින් ගැලනිගම අන්තර් හුවමාරු මධ්‍යස්ථානය ද, 13Km දුරකින් දොඩන්ගොඩ අන්තර් හුවමාරු මධ්‍යස්ථානය ද ඉදිකර ඇති බැවින් එය වෙනත් කලාප හා පවතින සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමට ඉවහල් වී ඇත. මීට අමතරව මරදාන සිට බෙලිඅත්ත දක්වා දිවෙන මුහුදුබඩ දුම්රිය මාර්ගයේ පිහිටි ශීඝ්‍රගාමී දුම්රිය නැවතුම්පලක් ලෙස කළුතර දුම්රිය නැවතුම්පල ක්‍රියාත්මක වීම හේතුකොටගෙන ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ සුවිශේෂී ස්ථානයක් කළුතර නගරය දිනාගන්නා අතරම කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරය වශයෙන් ද වෙළඳ, පරිපාලන, අධ්‍යාපන, සංස්කෘතික හා සේවා මධ්‍යස්ථානයක් ලෙසද ඉහළ සේවාවක් සපයනු ලබයි.




*සිතියම 2.2 : කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා වන ජාතික හා කලාපීයකරණ සම්බන්ධතාවය (2018)*

*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## 02 පරිච්ඡේදය මූලික අධ්‍යයනය

### සැලසුම් සහ තත්ත්ව සන්දර්භය (Planning and Situational Context)

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2018 වසර සඳහා වන සම්පත් පැතිකඩෙහි සඳහන් වන පරිදි මෙම ප්‍රදේශයට පුරාණයේ සිටම 18 වන සියවස දක්වා රුවල් නැව් ලඟා වී ඇත. ඒ නිසා කාලතිත්ථ ලෙස හඳුන්වනු ලැබූ මෙම ප්‍රදේශය පසු කලෙක කළුතර ලෙස ව්‍යවහාර වූ බව අනුමාන කෙරේ.

එයට අනුව කළුතර උඩමළුවේ බෝධිවෘක්ෂය, අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේගෙන් ලබාගත් දෙතිස් මහා ඵල රුක් අතරින් එකක්ය යන්න විශ්වාසය කෙරේ. ක්‍රි.ව.2 වන සියවසේදී ටොලමි විසින් අඳින ලද පැරණි ලංකා සිතියමෙහි "නුබරත" යනුවෙන් සඳහන් කර ඇති ස්ථානය මෙම ප්‍රදේශය බව ද අනුමාන කෙරේ. එමෙන්ම ක්‍රි.ව. 5 වන සියවසට අයත් යැයි සැළකෙන කළුතර දියගම ප්‍රදේශයේ කළුගඟ මැද පිහිටි පැලුණු ගල ආසන්නයේ පිහිටි දැනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සංරක්ෂණයට ලක්ව ඇති පැරණි බ්‍රාහ්මීය අක්ෂර සහිත සෙල්ලිපියට අනුව එම අවදියේදී මෙම ප්‍රදේශයෙහි මිනිසුන් වාසය කළ බවත්, කෘෂි කර්මාන්තය ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූ බවත් හෙළිවේ. මේ අනුව 5 වන සියවස වන විට කෘෂිකාර්මික හා වෙළඳාම පදනම් කරගත් ආර්ථිකමය පසුබිමක් සහිතව ආගමික කටයුතු වල නිරත වූ ජනතාවක් වාසය කර ඇති බවත් පැහැදිලි වේ. මෙසමයේදී කළුතර කලපුවෙහි උතුරු හා දකුණු සීමාව තුළ කුඩා ධීවර ගම්මාන 02 ක් ස්ථාපනය වූ අතර පටු අඩි මාර්ග ද නිර්මාණය වූ බව සඳහන් වන අතර එවකට බේරුවල සිටි වෙළෙන්දන් සබරගමුවේ සිට භාණ්ඩ හුවමාරුව කළුගඟ හරහා සිදු කළ බවද සඳහන් වේ.

කළුතර වසර සියගණනක යටත් විජිත පාලන සමයක් පැවති නගරයක් ලෙස ද හඳුනාගත හැකිය. එනම් පෘතුගීසි පාලන සමය තුළ (1505–1655) එනම් වර්ෂ 1505 දී පෘතුගීසීන්, කළුතර ස්වභාවික ආරක්ෂිත පිහිටීම හේතුකොටගෙන තම බලකොටුවක් නිර්මාණය කර ගත් අතර වන්දනාමාන කටයුතු සඳහා පල්ලියක්ද සාදා ගන්නා ලදි. ඉන් අනතුරුව ලන්දේසි සමය තුළ (1655–1796) 1655 දී ලන්දේසීන් විසින් පෘතුගීසීන් පරාජය කළ පසු කොළඹට යෑම සඳහා බොරළු මාර්ගයක් ඉදි කෙරුණි. එය වෙරළ තීරයට සමාන්තරව සෙබළුන් 8 දෙනෙකුට තුවක්කුද සමගින් තිරස් ආකාරයේ පේළියක් ආකාරයට යෑමට හැකි පළලකින් යුක්තව සකස් කරන ලදි. එමෙන්ම අභ්‍යන්තර භාණ්ඩ හුවමාරුව සඳහා අභ්‍යන්තර ඇළ මාර්ග යොදා ගන්නා ලදි.

පූර්ව ඉංග්‍රීසි සමයේදී (1796–1877) පරිපාලන කටයුතු බලකොටුව ආසන්නයේත් වාණිජ කටයුතු වරාය ආසන්නයේත් රේඛීය ලෙස ව්‍යාප්ත විය. ඉන්පසු පශ්චාත් ඉංග්‍රීසි පාලන සමය (1877–1948) තුළ 1887 දී කළු ගඟ හරහා නව පාලමක් නිර්මාණය කෙරුණි. ඒත් සමඟම වාණිජ හා සේවා කටයුතු නව මාර්ගය සමග රේඛීය ලෙස ව්‍යාප්ත විය. එමෙන්ම පරිපාලන කටයුතු විමධ්‍යගත කිරීමත් සමඟ 1878 වර්ෂයේදී දේශීය වෛද්‍ය මණ්ඩලයත් 1915 දී දිසාපති තනතුරත්, 1923 දී නගර සභාවත් 1933 දී හා 1940 දී පිළිවෙලින් විදුලිබල සැපයුමක් හා ජල සැපයුමක් කළුතර නගරයට ලබාදෙන ලදි. එමෙන්ම නගර ව්‍යාප්තිය පිළිබඳව සැලකීමේදී කළුතර ප්‍රධාන නගරයට අමතරව උප නගර කළුතර උතුර, දකුණ හා කටුකුරුන්ද යන ප්‍රදේශ ආශ්‍රිතව බිහිවූ අතර මධ්‍යම පන්තික ජනයා තම වාසස්ථානය වශයෙන් උතුරු කළුතර තෝරා ගන්නා ලදි.

නිදහසින් පසු කාලය තුළ (19 හ 20 ශත වර්ෂ වල) 1910 බෝධිය බේරා ගැනීමේ අරගලය හා 1980 චෛත්‍ය නිර්මාණයත් සමග ප්‍රධාන වශයෙන් බෞද්ධ ආගමික පුනරුදයක් ද සිදුවිය. එමෙන්ම 1990 දි නව පාලම නිර්මාණය හා කළුතර උතුරු හා දකුණු ප්‍රදේශ තුළ අභ්‍යන්තර ජල මාර්ග පද්ධතිය දක්වා කොටු දැලක ආකාරයේ අභ්‍යන්තර මාර්ග පද්ධතියක් නිර්මාණය ද සිදු විය. මෙම ඓතිහාසික විකාශනය හා සම්බන්ධ වන කළුතර නගරයේ ඓතිහාසික ඡායාරූප පෙළක් රූපය 2.1 ට අනුව හඳුනාගත හැකිය. ඊට අමතරව කළුතර ඓතිහාසික විකාශනය සම්බන්ධ සිතියම් ඇමුණුම 08 හි දක්වා ඇත

1979.06.01 දිනැති අංක 38/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් කළුතර නගර සභාව නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කොට ඇති අතර ඉන් කොටසක් 1988.01.29 වන දින නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව විසින් පූජා නගරයක් ලෙසට ප්‍රකාශයට පත්කර ඇත. කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ කොටසක් 2002.06.07 දිනැති අංක 1239 / 27 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ද, ඉතිරි කොටස 2005.05.18 දිනැති අංක 1393/06 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ද වෙරළ ඉමේ සිට කි.මී.1 ක ඇතුළත් වන ප්‍රදේශය 1982.12.17 දිනැති අංක 223/16 දරණ රජයේ ගැසට් නිවේදනය මගින් ද නාගරික සංවර්ධන අධිකාරී ප්‍රදේශ ලෙසට ප්‍රකාශයට පත්කරමින් වර්තමානය දක්වා සංවර්ධනය වී ඇත. වර්තමාන හා ඓතිහාසික කළුතර නගරය දැක්වෙන ජායාරූප පෙළක් රූපය 2.1 හා 2.2 ට අනුව හඳුනාගත හැකිය. (පිටු අංක 26 හා 27 බලන්න)

දේශගුණික ලක්‍ෂණ හා භූ විෂමතාවය පිළිබඳව සලකා බැලීමේදී කළුතර පහතරට තෙත් කලාපයට අයත් වන අතර කළුතර ප්‍රදේශයේ දෛනික සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 24-26 $^{0}$C ද සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. ද සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 2500 – 3000 අතර ද හා සාපේක්ෂ ආර්ද්‍රතාවය 80 – 85% ක් වේ.වර්ෂය මුළුල්ලේම සූර්යාලෝකය පවතින අතර තද සුළං කාලපරිච්ඡේදයක් නොමැත.

සිතියම් අංක 2.3 හි හඳුනාගත් පරිදි කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයෙහි, ප්‍රධානතම ජල ප්‍රභවය වන්නේ ප්‍රදේශය හරහා ගලා යන කළු ගඟ වේ. සමනල ගිරි හිසින් ආරම්භ වන මෙම ගඟ කුඩා ගඟුලැල් වලින් හා දියදහර වලින් පෝෂණය ලබා ගනිමින් කළු ගං මෝය කටින් මුහුදට ගලා යයි. කළුගඟ හරහා කුඩා ඇළ මාර්ග රාශියක් කොට්ඨාසය පුරාම ව්‍යාප්තව පවතින අතර කොට්ඨාසයේ දකුණු අර්ධයේ පවතින හීනටියන්ගල ඇළ හා මොරැන් ඇළ, උතුරු අර්ධයේ පවතින අළුත් ඇළත් ප්‍රධාන වේ. ඊට අමතරව බොල්ගොඩ වැවේ කොටසක් ද කොට්ඨාසයේ උතුරු මායිමේ සැලසුම් බලප්‍රදේශයේ මායිමට අයත්වේ. ඒ අනුව මෙම පාරිසරික පද්ධතිය මුල් කර ගනිමින් ප්‍රදේශයේ උතුරු අර්ධය වර්ෂය පුරාම ජලයෙන් පිරී පවතින අතර මෙම සැලසුම් බලප්‍රදේශය තැනිතලා බිම් ස්වරූපයක් හා වගුරු බිම් වලින් යුක්ත නිසා බොහෝ විට සමතුළිත දේශගුණ තත්ත්වයක් දක්නට ලැබේ.




***සිතියම 2.3 :*** *කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පවතින ජලවහන තත්ත්වය (2018)*

***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ ජන සංගණනයන්ට අනුව 2001 හා 2011 වර්ෂය සංසන්දනය කිරීමේදී කළුතර නගර සභා බලප්‍රදේශය තුළ ජනගහනය හා ජනගහන වර්ධන වේගයේ ක්‍රමික අඩුවීමක් හඳුනාගත හැකිය. එනම් මෙම නාගරික ප්‍රදේශයේ ජනගහනය 2001 වර්ෂයේදී 37,946 ක්ද 2011 වර්ෂයේදී 31,987 ක්ද,2017 වර්ෂයේදී 29,626 ක් ලෙසත් ක්‍රමයෙන් අඩුවීමේ ප්‍රවණතාවයක් හඳුනාගත හැකි අතර මෙම නගර සභා බලප්‍රදේශය තුළ 2001-2011 කාලසීමාව සඳහා ජනගහන වර්ධන වේගය සැලකීමේදී ද එය -1.69% ක ඍණ අගයක් ලෙසත් හඳුනාගත හැකිය. නමුත් කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය පිළිබඳව සැලකීමේදී 2001-2011 ජන සංගණනයන්ට අනුව ජනගහන වර්ධන වේගය 2.0 % ක ධන අගයක් ලෙස හඳුනාගත හැකිය. 2001 – 2011 වර්ෂ වලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනගහන වර්ධන වේගය 1.13% කි. මේ අනුව ජනගහන වර්ධනය වෙරළබඩ ප්‍රදේශය හැර රට ආසන්න ගොඩබිම දෙසට යොමුවන බව හඳුනාගත හැකි අතර එය ඇමුණුම් අංක 09 හි දක්වා ඇත.

ඒ අනුව නගර සභා බලප්‍රදේශය හා ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සඳහා වන ජනගහන වර්ධනය පහත වගුව 2.1 පරිදි සාරාංශ ගත කොට දැක්විය හැකිය.

| ප්‍රදේශය | 2001 | 2011 | ජනගහන වර්ධන වේගය 2001 - 2011 | 2017 (ඇස්තමේන්තු කළ) | 2030 (ඇස්තමේන්තු කළ) |
|---|---|---|---|---|---|
| නගර සභාව | 37,946 | 31,987 | -1.69 | 29,626 | 26,214 |
| ප්‍රාදේශීය සභාව | 104,740 | 127,710 | 2.0 | 141,209 | 173,640 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 142,686 | 159,697 | 1.13 | 170,835 | 199,854 |

*වගුව 2.1 : කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජන සංඛ්‍යා වර්ධනය 2001-2030*
*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2001, 2011)*

ඒ අනුව වැඩිම ජනගහන වර්ධන වේගයක් සහිත ග්‍රාම නිලධාරී වසම් ලෙස පිළිවෙලින් පුලර්ටන් බටහිර 7.7% , කිතුළාව 6.3% හා තේක්කවත්ත 3.3% යන ග්‍රාම නිලධාරී කොට්ඨාසයන් ලෙස හඳුනාගෙන ඇති අතර එයට හේතුව සුනාමි නැවත පදිංචි කිරීම් හා ඉඩම් කට්ටි කිරීම් ලෙස හඳුනාගත හැකිය. ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව 2001, 2011, 2017 වර්ෂ වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ව්‍යාප්ත වී ඇති නිවාස ඒකක ප්‍රමාණය හා ඒවායේ ව්‍යාප්ති රටා සන්සන්දනය කිරීමේදී පිළිවෙලින් 34,391 ක්ද, 39,876 ක් ද, 43,591 ක් ද වන අතර ඒකක ප්‍රමාණය ජනගහන වර්ධන වේගය ඉහළ යාමත් සමග ක්‍රමයෙන් වැඩි අගයක් ගෙන ඇත. 2017 වර්ෂය වන විට වැඩිම ජනඝනත්වය වර්ග කිලෝමීටරයට පුද්ගලින් 18,722 ක් වන අතර එය මහවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙන් වාර්තා වන අතර අඩුම ජන ඝණත්වය වර්ග කිලෝමීටරයට පුද්ගලින් 487 ක් ලෙස කුඩා ගෝනදූව ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙන් ද වාර්තා වේ. 2001 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා සැලසුම් බලප්‍රදේශයේ ජනඝනත්වයේ වෙනස්වීම ඇමුණුම අංක 10 ට අනුව හඳුනාගත හැකිය.

2011 වර්ෂයේ ජන සංගණන වාර්තා වලට අනුව කළුතර ජනගහනයෙන් 52% ක් ස්ත්‍රීන් වන අතර 48% ක් පුරුෂ ජනගහනය නියෝජනය කරනු ලබයි. වයස් කාණ්ඩ අනුව ජනගහන විග්‍රහයේදී 0-14 ත් අතර වයස් කාණ්ඩයේ පසුවන ජනගහනය 24% ක් ද 15-59 අතර වයස් කාණ්ඩය 63% ක් ද අවුරුදු 60 ට වඩා වැඩි පිරිස 13%ක්ද වේ. ඒ අනුව කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 63% ක් වූ ඉහළ ශ්‍රම බලකායක් පවතී. ප්‍රදේශයේ ජන සංයුතියට අනුව බහුතරය සිංහල ජනතාව වේ. එය ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 91% කි.

## 02 පරිච්ඡේදය
## මූලික අධ්‍යයනය

### සැලසුම් සහ තත්ත්ව සන්දර්භය (Planning and Situational Context)

කළුතර දිස්ත්‍රික්කය තුළ කළුතර නගරය ප්‍රධාන අග නගරය හා පරිපාලන කේන්ද්‍රය වශයෙන් ක්‍රියා කරයි. එසේම ආගමික, සංස්කෘතික, පාරිසරික හා ප්‍රවාහන ක්ෂේත්‍රයන් හි කළුතර නගරයට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. එබැවින් උක්ත සේවාවන් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විශාල සංසරණ ජනගහනයක් දෛනිකව කළුතරට ආකර්ෂණය වේ.

දුම්රිය දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව කළුතර ශීඝ්‍රගාමී දුම්රිය නැවතුම්පලක් වීම නිසා දිනකට 6,500 ක් පමණ සංසරණ ජනගහනයක් පැමිණෙන බව වාර්තා වේ. කළුතර අධ්‍යාපන කොට්ඨාස කාර්යාලයේත් කළුතර වෙළද සංගමයේ දත්තවලට අනුව දෛනික වාණිජ හා අධ්‍යාපන කටයුතු සඳහා පිළිවෙලින් 25,000 හා 20,000 පමණ සංසරණ ජනගහනයක් ද ආකර්ෂණය වේ. එමෙන්ම කළුතර නාගොඩ මහ රෝහලේ දත්ත වලට අනුව දෛනිකව 5,800 ක පමණ සංසරණ ජනගහනයක් ද පරිපාලන කටයුතු සඳහා දිනකට 5,000 කට වැඩි සංසරණ ජනගහනයක් ද ආකර්ෂණය වන බව ද වාර්තා වේ. තවද කළුතර බෝධි භාරකාර මණ්ඩලයේ සහ මහාභාරකාර දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව කළුතර බෝධිය, කැලිඩෝ වෙරළ තීරය හා රිච්මන්ඩ් කාසල් මන්දිරිය මූලික කරගත් සංචාරක කර්මාන්තය සඳහා දෛනිකව ආකර්ෂණය වන සංසරණ ජනගහනය වර්ෂයේ කාලසීමාවන් අනුව වෙනස් වේ. ප්‍රධාන වශයෙන් කළුතර බෝධිය මූලික කර ගනිමින් විවිධ කාලපරිච්ඡේද වලදී නගරයට ආකර්ෂණය වන ජනගහනය පහත වගුව 2.2 පරිදි හඳුනාගත හැකිය.

| | |
|---|---|
| *සාමාන්‍ය දින* | *1000 - 1500* |
| *සාමාන්‍ය පොහෝ දින* | *3500 - 4000* |
| *විශේෂ පොහෝ දින* | *8000 පමණ හෝ රට වැඩි* |

***වගුව 2.2 :** කළුතර බෝධියට ආකර්ෂණය වන ජනගහනය*
***මූලාශ්‍රය :** බෝධි භාරකාර මණ්ඩලය (2018)*

සංසරණ ජනගහනය ප්‍රදේශයේ පවතින සංචාරක හෝටල් ව්‍යාප්තිය මත ද පදනම් වන බව පෙනේ. 2016 සම්පත් පැතිකඩ දත්ත වලට අනුව ප්‍රදේශය තුළ තරු පන්තියේ හෝටල් 05 ක්ද, සාමාන්‍ය ගනයේ හෝටල් 50 ක්ද ඇතුළත් වන අතර කාමර 900 ක පමණ ප්‍රමාණයක් ද, වෙරළබඩ ප්‍රදේශය මූලික කර ගනිමින් ප්‍රදේශය පුරා විසිර පවතී. තරු පහ පන්තියේ හෝටල් ලෙස ටැංජරීන්, අවානි, අනන්තරා, තූර්යා හා සිට්රස් හඳුනාගත හැකිය. ඒ අනුව සමස්ථ වශයෙන් දිනකට 80,000 කට වැඩි සංසරණ ජනගහනයක් කළුතර නගරයේ මධ්‍ය වාණිජ කේන්ද්‍රයට (CBD) ආකර්ෂණය වන බව හඳුනාගත හැකිය.

කළුතර ප්‍රදේශයේ ආර්ථික පසුබිම පිළිබඳ අවධානය යොමු කිරීමේදී එය අතීතයේ සිටම කෘෂිකාර්මික හා වාණිජ කටයුතු මූලික කරගත් ආර්ථික රටාවක් ලෙස විකාශනය වී ඇති අතර 2018 සම්පත් පැතිකඩට අනුව ආර්ථිකය 70% සේවා අංශය මත පදනම් වේ. එමෙන්ම මෙම සේවා අංශය තුළ ද කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පෞද්ගලික අංශයේ දායකත්වය 39% ක් ලෙස ඉහළ අගයක් නියෝජනය කරන අතර ප්‍රදේශය තුළ ව්‍යාප්ත ධීවර කටයුතු පිළිබඳව සළකා බැලීමේදී එය 7% ක් වැනි ඉතා සුළු ප්‍රමාණයක් බවද වාර්තා වේ.

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දිනකට එකතුවන ජෛව හායනය වන (Bio Degradable) අපද්‍රව්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 26 ක් ද ජෛව හායනය නොවන අපද්‍රව්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 4 ක් පමණ වේ. ඒ අනුව, සැලසුමකට අනුව කළුතර නගර සභාව හා ප්‍රාදේශීය සභා කාර්යාල මඟින් දිනපතා කසළ එකතු කර බැහැර කිරීම සිදු කෙරේ. නමුත් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා මළ අපවහනය සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබෙන අතර වර්තමානය වන විට උද්ගත වී ඇති පාරිසරික හා සෞඛ්‍ය ගැටළු මඟ හරවා ගැනීම සඳහා විශේෂයෙන්ම නගර සභා බලප්‍රදේශය සඳහා මළ අපවහන පද්ධතියක් සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගත හැකිය.

2018 සම්පත් පැතිකඩ දත්ත වලට අනුව, ප්‍රදේශයේ නල ජලය සැපයීම ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් සිදු කරනු ලබන අතර, ජල මූලාශ්‍රය ලෙස කළු ගඟ යොදා ගනී. නගර සභා බලප්‍රදේශය තුළ 99% පවුල් ප්‍රමාණයක් නල ජලය ලබා ගන්නා අතර, ඊට අමතරව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ජලය ලබාගන්නා මූලාශ්‍ර හා පවුල් සංඛ්‍යාව පහත 2.3 වගුවට අනුව හඳුනාගත හැක.

| *ජල මූලාශ්‍ර* | *පවුල් සංඛ්‍යාව* |
|---|---|
| *නල ජලය* | *24,274* |
| *නල ළිං* | *2510* |
| *නොගැඹුරු ළිං* | *9992* |
| *ඇළ දොල ගංගා* | *49* |

***වගුව 2.3 :*** *පානීය ජල මූලාශ්‍ර*
***මූලාශ්‍රය :*** *සම්පත් පැතිකඩ (2018)*

කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ රජයේ පාසැල් 34 ක් පිහිටා ඇති අතර, 2017 වර්ෂය වන විට මුළු සිසුන් සංඛ්‍යාව 37,370ක් වේ. කළුතර මහ විද්‍යාලය, කළුතර බාළිකා විද්‍යාලය, තිස්ස මධ්‍ය විද්‍යාලය, ඥාණෝදය මහ විද්‍යාලය, කළුතර මුස්ලිම් මහ විද්‍යාලය ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන පාසැල් වන අතර, රජයේ පාසැල් වලට අමතරව නූර් පෞද්ගලික පාසැල හා විදුර විද්‍යාලය  පවතී. සිරි කුරුස විද්‍යාලය හා ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය යන  අගරදගුරු අරමුදල මඟින් පාලනය වන ප්‍රධාන පාසැල් 02 ක් ද පිහිටා ඇත.පාසැල් අධ්‍යාපනයට අමතරව උසස් අධ්‍යාපනය නංවාලීම සඳහා පස්දුන්රට අධ්‍යාපන විද්‍යා පීඨයද, විවෘත විශ්ව විද්‍යාලයේ ශාඛාවක් ද මෙම සැලසුම් ප්‍රදේශය තුළ පිහිටා ඇත.

මීට අමතරව ජාතික තලයේ ආරක්ෂක සේවා පුහුණු කිරීමේ ආයතනද, ප්‍රධාන වශයෙන් පොලිස් අභ්‍යාස විද්‍යාලය, විශේෂ කාර්ය බලකා පුහුණු කිරීමේ ආයතන, නාවික හමුදා පුහුණු කඳවුර, ගුවන් හමුදා කඳවුර පිහිටා ඇති අතරම, වෘත්තීය අධ්‍යාපනය නංවාලීම අරමුණින් වෘත්තීය පුහුණු අධිකාරිය, කාර්මික විද්‍යාලය, හෙද පුහුණු පාසැල, සාගර විශ්ව විද්‍යාල අනුබද්ධිත ආයතනද, ප්‍රදේශය තුළ පිහිටා ඇත.

කළුතර සැලසුම් ප්‍රදේශ සීමාව තුළ පිහිටි ප්‍රධාන සෞඛ්‍ය මධ්‍යස්ථානය නාගොඩ මහරෝහල වන අතර, එහි වෛද්‍යවරු 258 ක්ද, ඇතුළුව සියළුම කාර්ය මණ්ඩලය 1,865 ක් වේ. දෛනික බාහිර රෝගීන් සංඛ්‍යාව 1,900 ක් වන අතර, සතියකට සහභාගි වන සායන රෝගීන් සංඛ්‍යාව 6,980 කි. මෙම රෝහලේ නේවාසික රෝගී ඇඳන් සංඛ්‍යා 859 ක් වේ. මීට අමතරව පෞද්ගලික රෝහල් 02 ක් ද, පවුල් සෞඛ්‍ය කාර්යාල 01 ක්ද ඒ යටතේ ප්‍රාථමික ප්‍රතිකාර ඒකක 08 ක්ද, ප්‍රදේශය තුළ පවතී.

මෙම සැලැසුම් හා තත්ත්ව සංදර්භය කොටස තුළ විස්තර වන කරුණු වලට අමතරව සැලැසුම් බලප්‍රදේශය තුළ වැදගත් වන සාරාංශ ගත දත්ත කිහිපයක් පහත රූපය 2.3 ට අනුව හඳුනාගත හැක.

## භූමි පරිභෝජනය




## ස්ත්‍රී පුරුෂ ජනගහනය




## ආගමික සංයුතිය

බුද්ධාගම **85%**

ඉස්ලාම් **8%**

රෝමානු කතෝලික **6%**

හින්දු **1%**

## අධ්‍යාපන සංයුතිය

ප්‍රාථමික 18%

ද්විතීක 40%

සාමාන්‍ය පෙළ 20%

උසස් පෙළ 17%

උපාධිය සහ ඉහළ 3%

අධ්‍යාපනය නොලැබූ 2%

## සාමාන්‍ය මාසික වර්ෂාපතනය




## ජනගහනයේ ආර්ථිකමය ක්‍රියාකාරීත්වය




## සාමාන්‍ය උපරිම හා අවම උෂ්ණත්වය




*රූපය 2.3 : සැලසුම් බලප්‍රදේශය පිළිබඳ සාරාංශගත දත්ත*
*මූලාශ්‍රය : සම්පත් පැතිකඩ (2018)*

## 2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

කළුතර නගර සංවර්ධන සැලසුම සඳහා සැලසුම් බලප්‍රදේශය නිර්ණය කිරීමේදී මූලිකව කරුණු 03ක් සලකා බලන ලදී.

### 2.3.1. ක්‍රියාකාරී සීමාව (Functional Region)

කළුතර නගරය, කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටි ප්‍රධාන සේවා හා පහසුකම් සපයන වාණිජ කේන්ද්‍රස්ථානයකි. එය බස් නැවතුම්පල ආශ්‍රිතව ව්‍යාප්තව පවතී. එමෙන්ම ආගමික, පරිපාලන, සෞඛ්‍ය, ජාතික මට්ටමේ අධ්‍යාපනික ආයතන යන විවිධ සේවාවන් නගර සභා බලප්‍රදේශය තුළ වැඩි සනත්වයකින් යුතුව ප්‍රධාන මාර්ග ඔස්සේ රේඛීයව ව්‍යාප්තව පවතී.

මූලිකව සංචාරකයින් සඳහා අවශ්‍ය පහසුකම් (හෝටල්, නවාතැන් පහසුකම් , අවන්හල් ) කළුතර වෙරළ තීරය ආශ්‍රිතව ව්‍යාප්ත වී තිබුණ ද සංචාරක ආකර්ශණය දිනාගත් ස්ථාන කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය පුරාම ව්‍යාප්තවී පවතී.

මේ අනුව ප්‍රදේශයේ සංවර්ධන ප්‍රවණතාව (Development Pressure) හා සංවේදිතා දර්ශකය (Sensitivity Index) සලකා බලන කල්හි සංවර්ධන ප්‍රවණතාව ප්‍රධාන මාර්ග ඔස්සේ සංවේදිතා දර්ශකය ඉහළ ප්‍රදේශ කරා ගලායාමේ නැඹුරුතාවයක් හඳුනාගත හැකිය. එබැවින් මෙම සංවේදිතා ප්‍රදේශ ආරක්ෂා කරගැනීමේ අරමුණින් හා දැනට ප්‍රදේශය තුළ පවතින ක්‍රියාකාරීත්වය මූලික කරගනිමින් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයම ඇතුළත් වන පරිදි සැලසුම් බලප්‍රදේශය නිර්ණය කෙරුණි.

### 2.3.2. භූගෝලීය සීමාව (Geographic Region)

ලංකාවේ විශාලතම ගං මෝය වන කළු ගං මෝය ආශ්‍රිතව පිහිටි කළුතර නගරය එක් පසෙකින් මුහුදෙන් මායිම්ව පවතී. එමෙන්ම කළු ගඟේ ජලාධාර ප්‍රදේශය ද කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විශාල භූමි ප්‍රදේශයක පැතිරී පවතී. ප්‍රදේශය පුරා ව්‍යාප්ත වී ඇති වගුරු බිම්, අතු ගංගා, පාරිසරික සංවේදී කලාප යන සියළු භූගෝලීය ලක්ෂණ සලකමින් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයම ඇතුළත් වන පරිදි සංවර්ධන සැලසුම් බලප්‍රදේශය නිර්ණය කරන ලදී.

### 2.3.3. පරිපාලන සීමාව (Administrative Region)

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පරිපාලන කලාප දෙකක් අන්තර්ගත වී ඇත. එනම්, කළුතර නගර සභා බලප්‍රදේශය හා කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයයි. මෙම බල ප්‍රදේශ දෙකම නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත සංවර්ධන කලාප වන බැවින් එම බල ප්‍රදේශ දෙකම ඇතුළත් වන සේ කළුතර සංවර්ධන සැලසුම් බලප්‍රදේශය නිර්ණය කර ඇත.

**රූපය 2.1 : කළුතර ඓතිහාසික ඡායාරූප**
**මූලාශ්‍රය : lankapura.com**


කළුතර මහා සෑය හා කළුතර පාලම 1980


බ්‍රිතාන්‍ය රජුගේ ප්‍රතිමාව - 1930 දී පමණ



කළුතර විද්‍යාලය පාසලේ බාලදක්ෂ කණ්ඩායම 1950 (Sea Scouting)


කළුතර දකුණ දුම්රිය පොළ 1910


ලන්දේසි පාලන සමයේ කළුතර බලකොටුව 1700


ගාලු පාර දෙපස පිහිටි නුග ගස 1870 - කළුතර වෙට්ටුමකඩ හංදියේ



කළුතර පාලම 1840 දී පමණ


කළුතර මහා සෑයේ ඉදිකිරීම් සිදුකරන අතරතුර - 1970 පමණ


ලන්දේසි පාලන සමයේ කළුතර බලකොටුව 1700



කළුතර පොලිසිය 1915


කළුතර පාලම


කළුතර නගරයේ බෞද්ධ ආගමික උළෙලක් - 1950


කළුතර මහා ස්තූපයේ කොත් පැළඳවීම 1974

**රූපය 2.2 :** වර්තමාන කළුතර නගරය

**මූලාශ්‍රය :** google.com



03 පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මූලික වශයෙන් ප්‍රදේශයේ පසුබිම් අධ්‍යනයෙන් ලබා ගත් දත්ත හා 2017.12.04 වන දින පැවැත්වූ පාර්ශවකරුවන්ගේ රැස්වීමෙන් ලබා ගත් දත්ත සැලසුම් මූලධර්මයන්ට අදාළ විවිධ විශ්ලේෂණ ක්‍රම මඟින් ප්‍රමුඛතා ගත කළ අතර එහි ප්‍රතිඵල ද සමඟ ප්‍රදේශයේ පවත්නා ගැටළු හා විභවතා පිළිබඳව හඳුනා ගන්නා ලදී. එහිදී, සංවර්ධන කටයුතු සඳහා වූ බාධක හා ප්‍රයෝජනයට නොගත් ප්‍රදේශයේ පවතින විභවතාවයන් මූලික කර ගනිමින් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.

ඒ අනුව සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය ප්‍රධාන වශයෙන් කරුණු 05ක් යටතේ පදනම් වූ අතර එම කරුණු ප්‍රමුඛතාවයට අනුව පහත පරිදි හඳුනාගත හැකිය.

## 3.1 ගැටළුව 01 :
## ප්‍රධාන ජනාකර්ෂණීය ස්ථාන අවට නොගැළපෙන භූමි පරිභෝජන රටාවක් පැවතීම

ගංගා ද්‍රෝණි නගරයක් ලෙස ආකර්ෂණීය ස්වභාව සෞන්දර්යකට හිමිකම් කියන කළුතර නගරය පූජනීයත්වය අතින් ද, අන්තර් හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස ද, හෝටල් කර්මාන්තය හා ඒ හා සබැඳි සංචාරක කර්මාන්තය හේතුවෙන් ද, නේවාසික ජනතාවට අමතරව විශාල වශයෙන් දේශීය විදේශීය සංචාරකයින්ගේ, වන්දනාකරුවන්ගේ හා මඟීන්ගේ ආකර්ෂණයට ලක් වී ඇත.

නමුත් ප්‍රධාන වශයෙන් මෙම සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන වල පවතින භූමි පරිභෝජනය පිළිබඳව සළකා බැලීමේදී එය නොගැළපෙන අයුරින් එනම්, මෙම ජනතාවගේ අවශ්‍යතාවයන් සපුරාලිය හැකි අන්දමින් හා එමඟින් කළුතර ආර්ථිකයට ආදායමක් ඉපයිය හැකි අන්දමින් දැනට සැකසී නොමැත. මෙම තත්වය පවතින ස්ථාන සඳහා උදාහරණ වශයෙන් ස්ථාන තුනක් මෙහිදී සළකා බැලුණි. එම ස්ථාන වන්නේ කළුතර බෝධිය හා අන්තර් හුවමාරු මධ්‍යස්ථානය අවට ප්‍රදේශය (බස් නැවතුම් පොළ හා දකුණු කළුතර දුම්රිය ස්ථානය ආශ්‍රිතව) , කැළිඩෝ වෙරළ තීරය සඳහා ප්‍රවේශ වීමට පවතින වෙරළ මාර්ගය හා කැළිඩෝ වෙරළට සමාන්තරව ටැංජරින් හෝටලය දක්වා දිවෙන වෙරළ මාර්ගය ද වේ.

ඒ අනුව කළුතර බෝධිය හා අන්තර් හුවමාරු මධ්‍යස්ථානය අවට ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 20ක කලාපය තුළ භූමි භාවිතය පිළිබඳ සළකා බලන විට එය මුළු භූමි භාවිතයෙන් 24% ක් රාජ්‍ය ආයතන සඳහාත් , 26% ක් වාණිජ සඳහාත්, 15% ක් ආගමික ස්ථාන සඳහාත් , 06% මල් කඩ සඳහාත් , 19% ක් ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධ භූමි භාවිතය සඳහාත් අනෙකුත් 10% තවමත් ඉදි කෙරෙමින් පවතින ඉදි කිරීම් කටයුතු සඳහාත් වෙන්වී ඇත. ඒ අනුව වැඩි භූමි භාවිතය රාජ්‍ය ආයතන සඳහා වෙන්වී ඇතත් එවැනි භූමි භාවිතයන් මෙම ප්‍රදේශයට නොගැළපෙන අතර , කැළිඩෝ වෙරළ සඳහා ප්‍රවේශ වන වෙරළ මාර්ගය හා කැළිඩෝ වෙරළ හා සමාන්තරව දිවෙන ටැංජරින් හෝටලය දක්වා වන මාර්ගය මධ්‍යයේ සිට දෙපසට මීටර් 10ක කලාපය තුළ සළකා බැලීමේදී එය මුළු භූමි භාවිතයෙන් 78 % ක් හා 60% ක් වශයෙන් නේවාසික භූමි භාවිතයන් පැවතීම ද මෙම ප්‍රදේශයන් සඳහා නොගැළපේ. මෙම නොගැලපීමට හේතුව වන්නේ එය කළුතර සංචාරක ක්ෂේත්‍රයේ දියුණුවට බාධාවක් නිසාවෙනි.

ඒ අනුව මෙම ප්‍රධාන ආකර්ෂණීය ස්ථාන අවට නොගැළපෙන භූමි පරිභෝජන රටාවක් පැවතීම සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීමට , ඔවුන්ට සේවා සැපයීමට හා එමගින් ප්‍රදේශයේ ආර්ථිකය නංවාලීමට සඳහාත් ගැටළුවක්ව පවතී. තවදුරටත් මෙම ගැටළුව පැවතීම මෙකී ජනාකර්ශනීය ස්ථාන කෙරෙහි පවත්නා ජනතා ආකර්ෂණය අඩුවීමටත් ඒවායින් ආර්ථිකයට ලැබෙන උන්නතිය අඩු වීමටත් බලපානු ඇත. එබැවින් මෙම ගැටළුව විසදීම කාලීන අවශ්‍යතාවයක් වන අතර, ඒ සඳහා ද සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

## 3.2 ගැටළුව 02 :
## දැනට කළුතර ප්‍රදේශයේ පවතින පාරිසරික අවක්‍රමණය

පවත්නා පාරිසරික අවක්‍රමණයට විසඳුමක් සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනුණි. ඒ අනුව ප්‍රධාන වශයෙන් ප්‍රදේශයේ සිදුවන පාරිසරික අවක්‍රමණයන් පහත පරිදි හඳුනා ගත හැකිය.

- *වියළි සෘතුවේදී ( ජනවාරි, පෙබරවාරි, මාර්තු , අගෝස්තු හා සැප්තැම්බර්) කළු ගඟෙහි ජලයට ලවණ මිශ්‍ර වීම හා එය ප්‍රදේශයේ නල ජලය භාවිතා කරන මුළු ජනගහනයෙන් 56%ක ජනතාවට ප්‍රබල ගැටළුවක් වීම ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ දත්ත වලට අනුව හඳුනා ගැනීම.*

- *දේශීය හා විදේශීය සංචාරකයන් විශාල ප්‍රමාණයක් ආකර්ෂණයට නතු කරගන්නා සුන්දර වෙරළ තීරයක් වූ කැළිඩෝ වෙරළ තීරය ක්‍රම ක්‍රමයෙන් විනාශ වීම.*

- *කළුතර ප්‍රදේශයේ ගංවතුරට යටවීමේ අවධානමක් සහිත හා නායයෑම් අවධානමක් සහිත ප්‍රදේශ හඳුනා ගැනීම.*

වියළි සෘතුවේදී කළු ගඟෙහි ජලයට ලවණ මිශ්‍රවීම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුළු ජනගහනයෙන් 56%ක පිරිසකට හා කළුතර නගර සභා බලප්‍රදේශය තුළ 99% ක ජනගහනයට ප්‍රබල ගැටළුක්ව පවතී. ප්‍රදේශයේ පානීය ජලය සඳහා ප්‍රධාන ජල ප්‍රභවය කළු ගඟ වේ. මෙම කාලය තුළදී ජලයේ පවතින විද්‍යුත් සන්නායකතාව (Electrical conductivity) 750ms/cm ක් හෝ ඊට ඉහළ අගයක් අතර, මෙම අගය 750ms/cm ට වැඩිවූ විට එම ජලය පුද්ගල ජල පරිභෝජනයට නුසුදුසු බව ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ දත්ත මඟින් හඳුනාගෙන ඇත.

මෙම කළු ගඟේ ජලයට ලවණ ජලය මුසුවන කාලය තුළදී පානීය ජලය බෙදාහැරීම ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කළද එය ප්‍රමාණවත් පරිදි නොලැබෙයි. මිනිසාගේ මූලික අවශ්‍යතාවයක් වන පානීය ජල අවශ්‍යතාවයට ප්‍රබල ගැටළුවක් වන මෙම ලවණ ජලය කළු ගඟට මුසු වීම හේතුවෙන් එයද පාලනය කළ යුතු ගැටළුවක් ලෙස හඳුනා ගත් අතර, ඒ අනුව ද සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා හඳුනා ගන්නා ලදී.

විශාල දේශීය හා විදේශීය සංචාරකයන් ප්‍රමාණයක් ආකර්ෂණයට නතු කරගන්නා සුන්දර වෙරළ තීරයක් වූ කැලිඩෝ වෙරළ තීරය ක්‍රම ක්‍රමයෙන් විනාශ වීම ද විශාල ගැටළුකි. මෙම ගැටළුව ප්‍රදේශයේ පවතින ආවේණික සුන්දර පරිසරයට තර්ජනයක් වී ඇති අතරම කළු ගඟෙහි ජෛව විවිධත්වයට ද, වැලි කර්මාන්තයට ද තර්ජනයක් වියහැකි අතර එය පවතින පානීය ජල ගැටළුව තව තවත් උග්‍ර වීමට ද හේතුවක් විය හැක. මන්ද වර්තමානය වන විට කළු ගඟ හා මුහුද එක එල්ලේම සම්බන්ධ වී ඇත. එමෙන්ම පසුගිය සුනාමි ව්‍යසනය අවස්ථාවේදී ද කළුතර නගරය ආරක්ෂා වීමට කැලිඩෝ වෙරළ තීරය හේතුවක් වී ඇත. නමුත් වර්තමානය වන විට එවැනි සුනාමි වැනි තර්ජනයකට නගරය ගොදුරුවීමේ අවධානම ද ඉහළය. මෙම කැලිඩෝ වෙරළ තීරය හා ඊට අයත් වැලිපරයේ වෙනස් වීම රූපය 3.1 ට අනුව හඳුනාගත හැකිය මේ අනුව දිගින් දිගටම සිදුවන මෙම ගැටළුව විසදීම සඳහා හා පාරිසරික තුළින තත්වය ආරක්ෂා කරගැනීම සඳහා අවශ්‍ය විසඳුම් හා රෙගුලාසි පැනවීම සඳහා සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.

එමෙන්ම වාර්ෂිකව ඇති වන ගංවතුර තත්ත්වය ද එදිනෙදා ජන ජීවිතයට බලපාන ප්‍රධාන ගැටළුවක් බව හඳුනාගෙන ඇත. කළුතර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව කළුතර වාර්ෂිකව සුළු ගංවතුර තත්ත්වයකට ලක්විය හැකි අවධානමක පවතින බවත් පස් අවුරුද්දකට පමණ වරක් මහා පරිමාණයේ ගංවතුරකට ලක් වන බවත් සඳහන් වේ. ගංගා ජල මාපකයේ අගය අඩි 2.5 ක් වූ විට සුළු ගංවතුර අවධානමක් ද ජල මාපකයේ අගය අඩි 5 ට වඩා වැඩි වූ විට මහා පරිමාණීය ගංවතුර

අවධානමක් ද හඳුනාගත හැකිය. දැනට පවතින වාර්තාවලට අනුව කළුතර ප්‍රදේශය සඳහා මහා පරිමාණයේ ගංවතුර ගැලීම් 2003 (අඩි 6.2), 2008(අඩි 7.1) හා 2017(අඩි 6.8) යන වර්ෂ වලදී ඇතිවී ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දත්ත වලට අනුව 2017 වර්ෂයේ ඇතිවූ ගංවතුරට කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ග්‍රාම නිළධාරී වසම් 43ක් ද, පවුල් 11,854ක් ද මුහුණ පා ඇත.

එමෙන්ම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ දත්ත වලට අනුව බොල්ගොඩ ප්‍රදේශයේ හා කිතුළාව ග්‍රාම නිලධාරී වසම් තුළ කුඩා ප්‍රදේශයන් නාය යාමේ අවධානමක් සහිත ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති නමුත් මෙම නායයාම් තත්වය කුඩා පස්කඳු කඩා වැටීමක් විය හැකි බව එම ආයතනය සඳහන් කරනු ලබයි. උක්ත ගැටළු සියල්ල කාලීන හා එදිනෙදා ජන ජීවිතය කෙරෙහි සෘජුවම බලපාන අතර, ඒවාට නිසි විසඳුමක් නොගතහොත් සමස්ථ කළුතර නගරයම අර්බුධකාරී තත්ත්වයකට පත්වෙනු ඇත. එබැවින් ඉහත පාරිසරික ගැටළුවලින් තොර සැපපහසු සේ ජීවත්වීමට හැකි පරිසරයක් නේවාසික ජනතාව වෙත ලබාදීම යන කරුණ මූලික කරගනිමින් ද කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල-ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී.







**රූපය 3.1 :** *කැලිඩෝ වෙරළ තීරයට අයත් වැලිපරයේ වෙනස්වීම*
**මූලාශ්‍රය :** *ගූගල් ඡායාරූප*

## 3.3. ගැටළුව 03 :
## නගරය පුරා චාරිකාවක යෙදිය හැකි සංචාරක ආකර්ෂණීය ස්ථාන අතර අන්තර් සම්බන්ධතාවයක් නොමැති වීම.

දැනට පවත්නා සංචාරක ආකර්ෂණීය ස්ථානයන් වන කළුතර බෝධිය, කැලිඩෝ වෙරළ තීරය, දියගම පැලුණු ගල, රිච්මන්ඩ් කාසල් මන්දිරය ඒකාබද්ධ කර චාරිකා ගමන් මාර්ගයක් නිර්මාණය කිරීමේ විභවතාවයක් ප්‍රදේශය තුළින් හඳුනා ගත හැක. නමුත් එම සාංචාරක ගමනාන්ත ඒකාබද්ධ කරන හා ලඟාවීමේ හැකියාව වැඩිදියුණු කරන මාර්ග පද්ධතියක් නොමැති වීමත්, එම ගමනාන්ත අවට සංචාරකයන්ට සුවපහසු පාරිසරික සැකැස්මක් නොමැති වීම හා ප්‍රමාණවත් ගමන් විස්තර හා සිතියම් නොතිබීමත් නිසා ඒවා සංචාරකයන් අතර තවමත් ප්‍රචලිත නැතිවීමත් ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ දියුණුව කෙරෙහි බාධාවකි.

අද වන විටත් කළුතර බෝධිය කරා එන සංචාරකයන්ට සාපේක්ෂව අනිකුත් සංචාරක ආකර්ෂණ ස්ථාන සඳහා ඇදී එන ජනගහනයේ ඌණතාවයක් දක්නට ඇත. තව දුරටත් මෙම ගැටළුව පැවතුනහොත් එකී ස්ථාන ජනශූන්‍ය වීමේ ද ප්‍රස්ථාවක් පවතී. එබැවින් මෙම ගැටළුව මඟ හරවා ගැනීම සඳහා ද සංවර්ධන සැලැස්මක් හරහා ක්‍රියාත්මක විය යුතුය. ඒ අනුව මෙම කරුණ මූලික කරගනිමින් ද සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී.

## 3.4. ගැටළුව 04 :
## කළුතර අවට පර්යන්ත සංවර්ධනයන් නිසා කළුතර දේහලීය ජනගහනය (Threshold Population) අඩුවීමේ තර්ජනය

කළුතර නගරයේ පර්යන්ත ප්‍රදේශ තුළ ඇතිවන දියුණුවත් සමඟ කළුතර නගරයට දැනට පවතින දේහලීය ජනගහනය (Threshold Population) අඩුවීමේ අවධානමක් පවතී. උදාහරණයක් වශයෙන් හොරණ කර්මාන්තපුර සංවර්ධනය, හා දක්ෂිණ අධිවේගී මාර්ග සංවර්ධනයන් නිසා කළුතර අවට ප්‍රදේශයන්ගේ වැඩි සංවර්ධනයක් ඉදිරියේදී ඇතිවීමට ඉඩකඩ පවතින අතර එය කළුතර නගරයෙහි දේහලීය ජනගහනය (Threshold Population) අඩු වීමට ඇති ඉඩකඩ වැඩි කරයි. තව දුරටත් මෙකී පර්යන්ත ප්‍රදේශ වල සංවර්ධනයේ උන්නතියක් සිදු වුවහොත් ඒ කරා ජනතා ආකර්ෂණය ඉහළ ගොස් කළුතර නගරය කෙරෙහි තර්ජනයක් විය හැක. මේ අනුව එය පාලනය කිරීම සඳහා ගත හැකි උපායමාර්ගික සැලසුම් හා අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම සඳහා ද සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා හඳුනා-ගන්නා ලදී.

## 3.5. ගැටළුව 05 :
## සංවර්ධනයේ තීව්‍රතාවය දැනට පවත්නා සැළසුම් බලප්‍රදේශයෙන් බැහැරව පාරිසරික සංවේදී ප්‍රදේශ කරා ව්‍යාප්ත වීමේ නැඹුරුතාවය.

දැනට පවතින සංවර්ධන සැලැස්ම (2005-2020) නගර සභා බලප්‍රදේශයට පමණක් සීමාවේ. සිතියම් අංක 3.1 හි දැක්වෙන පරිදි දැනට පවතින සංවර්ධනයේ තීව්‍රතාවය හඳුනා ගැනීම සඳහා කළ විශ්ලේෂණයට අනුව කළුතර ප්‍රදේශයේ සංවර්ධනය ප්‍රධාන මාර්ග ඔස්සේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට එනම් රට අභ්‍යන්තරයට ගලා යාමත් හඳුනා ගත හැකිය. එමෙන්ම සිතියම් අංක 3.2 හි දැක්වෙන පරිදි පාරිසරික සංවිදිතාවය පිළිබඳ විශ්ලේෂණයට අනුව පැහැදිලි වන අයුරින් පාරිසරික සංවේදීතාවයේ ඉහළ ප්‍රදේශයන්ද මෙම වර්තමානයේ සංවර්ධනය ගලා යන ප්‍රදේශයට අන්තර්ගත වී පවතින බව අනාවරණය වේ. එමෙන්ම ප්‍රදේශයේ 2018 වර්ෂය සඳහා වන භූමි භාවිතය පිළිබඳ සලකා බැලීමේදී ද මුළු භූමි භාවිතයෙන් 54%ක් පොල්, වී, රබර්, තෙත්බිම්, ජලය හා ලඳු කැලෑ යන හරිත ආවරණයන්ගෙන් සමන්විත ප්‍රදේශයන් ලෙසද හඳුනාගත හැකි අතර සැලසුම් බලප්‍රදේශය තුළ පවතින භූමි පරිභෝජන රටාව ඇමුණුම් අංක 11 ට අනුව හඳුනාගත හැකිය.

2030 වර්ෂය සඳහා කරන ලද ජනගහන පුරෝකථනයන්ට අනුව ද වැඩි ජනගහන වර්ධන වේගයක් පවතින ග්‍රාම නිළධාරී කොට්ඨාශ සඳහා එනම් නේක්කවත්ත (3.3%), කිතුළාව (6.3%) පුලර්ටන් බටහිර (7.7%), දෙල්දූව (6.5% ) යන ග්‍රාම නිළධාරී කොට්ඨාසයන්ගෙන් නේක්කවත්ත හා කිතුළාව යන ග්‍රාම නිළධාරී කොට්ඨාශ සඳහා ජලගැලීම් ද , කිතුළාව ග්‍රාම නිළධාරී කොට්ඨාසය සඳහා නායයාම් උවදුරු වලට ද අවධානමක් පවතින බව ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ දත්ත වලට හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ දත්ත වාර්තා වලට අනුව හඳුනා ගත හැකිය. එසේම, භූමි පරිභෝජනය මඟින්ද ප්‍රදේශයේ අභ්‍යන්තරය දෙසට නේවාසික වශයෙන් ජනතාව පදිංචි වීමට වැඩි නැඹුරුතාවයක් දක්වන බව පෙනී යයි. මෙයට හේතුවක් ලෙස ඉඩම්

## 03 පරිච්ඡේදය සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

ගැටළුව 05 :
සංවර්ධනයේ තීව්‍රතාවය දැනට පවත්නා සැළසුම් බලප්‍රදේශයෙන් බැහැරව පාරිසරික සංවේදී ප්‍රදේශ කරා ව්‍යාප්ත වීමේ නැඹුරුතාවය

වටිනාකම ද දැක්විය හැකිය. වෙරළාසන්න ප්‍රදේශවල හා ගාලු පාර දෙපසට වන්නට ඉඩම් වටිනාකම් ඉතා වැඩි අගයක් ගන්නා අතර අනෙකුත් අභ්‍යන්තර ප්‍රදේශ වල ඇත්තේ සාපේක්ෂව අඩු අගයකි. මෙම සැලසුම් බලප්‍රදේශය තුළ පවතින ඉඩම් වටිනාකමේ ව්‍යාප්තිය ඇමුණුම් අංක 12 ට අනුව හඳුනාගත හැකිය.

ඒ අනුව මෙම සංවර්ධනය වර්තමානය වන විට සැලසුම් සකස් කර ඇති නාගරික බලප්‍රදේශය ඉක්මවමින් යන බවත්, එය රට යාබද දැනට නාගරික සැලසුමක් සකස් කර නොමැති සංවේදි කලාපයන් බහුල හා ගංවතුර හා නායයාම් අවධානමක් සහිත වන ප්‍රාදේශීය සභා බලප්‍රදේශය දෙසට ගලායන බවත් හඳුනාගත හැකි වේ. ඒ අනුව මෙහිදී කළුතර නගර සභා බලප්‍රදේශයත් , ප්‍රාදේශීය සභා බලප්‍රදේශයත් යන දෙකම ඒකාබද්ධ කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයම සඳහා සංවර්ධන සලැස්මක් සකස් කිරීම සඳහා සැලසුම් අවශ්‍යතාවය හඳුනා ගැනුණි.






බස්නාහිර පළාත් අංශය | කළුතර සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 3.1 : සංවර්ධනයේ තීව්‍රතාවය (2018)* *මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*




***සිතියම 3.2 :*** *පාරිසරික සංවේදීතාවය (2018)*

***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*



# දෙවන කොටස

**කළුතර නගර සභාව, කළුතර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන**

**කළුතර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ**

**සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 මැයි 28 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකරන මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන කළුතර නගර සභාව, කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සංයුක්ත වන කළුතර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

..........................................................
පාඨලී චම්පික රණවක
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 වන මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල

2019 ......ජුනි...... මස ..28.. වන දින.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2129/94 - 2019 ජූනි මස 28 වැනි සිකුරාදා - 2019.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**කළුතර නගර සභාව, කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන කළුතර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි.**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනත් හි 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව කළුතර නගර සභාව, කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත කළුතර නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද කළුතර නාගරික සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මා විසින් එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජූනි මස 28 වෙනි දින.
17 හා 18 වන මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**කළුතර නගර සභාව සහ කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 ''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද කළුතර නගර සභාව සහ කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 ජූනි මස 28 දින.

07 - 4553/4

---


1A - PG 4553 — 177 (2019/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

04 පරිච්ඡේදය



# සංවර්ධන සැලසුම් රාමුව

## 4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම

"The prime caesura of south west coast"
*An enshrined autarchic city rising by the estuary of Kaluganga*
*as a midway haven for all journeyers*

"නිරිතදිග වෙරළ තීරයේ අග්‍ර නැවතුම්පළක් කරා"
*ස්වයංපෝෂිත උරුමය නිදන් කරගත් කළු ගංගා මෝය තීරයේ සියළුම යාත්‍රිකයන්ට හා නේවාසිකයන්ට අතරමැදි නැවි තොටක් වූ නැගී එන පූජනීය කළුතර පුරවරය*

## 4.2. දැක්මෙහි ප්‍රකාශනය

සමනල කන්ද සිප ගනිමින් කඩාහැලෙන කළු නදියත්, තෙරක් නොපෙනෙනා සාගරයත්, මුවට මුව ගැටෙනා කළු ගංගා නිම්න තීරයේ කළුතරටම පමණක් ආවේණික වූ සුවිශේෂී භූ දර්ශනයකින් හෙබි කළුතර නගරය ක්ෂේත්‍ර වර්ණයෙන් තේජාන්විතව නැගී සිටින චෛත්‍යරාජයානන්ගේ හා බෝ සමිඳුන්ගේ ආශිර්වාදය ලැබූ පුණ්‍ය භූමියකි. එබැවින් "Enshrined "යන යෙදුම තුළින් නගරයේ පූජනීයත්වය පිළිබිඹු කර ඇත.

කළුතර නගරය යනු භෞතික , සමාජීය හා ආර්ථික සම්පත් වලින් පරිපූර්ණ වූ නගරයකි. නගර ආර්ථිකයේ කොඳුනාරටිය බඳුව සේවා අංශය ක්‍රියාත්මක වන අතර මෙම සේවා අංශයේ ප්‍රගමනය සඳහා බලපාන 81,700 ට වැඩි දෛනික සංසරණ ජනගහනයක් දැනටමත් කළුතර සැලසුම් බලප්‍රදේශයට ආකර්ෂණය වේ. මෙලෙස දෛනික සංසරණ ජනගහනයක් පැවතීමට හේතුව වන්නේ කළුතර දිස්ත්‍රික්කයේ පරිපාලන , අධ්‍යාපනික, සංචාරක, සෞඛ්‍ය හා ප්‍රවාහන යන පහසුකම් සියල්ල සැලසුම් බලප්‍රදේශය තුළ කේන්ද්‍රගත වී තිබීමයි. මෙම පිහිටීම නගරයේ තිර පැවැත්මට මෙන්ම ස්වයංපෝෂිත භාවයට ද හේතුවීම නිසාවෙන් "Autarchic City" යන යෙදුම භාවිතා කර ඇත.

ශ්‍රී ලංකාවේ අග නගරය වන කොළඹට කි.මී. 43 ක් වැනි ඉතා අඩු දුරකින් පිහිටා ඇති කළුතර නගරය, කොළඹ, ගාල්ල, හම්බන්තොට හරහා වැල්ලවාය පසු කර දිවෙන (A2) මාර්ගයේ කේන්ද්‍රස්ථානයක පිහිටා ඇත. තවද එය මරදාන – මාතර දුම්රිය මාර්ගයේ ප්‍රධාන දුම්රිය නැවතුම්පළක් ද වේ. මෙම දුම්රිය නැවතුම්පළ හා ප්‍රධාන බස් නැවතුම්පළ එකිනෙකට සමීපව පිහිටා ඇති බැවින් එය බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් (TOD Center) ලෙස ක්‍රියා කරමින් ලංකාවේ ප්‍රවාහන පද්ධතිය තුළ සුවිශේෂ ස්ථානයක පිහිටන නිසා "midway haven" යන යෙදුම භාවිතා කර ඇත.

කළුගං මෝය ආශ්‍රිතව පිහිටා ඇති නිසා ගංගා මෝය නගරයක් ලෙස ඊටම ආවේණික භූගෝලීය පිහිටීමකින් කළුතර නගරය සැකසී ඇති අතර ඒ වෙත දෛනිකව විශාල සංසරණ ජනකායක් ආකර්ෂණය වේ. දේශීය විදේශීය සංචාරකයන්, වන්දනාකරුවන්, පදිකයින් හා නේවාසිකයින් යනුවෙන් සිව් වැදෑරුම් වන එම ජනකාය 'All journeyers ' යනුවෙන් මෙහිදී අර්ථ දැක්වේ.

ඒ අනුව ප්‍රදේශය සතු භෞතික , සමාජීය , ආර්ථික හා පාරිසරික සම්පත් ප්‍රශස්ථ ලෙස උපයෝගී කර ගනිමින්, සියළුම ජනතාවට අවශ්‍ය පහසුකම් සහිතවත් හා නේවාසික ජනතාවට උවදුරු වලින් තොරව ජීවත් වීමටත් සුදුසු නගරයක් ලෙස කළුතර 2030 වන විට සංවර්ධනය කරමින් නිරිත දිග වෙරළ තීරයේ අග්‍ර නැවතුම්පළක් කිරීම මෙම සංවර්ධන සැලැස්මේ අරමුණයි.

## 4.3. සංවර්ධන සැලැස්මේ අරමුණු

අරමුණ 01

කළුතර ගං මෝය ආශ්‍රිත කර ගනිමින් නිරිත දිග වෙරළ තීරයේ සැදුණු කළුතර නගරය සංචාරකයන්ගේ හා වන්දනාකරුවන්ගේ හොඳම නවාතැන්පළක් බවට පත් කිරීම.

අරමුණ 02

කළු ගංගාව අවට ප්‍රදේශයේ ස්ථිර හා තාවකාලික නේවාසිකයන් සඳහා ජීවත් වීමට හැකි සහ සුවපහසු නගරයක් බවට පත් කිරීම

අරමුණ 03

කළු ගං මෝය ආශ්‍රිත කර ගනිමින් සැදුණු කළුතර නගරයට පැමිණෙන මඟීන්ට හිතෛෂී සේවා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.



# 4.4 සංවර්ධන සැලැස්මේ පරමාර්ථ

**අරමුණ 01**

කළුතර ගං මෝය ආශ්‍රිත කර ගනිමින් හිරිත දිග වෙරළ තීරයේ සැදුණු කළුතර නගරය සංචාරකයන්ගේ හා වන්දනාකරුවන්ගේ හොඳම නවාතැන්පළක් බවට පත් කිරීම.

**පරමාර්ථ**

1. ඓතිහාසික උරුමයන් මූලික කරගත්, වෙරළ තීරය මූලික කරගත් හා හරිත පද්ධතීන් මූලික කරගත් වශයෙන් සංචාරක කර්මාන්තය 2030 වන විට විවිධාංගීකරණය කිරීම.

2. සංචාරක ගමනාන්ත වන කළුතර බෝධිය, කැලිඩෝ වෙරළ තීරය, රිච්මන්ඩ් කාසල් මන්දිරය අතර අන්තර් සම්බන්ධතාවයක් ඇති කරමින් සුවපහසු නගර චාරිකාවක් බිහි කිරීමේ හැකියාව 2030 වර්ෂය වන විට ඇති කිරීම.

**අරමුණ 02**

කළු ගංගාව අවට ප්‍රදේශයේ ස්ථිර හා තාවකාලික නේවාසිකයන් සඳහා ජීවත් වීමට හැකි සහ සුවපහසු නගරයක් බවට පත් කිරීම

**පරමාර්ථ**

1. සමස්ත සැලසුම් බලප්‍රදේශයටම 100% ක් සුපිරිසිදු සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය 2030 වර්ෂය වන විට ලබාදීම.

2. කළුතර සැලසුම් බලප්‍රදේශයේ බටහිර සීමාව වන ධීරකන්ද මාවත ආසන්නයේ සිට දකුණු පයාගල දක්වා දිවෙන කි.මී. 13ක් පමණ වූ වෙරළ තීරයේ සමුද්‍ර ඛාදනය 2025 වන විට අවම කිරීම.

3. හෙක්ටයාර් 1925 ක් වූ පාරිසරික සංවේදී කලාප කළමනාකරණය හරහා ග්‍රාම නිළධාරි වසම් 21 කට බලපාන ගංවතුර අවධානම පාලනය කරමින්, ජීවත් වීමට හිතකර පරිසරයක් 2025 වන විට ඇති කිරීම.

4. හඳුනාගත් නේවාසික න්‍යෂ්ටීන් (Residential Nodes) 02 ක්ද, සෞඛ්‍ය සේවා සපයන න්‍යෂ්ටීන් (Health Promotion Node) 01 ක් ද හා අසල්වැසි න්‍යෂ්ටීන් 06 ක් ද (Neighborhood Nodes) අවශ්‍ය නාගරික සේවාවන් හා ප්‍රවාහන පහසුකම් සපයමින් විවිධ ඝනත්වයෙන් යුතු නේවාසික කලාප 04ක් ද 2030 වර්ෂය වන විට ඇති කිරීම.

**අරමුණ 03**

කළු ගං මෝය ආශ්‍රිත කර ගනිමින් සැදුණු කළුතර නගරයට පැමිණෙන මගීන්ට හිතෛෂී සේවා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

**පරමාර්ථ**

1. නගර මධ්‍ය ආශ්‍රිත ප්‍රදේශය තුළ හඳුනාගන්නා ලද මාර්ග (කි.මී. 2.3ක ප්‍රමාණයක්) පදිකයින්ට ආරක්ෂිත හා සුව පහසු ලෙස ඇවිදීමට හැකිවන පරිදි සකස් කිරීම.

2. පරිපාලන සේවාවන් එකම ස්ථානයක ස්ථානගත වීමේ ආර්ථික වාසි නගරයට ලබා ගැනීමේ අරමුණින් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල අවට මීටර් 200 ක වපසරිය තුළ 80%ක් දක්වා පරිපාලන සේවාවන් සැපයීම 2025 වන විට සිදුකිරීම.

3. කළුතර මහ රෝහල අවට කි.මී.1 ක වපසරිය තුළ ද්විතීයික හා තෘතීක මට්ටමේ සෞඛ්‍ය සේවාවන් 80% දක්වා සැපයීම 2030 වන විට සිදුකිරීම.

# 05 පරිච්ඡේදය



# SWOT විශ්ලේෂණය

## 5.1. සාරාංශගත SWOT විශ්ලේෂණය

### අරමුණ 01

කළුතර ගං මෝය ආශ්‍රිත කර ගනිමින් නිරිත දිග වෙරළ තීරයේ සැදුණු කළුතර නගරය සංචාරකයන්ගේ හා වන්දනාකරුවන්ගේ හොඳම නවාතැන්පළක් බවට පත් කිරීම.

### S

- සංචාරකයන්ට හා වන්දනාකරුවන්ට විශාල වශයෙන් ආකර්ෂණීය ස්ථාන පැවතීම (කළුතර බෝධිය, රිච්මන්ඩ් මන්දිරය, කැලිඩෝ වෙරළ තීරය හා සංචාරක හෝටල්)
- සියලුම සංචාරක ස්ථාන එකිනෙකට ආසන්න සීමාවක පැවතීම (කි.මී. 01 - කි.මී.03 ඇතුළත)
- ප්‍රධාන ප්‍රවාහන ජාල සමීපයේ සංචාරක ගමනාන්ත පිහිටා තිබීම. (කළුතර - හොරණ,කළුතර - බණ්ඩාරගම, කළුතර- මතුගම යන මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග)
- ප්‍රධාන ගංගා ද්‍රෝණි ආශ්‍රිතව නිර්මාණය වී ඇති නගරවල ගංගා ද්‍රෝණියේ සිට කි.මී.1 ක වපසරිය තුළ සංවර්ධනය සංසන්දනය කිරීමේදී කළුතර නගරය ප්‍රමුඛස්ථානයක් ගැනීම.

### W

- කළුතර නගරයේ ප්‍රධාන සංචාරක ආකර්ෂණීය ස්ථාන අවට නොගැළපෙන භූමි පරිභෝජන රටාවක් පැවතීම (බෝධිය අවට ප්‍රදේශය, කැලිඩෝ වෙරළ තීරයට ප්‍රවේශවීම සඳහා පවතින ආබාධ මාර්ගය (වෙරළ තීරයට සමාන්තරව දිවෙන ටැංජරින් හෝටලය දක්වා කොටස පමණක් – කි.මි.2) හා වෙරළ පාර (කැලිඩෝ පාර) මාර්ගය-මී.600)
- ප්‍රධාන සංචාරක ස්ථානයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් නොමැති වීම.

## O

- කළුතර කි.මී. 2 ක් වන ටැංජරීන් හෝටලයේ සිට කැළිඩෝ වෙරළ තීරය දක්වා වන වෙරළ බඩ මුහුණතේ සිදු කෙරෙමින් පවතින වෙරළ සංවර්ධන ව්‍යාපෘතීන්.
- නාගරික සංවර්ධන අධිකාරි විසින් සකස් කරන ලද යෝජිත බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්ම - 2018 ට අනුව සංචාරක කලාපයට අයත් ප්‍රදේශයක් ලෙස සැලසුම් ප්‍රදේශය හඳුනාගෙන තිබීම. (හඳුනාගත් සංචාරක කලාපය අළුත්ගම - මීගමුව)
- 2040 වර්ෂය සඳහා සකස් කර ඇති ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියට අනුව කළුතර ආර්ථික කොරිඩෝවට අයත් වීම.
- මහ කොළඹ ව්‍යුහ සැලැස්මට (1998) අනුව බස්නාහිර පළාතේ නාගරික ධූරාවලිය සලකමින් කළුතර දෙවන පෙළ නගරයක් හා ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ලෙසත් සංචාරක ආකර්ෂණය සහිත ස්ථානයක් ලෙසත් හඳුනාගෙන තිබීම.
- නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව විසින් 1988.01.29 වන දින ගැසට් නිවේදනය මඟින් කළුතර බෝධිය ආශ්‍රිත (අක්කර 10) ප්‍රදේශය පූජා භූමි කලාපයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබීම.

## T

- කැලිඩෝ වෙරළ තීරය හා රේට යාබද වැලිපරය විනාශයට පත් වීම.
- කළුතර නගර පර්යන්තයේ සිදුවන දියුණුවත් සමඟ ජනගහනය කළුතර නගරයට ආකර්ෂණය කර ගැනීමට ඇති බාධාව.

## අරමුණ 02

කළු ගංගාව අවට ප්‍රදේශයේ ස්ථිර හා තාවකාලික නේවාසිකයන් සඳහා ජීවත් වීමට හැකි සහ සුවපහසු නගරයක් බවට පත් කිරීම.

### S

- කළුතර දිස්ත්‍රික්කයේ පරිපාලන හා සෞඛ්‍ය සේවාවන් සපයන ප්‍රධාන නගරය වශයෙන් ක්‍රියාත්මක වීම.
- දැනට පවතින මුළු භූමි පරිභෝජනයෙන් 55% ක් වූ පහත් බිම් ප්‍රමාණය ගංවතුර තත්ත්ව පාලනය කිරීමට උපකාරී වීම.
- සැලසුම් බලප්‍රදේශයේ, ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ඉහළ ජනගහන වර්ධන වේගයක් (2%) ක් පැවතීම.
- කොළඹ වාණිජ කේන්ද්‍රය සමඟ දුම්රිය හා මහා මාර්ග යන බහුවිධ ප්‍රවාහන මාදිලි හරහා ප්‍රබල අන්තර් සම්බන්ධතාවක් පැවතීම.
- කළුතර දිස්ත්‍රික්කය තුළ ජාතික මට්ටමේ වෘත්තීයමය පුහුණු ආයතන වැඩිම ප්‍රමාණයක් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ලෙස කළුතර හඳුනාගත හැකිවීම.

### W

- ගංවතුර අවදානමට ලක්වන ප්‍රදේශ වල (තේක්කවත්ත, කිතුළාව, පුලර්ටන් බටහිර) වැඩි ජනගහන වර්ධන වේගයක් පැවතීම.
- වියළි කාලසීමාවේදී (ජනවාරි, පෙබරවාරි, මාර්තු, අගෝස්තු, සැප්තැම්බර්) ගංගා ජලයට ලවණ ජලය මුසුවීම නිසා සැලසුම් බලප්‍රදේශය තුළ වාසය කරන ජනගහනයෙන් 56%කට පානීය ජල අර්බුද වලට මුහුණ දීමට සිදුවීම.

## O

- පානදුර දක්වා විදුලි දුම්රිය සේවාව ඇරඹීම තුළින් කොළඹ කොටුව වාණිජ අග නගරයේ සිට කළුතර දක්වා ගමනාගමනයට ගතවන කාල සීමාව අඩුකර ගත හැකිවීම.
- කළුතර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ලවණ බාධකයක් කළු ගඟෙහි ඉදිකිරීමට යෝජනා කර තිබීම.

## T

- කළුතර සැලසුම් බලප්‍රදේශයේ බටහිර සීමාව වන ධීරක්කන්ද මාවත ආසන්නයේ සිට දකුණු පයාගල දක්වා දිවෙන කිලෝමීටර් 13ක් පමණ වූ වෙරළ තීරයේ සමුද්‍ර ඛාදනය සිදුවීම.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් 2025 දක්වා කරන ලද පුරෝකථනයන්ට අනුව සාගර ජල මට්ටම ඉහළ යාම හඳුනාගෙන තිබීම.

## අරමුණ 03

කළු ගං මෝය ආශ්‍රිත කර ගනිමින් සැදුණු කළුතර නගරයට පැමිණෙන මගීන්ට හිතෛෂී සේවා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

### S

- කළුතර ප්‍රධාන සීඝ්‍රගාමී දුම්රිය නැවතුම්පලක් වීම.
- දකුණු කළුතර දුම්රිය නැවතුම්පළත් ප්‍රධාන බස් නැවතුම්පළත් එකිනෙකට ඉතා ආසන්නව පිහිටා තිබීම. (මී.100 දුර)
- පර්යන්ත ප්‍රදේශ සමඟ මනා මාර්ග සම්බන්ධතාවයක් ප්‍රධාන මාර්ග ඔස්සේ පැවතීම

### W

- නගර මධ්‍යයේ පිහිටි මාර්ගයන්හි (කි.මී 2.3) මගීන් සඳහා ප්‍රමාණවත් මගී මංතීරු නොමැති වීම.

## O

- පානදුර දක්වා විදුලි දුම්රිය මාර්ගයක් දැනටමත් යෝජනා වී තිබීම නිසා කළුතර දක්වා ද එය දීර්ඝ කිරීමට ඇති විභවතාවය

- ක්‍රියාත්මක දක්ෂිණ අධිවේගි මාර්ගයේ නව අන්තර් හුවමාරු ස්ථානයක් ලෙස පැල්පොල යෝජනා කර තිබීම හා එමඟින් කළුතර - හොරණ මාර්ගයට සම්බන්ධතාවයක් ලබා ගැනීමට ඇති හැකියාව

## T

- දක්ෂිණ අධිවේගි මාර්ගය ඉදිකිරීමත් සමඟම පර්යන්ත ප්‍රදේශ තුළ ඇති වන දියුණුව හේතුවෙන් කළුතර නගරය සඳහා දේහලීය ජනගහනය (Threshold Population) ආකර්ෂණය කර ගැනීමේදී ගැටළු ඇතිවීමට ඇති හැකියාව.

# 5.2. විස්තරාත්මක SWOT විශ්ලේෂණය

## අරමුණ 01

කළුතර ගං මෝය ආශ්‍රිත කර ගනිමින් නිරිත දිග වෙරළ තීරයේ සැදුණු කළුතර නගරය සංචාරකයන්ගේ හා වන්දනාකරුවන්ගේ හොඳම නවාතැන්පළක් බවට පත් කිරීම.

### ශක්තීන් | අරමුණ 01

- සංචාරකයන්ට හා වන්දනාකරුවන්ට විශාල වශයෙන් ආකර්ෂණීය ස්ථාන පැවතීම (කළුතර බෝධිය, රිච්මන්ඩ් මන්දිරය, කැලිඩෝ වෙරළ තීරය හා සංචාරක හෝටල්)

සංචාරකයන්ට හා වන්දනාකරුවන්ට ආකර්ෂණීය ස්ථාන විශාල වශයෙන් පැවතීම කළුතර නගරය සතු ප්‍රධාන ශක්තියකි. රූපය 5.1 හි දක්වා ඇති කළුතර බෝධිය, රිච්මන්ඩ් මන්දිරය, කැලිඩෝ වෙරළ තීරය හා සංචාරක හෝටල් නිසා කළුතර නගරයට වන්දනා කරුවන්ගේ හා සංචාරකයින්ගේ ආකර්ෂණය හිමි වී ඇත. මේ අතරින් විශාල බැතිමතුන් ප්‍රමාණයක් දෛනිකව කළුතර බෝධිය කරා ඇදී එයි. විවිධ කාල පරාසයන්ට අනුව එහි වන වෙනස් වීම පහත පරිදි හඳුනා ගත හැක.

- *සාමාන්‍ය දිනවල* *–1000–1500*
- *සාමාන්‍ය පෝය දිනවල* *–3500–4000*
- *විශේෂ පෝය දිනවල* *–7000–8000*

එමෙන්ම වාර්ෂිකව දේශීය සංචාරකයින් 40,993 ක ප්‍රමාණයකුත් විදේශීය සංචාරකයින් 371,104 ක ප්‍රමාණයකුත් කළුතර නගරය කරා පැමිණෙන බව 2016 සංචාරක මණ්ඩලයේ වාර්ෂික දත්ත වාර්තාවලට අනුව සඳහන් වී ඇත. රිච්මන්ඩ් මන්දිරය ද දෙස් විදෙස් ආකර්ෂණය දිනාගත් ස්ථානයක් වේ. තවද එය විවාහ මංගල්‍යයන් ඡායාරූපගත කිරීම සඳහා ද යොදා ගනු ලැබේ. ඒ අනුව එහි මාසික ආදායම මුදලින් රුපියල් ලක්ෂ 4.5 ක් වන බවද ඔවුන්ගේ දත්ත වාර්තා වල සඳහන්ය.

- සියළුම සංචාරක ස්ථාන එකිනෙකට ආසන්න සීමාවක පැවතීම (කි.මී. 01 – කි.මී.03 ඇතුළත)

සියළුම සංචාරක ස්ථාන කළුතර නගරය අවට ඉතා ආසන්න සීමාවක (කි.මී.1 – කි.මී 3 වපසරියක්) පැවතීම ද ශක්තියක් ලෙස හැඳින්විය හැකිය. ඒ අනුව රූපය 5.1 හි දක්වා ඇති කළුතර බෝධිය, රිච්මන්ඩ් මන්දිරය, දියගම පැළුණු ගල, කැළිඩෝ වෙරළ තීරය, දෙස් විදෙස් සංචාරක හෝටල් එකිනෙකට ආසන්න දුරකින් පිහිටා තිබීම නිසා සංචාරකයන්ට පහසුවෙන් ගමන් කළ හැකි ඒකාබද්ධ නගර චාරිකාවක් සකස් කිරීමේ හැකියාවක් ද කළුතර සැලසුම් බලප්‍රදේශය සඳහා පවතී.

- ප්‍රධාන ප්‍රවාහන ජාල සමීපයේ සංචාරක ගමනාන්ත පිහිටා තිබීම. (කළුතර – හොරණ,කළුතර – බණ්ඩාරගම, කළුතර – මතුගම යන මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග)

ප්‍රධාන ප්‍රවාහන ජාල ලෙස සැළකෙන කොළඹ, ගාල්ල, හම්බන්තොට හරහා වැල්ලවාය පසු කර දිවෙන (A2) මාර්ගය, කළුතර – හොරණ, කළුතර – බණ්ඩාරගම, කළුතර – මතුගම හා කළුතර – පලාතොට යන මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ප්‍රධාන මාර්ගයන් සමීපයේ මෙම සංචාරක ගමනාන්ත පිහිටා තිබීම ද දේශීය, විදේශීය සංචාරකයන් හා වන්දනාකරුවන්ගේ මෙම ගමනාන්ත කෙරෙහි ඇති ආකර්ෂණය තව

තවත් ඉහළ යාමට හේතුවකි.

- ප්‍රධාන ගංගා ද්‍රෝණි ආශ්‍රිතව නිර්මාණය වී ඇති නගරවල ගංගා ද්‍රෝණියේ සිට කි.මී.1 ක වපසරිය තුළ සංවර්ධනය සංසන්දනය කිරීමේදී කළුතර නගරය ප්‍රමුඛස්ථානයක් ගැනීම.

ප්‍රධාන ගංගා ද්‍රෝණි ආශ්‍රිත නගරයන් වශයෙන් මහවැලි ගඟ ආසන්නයේ ත්‍රිකුණාමල නගරයත්, කැළණි ගඟ ආසන්නයේ කොළඹ නගරයත් , වළවේ ගං ද්‍රෝණිය ආසන්නයේ අම්බලන්ගොඩ නගරයත්, කළු ගංගා ද්‍රෝණිය ආසන්නයේ කළුතර නගරයත් හඳුනාගත හැකිය. ඒවායේ කි.මී. 1ක වපසරිය තුළ හඳුනාගත හැකි ක්‍රියාකාරකම් වගුව 5.1 හි දක්වා ඇත.

| ගංගා ද්‍රෝණිය | නගරය | සේවා |
|---|---|---|
| මහවැලි ගඟ | ත්‍රිකුණාමලය | වාණිජ, කෘෂිකාර්මික |
| කැළණි ගඟ | කොළඹ | අධ්‍යාපනික,වාණිජ, කෘෂිකාර්මික |
| වලවේ ගඟ | අම්බලන්තොට | අධ්‍යාපනික,වාණිජ, කෘෂිකාර්මික |
| කළු ගඟ | කළුතර | ආයතනික,අධ්‍යාපනික,වාණිජ, කෘෂිකාර්මික, සංචාරක ව්‍යාපාරය, ආගමික සුවිශේෂත්වය, ප්‍රවාහනය මූලික කරගත් සංවර්ධන කටයුතු |

*වගුව 5.1 : ප්‍රධාන ගංගා ද්‍රෝණි ආශ්‍රිත සංවර්ධනය*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

මේ අනුව ප්‍රධාන ගංගා ද්‍රෝණි ආශ්‍රිතව නිර්මාණය වී ඇති නගර වල සංවර්ධනය සංසන්දනය කිරීමේදී කළුතර නගරය ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර, එය නගරය සඳහා වන සංචාරකයන්ගේ හා වන්දනාකරුවන්ගේ ආකර්ෂණය ඉහළ යාමට මහත් පිටුවහලක් වේ.




*රූපය 5.1 : කළුතර සංචාරක ආකර්ෂණය දිනා ගත් ස්ථානයන්ගේ පිහිටීම*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## දුර්වලතා | අරමුණ 01

- කළුතර නගරයේ ප්‍රධාන සංචාරක ආකර්ෂණීය ස්ථාන අවට නොගැළපෙන භූමි පරිභෝජන රටාවක් පැවතීම (කළුතර බෝධිය අවට ප්‍රදේශය, කැලිඩෝ වෙරළ තීරයට ප්‍රවේශ වීම සඳහා පවතින ආබෘ මාර්ගය (වෙරළ තීරයට සමාන්තරව ටැංජරින් හෝටලය දක්වා දිවෙන කොටස පමණක් – කි.මී.2) හා වෙරළ පාර(කැලිඩෝ පාර) – මී.600)

කළුතර නගරය යනු ආකර්ෂණීය ස්ථාන විශාල ප්‍රමාණයකින් පරිපූර්ණ වූ සුන්දර නගරයකි. නමුත් මෙම ස්වභාවික වූත් නිර්මිත වූත් සුන්දර ස්ථාන වටා ඇති නොගැළපෙන භූමි පරිහරණ රටාව මෙම ආකර්ෂණීය ස්ථානයන් සඳහා නොගැළපෙන ලෙස සැකසී ඇත. එමඟින් සැලසුම් බලප්‍රදේශයේ ආර්ථිකය නංවාලීම සඳහා බාධාවක් වී පවතී.

රූපය 5.2 හි අංක 03 න් සළකුණු කර ඇති පරිදි  කළුතර බෝධිය අවට ප්‍රදේශයේ මුළු භූමි පරිභෝ-ජනයෙන් 24% ක ප්‍රමාණයක් වෙන්වී ඇත්තේ පරිපාලන කටයුතු සඳහා වේ. ආගමික කටයුතු හා ඒ හා ගැළපෙන වාණිජ කටයුතු  සඳහා වෙන්වී ඇත්තේ 6% ක් වැනි ඉතා අඩු  ඉඩකඩ ප්‍රමාණයකි. එය සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ගැටළුවකි.

එමෙන්ම රූපය 5.2 හි අංක 01 හා 02 න් සළකුණු කර ඇති පරිදි කැලිඩෝ වෙරළ තීරයට ප්‍රවේශ වීම සඳහා පවතින ආබෘ මාර්ගය (වෙරළ තීරයට සමාන්තරව ටැංජරින් හෝටලය දක්වා දිවෙන කොටස පමණක් –කි.මී. 2.0) හා වෙරළ පාර (කැලිඩෝ පාර) (මීටර් 600) දෙපස මීටර් 50 ක ප්‍රදේශයේ භූමි පරිභෝජනයෙන් වැඩි ඉඩකඩ ප්‍රමාණයක්, එනම් පිළිවෙළින් 78%  ක් ද හා 60% ක් ද වෙන්වී ඇත්තේ නේවාසික භාවිතයන් සඳහා වන අතර සංචාරක කර්මාන්තය මූලික කරගත් වෙළඳ හා සංචාරක කටයුතු සඳහා වෙන් වී ඇත්තේ අඩු ඉඩකඩ ප්‍රමාණයකි. එය පිළිවෙළින් මුළු භූමි භාවිතයෙන් 10% ක් හා 28% ක් වේ. එයද සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ගැටළුවකි.




***රූපය 5.2 :*** *නොගැළපෙන භූමි පරිභෝජන රටාවේ ව්‍යාප්තිය*
***මූලාශ්‍රය :*** *"Open Street" ඡායාරූප (2018)*

- ප්‍රධාන සංචාරක ස්ථානයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් නොමැති වීම.

එමෙන්ම උක්ත සඳහන් සියළු සංචාරක ආකර්ෂණයක් ඇති ස්ථාන අතර අන්තර් සම්බන්ධතාවයක් නොමැති අතර ඒවාට ළඟා විය හැකි විධිමත් සංඥා පුවරු  හෝ මාර්ග විස්තර සහිත සිතියම් ද දක්නට නොමැත. එම නිසා ආගන්තුක සංචාරකයින්ට එම ස්ථාන විවර නොවීම  ඒවායේ උන්නතියට මෙන්ම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ දියුණුවට ද බාධාවකි.

## අවස්ථා | අරමුණ 01

- කළුතර කි.මී. 2 ක්  වන ටැංජරින් හෝටලයේ සිට කැළිඩෝ වෙරළ තීරය දක්වා වන වෙරළ බඩ මුහුණතේ සිදු කෙරෙමින් පවතින වෙරළ සංවර්ධන ව්‍යාපෘතීන්.

කළුතර ප්‍රදේශයේ උන්නතිය සඳහා පවතින අවස්ථාවන් අතරින් ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත හා මේ වන විටත් ආරම්භ කර ඇති ව්‍යාපෘතීන් ප්‍රධාන ස්ථානයක් ගනී. උදාහරණයක් වශයෙන් කැලිඩෝ වෙරළ සංවර්ධන ව්‍යාපෘතිය හඳුනාගත හැකි අතර මෙම ව්‍යාපෘතිය තුළින් සංචාරක අංශයේ උන්නතිය සඳහා ප්‍රධාන වශයෙන් විවේක කුටි, ඇවිදින මංතීරු, බෝට්ටු ජැටි, ක්‍රීඩා උද්‍යාන, මුහුදු පාපන්දු පිටි, පයින් ගස් අංගනයන් සඳහා වූ මංතීරු, මුහුදු තීරය දිගේ විවේක කුටි, වැසි කිළි, මුර කුටි ඉදිකිරීමට යෝජනා කිරීම සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගතියට ඉවහල් වේ.

- රූපය 5.3 න් දැක්වෙන යෝජිත බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්මට අනුව සංචාරක කලාපයට අයත් ප්‍රදේශයක් ලෙස සැලසුම් ප්‍රදේශය හඳුනාගෙන තිබීම. (අළුත්ගම සිට මීගමුව දක්වා සංචාරක කලාපය)

- රූපය 5.4 න් දැක්වෙන 2040 වර්ෂය සඳහා සකස් කර ඇති ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියට අනුව කළුතර ආර්ථික කොරිඩෝවට අයත් වීම.

- රූපය 5.5 න් දැක්වෙන මහ කොළඹ ව්‍යුහ සැලැස්ම –1998 අනුව බස්නාහිර පළාතේ නාගරික ධූරාවලිය සලකමින් කළුතර නගරය දෙවන පෙළ නගරයක් හා ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ලෙසත් සංචාරක ආකර්ෂණය සහිත ස්ථානයක් ලෙසත් හඳුනාගෙන තිබීම.

- නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව විසින් 1988.01.29 වන දින ගැසට් නිවේදනය මඟින් කළුතර බෝධිය ආශ්‍රිත (අක්කර 10) ප්‍රදේශය පූජා භූමි කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබීම.




*රූපය 5.3 : යෝජිත බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්ම*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*




*රූපය 5.4 : ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය - 2040*
*මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (2018)*






*රූපය 5.5 : මහ කොළඹ ව්‍යුහ සැලැස්ම - 1998*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## තර්ජන | අරමුණ 01

- කැලිඩෝ වෙරළ තීරය හා රට යාබද වැලිපරය විනාශයට පත් වීම.

කළුතර නගරය සංචාරකයන්ගේ හා වන්දනාකරුවන්ගේ හොඳම නවාතැන්පළක් බවට පත් කිරීම සඳහා පවත්නා බාධක අතරින් ප්‍රදේශයේ පවතින මුහුදු ඛාදනය හා රට යාබද වැලිපරය විනාශ වීම ප්‍රධානතම ස්ථානයක් ගනී. මේ වන විට අතිශය ඛේදනාත්මක අයුරින් කැලිඩෝ වෙරළ තීරය විනාශ මුඛයට පත්වෙමින් පවතී. රූපය 5.6 හා රූපය 5.7 හි ඇති චන්ද්‍රිකා ඡායාරූප මගින් පිළිවෙලින් 2005 වර්ෂයේ දී කැලිඩෝ වෙරළ තීරය හා රට යාබද වැලිපරය පැවති තත්වය හා 2018 වර්ෂයේදී ඒවා විනාශ වී වර්තමානය වන විට පවතින තත්වයත් දැක්වේ. සංචාරක ක්ෂේත්‍රයන්හි ප්‍රධාන ස්ථානයක් ගන්නා මෙම කළුතර කැලිඩෝ වෙරළ තීරය හා රට යාබද වැලිපරය මෙසේ විනාශයට පත්වීම කළුතර නගරයේ සුන්දරත්වයට හා සංචාරක කර්මාන්තයට අතිශයින්ම බලපානු ඇත.

- පර්යන්ත නගර වල සිදුවන සංවර්ධනය කළුතර නගරයේ ජනගහන ආකර්ෂණය සඳහා බාධාවකි.

කළුතර නගරය අවට වර්තමානය තුළ සිදුවන නව සංවර්ධනයන් හේතුවෙන් කළුතර නගරයට පවතින දේහලීය ජනගහනය (threshold population) අඩු විය හැක. උදාහරණයක් වශයෙන් අධිවේගී මාර්ග සංවර්ධනය හේතුවෙන් කළුතර නගරයේ පැවති මාර්ග ඒකාබද්ධතාවය (integration) අඩුවීමක් වී ඇත. එය නගරයේ දියුණුව කෙරෙහි බාධාවක් විය හැක. එයට හේතුව වන්නේ වර්තමානයේ කළුතර නගරය, මාර්ග පද්ධතිය හා දුම්රිය මාර්ග පද්ධතිය මූලික කර ගනිමින් සංවර්ධනය වී තිබෙන නමුත්, අධිවේගී මාර්ගය හා අන්තර් භුවමාරුව නගරයෙන් ඔබ්බට වන්නට ඉදි වී ඇති බැවින් ඒ ආශ්‍රිත ප්‍රදේශ වල සංවර්ධනයේ ප්‍රවණතාවයක් දක්නට තිබීමයි.



***රූපය 5.6 :*** *කැලිඩෝ වෙරළ පෙර පැවති තත්ත්වය (2005)*
***මූලාශ්‍රය :*** *"Goole Earth" ඡායාරූප (2018)*



***රූපය 5.7 :*** *කැලිඩෝ වෙරළ තීරයේ වර්තමාන තත්ත්වය. (2018)*
***මූලාශ්‍රය :*** *"Goole Earth" ඡායාරූප (2018)*

මේ අනුව කළුතර අවට කර්මාන්ත කලාප සංවර්ධනය, මතුගම වනාන්තර නගර සංවර්ධනය හා දුම්රිය මාර්ග පද්ධතිය පානදුර දක්වා විදුලිත් කිරීම යන අනාගත සංවර්ධනයන් කළුතර නගරයේ ප්‍රශස්ත ක්‍රියාකාරීත්වයට අවශ්‍ය අනාගත දේහලීය ජනගහනය (Threshold Population) අඩු වීම කෙරෙහි තර්ජනයක් විය හැක.

## අරමුණ 02

කළු ගංගාව අවට ප්‍රදේශයේ ස්ථිර හා තාවකාලික නේවාසිකයන් සඳහා ජීවත් වීමට හැකි සහ සුවපහසු නගරයක් බවට පත් කිරීම

### ශක්තීන් | අරමුණ 02

- කළුතර දිස්ත්‍රික්කයේ පරිපාලන හා සෞඛ්‍ය සේවාවන් සපයන ප්‍රධාන නගරය වශයෙන් ක්‍රියාත්මක වීම.

කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන පොදු සේවාවන් සපයන ආයතන මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති අතර පරිපාලන, සෞඛ්‍ය සේවා මින් ප්‍රමුඛස්ථානයක් ගනී. මෙම සේවා ලබා ගැනීමේ අරමුණින් දිනපතා 80,000 ක් පමණ විශාල ජනකායක් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත ඇදී එයි. සිතියම් අංක 5.1හි දක්වා ඇති පරිදි කළුතර දිස්ත්‍රික් කාර්යාලය හා ඒ අවට ප්‍රදේශයේ පරිපාලන සේවා ඒකරාශි වී පවතී. එය කළුතර දිස්ත්‍රික්කයේ පරිපාලන කේන්ද්‍රස්ථානය වශයෙන් ක්‍රියා කරයි. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන මහ රෝහල පිහිටා ඇත්තේ ද මෙම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ බැවින් සෞඛ්‍ය සේවා ද මෙහි ඒකරාශි වී ඇත.

- දැනට පවතින මුළු භූමි පරිභෝජනයෙන් 55% ක් වූ පහත් බිම් ප්‍රමාණය ගංවතුර තත්ත්ව පාලනය කිරීමට උපකාරී වීම.

සැලසුම් බලප්‍රදේශය තුළ වගුරු බිම්, කුඹුරු සහ අනෙකුත් තෙත් බිම් වැනි විවිධ වූ පහත් බිම් පිහිටා ඇත. මේවා වැසි ජලය රඳවා තබා ගනිමින් ගංවතුර තත්ත්ව පාලනය කිරීමට උපකාරී වේ. තවද, මෙම ප්‍රදේශයේ පවතින අඩු බෑවුම් සහිත භූ විෂමතා ලක්ෂණය නිසා වැසි ජලය ගලා යාමේ ගැටළු සහගත තත්ත්වයක් පවතී. එබැවින් මෙම පහත් බිම් වැසි ජලය තාවකාලිකව රඳවා තබා ගැනීමට හා ගංවතුර තත්ත්ව පාලනයට ඉතා වැදගත් වේ.

සිතියම් අංක 5.3 ට අනුව කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ පවතින පහත්බිම් ව්‍යාප්තිය හඳුනාගත හැකි අතර ඒවායේ භූමි ප්‍රමාණයන් වගු අංක 5.2 ට අනුව හඳුනාගත හැකිය.

| භූමි භාවිතය | භූමි ප්‍රමාණය(හෙක්:) |
|---|---|
| විශේෂ කුඹුරු වගා ඉඩම් | 471.72 |
| ස්වභාවික තෙත්බිම් සංරක්ෂණ ප්‍රදේශ | 1484.74 |
| තෙත් බිම් ආරක්ෂණ ප්‍රදේශ | 75.87 |

වගුව 5.2 : පහත්බිම් වර්ගීකරණය
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

05 පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT විශ්ලේෂණය

- සැලසුම් බලප්‍රදේශයේ, ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ඉහළ ජනගහන වර්ධන වේගයක් (2%) පැවතීම.

විශේෂයෙන්ම තේක්කවත්ත (3.3%) කිතුළාව (6.3%) පුලටන් – බටහිර (7.7%) දෙල්දූව (6.5%) වැනි ග්‍රාම නිලධාරී වසම් වල වැඩි ජනගහන වර්ධන වේගයක් පවතින බව සිතියම් අංක 5.2 ට අනුව හඳුනාගත හැක. එබැවින් අනාගතයේදී ජීවමාන වූත්, ක්‍රියාකාරීවූත් නගරයක් ලෙස මෙම ප්‍රදේශය වර්ධනය වීමට වැඩි ඉඩකඩක් පවතී. එමෙන්ම මෙම වැඩි ජනගහනය නිසා ප්‍රමාණවත් සේවා නියුක්තියක් ද කළුතර නගරයට හිමිවනු ඇත.

- කොළඹ වාණිජ කේන්ද්‍රය සමඟ දුම්රිය හා මහා මාර්ග යන බහුවිධ ප්‍රවාහන මාදිලි හරහා ප්‍රබල අන්තර් සම්බන්ධතාවක් පැවතීම.

ශ්‍රී ලංකාවේ වාණිජ කේන්ද්‍රය ලෙස සළකන කොළඹ නගරය කළුතර සිට කි.මී.43 වූ සමීප දුරකින් පිහිටා ඇත. තවද එම නගර දෙක එකිනෙක හා සම්බන්ධ කරමින් දිවෙන ප්‍රධාන මාර්ග ගණනාවක් හා දුම්රිය මාර්ගයක් පවතී. එසේම මෙම කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ආසන්න දුරකින් දක්ෂිණ අධිවේගී මාර්ගය වෙත පිවිසුම් කිහිපයක් ද පිහිටා ඇත. (ගැලනිගම ( කි.මී.14 ), දොඩන්ගොඩ (කි.මී.18 ) , යෝජිත පැල්පොල පිවිසුම (කි.මී.15) මෙම දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ ද, කළුතර නගරය කොළඹ නගරය හා සම්බන්ධ කෙරේ.

- කළුතර දිස්ත්‍රික්කය තුළ ජාතික මට්ටමේ වෘත්තීයමය පුහුණු ආයතන වැඩිම ප්‍රමාණයක් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ලෙස කළුතර හඳුනාගත හැකිවීම.

කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටි අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා සන්සන්දනය කර බැලීමේදී කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කළුතර දිස්ත්‍රික්කය තුළ වැඩිම වෘත්තීය පුහුණු ආයතන සංඛ්‍යාවක් පිහිටා තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වීම වැදගත් ලක්ෂණයක් වේ.
මෙහිදී හඳුනා ගත හැකි වෘත්තීය පුහුණු ආයතන පහත පරිදි වේ.

- *ජාතික හෙද විද්‍යාල*
- *පස්දුන්රට ජාතික ගුරු අභ්‍යාස විද්‍යාලය*
- *වී පර්යේෂණ ආයතනය*
- *අභ්‍යන්තර ගුවන් හමුදා කඳවුර*
- *විශේෂ කාර්ය බලකා පුහුණු පාසල*
- *පොලිස් අභ්‍යාස විද්‍යාලය*




*__සිතියම 5.1 :__ පරිපාලන ගොඩනැගිලි ඝනත්වය (2018)* *__මූලාශ්‍රය :__ නාගරික සංවර්ධන අධිකාරිය (2018)*




***සිතියම 5.2 :*** *ජනගහන වර්ධන වේග අනුපාතිකය (2001–2011)* ***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*




**තෙත් බිම් ව්‍යාප්තිය (2018)**
**කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

මූලාශ්‍රය : බස්නාහිර පළාත් පාරිසරික සංවේදී තෙත්බිම් සහ ක්ෂේත්‍ර සමීක්ෂණ

0 0.45 0.9 1.8 2.7 3.6 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

බස්නාහිර පළාත් අංශය | කළුතර සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

**සිතියම 5.3 :** *තෙත් බිම් ව්‍යාප්තිය (2018)*

**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## දුර්වලතා | අරමුණ 02

- ගංවතුර අවදානමට ලක්වන ප්‍රදේශ වල (නේක්කවත්ත, කිතුළාව, පුලර්ටන් බටහිර) වැඩි ජනගහන වර්ධන වේගයක් පැවතීම.

වසරේ මැයි, සැප්තැම්බර්, ඔක්තෝම්බර් මාස වල දී කළුතර නගරය ගංවතුර තත්ත්වයන්ට බහුලව ලක්වේ. ඉහළ ජනගහන වර්ධන වේගයන් සහිත පුලර්ටන් බටහිර, කිතුළාව හා නේක්කවත්ත වැනි ග්‍රාම නිලධාරී වසම් වල ඉහළ ගං වතුර අවධානමක් ද පවතින බැවින් එහි ආපදාවන්ට ලක්විය හැකි මුළු ජනගහනය ඉහළ යා හැක. එය සමස්ත සංවර්ධන බලප්‍රදේශයේම සංවර්ධන ක්‍රියාවලිය අඩපණ කිරීමට හේතු වේ.

- වියළි කාලසීමාවේදී ( ජනවාරි, පෙබරවාරි, මාර්තු , අගෝස්තු , සැප්තැම්බර්) ගංගා ජලයට ලවණ ජලය මුසුවීම නිසා සැලසුම් බලප්‍රදේශය තුළ වාසය කරන ජනගහනයෙන් 56%කට පානීය ජල අර්බුද වලට මුහුණ දීමට සිදුවීම.

සැලසුම් බලප්‍රදේශය තුළ මූලික පානීය ජල මූලාශ්‍රය කළු ගඟයි. එබැවින් කළු ගං ජලයේ ලවණතාවය වැඩිවීම, ප්‍රදේශයේ පානීය ජලය අර්බුධ ඇති කිරීමට හේතු වී ඇත. නගර සභා බලප්‍රදේශය තුළ පවුල් 100% ක් හා සමස්තයක් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවුල් 56% ක් නල ජලය භාවිතා කරන අතර මෙම සමස්ත පිරිසට මින් බලපෑම් එල්ල වී ඇත.

වියළි කාලයේදී, විශේෂයෙන්ම ජනවාරි, පෙබරවාරි, මාර්තු , අගෝස්තු , සැප්තැම්බර් මාස වලදී ගඟේ ජල මට්ටම පහත වැටීම නිසා ලවණ මිශ්‍ර ජලය කලපුව හරහා ගංගාව වෙත ගලා ඒම සිදු වේ. එවිට ගංගා ජලයේ ලවණතාවය ඉහළ නගී. රූපය 5.8 ට අනුව වියළි සෘතුවේදී ජලයේ විද්‍යුත් සන්නායකතාවය ඉහළ අගයක් ගැනීමෙන් පෙන්නුම් කරන්නේ අදාළ වකවානු වල ජලයේ ලවණතාවය ද ඉහළ අගයක් ගන්නා බවයි. මෙය ගංගාව ආශ්‍රිත සංවේදී පරිසර පද්ධතියට හානිකර බලපෑම් ඇති කරන අතර විශේෂයෙන්ම එම පරිසර පද්ධතිය තුළ පවතින ආහාර දාම හා ආහාර ජාල බිඳ දමමින්, එම පරිසර පද්ධතියට අනුවර්තනය වෙමින් වාසය කරන ජීව ප්‍රජාවට හානි කරයි. මින් ගංගා පරිසර පද්ධතියේ ජෛව විවිධත්වය අඩු වේ. එසේම එහි තුළිතතාවය ද බිඳ වැටිය හැක.




***රූපය 5.8 :** වියළි සෘතුවේදී ජලයේ විද්‍යුත් සන්නායකතාවය*
***මූලාශ්‍රය :** ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය(2018)*

- පානදුර දක්වා විදුලි දුම්රිය සේවාව ඇරඹීම තුළින් කොළඹ කොටුව වාණිජ අග නගරයේ සිට කළුතර දක්වා ගමනාගමනයට ගතවන කාල සීමාව අඩුකර ගත හැකිවීම.

පානදුර දක්වා ඉදිකිරීමට යෝජිත විදුලි දුම්රිය මාර්ගය මඟින් ප්‍රදේශයේ ප්‍රවාහන පහසුකම් තව දුරටත් සංවර්ධනය කිරීමට වැඩි විභවතාවයක් පවතින අතර යෝජිත අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති ඔස්සේ ප්‍රදේශයට 2030 වර්ෂයේදී ආකර්ෂණය වන 80,000 පමණක් වූ සංසරණ ජනගහනයේ ප්‍රවාහන අවශ්‍යතා වඩාත් කාර්යක්ෂමව හා තදබදයකින් තොරව සිදු කිරීමට ද මින් හැකිවනු ඇත. තවද කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිට කොළඹ වාණිජ අග නගරය වෙත රැකියා සඳහා යන ජනතාවට පහසුවෙන් ගමනාන්ත වෙත ළඟා වීමට මින් අවස්ථාව උදාවේ.

එසේම වාණිජ කේන්ද්‍රය වන කොළඹ හා අනෙකුත් ප්‍රධාන නගර හා පවතින අන්තර් සම්බන්ධතාව වැඩි කිරීමට මෙම නව ප්‍රවාහන ජාලය උපකාරී වනු ඇත.

වර්තමානයේ කොළඹ සිට කළුතර දක්වා ළඟා වීමට සීඝ්‍රගාමී දුම්රිය මඟින් – පැය ½ ක කාලයක් ද, සාමාන්‍ය දුම්රිය මඟින් – පැය 1 ½ ක කාලයක් ද ගත වේ. නමුත් මෙම විදුලි දුම්රිය මාර්ගය කළුතර දක්වාම දීර්ඝ කිරීමට විභවතාවයක් පවතින බැවින් මෙම ගමන් කාලය ඉන් තවදුරටත් අඩු වනු ඇත. මේ පිළිබඳ තොරතුරු රූපය 5.9 ට අනුව හඳුනාගත හැකිය.

- කළුතර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ලවණ බාධකයක් කළු ගඟෙහි ඉදිකිරීමට යෝජනා කර තිබීම.

ලවණ ජලය ගොඩබිම කරා ඒම වැලැක්වීමට කළුතර ප්‍රධාන පාලම සමීපයේ ලවණ බාධකයක් ඉදිකිරීමට දැනට කළුතර දිස්ත්‍රික් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යෝජනා කර ඇත. මෙහි වියදම ලෙස රු.මිලියන 300 ක මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර තවමත් ව්‍යාපෘතිය පිළිබඳ ශක්‍යතා අධ්‍යනයන් කෙරෙමින් පවතී. මෙයද කළුතර නේවාසිකයන් සඳහා සුවපහසු නගරයක් කිරීමෙහිලා වැදගත් වන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත හැකිය.




*රූපය 5.9 : පානදුර දක්වා ඉදිකිරීමට යෝජිත විදුලි දුම්රිය මාර්ග ව්‍යාපෘතිය*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## **තර්ජන** | අරමුණ 02

- **කළුතර සැලසුම් බලප්‍රදේශයේ බටහිර සීමාව වන ධීරක්කන්ද මාවත ආසන්නයේ සිට දකුණු පයාගල දක්වා දිවෙන කිලෝමීටර් 13ක් පමණ වූ වෙරළ තීරයේ සමුද්‍ර ඛාදනය සිදුවීම.**

කළුතර නගරයේ දියුණුව කෙරෙහි පවත්නා බාධක අතරින් වෙරළ ඛාදනය ප්‍රධානම බාධාවකි. මේ වන විටත් කැලිඩෝ වෙරළ තීරය විනාශ මුඛයට ඇද වැටෙමින් පවතී. සංචාරක ක්ෂේත්‍රයේ අග්‍රගන්‍ය ස්ථානයක් ගන්නා මෙම කළුතර කැලිඩෝ වෙරළ තීරය මෙසේ විනාශයට පත් වීම කළුතර නගරයේ සුන්දරත්වයට හා සංචාරක ආකර්ෂණය අඩුවීමට අතිශයින්ම බලපානු ඇත. එමෙන්ම ඉන් වෙරළ පරිසර පද්ධතියටද හානි පැමිණේ. සිතියම් අංක 5.4 න් දැක්වෙන පරිදි වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අවදානම් මට්ටම සලකා මෙම කළුතර මුහුදු තීරය අවදානම් කලාප තුනකට වර්ග කර ඇත.

I. *ඉහළ අවදානම් කලාපය*
*ටැංජරීන් හෝටලයේ සිට අවානි හෝටලය දක්වා*

II. *මධ්‍යම අවදානම් කලාපය*
*අවානි හෝටලයේ සිට දකුණු පයාගල දක්වා*

III. *අඩු අවදානම් කලාපය*
*පින්වත්ත දුම්රිය නැවතුම්පළේ සිට ටැංජරීන් හෝටලය දක්වා*

- **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් 2025 දක්වා කරන ලද පුරෝකථනයන්ට අනුව සාගර ජල මට්ටම ඉහළ යාම හඳුනාගෙන තිබීම.**

මුහුදු මට්ටම ඉහළ යාම කළුතර දිස්ත්‍රික්කය සඳහා බලපාන ආකාරය හා එහි අවදානම පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් කළ අධ්‍යනයට අනුව එම අවදානම් ප්‍රදේශ සිතියම් අංක 5.4 න් හඳුනාගත හැක.




***සිතියම 5.4 :*** *කළුතර මුහුදු තීරයේ අවදානම් කලාප (2018)* ***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*




**මුහුදු මට්ටම ඉහළ යාමේ අවදානම් කලාප (2025)**
**කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

මූලාශ්‍රය : ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

0 0.45 0.9 1.8 2.7 3.6 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

බස්නාහිර පළාත් අංශය | කළුතර සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

***සිතියම 5.5 :*** *මුහුදු මට්ටම ඉහළ යාමේ අවදානම් කලාප (2025)*　***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## අරමුණ 03

කළු ගං මෝය ආශ්‍රිත කර ගනිමින් සැදුණු කළුතර නගරයට පැමිණෙන මගීන්ට හිතෛෂී සේවා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

## ශක්තීන් | අරමුණ 03

- කළුතර ප්‍රධාන සීඝ්‍රගාමී දුම්රිය නැවතුම්පළක් වීම.

කළුතර දුම්රිය නැවතුම් මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම දුම්රිය නැවතුම් මධ්‍යස්ථානයකි. මන්දගාමී හා සීඝ්‍රගාමී යන සියළුම දුම්රියන් කළුතර දුම්රිය මධ්‍යස්ථානයේ නවත්වන බැවින් එය දකුණු - කොළඹ දුම්රිය මාර්ගයේ ගමන් ගන්නා මගීන්ට පහසුවකි. එමෙන්ම ද්විත්ව රේල්පීලි සහිත දුම්රිය ස්ථානයක් ලෙස ද කළුතර හඳුනා ගත හැකිය.

රූපය 5.11 න් දැක්වෙන පරිදි මෙම ප්‍රවාහනයේ පහසුව හේතුවෙන් දෛනිකව 6500 ක සංසරණ ජනගහනයක් කළුතර නගරය කරා ඇදී එන බව දුම්රිය දෙපාර්තමේන්තුවේ වාර්ෂික දත්ත වල සඳහන් වී ඇත. එමෙන්ම කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දුම්රිය නැවතුම්පළවල් 04 ක් දැකගත හැකිය. එනම්,

දුම්රිය නැවතුම්පළ අංක 01 / උතුරු කළුතර / දකුණු කළුතර / කටුකුරුන්ද

මෙමගින් කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ජනතාවට පහසුවෙන් දුම්රිය ප්‍රවාහන පහසුකම් ලබාගත හැකිවීම කළුතර නගරය සංක්‍රමණික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට මහත් ශක්තියකි.

- දකුණු කළුතර දුම්රිය නැවතුම්පළත් ප්‍රධාන බස් නැවතුම්පළත් එකිනෙකට ඉතා ආසන්නව පිහිටා තිබීම. (මීටර් 100 දුර)

රූපය 5.10 න් දැක්වෙන ආකාරයට දකුණු කළුතර දුම්රිය නැවතුම්පළත්, බස් නැවතුම්පළත් එකිනෙකට ඉතා සමීපව පිහිටා තිබීම තුළින් සැලසුම් බලප්‍රදේශය තුළ මෙම ප්‍රවාහන සේවාවන් ලබාගන්නා සියළුදෙනා හට කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට හැකිවන අතරම මෙම ස්වභාවික පිහිටීම හේතුවෙන් කළුතර ප්‍රවාහනය මූලික කරගත් සංවර්ධන (TOD) මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමටද අවස්ථාව විවර වනු ඇත.

- පර්යන්ත ප්‍රදේශ සමඟ මනා මාර්ග සම්බන්ධතාවයක් ප්‍රධාන මාර්ග ඔස්සේ පැවතීම

සිතියම් අංක 5.6 න් දැක්වෙන පරිදි කළුතර - බණ්ඩාරගම, කළුතර - හොරණ, කළුතර - මතුගම යන ප්‍රධාන මාර්ග පද්ධතිය ඔස්සේ කළුතර නගරය පර්යන්ත ප්‍රදේශයන් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන ඇත.




***රූපය 5.10 :*** *කළුතර දුම්රිය ස්ථානය හා බස්නැවතුම්පලේ පිහිටීම*
***මූලාශ්‍රය :*** *"Open Street" ඡායාරූප (2018)*




***රූපය 5.11 :*** *දුම්රිය පිළිබඳ විස්තර*
***මූලාශ්‍රය :*** *නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය (2005)*




**මාර්ග පද්ධතිය**
**කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
මූලාශ්‍රය : මිනින්දෝරු දෙපාර්තමේන්තුව

0 0.45 0.9 1.8 2.7 3.6 කි.මී

**නාගරික සංවර්ධන අධිකාරිය**
දෙසැම්බර් 2018

බස්නාහිර පළාත් අංශය | කළුතර සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

**සිතියම 5.6:** *දුම්රිය හා මහා මාර්ග ව්‍යාප්තිය (2018)* **මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## දුර්වලතා | අරමුණ 03

- **නගර මධ්‍යයේ පිහිටි මාර්ගයන්හී (කි.මි. 2.3) මඟීන් සඳහා ප්‍රමාණවත් මඟී මංතීරු නොමැති වීම.**

නගර මධ්‍යයේ පවතින නොවිධිමත් භූමි පරිභෝජන රටාව හා මඟී මංතීරු නොමැතිකම නිසා ඇවිදීමට හිතකර වූ පරිසරයක් නොපවතී. රූපය අංක 5.12 හි හඳුනාගෙන ඇති එබඳු මාර්ග පහත දැක්වේ.

| | |
|---|---|
| *කළුතර ඔරලෝසු කණුවේ සිට තුම්මන්හන්දිය දක්වා* | *– මීටර් 853* |
| *දුම්රියපළ පාර* | *– මීටර් 180* |
| *බඩු ගබඩා පාර* | *– මීටර් 338* |
| *සාරානන්ද මාවත* | *– මීටර් 270* |
| *චම්ලි ගුණවර්ධන මාවත* | *– මීටර් 190* |
| *ඥාණෝදය මාවත* | *– මීටර් 180* |
| *ග්‍රෙගරි පාර* | *– මීටර් 348* |




***රූපය 5.12 :*** *මඟී මංතීරු රහිත මාර්ග*
***මූලාශ්‍රය :*** *"Open Street" සිතියම (2018)*

## අවස්ථා | අරමුණ 03

- පානදුර දක්වා විදුලි දුම්රිය මාර්ගයක් දැනටමත් යෝජනා වී තිබීම නිසා කළුතර දක්වාද එය දීර්ඝ කිරීමට ඇති විභවතාවය

පානදුර දක්වා විදුලි දුම්රිය මාර්ගයක් යෝජනා කර තිබීම, කළුතර නගරය මඟීන්ට හිතෛෂී නගරයක් බවට පත්කිරීමෙහිලා ප්‍රධාන අවස්ථාවක් කොටගත හැකිය.

- ක්‍රියාත්මක දක්ෂිණ අධිවේගි මාර්ගයේ නව අන්තර් හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස පැල්පොල යෝජනා කර තිබීම හා එමඟින් කළුතර – හොරණ මාර්ගයට සම්බන්ධතාවයක් ලබාගැනීමට ඇති හැකියාව

පැල්පොල අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථානයක් දැනටමත් යෝජනා කර තිබීම හා රූපය 5.13 න් දැක්වෙන පරිදි එමඟින් කළුතර–හොරණ මාර්ගයට සම්බන්ධතාවක් ලබා ගැනීමේ හැකියාව ද අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.




***රූපය 5.13 :*** *පැල්පොල අන්තර් හුවමරු මධ්‍යස්ථානය, කළුතර - හොරණ මාර්ගය ඔස්සේ කළුතර නගරය හා සම්බන්ධ වීම*
***මූලාශ්‍රය :*** *"Google " ඡායාරූප (2018)*

## තර්ජන | අරමුණ 03

- *දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමත් සමගම පර්යන්ත ප්‍රදේශ තුළ ඇති වන දියුණුව හේතුවෙන් දේහලීය ජනගහනය (Threshold population) ආකර්ෂණය කර ගැනීමේදී ගැටළු ඇතිවීමට ඇති හැකියාව.*

දක්ෂිණ අධිවේගී මාර්ගය හේතු කොටගෙන කළුතර නගරයෙන් පර්යන්ත ප්‍රදේශ වල සීඝ්‍ර දියුණුවක් මේ වන විට දක්නට ඇත. රූපය 5.14 දැක්වෙන පරිදි දොඩන්ගොඩ හා ගැලනිගම අධිවේගී අන්තර් හුවමාරු මධ්‍යස්ථානයන් හේතුකොට ගෙන එම ප්‍රදේශවල ද දියුණුවක් දක්නට ලැබී ඇති අතර ජනගහනයේ ආකර්ෂණය එම ප්‍රදේශ වලට ලැබී ඇත. මෙම ආකර්ෂණය හේතුකොට ගෙන කළුතර සංවර්ධන බලප්‍රදේශයට පවතින ජනගහන ආකර්ෂණය අඩුවීමේ ප්‍රවණතාවයක් පවතී. මේ නිසා අනාගතයේදී නගරයේ ප්‍රශස්ත ක්‍රියාකාරීත්වයට අවශ්‍ය දේහලීය ජනගහනය පවත්වා ගැනීම අර්බුධයක් විය හැක.



*__රූපය 5.14 :__ දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදි කිරීමෙන් පසු අවකාශීය සම්බන්ධතා සමෝධානිතයේ සිදු වූ වෙනස් වීම*
*__මූලාශ්‍රය :__ නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

# 06 පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්ම

## 6.1. සංකල්පිත සැලැස්ම

සංකල්පිත සැලැස්ම යටතේ සැලසුම් බලප්‍රදේශයේ අනාගත සංවර්ධනය කෙසේ සිදුවිය යුතුද යන්න පිළිබඳව මූලික පැහැදිලි කිරීමක් සංකේතාත්මකව සිදු කෙරේ. ඒ අනුව කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද සංවර්ධන සැලැස්ම මඟින් 2030 වර්ෂය වනවිට, විශ්ලේෂණ තුළින් හඳුනාගන්නා ලද ගැටලු විසඳමින් තිරසාර සංවර්ධනයක් සැලසුම් බලප්‍රදේශය තුළ ඇති කිරීමට අරමුණ වූ අතර එය සාක්ෂාත් කර ගැනීමට ඉවහල් වන ආකාරයේ සැලසුම් සංකල්පයක් මෙහිදී ගොඩනගා ඇත.

සංකල්පිත සැලැස්ම යටතේ මූලිකව ප්‍රදේශයේ සංවර්ධනය ක්ෂේත්‍ර 05ක් යටතේ ඇති කිරීම තුළින් අපේක්ෂිත ඉදිරි දැක්මට ළඟා වීමට බලාපොරොත්තු වේ. එම සංවර්ධන ක්ෂේත්‍ර ලෙස විවිධාංගීකරණය වූ න්‍යෂ්ටි සංවර්ධනය කිරීම, සැලසුම් බලප්‍රදේශයේ බටහිර සීමාව සාගරයට මායිම් වීමේ වාසිය පදනම් කරගනිමින් වෙරළ ආශ්‍රිත සංචාරක ප්‍රබෝධයක් ඇතිකිරීම, සැලසුම් බලප්‍රදේශයේ උතුරු අර්ධයේ කොටසක් බොල්ගොඩ ගඟ ප්‍රදේශයට මායිම්වීමේ වාසිය සලකමින් මෙම ප්‍රදේශය තුළ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තයක් ඇතිකිරීම, කළු ගඟෙහි ස්වභාවික පිහිටීම මූලික කරගනිමින් ගඟ ඔස්සේ ඓතිහාසික උරුමයන් මූලික කරගත් සංචාරක කර්මාන්තයක් ඇති කිරීම හා නාගොඩ ප්‍රදේශය සෞඛ්‍ය පහසුකම් ප්‍රවර්ධන කලාපයක් ලෙස සංවර්ධනය කිරීම යනාදි වශයෙන් හඳුනාගත හැකිය.

ඊට අමතරව සැලසුම් බලප්‍රදේශය තුළ පවතින ඉහළ පාරිසරික සංවේදී කලාප ආරක්ෂා කර ගනිමින් හා ආපදා අවම කර ගනිමින් නේවාසික ජනතාවට සුවපහසු, ආරක්ෂාකාරී, ජීවත්වීමට සුදුසු පරිසරයක් සකස් කිරීමේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා විවිධ ඝනත්වයෙන් යුතු නේවාසික කලාප 04ක් සංවර්ධනය කිරීමට ද මෙහිදී බලාපොරොත්තු වේ.

මෙම නේවාසික කලාප 4ට අවශ්‍ය සේවා නිසි ආකාරයෙන් ලබා දීමට නගර මධ්‍යයේ ප්‍රධාන වාණිජ කේන්ද්‍රස්ථානයක්, අසල්වැසි න්‍යෂ්ටි 06 ක්, නේවාසික න්‍යෂ්ටි 02 ක් හා සෞඛ්‍ය පහසුකම් සපයන න්‍යෂ්ටියක් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. ඒ යටතේ ප්‍රධාන නගර මධ්‍ය වාණිජ කේන්ද්‍ර න්‍යෂ්ටිය ලෙස කළුතර නගරය සංවර්ධනය කිරීමටත්, අසල්වැසි න්‍යෂ්ටි ලෙස පලාතොට, කොළනිය, මල්වත්ත, උග්ගල්බඩ, මිල්ලගස් හන්දිය හා ඇළමෝදර හන්දිය යන න්‍යෂ්ටීන් සංවර්ධනය කිරීමටත්, නේවාසික න්‍යෂ්ටීන් ලෙස සෙන්ට්‍රල් හන්දිය හා මොරොන්තුඩුව සංවර්ධනය කිරීමටත්, සෞඛ්‍ය ප්‍රවර්ධන න්‍යෂ්ටිය වශයෙන් නාගොඩ හන්දිය සංවර්ධනය කිරීමටත් අපේක්ෂිතය. එමෙන්ම මෙම න්‍යෂ්ටීන් සැලසුම් බලප්‍රදේශය තුළ පවතින මාර්ග පද්ධතිය ඔස්සේ මධ්‍ය වාණිජ කේන්ද්‍රය හා මනාව සම්බන්ධ කිරීමට බලාපොරොත්තු වේ.

කළු ගංගා මෝය ආශ්‍රිතව නගර මධ්‍යයේ පවතින විවිධාංගීකරණය වූ ක්‍රියාකාරකම් සලකා බලා එම ප්‍රදේශය මධ්‍ය වාණිජ කේන්ද්‍රය (CBD) ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගන්නා ලදී. එම විවිධාංගීකරණය වූ කාර්යයන් වන්නේ පරිපාලන, ආගමික, වාණිජ හා ප්‍රවාහන යන සිව් වැදෑරුම් ක්‍රියාකාරකම්ය.

එමෙන්ම වස්කඩුව, නාගස් හන්දිය හා කටුකුරුන්ද යන උප වාණිජ කේන්ද්‍ර තුනක් මෙම මධ්‍ය වාණිජ කේන්ද්‍රය සමඟ ගාලු පාර හරහා සම්බන්ධ වේ.

සැලසුම් බලප්‍රදේශය තුළ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමේ එක් උපාය මාර්ගයක් වශයෙන් සංචාරක ක්ෂේත්‍රය ඔප්නැංවීම හඳුනාගත හැක. ඒ අනුව සැලසුම් බලප්‍රදේශයේ වෙරළාශ්‍රිත පරිසරයට හානියක් නොවන අන්දමින් උපායමාර්ගික ක්‍රමවේදයක් යටතේ බටහිර වෙරළාශ්‍රිත ප්‍රදේශ සීමාව අධිඝණත්ව සංචාරක ප්‍රවර්ධන කලාපයක් ලෙස සංවර්ධනය කිරීමටත්, බොල්ගොඩ සඳහා වන පරිසර හිතකාමී සංචාරක ප්‍රවර්ධන කලාපය, පාරිසරික සංවේදී කලාප ආරක්ෂා කරගනිමින් තිරසාර ලෙස සිදුකිරීමටත්, කළු ගඟෙහි ස්වභාවික පිහිටීම මූලික කර ගනිමින් කළු ගඟද සම්බන්ධ කර ගනිමින් සිදුවන ඓතිහාසික උරුමයන් මූලික කරගත් සංචාරක ප්‍රවර්ධන කලාපය ඓතිහාසික කළුතර බෝධිය හා රිච්මන්ඩ් කාසල්

මන්දිරය මූලික කරගනිමින් සිදුකිරීමටත්, අපේක්ෂිතය. ඊට අමතරව සෞඛ්‍ය ක්ෂේත්‍ර සංවර්ධනය කිරීම ද සැලසුම් බලප්‍රදේශයට ආකර්ෂණය වන දේශීය විදේශීය සංචාරකයන්, මඟීන් හා වන්දනාකරුවන් සඳහා පහසුකම් සැලසීමකි. මේ සඳහා නාගොඩ ආශ්‍රිත ප්‍රදේශයේ පවතින රෝහල් හා ඊට අනුබද්ධ පහසුකම් සලකා බලමින් එය සෞඛ්‍ය ප්‍රවර්ධන කලාපයක් ලෙස හඳුනා ගැනීමේ උපාය මාර්ගය ද සැලසුම් සංකල්පය තුළ හඳුනාගත හැක.

එමෙන්ම මෙම සැලසුම් බලප්‍රදේශයට ආකර්ෂණය වන සියළුම යාත්‍රික පිරිසට එනම් දේශීය හා විදේශීය සංචාරකයන් , මඟීන් , විවිධ  සේවා ලබා ගැනීමට පැමිණෙන පිරිස හා නේවාසික ජනතාවට අවශ්‍ය මාර්ග හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම  ද සංකල්පිත සැලැසුමෙහි එක් අංගයකි. ඒ අනුව ඉහත සඳහන් සියළු කරුණු අඩංගු කරමින් සැලසුම් ප්‍රදේශය සඳහා සංකල්පිත සැලැස්ම සකස් කර ඇති අතර, එම සංකල්පිත සැලැස්ම සාක්ෂාත් කර ගැනීමට ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම (සහනදායී නවාතැන්පල – Console Caesura), අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම (ඒකාබද්ධ නවාතැන්පල – Conjoined Caesura), නිවාස සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම (සුවපහසු නවාතැන්පල – Cushy Caesura), තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම (නීලහරිත නවාතැන්පල – Cyan Caesura) හා සංස්කෘතික, ආගමික හා උරුමයන් කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම යන සැලසුම් 05 හරහා උපාය මාර්ග සකස් කර ඇත.

ඒ අනුව මෙම සියළුම උපාය මාර්ග සංකලනයෙන් නගරයට ඇදී එන සියළුම දේශීය විදේශීය සංචාරකයන්ට, මඟීන්ට, වන්දනාකරුවන්ට මෙන්ම නේවාසික ජනතාවටද පහසුකම් වලින් සපිරි හා ආපදා වලින් තොර, නිරිතදිග වෙරළ තීරයේ අග්‍ර නැවතුම් පලක් බවට කළුතර පත්කිරීම මෙම සංවර්ධන සැලැස්මේ අනාගත දැක්ම වේ. මෙම සංකල්පිත සැලැස්ම  රූපය 6.1 ට අනුව හඳුනාගත හැකිය.




*රූපය 6.1 : සංකල්පිත සැලැස්ම*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## 6.2. යෝජිත භූමි පරිහරණ සැලැස්ම

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මූලික කරගනිමින් සකස් කරන ලද කලාපීයකරණ සැලැස්ම හරහා සංවර්ධන සැලැස්මෙහි දැක්ම, ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගනිමින් "නිරිතදිග වෙරළ තීරයේ අග්‍ර නැවතුම්පළක්" ලෙස සැලසුම් ප්‍රදේශය සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. මෙම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවතින අනන්‍යතාවය ඒ අයුරින්ම සුරැකීමට බලාපොරොත්තු වේ.

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා යෝජිත නාගරික වින්‍යාසය ආකර්ෂණීය මට්ටමින් දර්ශනීය දර්ශන තල සහිතව හා විවිධ ගොඩනැගිලි ඝනත්ව හා උස මට්ටම් ද සහිතව සකස් විය යුතු බව හඳුනාගෙන ඇත. මීට අමතරව මාර්ග, පොදු විවෘත භූමි සංවර්ධනය හා අනෙකුත් සියළුම අංශ සංවර්ධනය කිරීමේ උපාය මාර්ග හරහා දර්ශනීය හා විවිධාංගීකරණයකින් යුතු නගර වින්‍යාසයක් ප්‍රදේශය තුළ ඇති කිරීමට මෙම සැලැස්ම මඟින් යෝජිතය. මන්ද ගොඩනැගිලිවල හැඩය, ඝනත්වය මත හා ස්වභාවික පරිසරයේ ගැළපීම (විවෘත භූමි) අනුව නගරයේ භෞතික අවකාශය, යෝජිත භූමි පරිහරණ රටාව තීරණය වන බැවිනි.

කළු ගං මෝය ආශ්‍රිතව පිහිටා ඇති කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කොළඹ – වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ හා මරදාන – මාතර දුම්රිය මාර්ගයේ සුවිශේෂී මංසන්ධි නගරයක් ලෙස හඳුනාගත හැක. මීට අමතරව එහි මධ්‍ය වාණිජ කේන්ද්‍රය ආගමික, පරිපාලන, වාණිජ හා ප්‍රවාහන යන ප්‍රධාන අංශයන්ගෙන් සමන්විත විවිධාංගීකරණය වූ ක්‍රියාකාරකම් ඒකරාශී වී ඇති නගරයක් ලෙසත් හඳුනාගත හැක. කළු ගංගාව හා ඉන්දියන් සාගරය එක්වන කළු ගංගා මෝය තීරය ද ප්‍රදේශයට ආවේණික ලක්ෂණයන් වන අතර කළුතර නගරය විවිධ භූමි භාවියන්ගෙන් හා විවිධ උස පරාස වලින් යුතු ගොඩනැගිලි සහිත නගරයක් ලෙසත් හඳුනාගත හැක.

සැලසුම් බලප්‍රදේශය තුළ භූමි භාවිතය පිළිබඳව සලකා බැලීමේදී මුළු භූමි භාවිතයෙන් 55% ක් එනම් හරි අඩකට වඩා වැඩි භූමි ප්‍රතිශතයක් වෙන්වී ඇත්තේ හරිත භූමි භාවිතයකට වන අතර ඒත් සමඟ කළුගඟ, කලපුව හා අනෙකුත් ස්වභාවික ජල මාර්ගයන් මෙම භූමි භාවිතය සමඟ මුසුව පැවතීම තුළින් ඉතා ඉහළ ස්වභාවික සෞන්දර්යයක් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හිමි වී ඇත.

ඉහත හඳුනාගත් විභවතා කළුතර සැලසුම් බලප්‍රදේශයේ පැවතුන ද එම විභවතා නගර සංවර්ධනයට දායක කර ගැනීමට බාධා කිහිපයක් වේ.

විශේෂයෙන්ම කළුතර සැලසුම් බලප්‍රදේශයෙහි කළුගං මෝය  ආශ්‍රය කර ගනිමින් සැදුණු පූජනීය කලාපය තුළ හා නගර මධ්‍ය වාණිජ කලාපය තුළ ප්‍රධාන වශයෙන් වාණිජ, පරිපාලන, ආගමික හා අධ්‍යාපනික ක්‍රියාකාරකම් ඒකරාශී වුවද ඒවා නගර ආර්ථිකයට උපරිම දායකත්වය ලබාගත හැකිවන අයුරින් සැලසුම් වී නොමැත. දැනට සංචාරක ආකර්ෂණය දිනාගත හැකි ස්ථාන ලෙස හඳුනාගෙන ඇති දර්ශනීය වෙරළ තීරය, කලපුව, ඓතිහාසික ස්ථාන (කළුතර බෝධිය, රිච්මන්ඩ් කාසල්), බොල්ගොඩ පාරිසරික සංවේදී කලාපය අතර ද අන්තර් සම්බන්ධතාවක් හඳුනාගත නොහැක. කළු ගඟේ පිහිටීම හා ප්‍රදේශය තුළ තැනිතලා භූමි ප්‍රදේශ පැවතීම හේතුවෙන් වාර්ෂික ජලගැලීම් වලට ලක්වීමට අවධානමක් පවතින අතර එම ප්‍රදේශ වල ජන ඝනත්වය ඉහළ යාම 2030 වර්ෂය වන විට ජනගහන පුරෝකථනයන්ට අනුව හඳුනාගෙන ඇත. ඒ අනුව මෙම ගැටළු සඳහා සුදුසු පිළියම් ලබා දෙමින්  නිරිතදිග වෙරළ තීරයේ අග්‍ර නැවතුම්පළක් ලෙස සංවර්ධනය කිරීමට නියමිත සැලසුම් බලප්‍රදේශයෙහි භූමි පරිභෝජන රටාව ප්‍රදේශයට ආකර්ෂණය වන දේශීය හා විදේශීය සංචාරකයන්ටත්, මඟීන්ටත්, නේවාසික ජනතාවටත් හිතකර වන ලෙස සැකසීමට අවශ්‍ය උපක්‍රම හා ව්‍යාපෘති මෙම භූමි පරිභෝජන සැලැස්ම යටතේ සලකා බලන ලදී. ඒ අනුව සැලසුම් බලප්‍රදේශයෙහි පවතින සංවේදී ස්වභාවික පරිසරයද සුරකිමින් ප්‍රදේශයේ භූමි පරිහරණයන් පහත පරිදි ව්‍යාප්ත කරන ලදී.

මෙම සැලසුම් බලප්‍රදේශයේ බටහිර සීමාව ඉන්දියන් සාගරය මඟින් සීමා වීමත් ආසන්නව කළුගං මෝය, කළුතර බෝධිය පිහිටීමත් නිසා දේශීය, විදේශීය සංචාරකයින් විශාල ප්‍රමාණයක් ආකර්ෂණය වීමට එය රුකුලක් වන අතර මෙම පිහිටීම ප්‍රදේශයට අනන්‍ය ලක්ෂණ පෙන්නුම් කරයි. මෙම අනන්‍ය ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් හා මධ්‍ය වාණිජ කේන්ද්‍රය සමඟ ඇති සම්බන්ධතා වැඩි දියුණු කරමින් එම ප්‍රදේශය පූජනීය කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරන ලදී.

හරස්කඩ රූප අංක 6.2 ට අනුව කැලිඩෝ වෙරළ තීරය සමඟ ගමන් ආරම්භ කරන්නා වූ නිරීක්ෂකයාට ස්වභාවික ගංතීරයත් ඒ ආසන්නයෙන්ම පූජනීය කළුතර බෝධි පරිශ්‍රයත් හඳුනාගත හැකිවේ. එමෙන්ම ඉන්පසු ඉහළ ඝනත්ව වාණිජ කලාපයත් හඳුනාගත හැකි අතර එහි ගොඩනැගිලි උස කළුතර බෝධියේ සිට මීටර් 300 ක වපසරියක් තුළ උස පාලනය කිරීමෙන් භූමි ප්‍රදේශය තුළ කළුතර චෛත්‍යට වඩා අඩු උස මට්ටමක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. මෙම කලාපයට පසුව මධ්‍යස්ථ ඝනත්ව වාණිජ කලාපය I ත්, තෙත් බිම් ආරක්ෂණ කලාපයත්, ඉහළ ඝනත්ව නේවාසික කලාපයත්, තෙත් බිම් ආරක්ෂණ කලාපයත්, එමෙන්ම නැවතත් ඉහළ ඝනත්ව නේවාසික කලාපයත්, නැවතත් ඉහළ ඝනත්ව සෞඛ්‍ය ප්‍රවර්ධන කලාපයත් හඳුනාගත හැකිවේ. මෙහිදී විවිධ ඝනත්වයන්ගෙන් හා ක්‍රියාකාරකම් වලින් යුක්ත කලාප ලෙස මෙම කලාප සංවර්ධනය කිරීමට යෝජිත අතර එය පහත පරිදි හඳුනාගත හැකි වේ.




*රූපය 6.2 : හරස් පැතිකඩ 1 (A–A)*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

සැළකිය යුතු මට්ටමක විවිධත්වයෙන් යුතු නාගරික භූමි භාවිතයන් ඇති කිරීම සඳහා කලාපීයකරණ සංගුණකය (Zoning Factor) හා භූමි ආවරණය (Plot Coverage) වැනි නිතී රෙගුලාසි උපාය මාර්ගයක් වශයෙන් හඳුන්වා දී ඇත. මෙම නීති රෙගුලාසි භාවිතය තුළින් විවිධ ඝනත්ව භූමි භාවිතයන් ඇති කිරීමට යෝජනා කර ඇත. ඒ අනුව සැලසුම් බලප්‍රදේශය බටහිර සීමාව මුළුමනින්ම සාගරයෙන් සීමා වීමේ ප්‍රයෝජනය සලකමින් ටැංජරීන් හෝටල් ප්‍රදේශයේ සිට කැලිඩෝ වෙරළ දෙසට ප්‍රදේශය ඉහළ ඝනත්ව භූමි ආවරණය වැඩි ඉහළ ඝනත්ව සංචාරක කලාපය I ලෙස හඳුනාගෙන ඇති අතර ඉන් අනතුරුව මධ්‍යස්ථ ඝනත්ව වාණිජ කලාපය I ලෙසත් හඳුනාගත් අතර, නමුත් එහිදී කළුගඟ පිහිටීම හේතුවෙන් එහි රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කර ගඟ දෙපස ඇති දර්ශනය සැමට ලබාගත හැකි වන අයුරින් ගොඩනැගිලි වල උසද උපායමාර්ගිකව පවත්වා ගනිමින් වන ඉහළ ඝනත්ව නේවාසික කලාපයත්, ඉන් අනතුරුව පවතින කලාපය කළුගඟේ ජල පිටාර ගැලීම හේතුවෙන් අඩු ඝනත්ව නේවාසික කලාපයක් ලෙසද සංවර්ධනය වන අතර එයද නිරීක්ෂකයාට හඳුනාගත හැකි වේ. මෙම සංවර්ධන කලාපයන් රූපය 6.3 හි දැක්වෙන හරස් පැතිකඩ අනුව හඳුනාගත හැකි වේ.




*රූපය 6.3 : හරස් පැතිකඩ 2 (B–B)*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

ජාතික මට්ටමේ ආයතන වන පස්දුන් රට ගුරු අභ්‍යාස විද්‍යාලය, හෙද විදුහල, පොලිස් අභ්‍යාස විද්‍යාලය, විශේෂ කාර්ය බලකා පුහුණු අභ්‍යාස විද්‍යාලය,විවෘත විශ්ව විද්‍යාල දිස්ත්‍රික් ශාඛාව ප්‍රදේශය තුළ පිහිටීම හේතුවෙන් ප්‍රදේශයට ලැබෙන ආකර්ෂණය ඉහළය. ඒ අතරම කටුකුරුන්ද අභ්‍යන්තර ගුවන්තොටුපළ නිසාද ප්‍රදේශයට ලැබෙන ආකර්ෂණය ඉහළය. මන්ද එය ගුවන් ගමන් කටයුතු වලට අමතරව ප්‍රේක්ෂක ජනතාවගේ වැඩි ජනාදරය දිනාගත් රිය ධාවන පථයක් ලෙස ද යොදාගන්නා අතර එය ප්‍රදේශයට ශක්තියක් ද වේ.

ඒ අනුව මෙම අභ්‍යන්තර ගුවන්තොටුපළ අවට ප්‍රදේශය ඉහළ ඝනත්ව උස පාලිත නේවාසික කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට ද යෝජිතය. මෙම ප්‍රදේශයේ සංවර්ධනය ද ඇතුළත් වන හරස් පැතිකඩ සහිත කලාපය පිළිබඳව සලකා බැලීමේදී පළමුවෙන්ම නිරීක්ෂකයාට කළු ගඟේ කලපු ප්‍රදේශයෙන් ආරම්භය හඳුනාගත හැකි අතර, දෙවනුව මධ්‍යස්ථ ඝනත්ව වාණිජ කලාපය I, ඉන්පසුව ඉහළ ඝනත්ව උස පාලිත නේවාසික කලාපය හඳුනාගත හැකි වේ. මෙම කලාපයන්ගේ හරස්කඩ රූපය 6.4 හි දක්වා ඇත.




*රූපය 6.4 : හරස් පැතිකඩ 3 (C–C)*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

මොරොන්තුඩුව ප්‍රදේශය, නේවාසික න්‍යෂ්ටියක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කර ඇත. මෙම මොරොන්තුඩුව ප්‍රදේශය වාද්දුව – මොරොන්තුඩුව, හා කළුතර – බණ්ඩාරගම මාර්ග හරහා මාර්ග සම්බන්ධතාව ලබාගන්නා අතරම ගැලනිගම දක්ෂිණ අධිවේගී අන්තර් හුවමාරු මධ්‍යස්ථානයට කි.මී.8.00 ක් වැනි ඉතා ආසන්න දුරකින් පිහිටා තිබීම ද හේතුවෙන් එයට ලැබී ඇති ඉහළ සංවර්ධන විභවතාව උපයෝගී කර ගැනීමට නියමිතය.

ඒ අනුව මෙහිදී මොරොන්තුඩුව නේවාසික සංවර්ධන කලාපය සහිත හරස්කඩ පිළිබඳ අවධානය යොමු කිරීමේදී පළමුවෙන්ම නිරීක්ෂකයාට සාගරය මූලිකකර ගත් ඉහළ ඝනත්ව සංචාරක කලාපය II ත්, මධ්‍යස්ථ ඝනත්ව වාණිජ කලාපය I ත්, තෙත්බිම් ආරක්ෂණ කලාපයත්, මධ්‍යස්ථ ඝනත්ව නේවාසික කලාපයත්, අඩු ඝනත්ව නේවාසික කලාපයත්, අවසාන වශයෙන් බොල්ගොඩ පාරිසරික හිතකාමී අඩු ඝනත්ව සංචාරක කලාපයත් හඳුනාගත හැකිවේ. ඒ අනුව රට අදාළ හරස් පැතිකඩ රූපය 6.5 ට අනුව හඳුනාගත හැකි වේ.




*රූපය 6.5 : හරස් පැතිකඩ 4 (D–D)*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

ඒ අනුව මෙම පරිච්ඡේදය මඟින් සැලසුම් බලප්‍රදේශය තුළ සම්පූර්ණ අනාගත නාගරික වින්‍යාස හා භූමි පරිභෝජන රටාව පිළිබඳව මූලික පැහැදිලි කිරීමක් සිදු කෙරෙන අතර එය සිතියම 6.1 මඟින් දක්වා ඇත.

එමඟින් සැලසුම් බලප්‍රදේශය තුළ ව්‍යාප්ත කරන විවිධ ක්‍රියාකාරකම්, නාගරික වින්‍යාසයන් හා ආර්ථික සංවර්ධනයන්ගේ සම්පිණ්ඩනයක් වන යෝජිත භූමි පරිභෝජන සැලැස්ම තුළින් නිරිතදිග වෙරළ තීරයේ හොඳම නැවතුම්පළ ලෙස කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය සැලසුම් කිරීමට නියමිතය.




බස්නාහිර පළාත් අංශය | කළුතර සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

**සිතියම 6.1 :** *යෝජිත භූමි පරිහරණ සැලැස්ම (2030)* **මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

# 6.3. අපරව්‍යුහ පහසුකම් සංවර්ධන කිරීමේ උපායමාර්ගික සැලැස්ම

කළුතර සැලසුම් බලප්‍රදේශයේ අපේක්ෂිත නේවාසික ජනගහනය සඳහා මෙන්ම සංසරණ ජනගහනය සඳහාත් අවශ්‍ය සියළුම සමාජීය පහසුකම්, භෞතික හා අපරව්‍යුහ පහසුකම් ලබාදීම පිළිබඳව මෙහිදී සවිස්තරාත්මකව දක්වා ඇත.

## 6.3.1. සේවා කළමනාකරණ සැලැස්ම

සැලසුම් බලප්‍රදේශයට අදාළ සේවා පහසුකම් පිළිබඳව සලකා බැලීමේදී සෞඛ්‍ය පහසුකම්, රෝහල් පහසුකම් මෙන්ම අධ්‍යාපන පහසුකම් පිළිබඳව ද හඳුනා ගැනීම වැදගත් වේ.

### 6.3.1.1. සෞඛ්‍ය පහසුකම්

කළුතර සැලසුම් බලප්‍රදේශයේ මේ වන විටත් සෞඛ්‍ය පහසුකම් අතින් ඉහළ ස්ථානයක පවතින අතර කළුතර මහ රෝහල කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම රෝහලයි. මේ වන විටත් දිනකට රෝගීන් 1900 ක් පමණ මෙහි සේවය ලබාගන්නා අතර නේවාසික රෝගීන් , රෝගීන් බැලීම සඳහා පැමිණෙන පිරිස්, සායන සඳහා පැමිණෙන රෝගීන් යන සියල්ලන්ගේ එකතුව දිනකට 5767 ක් පමණ වේ. එමෙන්ම මේ වන විටත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය තුළ සායන හා ඒ යටතේ උප සායන රැසක්ද පවතී. එමෙන්ම පෞද්ගලික රෝහල් දෙකක්ද (Philip, Family Care) පවතින අතර කළුතර මහ රෝහල යටතේ පාලනය වන බෙහෙත් සාප්පු 02 ක්ද, අනෙකුත් බෙහෙත් සාප්පු 05 ක් ද පවතී. කළුතර හෙද විදුහල හෙවත් ස්වස්තා ආයතනය ද කළුතර සැලසුම් බලප්‍රදේශයේ පිහිටා ඇත. ඉදි කරමින් පවතින සෞඛ්‍ය ආයතන අතර ළමා හා මාතෘ රෝහල (ඇඳන් 400) ප්‍රමුඛස්ථානයක් ගනී. ඉදිකිරීමට යෝජිත සෞඛ්‍ය ආයතන අතර ඇස, කන, නාසය පිළිබඳ රෝහල හඳුනාගත හැකිය.

ඒ අනුව සලකා බැලීමේදී මේ වන විටත් කළුතර සැලසුම් බලප්‍රදේශය තුළ වර්තමාන ජනගහනය සඳහා මෙන්ම අනාගතයේදී වැඩිවන ජනගහනය සඳහාද ප්‍රමාණවත් සෞඛ්‍ය සේවා සපයන ස්ථාන පවතින බව හඳුනාගත හැකිවේ.

එමෙන්ම සමස්ත සැලැසුම් බලප්‍රදේශයේ පවත්නා රෝහල් පිළිබඳ විස්තර සහ සේවාවන් ලබා ගැනීමට මිනිසුන් ගමන් කිරීමට කැමති උපරිම දුර වන (walkability distance) මීටර් 500 ද සලකමින් පවත්නා සෞඛ්‍ය සේවා ප්‍රමාණවත්ද යන්න විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව සමස්ත සැලැසුම් බලප්‍රදේශයටම සෞඛ්‍ය අවශ්‍යතා සපුරාගත හැකි පරිදි සෞඛ්‍ය සේවා ප්‍රමාණවත්ව විසිරී පවතින බව හඳුනාගෙන ඇත. එය ඇමුණුම් අංක 13 ට අනුව හඳුනාගත හැකි වේ.

එබැවින් තවදුරටත් සෞඛ්‍ය සේවා සපයන ස්ථාන වැඩි කිරීමේ අවශ්‍යතාවයක් නොපවතින අතර පවත්නා සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

### 6.3.1.2. අධ්‍යාපන පහසුකම්

කළුතර සැලසුම් බලප්‍රදේශයේ අධ්‍යාපන පහසුකම් පිළිබඳව සැලකීමේදී කළුතර අධ්‍යාපන කොට්ඨාසයට අයත් පාසල් පිළිබඳව හඳුනා ගැනීම වැදගත් ය. එහිදී 1AB පාසල් 08 ක් ද, 1C පාසල් 06 ක්ද, T2 (6-11) පාසල් 17 ක්ද සහ T3 පාසල් 03 ක් ද පවතී. එමෙන්ම විශේෂ අධ්‍යාපන අංශ ඇතුළත් පාසල් 03 ක්ද (තිස්ස විද්‍යාලය, දෙල්දූව මහා විද්‍යාලය, වේලාපුර මධ්‍ය විද්‍යාලය) බලප්‍රදේශය තුළ පවතී.

මෙහිදී ද සමස්ත සැලැසුම් බලප්‍රදේශයේ පවත්නා පාසල් පිළිබඳ විස්තර සහ සේවාවන් ලබා ගැනීමට මිනිසුන් ගමන් කිරීමට කැමති උපරිම දුර වන (walkability distance) මීටර් 500 ද සලකමින් පවත්නා අධ්‍යාපන පහසුකම් ප්‍රමාණවත්ද යන්න විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව සමස්ත සැලැසුම් බලප්‍රදේශයටම අධ්‍යාපනික අවශ්‍යතා සපුරාගත හැකි පරිදි අධ්‍යාපනික සේවා ප්‍රමාණවත්ව විසිරී පවතින බව හඳුනාගෙන ඇත. ඒවායේ ව්‍යාප්තිය ඇමුණුම් අංක 14 ට අනුව හඳුනාගත හැකි වේ.

පවත්නා අධ්‍යාපන පහසුකම් වර්තමානයේ අධ්‍යාපනික අවශ්‍යතා සපුරනවාක් සමඟ අනාගතයේදී ඇති විය හැකි අධ්‍යාපන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ද ප්‍රමාණවත් වේ. එබැවින් නවදුරටත් පාසල් ඉදිකිරීමට වඩා පවත්නා පාසල්වල පහසුකම් හා ඒ හා සැබැඳි යටිතල පහසුකම් වර්ධනය කරමින් ඉදිරි අනාගතය සඳහා පවත්වාගෙන යාම යෝග්‍ය වේ.

## 6.3.2. මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම

ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස කළුතර නගරය දිස්ත්‍රික් මට්ටමින් වැදගත් සේවාවක් සිදුකරනු ලබයි. විශේෂයෙන්ම කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ පමණක් නොව මතුගම, වලල්ලාවිට වැනි ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයන්හි සිට කොළඹ නගරය කරා දිනපතා පොදු ප්‍රවාහන ඔස්සේ ගමන් කරනු ලබන මඟීන් ප්‍රධාන වශයෙන් ගමන් කරනු ලබන්නේ කළුතර නගරය හරහාය. මෙම ආකර්ෂණය සඳහා බලපාන ප්‍රධාන සාධකය වනුයේ කළුතර නගරය කොළඹ – ගාල්ල – වැල්ලවාය යන මාර්ගයෙන් (A2) හා මරදාන – මාතර දුම්රිය මාර්ගය ඔස්සේ ප්‍රවාහන පහසුකම් සැලසී තිබීමය. විශේෂයෙන්ම දකුණු කළුතර දුම්රිය ස්ථානය සීඝ්‍රගාමී දුම්රිය නැවතුම්පළක් වීම මෙම ආකර්ෂණය තීව්‍ර වීමට හේතු වේ.

කළුතර නගරයේ ප්‍රවාහන පහසුකම් පිළිබඳ සලකා බැලීමේදී කළුතර බස් නැවතුම්පළත් කළුතර දකුණ දුම්රිය ස්ථානයත් එක්ව පිහිටා තිබීම ප්‍රවාහන පහසුකම් ලබාගන්නා මඟීන්ට විශාල පහසුවක් වී තිබේ. එය වර්තමානය වනවිට ප්‍රවාහන අභිමුඛ සංවර්ධන මධ්‍යස්ථානයක් (TOD) ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.

කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය සඳහා සකස් කරනු ලබන මෙම සැලැස්ම තුළින් කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ හඳුනාගත් මාර්ග සංවර්ධනය කිරීම තුළින් මෙම සැලසුමෙහි හඳුනාගත් ආකාරයට සනත්ව කලාප වෙත ළඟා වීමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දීමට අපේක්‍ෂා කෙරේ. තවද මේ තුළින් නිවාස සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම යටතේ හඳුනාගත් නේවාසික කලාප හා කළුතර නගරය අතර සෘජු සම්බන්ධතාවය වර්ධනය වීම ද සිදුවේ. තවද යෝජිත ප්‍රවාහන සැලැස්ම යටතේ කළුතර නගරය තුළ මඟී මංතීරු සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

පළමු වෙළුමෙහි හඳුනාගත් අයුරින් කළුතර නගරයට දිනකට 80,000 අධික සංක්‍රමණික ජනගහනයක් දිනපතා පැමිණේ. මෙම ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් රැඳෙනුයේ කළුතර නගරයේ ඔරලෝසු කණුවෙන් ඇරඹෙන නගර මධ්‍යයේ සිට ගාලු පාරේ තුම්මන් හන්දිය අතර සීමාව තුළය. ඒ සිය ප්‍රවාහන, පරිපාලන හා වාණිජ අවශතා ඉටුකරගැනීම සඳහාය. විශ්ලේෂණයන් හි හඳුනාගත් පරිදි 2030 වර්ෂය වනවිට අපේක්ෂිත දෛනික සංසරණ ජනගහනයට පහසුකම් සැලසෙන අයුරින් කළුතර නගර මධ්‍ය තුළ පදික වේදිකා සංවර්ධනය කිරීමට ද මෙම සැලැස්ම යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතය. යෝජිත ප්‍රවාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුළින් පහත සඳහන් අරමුණු වෙත ළඟාවීම අපේක්ෂා කෙරේ.

1. *නගර මධ්‍ය ආශ්‍රිත ප්‍රදේශය තුළ හඳුනා ගන්නා ලද මාර්ග (කි.මී. 2.3ක ප්‍රමාණයක්) පදිකයින්ට ආරක්ෂිතව හා සුව පහසු ලෙස ඇවිදීමට හැකිවන පරිදි සකස් කිරීම.*
2. *හඳුනාගත් නේවාසික මංසල් (Residential Nodes) 02 ක්ද, සෞඛ්‍ය සේවා සපයන මංසල් 01 ක්ද හා අසල්වැසි මංසල් (Neighborhood Nodes) 06 ක්ද වශයෙන් අවශ්‍ය නාගරික සේවාවාන් (Urban Services) හා ප්‍රවාහන පහසුකම් සපයමින් විවිධ සණත්වයෙන් යුතු නේවාසික කලාප 04ක් 2030 වර්ෂය වන විට ඇති කිරීම.*

ඒ අනුව මෙම අරමුණු වෙත ළඟාවීම සඳහා ප්‍රවාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. යෝජිත ප්‍රවාහන සැලැස්ම තුළින් ප්‍රධාන වශයෙන් නේවාසික සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම (Residential Plan) යටතේ හඳුනාගත් නේවාසික මූලස්ථානයන් හා ප්‍රධාන නාගරික මධ්‍යස්ථානය ලෙස හඳුනාගත් දකුණු කළුතර අතර ඇති අන්තර් සම්බන්ධතාවය වර්ධනය කිරීම අපේක්ෂා කරන්නා සේම කළුතර නගරය හා පළාත් මට්ටමේ (Regional Level) අනෙකුත් නගර අතර පවතින අන්තර් සම්බන්ධතාවය වර්ධනය කරගැනීම ද අපේක්ෂා කෙරේ. ඒ අනුව යෝජිත මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ.

1. *මාර්ග සංවර්ධන සැලැස්ම*
2. *ප්‍රවාහන සංවර්ධන සැලැස්ම*

## *01. මාර්ග සංවර්ධන සැලැස්ම*

2019 – 2030 කළුතර සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගත් මාර්ග සංවර්ධන සැලැස්ම හරහා කළුතර සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගත් අවකාශීය සැලැස්ම (Spatial form) ගොඩනඟා ගැනීමට හැකි වන පරිදි සකසා ඇත. ඒ අනුව වම් පසින් ඉන්දියන් සාගරයත් දකුණින් කළුතර - පලාතොට පාර (ගඟබඩ පාර) සිට කළුතර නාගොඩ හන්දිය දක්වා ඇති මාර්ගයත් අතර මායිම් වූ කොටස සංවර්ධන ප්‍රවර්ධන (Development promotional) කලාපය ලෙස හඳුනාගෙන ඇත. එතැන් සිට ගාලුපාර, කළුතර– බණ්ඩාරගම පාර, කළුතර– හොරණ පාර, කළුතර– මතුගම පාර ප්‍රධාන සංවර්ධන ධාරාවන් (Development Corridors) ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව ඉහළ සනත්ව වාණිජ කලාපය හා ප්‍රධාන සංවර්ධන ධාරාවන් ප්‍රවර්ධනය වන ආකාරයටත් නේවාසික සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපාය-මාර්ගික සැලැස්ම යටතේ හඳුනාගත් කලාප හා නගර මධ්‍ය අතර සබඳතා වර්ධනය වන ආකාරයටත් මාර්ග සංවර්ධන කටයුතු සිදු කිරීමට නියමිතය. මාර්ග සංවර්ධනය යටතේ සිදු කිරීමට නියමිත ප්‍රධාන ක්‍රියාමාර්ගයන් 03 කි.

I. *හඳුනාගත් මාර්ගයන් පුළුල් කිරීම.*
*මේ යටතේ හඳුනාගත් මාර්ගයන්හි රථවාහන මංතීරු සංඛ්‍යාව වැඩි කිරීම හා පහසුකම් සැලසීමේ මංතීරු හඳුන්වා දීම.*

II. *හඳුනාගත් මාර්ගයන් අතර සම්බන්ධතා ඇති කිරීම.*
*විශ්ලේෂණ සිදු කිරීමේදී (විශේෂයෙන්ම 'space syntax' විශ්ලේෂණයේ දී) හඳුනාගත් ආකාරයට ඇතැම් මාර්ග අතර සම්බන්ධතා ඇති කිරීම තුළින් (මේ වනවිට සම්බන්ධ වී නොමැති මාර්ග) අවකාශීය සම්බන්ධතාව (spatial configuration) වර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. මෙම උපාය මාර්ගය විශේෂයෙන්ම සංවර්ධන ප්‍රවර්ධන කලාප තුළ සිදු කිරීමට නියමිතය.*

III. *හඳුනාගත් මාර්ගයන්හි පදික මංතීරු ඇති කිරීම.*
*මාර්ග සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගත් මාර්ගයන්හි මඟී මංතිරු සංවර්ධනය කිරීමට නියමිතය. මේ යටතේ නගර මධ්‍ය ලෙස හඳුනාගත් කොටස තුළ මඟී මංතීරු සංවර්ධනය කිරීමට නියමිතය.*

මෙම සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගත් සංවර්ධනය කළ යුතු මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම යටතේ විස්තර කර තිබේ.

## *02. ප්‍රවාහන සංවර්ධන සැලැස්ම*

ප්‍රවාහන සැලැස්ම තුළින් කළුතර නගරයත්, අනෙකුත් හඳුනාගත් නේවාසික මධ්‍යස්ථානයන් අතරත් (Residential Nodes) අන්තර් සම්බන්ධතාවය වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සැලැස්ම යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රධාන ක්‍රියාමාර්ගයන් දෙකකි

I. *මගී බස් රථ පර්යන්ත සංවර්ධනය*
II. *නව මගී බස් රථ මාර්ග හඳුන්වා දීම*

මේ අනුව නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම යටතේ හඳුනාගත් නේවාසික කලාප හා කළුතර නගරය අතර සම්බන්ධතාවය වර්ධනය වනසේ මගී බස් රථ සේවාවන් වර්ධනය කිරීමත් කළුතර නගරය හා අනෙකුත් නේවාසික කලාප තුළ පවතින මගී බස් පර්යන්තයන් සංවර්ධනය කිරීමටත් අපේක්ෂා කෙරේ. තවද නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම යටතේ හඳුනාගත් මංසන්ධි සංවර්ධන ව්‍යාපෘති තුළින් ද මෙම මගී බස් පර්යන්තයන් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

එසේම, දැනට පවතින බස් ගමනාගමන මාර්ගයන්ට අමතරව නව බස් රථ මාර්ග සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත. මෙසේ නව බස් රථ මාර්ග හඳුන්වා දීම තුළින් නේවාසික සැලසුමෙහි හඳුනාගත් නේවාසික කලාප හා කළුතර නගරය (දකුණු කළුතර) අතර අන්තර් සම්බන්ධතාවය වර්ධනය වීම සිදු වේ. මෙසේ හඳුනාගත් නව බස් රථ මාර්ග පහත පරිදි වේ.

- *කළුතර – නෑබඩ බස් රථ සේවාවක් හිල් වීදිය ඔස්සේ*
  *(දැනට පවතින කළුතර – නෑබඩ බස් රථ සේවාවට අමතරව)*
- *කළුතර – දූව පන්සල හන්දිය බස් රථ සේවාව*
  *(කළුතර නගරයේ සිට දූව පන්සල මාර්ගය ඔස්සේ දූව පන්සල පාර හන්දිය දක්වා)*
- *කළුතර – පැල්පොල යෝජිත අන්තර් හුවමාරු මධ්‍යස්ථානය දක්වා*

## 6.3.3. ජල සැපයුම් සැලැස්ම

කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් පුරෝකථනය කරන ලද ජනගහනය 196,556 කි. එම පුරෝකථනය කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා යොදාගත් පුරෝකථනය කරන ලද ජනගහනයට ආසන්න වේ. (නාගරික සංවර්ධන අධිකාරියේ පුරෝකථනය 199,000)

තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අනුව 2030 වර්ෂය වනවිට 93% ක් කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය සඳහා ජල පහසුකම් ලබාදීමට හැකියාව පවතී. ඉතිරි 7% අනෙකුත් ජල සම්පාදන මූලාශ්‍රයන් වන ළිං හා නල ළිං මඟින් සපුරා ගැනීමට හැක. සිතියම 6.2 මඟින් හඳුනාගත හැකි පරිදි විවිධ ජල සම්පාදන මූලාශ්‍රයන් හරහා සැලසුම් බලප්‍රදේශයට ජල සැපයුම සිදු කරයි. නාගරික සංවර්ධන අධිකාරිය විසින් අධි ජනගහන ඝනත්ව කලාප ලෙස හඳුනාගත් ප්‍රදේශ වෙත සම්පූර්ණයෙන්ම ජල සම්පාදනය කිරීමේ හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවතී.

දැනට කළුතර ප්‍රදේශයේ පානීය ජලය හා සම්බන්ධව පවතින ප්‍රධාන ගැටළුවක් වනුයේ, වර්ෂයේ මාස කිහිපයක් ප්‍රධාන පානීය ජල මූලාශ්‍රය වන කළු ගඟට ලවණ ජලය (මුහුදු වතුර) එක්වීමයි. එය අරමුණ 02 හි සවිස්තරාත්මක විශ්ලේෂණයේ දුර්වලතා යටතේ හඳුනාගෙන ඇත. එයට විසඳුමක් ලෙස ලවණ ජල බාධකයක් ඉදිකිරීම සඳහා වන ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යයනයක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් එක්ව ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ. මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු පාරිසරික කළමනාකරණ සංවර්ධන සැලැස්ම යටතේ විස්තර කර ඇත.




පානීය ජල මූලාශ්‍ර (2018)
කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

0 0.4 0.8 1.6 2.4 3.2 කි.මී

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

බස්නාහිර පළාත් අංශය | කළුතර සංවර්ධන සැලැස්ම (2019 - 2030) | සැකසුම : කළුතර දිස්ත්‍රික් කාර්යාලය

*සිතියම 6.2 : සැලසුම් බලප්‍රදේශයේ ජල සම්පාදන මූලාශ්‍රයන් (2018)* *මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## 6.3.4. විදුලි සැපයුම් සැලැස්ම

කළුතර ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශය තුළ විදුලි සැපයුම ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි පෞද්ගලික සමාගම යන ආයතන ද්විත්ත්වය විසින්ම සිදු කරනු ලැබේ. ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් කළුතර නගරාශ්‍රිත ප්‍රදේශයට විදුලි බලය සපයන අතර අනෙකුත් ප්‍රදේශ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය සැපයේ. එය රූපය 6.6 මඟින් පෙන්නුම් කරන අතර, එයට අනුව කළුතර ප්‍රාදේශිය ලේකම් බලප්‍රදේශය සඳහාම 100% විදුලි සැපයුමක් සිදුවේ. එසේම 2030 වර්ෂය වනවිට පුරෝකථනය කරන ලද 199,000 ජනගහනයට අදාළ විදුලි පරිභෝජන අවශ්‍යතා සැපයීමේ ශක්‍යතාව මෙම ආයතන ද්විත්ත්වය සතුව පවතී.




*රූපය 6.6 : ශ්‍රී ලංකාව තුළ ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් විදුලිය සැපයුම් සිදුකරන ප්‍රදේශ*
*මූලාශ්‍රය : ශ්‍රී ලංකාව ලංකා විදුලිබල මණ්ඩලය (2018)*

## 6.3.5. මළ හා අපජල කළමනාකරණ සැලැස්ම

### 6.3.5.1. අප ජල කළමනාකරණ සැලැස්ම

කළුතර නගරය ආශ්‍රිතව පවතින සංවර්ධනයේ සීඝ්‍රතාවය හේතුකොටගෙන මේ වනවිට කළුතර නගරය හා ඒ ආශ්‍රිතව ඉඩම් අනුබෙදුම් සිදුකිරීමේ ප්‍රවණතාවය ඉතා ඉහළ අගයක් ගනී. තවද කළුතර දකුණ හා කළුතර උතුර ආශ්‍රිතව පවතින ගොඩනැගිලි අධි ඝනත්වය හේතුකොට ගෙන වර්තමානයේ දී භාවිතා වන මළපවාහන ක්‍රමය වන 'වල ක්‍රමය' තවදුරටත් සෞඛ්‍ය ආරක්ෂිත නොවේ. ගොඩනැගිලි ඝනත්ව අනුපාතය හේතු කොටගෙන එම කලාපය තුළ මළපවාහනය සඳහා "පූතික වල" ඉදිකිරීම ද ප්‍රායෝගිකව අපහසු වන තත්වයක් උදාවී ඇත. ඒ අනුව සිතියම 6.3 න් හඳුනාගත් පරිදි කළුතර නගර සභා සීමාව හා කළුතර ප්‍රාදේශීය සභා සීමාවේ තෝරාගත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ කිහිපයක් ඇතුළත් වන සේ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් මළ හා අපජල කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය සඳහා අයත්වන ග්‍රාම නිලධාරී කොට්ඨාශ පහත පරිදි වේ.

1. කළුතර උතුර
2. දේශාස්ත්‍ර
3. දේශාස්ත්‍ර බටහිර
4. විද්‍යාසාර
5. තොටුපල
6. කළුතර දකුණ
7. කළුතර දකුණ A
8. වේලාපුර
9. මහවත්ත
10. කුඩා හීනටියන්ගල
11. කුරුදුවත්ත
12. අක්කරගොඩ
13. නාගොඩ බටහිර
14. වෙට්ටුමකඩ
15. කලපුව
16. කටුකුරුන්ද
17. පොහද්දරමුල්ල බටහිර
18. පොහද්දරමුල්ල නැගෙනහිර
19. පොතුපිටිය උතුර
20. පොතුපිටිය දකුණ
21. පොතුපිටිය බටහිර
22. මැද පොතුපිටිය
23. කුඩා වස්කඩුව උතුර
24. කුඩා වස්කඩුව බටහිර
25. කුඩා වස්කඩුව නැගෙනහිර
26. කුඩා වස්කඩුව දකුණ
27. මහ වස්කඩුව උතුර
28. දෙදියවෙල
29. මහ වස්කඩුව දකුණ
30. විලේගොඩ උතුර
31. මල්වත්ත
32. බෝට්නික්වත්ත
33. ජාවත්ත
34. එතනමඩල
35. පලාතොට
36. විලේගොඩ දකුණ
37. ඉලුක්වත්ත
38. ඇටවිල
39. වත්තමුල්ල
40. මහ හීනටියන්ගල
41. අලුබෝගහලන්ද
42. කජුදුවත්ත
43. කළමුල්ල උතුර
44. කළමුල්ල නැගෙනහිර
45. කළමුල්ල දකුණ
46. එතනමඩල නැගෙනහිර
47. එතනමඩල බටහිර
48. උස්වත්ත




*__සිතියම 6.3 :__ අපජල කළමණාකරණ ප්‍රදේශය (2018)* *__මූලාශ්‍රය :__ නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

# 6.3.6. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

## ඝන අපද්‍රව්‍ය යනු,

ගෘහස්ත කටයුතු, වෙළඳ හා වාණිජ කටයුතු, කාර්මික හා කෘෂිකාර්මික කටයුතු වලදී මෙන්ම අනෙකුත් පොදු කටයුතු වලදී ජනිත වන ද්‍රවමය නොවන ද්‍රව්‍යයන්, ඝණ අපද්‍රව්‍ය ලෙස සළකනු ලැබේ. ආහාරමය අපද්‍රව්‍ය, ඇසුරුම් වශයෙන් ඉවත් කරන කඩදාසි, ලෝහ, ප්ලාස්ටික්, වීදුරු ආදිය, ඉවතලන රෙදි, ගෙවත්තේ ඇතිවන අපද්‍රව්‍ය, ඉදිකිරීම් වලදී ඇතිවන අපද්‍රව්‍ය, කාර්මාන්ත ශාලාවලින් ඉවතලන ද්‍රව්‍ය යනාදී විවිධ කොටස් වලින් ඝන අපද්‍රව්‍ය සංයුක්ත වී ඇත. ඝන අපද්‍රව්‍ය ජනනය, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය, පරිසරයට හිතකර ලෙස වෙනත් ආකාරයකට සකස් කර අවසාන බැහැරලීම යන කරුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි අන්තර්ගත ක්‍රියාවලීන් වේ.

## කළුතර සැලසුම් බලප්‍රදේශයේ වර්තමාන තත්ත්වය

කළුතර සැලසුම් බලප්‍රදේශය සඳහා කළුතර නගර සභා බලප්‍රදේශය සහ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය අයත් වේ. රූප සටහන 6.7න් දැක්වෙන පරිදි කළුතර සැලසුම් බලප්‍රදේශය තුළ දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 30 ක් පමණ වේ.

පළාත්  පාලන ප්‍රදේශ ලෙස දෛනික ඝන අපද්‍රවය ජනනය වීම (ටොන්)




*රූපය 6.7 : දෛනික ඝන අපද්‍රව්‍ය ජනනය වීම (2018)*
*මූලාශ්‍රය : කළුතර නගර සභාව හා ප්‍රාදේශීය සභාව (2018)*

එයින් කළුතර නගර සභා බලප්‍රදේශය තුළ දිරන ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය  ටොන් 21 ක් සහ නොදිරන ඝන අපද්‍රව්‍ය ටොන් 3 පමණ වේ.

කළුතර ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 7 ක් පමණ වන අතර ඉන් ටොන් 5.5 ක්  දිරන ඝන අපද්‍රව්‍ය සහ ටොන් 1.5 ක් නොදිරන ඝන අපද්‍රව්‍ය  වේ. එය රූප සටහන 6.8ට අනුව පැහැදිලි වේ.

වර්ගය අනුව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය (ටොන්)




*රූපය 6.8 : ජනනය වන ඝන අපද්‍රව්‍ය වර්ග*
*මූලාශ්‍රය : කළුතර ප්‍රාදේශීය සභාව (2018)*

ප්‍රදේශයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය පොහොරවත්ත කසළ අංගනය වෙත බැහැර කිරීම සිදු කරනු ලබයි. කළුතර නගර සභාවට අයත් අක්කර 06 ක පමණ භූමියක බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් මෙම පොහොරවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබයි. 2011 වර්ෂයේ කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ආරම්භ කර ඇති අතර ඉන් දිනකට ටොන් 05 – 06 අතර ප්‍රමාණයක් කාබනික පොහොර නිෂ්පාදනය කරන අතර මසකට ටොන් 150 - 160 ක් පමණ නිෂ්පාදන කටයුතු සිදු කරයි.

කාබනික පොහොර කිලෝ එකක් රුපියල් 11 ක් වැනි මුදලකට අළෙවි කරනු ලබන අතර එමඟින් මාසිකව රුපියල් ලක්ෂ 08 පමණ ආදායමක් ලබගනී. පොහොරවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය තුළ ජීව වායු ඒකකයක් ස්ථාපනය කර ඇති අතර ඉන් නිපදවන ජීව වායුව මධ්‍යස්ථානය තුළ අවශ්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම සිදු කරයි.

වර්තමානයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සිදු කරන පොහොරවත්ත කසළ අංගනය සිතියම් අංක 6.4 මඟින් දක්වා ඇත.

2030 වසර සඳහා පුරෝකථන නේවාසික ජනගහනයට අනුව කළුතර නගර සභා බලප්‍රදේශය තුළ ජනගහන වර්ධනය ඍණ අගයක් ගන්නා බැවින් ඝන අපද්‍රව්‍ය ජනනය වීමේ අඩුවීමක් දැකිය හැකි අතර එය 2030 වසර සඳහා ටොන් 21 ක් පමණ වනු ඇත. ඒ අනුව 2030 වසරේදී සැලසුම් බලප්‍රදේශය තුළ නේවාසික ජනගහනයට අනුව ඝන අපද්‍රව්‍ය ටොන් 30 ක් පමණ ජනනය වනු ඇතැයි පුරෝකථනය කළ හැකිය.

එමෙන්ම 2030 වසර සඳහා පුරෝකථන සංක්‍රමණික ජනගහනයට අනුව 2030 වසර සඳහා නගර සභා බලප්‍රදේශය තුළ ටොන් 84 ක් පමණ සහ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ටොන් 7 ක් පමණ කැලි කසළ ප්‍රමාණයක් ජනනය වනු ඇතැයි පුරෝකථනය කළ හැකිය. ඒ අනුව කළුතර සැලසුම් බලප්‍රදේශයේ 2030 වසර සඳහා නේවාසික සහ සංක්‍රමණික ජනගහනයන්ට අනුව ඝන අපද්‍රව්‍ය ටොන් 121 ක් පමණ ජනනය වනු ඇතැයි පුරෝකථනය කළ හැකිය.

එසේ ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කරමින් සමස්ත බැහැර කිරීම අවම කිරීමට ඒ සඳහා වගකිවයුතු ආයතන වන කළුතර නගර සභාව, ප්‍රාදේශීය සභාව සහ ප්‍රදේශයේ ජනතාව සමඟ එක්ව සිදුකළ හැකි සැලසුම් සහගත ක්‍රමෝපායන් පහත දැක්වේ.

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන්

ක්‍රමෝපාය 01 – ඝන අපද්‍රව්‍ය ජනනය අවම කිරීම

I. *ගෘහස්ත, වෙළඳ, කාර්මික, ක්ෂේත්‍රයන්හී ඝන අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම, දිරීමත් කිරීම විධි ක්‍රම හඳුන්වා දීම.*

පොදු ස්ථාන හා පාසල් තුළ දැනුවත් කිරීමේ හා අධ්‍යාපනික වැඩ සටහන් සංවිධානය කර ඒ හරහා මහජනයාට කසළ කළමනාකරණය පිළිබඳ පවතින "10R" (භාවිතයෙන් වැළකී සිටීම, ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම, නැවත භාවිතා කිරීම, අලුත්වැඩියා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම, නැවත සිතීම, මතක තබා ගැනීම, නැවත නැවත ක්‍රියාත්මක කිරීම) වැනි සංකල්ප හඳුන්වා දී ඒ තුළින් ඝන අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම.

ක්‍රමෝපාය 02 – ඝන අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම වෙන් කිරීම.

I. *පළාත් පාලන ආයතන මඟින් නිවාස, වෙළඳ ආයතන සඳහා කසළ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.*

- *ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර නොකිරීම.*
- *අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩ සටහන් නිරතුරුව සංවිධානය කිරීම සහ එමඟින් වෙන් නොකරන කසළ එකතු නොකිරීමේ ක්‍රමවේදය (No Separation – No Collection) පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ ඒ අනුව ක්‍රියාත්මක වීම.*

උදා – ගෘහස්ත, ආයතනික, වෙළඳ, කාර්මික ලෙස සහ කසළ වල ස්වභාවය අනුව වර්ගීකරණය කර වෙන් වෙන්ව හඳුනාගත හැකි බඳුන් තැබීම. එනම්,

| | | | |
|---|---|---|---|
| *(අ)* | *කාබනික* | – | *කොළ පාට* |
| *(ආ)* | *කඩදාසි* | – | *නිල් පාට* |
| *(ඇ)* | *ප්ලාස්ටික්* | – | *තැඹිලි පාට* |
| *(ඈ)* | *ලෝහ* | – | *දුඹුරු පාට* |
| *(ඉ)* | *විදුරු* | – | *රතු පාට* |

ක්‍රමෝපාය 03 – කෙටි කාලීන ජෛව හායනය වන සියළුම ඝන අපද්‍රව්‍ය කාබනික පොහොර (කොම්පෝස්ට්) බවට පත් කිරීම ප්‍රවර්ධනය කිරීම හා ජනතාව ඒ සඳහා යොමු කිරීම සහ කාබනික පොහොර සඳහා ලාභදායී වෙළඳපළවල් හඳුන්වා දීම.

I. *නිවාස හා ආයතන වල ජනනය වන ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය ඒවා ජනනය වන ස්ථානයේදීම කාබනික පොහොර බවට පත් කිරීම.*

උදා : කොම්පෝස්ට් බඳුන් , වල ක්‍රමය, ජීව කොටු ආදී ක්‍රම හඳුන්වා දීම.

II. *විශාල ප්‍රමාණයෙන් ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය උත්පාදනය වන ස්ථාන සඳහා පළාත් පාලන ආයතන මඟින් පාලනය වන ස්ථානයක සරල තාක්ෂණික ක්‍රම භාවිතයෙන් කොම්පෝස්ට් නිපදවීම.*

උදා : හෝටල්, රෝහල් ආදී ස්ථාන සහ කොම්පෝස්ට් කිරීම සිදු නොකරන නිවාස ආදිය සඳහා පළාත් පාලන ආයතන මඟින් පාලනය වන ස්ථානයක සරල තාක්‍ෂණික ක්‍රම භාවිතයෙන් කොම්පෝස්ට් නිපදවීම.

III. *සෑම නිවසක්ම කොම්පෝස්ට් බඳුනක් භාවිතා කිරීම හෝ පහසු තාක්‍ෂණයක් භාවිතය මඟින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා දිරි ගැන්වීම සහ එමඟින් ගෘහස්ත කාබනික එළවළු, පළතුරු වගාව වැඩි කිරීම සහ කාබනික එළවළු වෙළඳපළ දිරිමත් කිරීම.*

ක්‍රමෝපාය 04 – රෝහල් හා රජයේ ආයතන තුළ ජීව වායු නිෂ්පාදනාගාර ස්ථාපනය කිරීම.

I. *ජෛව හායනය වන ආහාරමය ද්‍රව්‍ය, කෘෂි කාර්මික අපද්‍රව්‍ය, ජීව වායු නිෂ්පාදනය කිරීම සඳහා යොදාගත හැකි අතර, නිෂ්පාදනය වන ජීව වායුව ආහාර පිසීම, ආලෝකකරණය වැනි දේ සඳහා යොදා ගැනීම.*

ක්‍රමෝපාය 05 – ජෛව හායනය වන ආහාරමය ද්‍රව්‍ය ඌරු කොටු වලට ලබාදීමේ වැඩ පිළිවෙලක් සකස් කිරීම

I. *ජෛව හායනය වන ඉවතලන ආහාරමය ඝන අපද්‍රව්‍ය සත්ත්ව ආහාර ලෙස ඌරුකොටු සඳහා ලබාදීම.*

ක්‍රමෝපාය 06 – ජෛව හායනය නොවන (ප්‍රතිචක්‍රීකරණය කළ හැකි) ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු තාක්‍ෂණික ක්‍රම භාවිතා කිරීම.

I. *සෑම මට්ටමකම ජනතාව තුළ භාණ්ඩ නැවත භාවිතය (reuse) වැනි සංකල්ප ප්‍රවර්ධනය සඳහා ආකල්පමය වෙනසක් ඇති කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම (පාසල් හා ආයතනික මට්ටමින්)*
II. *ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඝන අපද්‍රව්‍ය (වීදුරු, කඩදාසි, ලෝහ) මිලදී ගනු ලබන ස්ථාන පිහිටුවීම, ප්‍රචලිත කිරීම සහ දිරි ගැන්වීම, වෙළඳපොල හා ව්‍යවසායකයින් වර්ධනය කිරීම.*
III. *පළාත් පාලන ආයතන මඟින් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඝන අපද්‍රව්‍ය මිලදී ගනු ලබන ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම, ඔවුන් සමඟ නිරතුරු සම්බන්ධතා පවත්වා ගැනීම සහ ඒ පිළිබඳව තොරතුරු ජනතාව වෙත ලබාදීම.*
IV. *එකතු වන කසළ අතර ඇති පොල්කටු, යකඩ, ප්ලාස්ටික්, විදුලි උපකරණ වැනි දේ සඳහා කසළ පොළ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.*

ක්‍රමෝපාය 07 – නාගරික ඝන අපද්‍රව්‍ය වෙත රෝහල් මඟින් නිකුත් කරන සායනික ඝන අපද්‍රව්‍ය එකතුවීම වැළැක්වීම සඳහා ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කිරීම.

I. *සායනික ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම අනිවාර්ය කිරීම.*
II. *සායනික ඝන අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීමට පෙර ඒවා ආසාධනය නොවන ද්‍රව්‍ය බවට පත්කිරීම අනිවාර්යය කිරීම.*
III. *සායනික ඝන අපද්‍රව්‍ය සෞඛ්‍යාරක්‍ෂිතව බැහැර කිරීම සඳහා රෝහල් තුළම ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.*

### ක්‍රමෝපාය 08 – ඝන අපද්‍රව්‍ය එකතු කිරීම සහ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම.

I. *දොරින් දොර එකතු කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.*
II. *ඝන අපද්‍රව්‍ය එකතු කරන දින සහ එම දිනවල එකතු කරනු ලබන ඝන අපද්‍රව්‍ය වර්ග (ප්ලාස්ටික්, පොල් කටු, වීදුරු ආදී ලෙස) පිළිබඳව කාල සටහන් නිවෙස් සඳහා ලබාදීම. (පළාත් පාලන ආයතනය මඟින්)*
III. *ඝන අපද්‍රව්‍ය එකතු කරනු ලබන වාහනය පැමිණීමේදී "සීනුවක්" නාද කිරීම.*
IV. *පළාත් පාලන ආයතන වලට කොම්පෝස්ට් අංගනය සඳහා අවශ්‍ය උපකරණ සහ පහසුකම් ලබාදීම.*
V. *ඝන අපද්‍රව්‍ය වර්ග සඳහා එකතු කරන වාහනයේ වෙන් කළ කොටස් තැබීම.*
VI. *බර වාහන ළඟා විය නොහැකි ස්ථාන වල අත්කරත්ත මඟින් ඝන අපද්‍රව්‍ය එකතු කිරීම.*

### ක්‍රමෝපාය 09 – සනීපාරක්ෂක බිම් පිරවුම් ස්ථාපිත කිරීම.

I. *ජෛවීය ක්‍රියාවලියට සහ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට භාවිතා කළ නොහැකි ජීර්ණය නොවන අක්‍රීය සහ අනෙකුත් කසළ බිම් පිරවීම සඳහා යොදා ගැනීම සුදුසු වන අතර තනි පළාත් පාලන ආයතනයක් මඟින් සනීපාරක්ෂක බිම් පිරවුම් ස්ථාපනය කිරීම මූල්‍යමය වශයෙන් ප්‍රායෝගික නොවන අතර පළාත් පාලන ආයතන කිහිපයක් එකතු වී එය සිදු කිරීම ප්‍රායෝගික වේ.*

### ක්‍රමෝපාය 10 – විද්‍යුත් ඝන අපද්‍රව්‍ය (E – Waste) කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම

I. *ඉවතලන පරිගණක, යතුරුපුවරු, රූපවාහිනී, ජංගම දුරකථන වැනි උපාංග නාගරික ඝන අපද්‍රව්‍ය සමඟ බැහැර නොකළ යුතු අතර එම අපද්‍රව්‍ය වෙන් කොට එක්රැස් කර ඒවා මිලදී ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි ගැනුම්කරුවන් වෙත ලබා දිය යුතුය.*

### ක්‍රමෝපාය 11 – පසු විපරම් කමිටුවක් පිහිටුවීම

I. *අදාළ ආයතන වල නිලධාරී මණ්ඩලයකින් සමන්විත පසු විපරම් කමිටුවක් පිහිටුවීම මඟින් පසු විපරම් කටයුතු සිදු කිරීම.*




**සිතියම 6.4 :** *පොහොරවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ පිහිටීම (2018)*

**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

# 6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

මෙම සැලැස්ම යටතේ ප්‍රදේශයේ පවත්නා විභවතා උපයෝගී කර ගනිමින් ආර්ථිකය නංවාලීමට අනුගමනය කළ හැකි උපායමාර්ග පිළිබඳව සලකා බලා ඇති අතර මෙම සැලැස්ම, සංචාරක සංවර්ධන සැලැස්ම හා සෞඛ්‍ය ප්‍රවර්ධන සැලැස්ම ලෙස අනු කොටස් 02 කින් සමන්විත වේ.

## 6.4.1. ආර්ථික සංවර්ධන සැලැස්ම

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම පිළිබඳව අවධානය යොමුකිරීමේදී එහි වන විවිධ ආර්ථික අංශයන් පිළිබඳව අවධානය යොමුකිරීම වැදගත් වේ. කළුතර නගර සීමාව වටා මූලික වශයෙන් වාණිජ කටයුතු කේන්ද්‍රගත වී ඇති අතර, මොරොන්තුඩුව, උග්ගල්බඩ හන්දිය , පලාතොට හන්දිය වැනි කුඩා ප්‍රමාණයේ වාණිජ මංසල් ද (Commercial nodes) දැකගත හැකිවේ. කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ ආර්ථික සංයුතියෙහි වැඩිම දායකත්වය දක්වනුයේ සේවා අංශය වේ. කළුතර නගරය කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වන අතර ප්‍රවාහන හා වාණිජ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා දිස්ත්‍රික්කයේ සැලකිය යුතු ජනගහනයක් නගරය වෙත ඇදේ.

පළමු පරිච්ඡේදයේ සඳහන් කළ අන්දමින් කළුතර නගරයට දිනකට 80,000ක් පමණ ජනතාවක් සංක්‍රමණය වේ. ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම, පරිපාලන අවශ්‍යතා ඉටුකර ගැනීම, අධ්‍යාපනික හා සෞඛ්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම එම සංක්‍රමණික ජනතාවගේ ප්‍රධාන අරමුණ වේ. කළුතර නගරය හා බැඳුණු ආගමික හා සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන හේතු කොටගෙන ද කළුතර නගරයට වන්දනා කරුවන් හා සංචාරකයන්ගේ ආකර්ෂණය ලැබේ. ඉහත සඳහන් කළ දෛනික සේවා සඳහා නගරයට පැමිණෙන ජනතාවත්, වන්දනාකරුවන් හා සංචාරකයන් යන දෙකොටසත් නගරයේ ආර්ථික කටයුතු ක්‍රියාත්මක වීම කෙරෙහි සාධනීය බලපෑමක් සිදුකරනු ලැබේ. කෙසේ නමුදු වර්තමානය වනවිට දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉදිකිරීම හා කළුතර දිස්ත්‍රික්කය අවට නගර ආශ්‍රිතව සිදුවන ජාතික මට්ටමේ විවිධ ආර්ථික ආයෝජනයන් කළුතර නගරයට දිනකට පැමිණෙන සංක්‍රමණික සංඛ්‍යාව කෙරෙහි ඍණාත්මක බලපෑමක් සිදුකරනු ලබයි.

ඒ අනුව SWOT විශ්ලේෂණ පරිච්ඡේදයේදී හඳුනාගත් ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජනයන් සලකා බලමින් ආර්ථික සංවර්ධන සැලැස්ම සකස් කරනු ලැබිය. ඒ අනුව ආර්ථික සංවර්ධන සැලැස්ම යටතේ ළඟාකර ගැනීමට බලාපොරොත්තු වන පරමාර්ථ පහත පරිදි දැක්විය හැක.

1. *පරිපාලන සේවාවන් එකම ස්ථානයක ස්ථානගත වීමේ ආර්ථික වාසි නගරයට ලබා ගැනීමේ අරමුණින් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල අවට මීටර් 200 ක වපසරිය තුළ 80%ක් දක්වා පරිපාලන සේවාවන් සැපයීම 2025 වන විට සිදුකිරීම.*
2. *කළුතර මහ රෝහල අවට කි.මී.1 ක වපසරිය තුළ ද්විතීයික හා තෘතීක මට්ටමේ සෞඛ්‍ය සේවාවන් 80% දක්වා සැපයීම 2030 වන විට සිදුකිරීම.*

මෙම අරමුණු වෙත ළඟාවීම සඳහා මූලික වශයෙන් ක්‍රමෝපායන් 02 ක් යොදාගනු ලබයි.

1. *කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ විසිරී ඇති දිස්ත්‍රික් මට්ටමේ පරිපාලන ආයතන කළුතර දිස්ත්‍රික් ලේකම් පරිශ්‍රය ආශ්‍රිත කලාපය තුළ පිහිටවීම.*
2. *කළුතර මහරෝහල් පරිශ්‍රය හා ඒ අවට ඉදිවන තෘතික මට්ටමේ සෞඛ්‍ය සේවා ආයතන අතර අන්තර් සම්බන්ධතා වැඩි කිරීම.*

ඒ අනුව මෙම අරමුණු වෙත ළඟා වීම සඳහා පරිපාලන හා සෞඛ්‍ය සංවර්ධන සැලැස්මක් සකස් කර ඇත.

### 6.4.1.1 පරිපාලන හා සෞඛ්‍ය කලාප සංවර්ධන සැලැස්ම

මෙම ආර්ථික සංවර්ධන සැලැස්ම යටතේ පරිපාලන හා සෞඛ්‍ය කලාප සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. කළුතර නගරයට දිනකට පැමිණෙන ජනතාව අතුරින් සැළකිය යුතු පිරිසක් පරිපාලන හා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනිම උදෙසා නගරය වෙත පැමිණේ. කළුතර දිස්ත්‍රික්කයේ පරිපාලන මධ්‍යස්ථානය කළුතර නගරය විම මෙයට එක් හේතුවකි. එමෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන රජයේ රෝහල වුන් බස්නාහිර පළාතේ පිහිටි මහ රෝහල් 03 අතුරින් එකක් වුන් කළුතර මහ රෝහල කළුතර නගරය තුළ පිහිටා තිබිම අනෙක් හේතුවය. තවද මේ වනවිට සෞඛ්‍ය අංශය තුළ සිදුවන සංවර්ධන ආයෝජනයන් හේතු කරගෙන කළුතර නගරය වෙත ඉදිරියේදි සෞඛ්‍ය සේවාවන් ලබාගැනීම සඳහා දිනකට පැමිණෙන පුද්ගලයින් සංඛ්‍යාවද ඉහළ යාමට නියමිතය. ඒ අනුව මෙම පරිපාලන හා සෞඛ්‍ය සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන ජනතාවට පහසු වන ආකාරයටත් ඒ තුළින් කළුතර නගරයේ ආර්ථික සංවර්ධනය ඇතිකිරීමත් අරමුණු කරගනිමින් පරිපාලන හා සෞඛ්‍ය කලාප සැලැස්ම සකස් කර ඇත. මෙහිදී සම්පිණ්ඩිත ආර්ථිකයේ (Agglomeration Economy) වාසිය නගරය වෙත ලබා ගැනීම අරමුණ වේ. මෙමඟින් ආර්ථික සංවර්ධන සැලැස්මෙහි 02 හා 03 වන අරමුණු කරා ළඟාවිම සිදුවේ.

මෙම සැලැස්ම යටතේ හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ විස්තර කර ඇත.

## 6.4.2. සංචාරක සංවර්ධන සැලැස්ම

ඉහත සඳහන් කළ පරිදි කළුතර නගරය වන්දනාකරුවන්ගේ හා සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගත් නගරයකි. සංචාරක ආකර්ෂණය හේතු කොටගෙන පෞද්ගලික අංශය විසින් සංචාරක ක්ෂේත්‍රයට අදාළ හෝටල් ඉදිකිරීම සඳහා ද විශාල වශයෙන් යොමු වී ඇත. ඒ අනුව සංචාරක ක්ෂේත්‍රයට අදාළ විභවතා හා දුර්වලතා හඳුනා ගනිමින් සංචාරක කර්මාන්තය තුළින් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආර්ථික සංවර්ධනයට ලබාගත හැකි දායකත්වය වර්ධනය වන පරිදි සංචාරක සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. කළුතර නගරයට පැමිණෙන සංචාරකයන් අතර “වන්දනාකරුවන්” විශේෂ තැනක් ගන්නා අතර, එම වන්දනාකරුවන්ගේ පැමිණීම වර්ෂය පුරාම ඒකාකාරීව දැකගත හැකි වීමද, මෙම වන්දනාකරුවන් දේශීය සංචාරකයින් විමත් නිසාද කළුතර නගරයේ ආර්ථික සංවර්ධනය සඳහා ඔවුන්ගෙන් අඛණ්ඩ දායකත්වයක් ලබාගත හැකි වේ. සංචාරක සංවර්ධන සැලැස්ම යටතේ සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන හා සංචාරක ආකර්ෂණය වැඩි කිරීමට විභවතා සහිත ස්ථානයක් සංවර්ධනය කරමින් ආකර්ෂණය සහිත ස්ථාන අතර සම්බන්ධතා වැඩිවන පරිදි සිතියම් අංක 6.5 හි දැක්වෙන සංචාරක සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

ඒ අනුව කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වැඩිම සංචාරක හා වන්දනාකරුවන්ගේ ආකර්ෂණය ලැබෙන කළුතර බෝධි පරිශ්‍රය ආශ්‍රිතව සංස්කෘතික සංචාරක කටයුතු (Heritage Tourism) ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා වෙනම කලාපයක් හඳුනාගෙන ඇත. රිච්මන්ඩ් කාසල් පරිශ්‍රය ද සංස්කෘතික සංචාරක ආකර්ෂණය සහිත ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අතර කළුතර බෝධි පරිශ්‍රයත්, රිච්මන්ඩ් කාසල් පරිශ්‍රයත් අතර කළු ගඟ ආශ්‍රිතව කළුගඟ මූලික කරගත් සංචාරක කලාපයක් (River Front Tourism Promenade) ඇති කිරීමට බලාපොරොත්තු වේ. කළුතර කැලිඩෝ වෙරළ තීරය ආශ්‍රිත වෙරළ සංචාරක කටයුතු සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. (Sea Front Tourism Promenade) තවද, මොරොන්තුඩුව, ගෝනදූව ග්‍රාමය කේන්ද්‍ර කොට ගනිමින් අඩු ඝනත්ව සංචාරක කලාපයක් ඇති කිරීමට නියමිතය. ඒ සඳහා කළු ගඟට හා බොල්ගොඩ ගඟට සම්බන්ධ වන කැප්පු ඇළ මොරටුව ප්‍රදේශය හා සම්බන්ධ වන බැවින් ජල ප්‍රවාහන මාධ්‍යක් ලෙස සංචාරක ආකර්ෂණය තීව්‍ර වන පරිදි සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. පවතින තෙත්බිම් හා අතුරු ඇළ මාර්ග ආරක්ෂා කර ගනිමින් පාරිසරික සමතුළිතතාවය ආරක්ෂා කිරීම ප්‍රධාන අරමුණ වේ. මෙමඟින් කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ සංචාරක කටයුතු විවිධාංගිකරණය කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව සංස්කෘතික සංචාරක කටයුතු, පාරිසරික සංචාරක කටයුතු, වෙරළාශ්‍රිත සංචාරක කටයුතු යන සංචාරක ක්ෂේත්‍රයට අදාළ විවිධාංගයන් ඉතා

කෙටි වපසරියකින් යුක්ත ප්‍රදේශයකදී අත්විඳීමට සංචාරකයන්ට හැකි වන අතර, මෙම විවිධ සංචාරක ක්‍රියාකාරකම් සඳහා උනන්දු සියලුම දේශීය හා විදේශීය සංචාරකයන් ප්‍රදේශය වෙත ආකර්ෂණය කරගැනීමට මෙමඟින් අවස්ථාව උදා වේ.

ඒ අනුව සංචාරක සංවර්ධන සැලැස්මේ පරමාර්ථ හා ඒ සඳහා යොදා ගන්නා ක්‍රමෝපායන් පහත පරිදි දැක්විය හැකිය.

## පරමාර්ථ

01. *සංචාරක ගමනාන්ත වන කළුතර බෝධිය, කැලිඩෝ වෙරළ තීරය, රිච්මන්ඩ් කාසල් මන්දිරය අතර අන්තර් සම්බන්ධතාවයක් ඇති කරමින් සුවපහසු නගර චාරිකාවක් බිහි කිරීමේ හැකියාව 2030 වර්ෂය වන විට ඇති කිරීම.*

## ක්‍රමෝපායන්

I. *කළුතර බෝධි පරිශ්‍රය ආශ්‍රිත කලාපය හා රිච්මන්ඩ් කාසල් පරිශ්‍රයත් යන ස්ථානයන් ද්විත්ත්වය කේන්ද්‍ර කොට ගනිමින් සංස්කෘතික සංචාරක කලාප ද්විත්ත්වයක් ඇති කිරීම.*

II. *කළුගඟ ආශ්‍රිතව හා කැලිඩෝ වෙරළ තීරය මූලික කරගත් වෙරළ තීරය ආශ්‍රිතව සංචාරක කලාප ද්විත්ත්වයක් ඇති කිරීම.*

*මෙම සැලැස්ම යටතේ හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම යටතේ විස්තර කර ඇත.*




**සිතියම 6.5 :** *සංචාරක සංවර්ධන සැලැස්ම (2018)*

**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

# 6.5. තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

කළුතර සැලසුම් බලප්‍රදේශයහේ එයටම ආවේණික වූ පාරිසරික අංග ලක්‍ෂණයන් රාශියක් වේ. කළු ගංගා මෝය ආශ්‍රිතව පිහිටීමත්, මුළු භූමි ප්‍රමාණයෙන් 55% ක් තෙත් බිම් වශයෙන් පැවතීම, මුහුදට මායිම්ව පිහිටා තිබීම යන එම ලක්‍ෂණ සමෝධානිත කොටගෙන කළුතර සැලසුම් බලප්‍රදේශයේ පාරිසරික පැවැත්ම තීරණය වී ඇත. එමෙන්ම එම ප්‍රදේශය ජාතික වශයෙන් ආපදාවන්ට ලක්වන ප්‍රදේශයක් ලෙස ද හඳුනාගත හැකි අතර උක්ත කරුණ සලකා බලමින් සැලසුම් බලප්‍රදේශය තුළ තිරසාර පාරිසරික තත්වයක් ඇති කිරීම සඳහා මෙම පරිච්ඡේදයේ සඳහන් වන තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග භාවිතා කරනු ලැබේ. ඒ අනුව තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම හරහා පහත පරමාර්ථ සාක්‍ෂාත් කර ගැනීම අපේක්‍ෂා කෙරේ.

a. *සමස්ත සැලසුම් බලප්‍රදේශයටම 100% ක් සුපිරිසිදු සෞඛ්‍යාරක්‍ෂිත පානීය ජලය 2030 වර්ෂය වන විට ලබාදීම.*
b. *කළුතර සැලසුම් බලප්‍රදේශයේ බටහිර සීමාව වන ධීරකන්ද මාවත ආසන්නයේ සිට දකුණු පයාගල දක්වා දිවෙන කි.මී. 13ක් පමණ වූ වෙරළ තීරයේ සමුද්‍ර ඛාදනය 2025 වන විට අවම කිරීම.*
c. *හෙක්ටයාර් 1925 ක් වූ පාරිසරික සංවේදී කලාප කළමනාකරණය හරහා ග්‍රාම නිළධාරී වසම් 21 කට බලපාන ගංවතුර අවධානම පාලනය කරමින්, ජීවත් වීමට හිතකර පරිසරයක් 2025 වන විට ඇති කිරීම.*

## 6.5.1. පාරිසරික සංරක්‍ෂණ සැලැස්ම

පරිසර සංරක්ෂණ උපාය මාර්ගයේ ප්‍රධාන අරමුණ වන්නේ සැළසුම් බලප්‍රදේශය තුළ පිහිටා ඇති තෙත්බිම් හා සංවේදී භූමි ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමත්, ජලවහන පද්ධතිය හා වෙරළාශ්‍රිත පරිසරය ආරක්‍ෂාකර ගැනිමත්, ජලයේ ලවණතා මට්ටම කළමනාකරණය කිරීමත් හා ආපදා අවදානම් කළමනා-කරණය කිරීමත්ය. තෙත්බිම් ආරක්ෂාකරණය තුළින් ජල රැඳවුමට පවත්නා හැකියාව වැඩිකර ගංවතුර අවධානම මඟ හරවා ගැනීමටත්, ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීමටත් හැකිවේ.

### 6.5.1.1. තෙත්බිම් හා සංවේදී ප්‍රදේශ ආරක්‍ෂණ උපාය මාර්ගය

තෙත්බිම් හා සංවේදී ප්‍රදේශ ආරක්‍ෂණ උපාය මාර්ගය යටතේ තෙත්බිම් හා සංවේදී ප්‍රදේශ ආරක්‍ෂා කර ගැනීම සඳහා බස්නාහිර පළාත් තෙත්බිම් සැලැස්මට අනුව ප්‍රධාන වශයෙන් තෙත්බිම් කලාපීයකරණයක් හඳුනාගත් අතර ඒවා පහත පරිදි වේ. ඉන් ප්‍රධාන ඇළ මාර්ග හා අතුරු ඇළ මාර්ග නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා ජලපවහනය නිසි පරිදි සිදු නොවීම හා ඒවායේ ආක්‍රමණකාරී පැළෑටි බහුලව තිබීම නිසා ජල බැස්ම අවහිර වීමේ ගැටළුවත්, පහත්බිම් ආශ්‍රිත අක්‍රමවත් හා අනවසර ඉදිකිරීම් සිදුවීමත් නිසා ඇතිවන ගැටළු විසඳීමට අපේක්‍ෂා කෙරේ. ඒ අනුව කළුතර සැලසුම් බලප්‍රදේශය තුළ හඳුනාගත හැකි තෙත්බිම් පහත අයුරින් කලාපීයකරණය සිදු කළ හැකිය.

I. *තෙත්බිම් ආරක්ෂණ කලාපය*
II. *තෙත්බිම් ස්වභාවික සංරක්‍ෂණ කලාපය*
III. *තෙත්බිම් කෘෂිකාර්මික කලාපය*
IV. *විශේෂ කුඹුරු වගා කලාපය*

සිතියම් අංක 6.6 හි මෙම කලාපීයකරණය දක්වා ඇත.

## 1. තෙත්බිම් ආරක්ෂණ කලාපය

බොල්ගොඩ වැව – පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, කළු සහ කැලණි ගංගා නිම්න අතරට මැදිවූ අර්ධ ලෙස සංවෘත්ත කලපුවක ස්වරූපයෙන් පිහිටයි. මෙය එකිනෙකට සම්බන්ධ වැව් පද්ධති දෙකක් (උතුරු සහ දකුණු) මෙන්ම වේරැස් ගඟ, බොල්ගොඩ ගඟ, පනාපෙ ඇළ, රම්බාන ඇළ, මහ ඔය හා නල්පිටිය ඇළ යන ජල මාර්ග සම්බන්ධ වී ඇත. අධික ජෛව විවිධත්වයකින් යුතු බොල්ගොඩ වැව ප්‍රදේශය දැනට කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීම, සැලසුම් රහිත සංවර්ධන කටයුතු, අනවසර ඉඩම් අත්පත් කර ගැනීම් සහ ආක්‍රමණශීලී ශාක වල ව්‍යාප්තිය වැනි තර්ජන වලට බඳුන් වී ඇත.මෙම තත්ත්වය පාලනය කිරීම සහ සංවර්ධන කටයුතු විධිමත් කිරීමේ අරමුණින් මෙම ප්‍රදේශය මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස 2009.12.30 දිනැති අංක 1634/23 දරණ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදී. (මූලාශ්‍රය: ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී කලාප – මධ්‍යම පරිසර අධිකාරිය)

බොල්ගොඩ වැව දකුණු කොටසෙහි වාර්තා වී ඇති පෘෂ්ඨවංශික ජීවීන් අතර මත්ස්‍ය විශේෂ 45ක්, උභය ජීවී විශේෂ 16 ක්, උරගයින් විශේෂ 40 ක්, පක්ෂි විශේෂ 97ක් සහ ක්ෂීරපායී විශේෂ 31 ක් වේ. (Source : National Wetland Directory of Sri Lanka by CEA – 2006)

බොල්ගොඩ වැව දකුණු කොටසේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ දෙකක් කළුතර සැලසුම් බලප්‍රදේශයට අයත් වන අතර ඒවා මහ ගෝනදුව සහ කුඩා ගෝනදුව යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වේ.

## 2. තෙත්බිම් ස්වභාවික සංරක්ෂණ කලාපය

ප්‍රදේශය හරහා ගලා බසින ප්‍රධාන ජල මූලාශ්‍රය වන කළු ගංගාව සහ බොල්ගොඩ වැව ආශ්‍රය කරගනිමින් අළුත් ඇළ, ජීනවියංගල ඇළ, කැප්පු ඇළ වැනි ඇළ මාර්ග පද්ධතියක් පිහිටා ඇති අතර ඒ ආශ්‍රිතව ඇති පහත් බිම් තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය යටතට අයත් වේ.

## 3. තෙත්බිම් කෘෂිකාර්මික කලාපය

කුඹුරු වගා බිම් හැර  කෘෂිකර්මාන්තයට සම්බන්ධ අනෙකුත් ඉතා වැදගත් ප්‍රදේශ සහ ඒ හා සම්බන්ධ දෙනිය සහ ඕවිට යන ප්‍රදේශ මෙම කලාපය යටතට අයත් වේ.

## 4. විශේෂ කුඹුරු වගා කලාපය

කළුතර සැලසුම් බලප්‍රදේශය තුළ ඇති සක්‍රීය කුඹුරු බිම් සහ අත්හරින ලද කුඹුරු බිම් මේ යටතට ගැනෙන අතර මෙම ප්‍රදේශය ජල රැදවුම් සහ ජල බැසයාම් ප්‍රදේශය ලෙස පවත්වාගත යුතුය.




*සිතියම 6.6 : තෙත්බිම් කළාපීයකරණ සැලැස්ම (2019–2030)*

*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

### 6.5.1.2. පවත්නා ජල වහන පද්ධති ආරක්ෂණ උපාය මාර්ගය

පවත්නා ජල වහන පද්ධති ආරක්ෂණ උපාය මාර්ගය යටතේ සැලසුම් බලප්‍රදේශය තුළ හෙක්ටයාර් 444.78 ක භූමි ප්‍රමාණයක් පුරා විසිරී පවතින ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම හඳුනාගත හැකි අතර ඊට අදාළ ක්‍රියා මාර්ග පහත පරිදි වේ.

**ක්‍රියාමාර්ග 01**
පාරිසරික සංරක්ෂණ කලාපයක් හඳුන්වාදීම.

2005 වසරේ ජූනි 07 වන දින ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කරන ලද (2005–2020) කළුතර සංවර්ධන සැලැස්ම මඟින් පහත සඳහන් පරිදි ගංගා සහ ඇළ මාර්ග පද්ධති සඳහා රක්ෂිත කලාප හඳුන්වා දී ඇති අතර, ඒවා වගු අංක 6.1 ට අනුව හඳුනාගත හැකි වේ.එම රක්ෂිත කලාප මෙම සංවර්ධන සැලැස්ම සඳහා ද යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. මේ පිළිබඳ රෙගුලාසි වෙළුම II හි සඳහන් වේ.

| ගඟේ නම | රක්ෂිතයේ පළල (මීටර්) | අඩි |
|---|---|---|
| කළු ගඟ | ඉවුරේ සිට මීටර් 20 | අඩි 66 |
| බොල්ගොඩ ජලාශය | ඉවුරේ සිට මීටර් 12 | අඩි 40 |
| හීනටියන්ගල ඇළ හා අළුත් ඇළ | ඉවුරේ සිට මීටර් 06 | අඩි 20 |

*වගුව 6.1 : සැලැසුම් බලප්‍රදේශයේ ගංගා ඇළ දොළ සඳහා ඇති රක්ෂිත කලාප*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

මෙයට අමතරව ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2016.07.14 දිනැතිව අංක 1662/17 යටතේ ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදනය මඟින් හඳුනාගෙන ඇති ආරක්‍ෂණ කලාප කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෙසු ජල මූලාශ්‍ර සඳහා යොදා ගැනීමට නියමිතය.

### 6.5.1.3. වෙරළබඩ පරිසර කළමනාකරණ උපාය මාර්ගය

කළුතර නගරයේ දියුණුව කෙරෙහි පවත්නා බාධක අතරින් මුහුදු ඛාදනය ප්‍රධානම බාධාවකි. මේ වන විටත් කළුතර කැලිඩෝ වෙරළ තීරය විනාශ මුඛයට ඇදවැටෙමින් පවතී. සංචාරක ක්ෂේත්‍රයේ අග්‍රගණ්‍ය ස්ථානයක් ගන්නා මෙම කළුතර කැලිඩෝ වෙරළ තීරය මෙසේ විනාශයට පත්වීම කළුතර නගරයේ සුන්දරත්වයට හා සංචාරක ආකර්ෂණය අඩුවීමට අතිශයින්ම බලපානු ඇත. එමෙන්ම ඉන් වෙරළ පරිසර පද්ධතියටද හානි පැමිණේ. මෙසේ වෙරළබඩ පරිසර පද්ධතියට සිදුවන හානි අවම කිරීම සඳහා මෙම සංවර්ධන සැලැස්ම මඟින් හඳුනාගෙන ඇති ක්‍රියා මාර්ග පහත පරිදි වේ.

## ක්‍රියාමාර්ගය 01
වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතට සමගාමීව හඳුනාගෙන ඇති නීති හා රෙගුලාසි වෙරළබඩ සංවර්ධන කටයුතු නියාමනය කිරීම සඳහා අනුකූල කර ගැනීම.

1981 අංක 58 දරණ ගැසට් නිවේදනය මඟින් වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණය නියාමනය කරනු ලබයි. මෙම නියාමනය කළුතර සංවර්ධන සැලැස්ම සඳහාද යොදා ගැනීමට අපේක්‍ෂා කෙරේ. ඒ අනුව කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ විහිදී ඇති වෙරළබඩ ප්‍රදේශය අවදානම් මට්ටම අනුව කොටස් තුනකට වර්ගීකරණය කර ඇත. එනම්,

I. *අධි අවදානම් ප්‍රදේශය (ටැංජරීන් හෝටලය ආසන්නයේ සිට ඇති අවානි හෝටලය දක්වා)*

ස්ථිර ශාක වැවෙන සීමාවේ සිට මීටර් 55 දක්වා වූ රක්‍ෂිත ප්‍රදේශයක් මෙම කලාපයට අයත්ය.

- ස්ථිර ශාක වැවෙන සීමාවේ සිට මීටර් 20 දක්වා වූ කලාපය තුළ කිසිඳු සංවර්ධනයකට අවසර නොමැත.
- එතැන් සිට මීටර් 35 දක්වා සීමා සහිත සංවර්ධනයකට අවසර ලබාදේ.

II. *මධ්‍යස්ථ අවදානම් කලාපය (අවානි හෝටලය – දකුණු පයාගල)*

මෙම කලාපයට ස්ථිර ශාක වැවෙන රේඛාවේ සිට මීටර් 50 දක්වා වූ රක්‍ෂිත ප්‍රදේශයක් අයත්ය.

- ඉන් මුහුදට වඩා සමීපව පිහිටි මීටර් 20 දක්වා කලාපය තුළ සංවර්ධන කටයුතු තහනම් වේ.
- එතැන් සිට මීටර් 30 දක්වා වූ සීමාව තුළ සංවර්ධන කටයුතු සීමා කර ඇත.

III. *අඩු අවදානම් කලාපය (පිංවත්ත දුම්රිය ස්ථානය – ටැංජරීන් හෝටලය)*

මෙම කලාපය සඳහා ස්ථිර ශාඛ වැවෙන රේඛාවේ සිටි මීටර් 35ක් දක්වා රක්ෂිත ප්‍රදේශයක් පනවා ඇත.

- ඉන් මුහුදු සීමාවේ සිට මීටර් 10ක් දක්වා කලාපය තුළ සංවර්ධන කටයුතු තහනම් වේ.
- එතැන් සිට මීටර් 25 දක්වා වූ සීමාව තුළ සංවර්ධන කටයුතු සීමා කර ඇත.

## ක්‍රියාමාර්ගය 02
වෙරළ තීරයේ පැවති වැලි වැටිය නැවත ස්ථාපිත කිරීම.

මුලින් පැවති වැලි වැටිය විනාශ වීම හේතුවෙන් පහත සඳහන් ගැටළු හඳුනාගත හැක.

- *ගංගා ජලයට ලවණ ජලය මුසුවීම ඉහළයාම හේතුවෙන් පානීය ජල ගැටළුව උග්‍රවීම.*
- *ගංගා ආශ්‍රිතව ප්‍රදේශයේ ජෛව විවිධත්වයට හානි පැමිණීම හා ඉන් එම පරිසර පද්ධතිවල සමතුළිත භාවය ගිලිහීම.*
- *කළුගඟේ වැලි ගොඩ දැමීමේ කර්මාන්තයට සෘජු බලපෑමක් ඇතිවීම.*
- *සුනාමි වැනි ස්වභාවික උපද්‍රවයන්ට භාජනය වීමේ වැඩි ප්‍රවණතාවයක් පැවතීම.*

මෙම ගැටළු වලට පිළියමක් වශයෙන් කි.මී.1.7 ක් දිගු වෙරළ තීරයේ පැවති වැලි වැටිය "නරිශ්මන්ට්" (Norishment) ක්‍රමයට නැවත ස්ථාපිත කිරීම මඟින් 2030 වන විට ස්ථාවර වැලි වැටියක් සකස් කිරීමට අපේක්ෂා කෙරේ.

### ක්‍රියාමාර්ගය 03
හඳුනාගත් ස්ථාන සඳහා කඩොලාන රෝපණය කිරීමේ ව්‍යාපෘතිය

මේ යටතේ දුම්රියපල හා කලපුව අතර ප්‍රදේශයේ පවතින අක්කර 10 ක් පමණ වන භූමි ප්‍රදේශය තුළ කඩොලාන වගා කිරීම මඟින් මුහුදු ඛාදනය හා දැඩි සුළඟින් වන හානිය අවම කිරීමට අපේක්ෂා කෙරේ.

### ක්‍රියාමාර්ගය 04
ටැංජරීන් හෝටලයේ සිට කැලිඩෝ වෙරළ තීරය දක්වා කි.මී. 02 ක් වූ දැඩි අවදානම් කලාපයේ වෙරළ තීරය ඔස්සේ පඳුරු ආකාරයේ ශාක සිටුවීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මඟින් වෙරළ තීරයේ පවතින දර්ශනයට බාධාවක් නොවන අයුරින් වෙරළ ඛාදනය අවම කිරීමට අපේක්ෂා කරන අතර ස්වභාවික පරිසරය සමග මුසුවූ සුන්දර කලාපයක් ලෙස මෙම ප්‍රදේශය පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.

## 6.5.2 භූ දර්ශන සැලැස්ම

කළුතර සැලසුම් බලප්‍රදේශය කළු ගංගා නිම්න තීරයේ පිහිටි ප්‍රදේශයක් වීම නිසාවෙන් කළු ගඟ, සාගරය, කැලිඩෝ වෙරළ තීරය, අභ්‍යන්තර ඇළ මාර්ග පද්ධතිය හා තෙත්බිම් ව්‍යාප්තිය මූලික කර ගනිමින් අතීතයේ සිටම එයටම ආවේණික වූ භූ දර්ශනයකින් හෙබි ප්‍රදේශයක් ලෙස පවතී.

2019–2030 සංවර්ධන සැලැස්ම මඟින් නිරිතදිග වෙරළ තීරයේ අග්‍ර නැවතුම්පළක් කිරීම යන දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සැලැසුම් බලප්‍රදේශයේ භූ දර්ශනය සකස් කිරීම හා වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග හඳුනාගත් ස්ථාන වල නිසි පරිදි කිරීමට අපේක්ෂිතය.එම ස්ථාන පහත පරිදි වේ.

කළුතර සංවර්ධන බලප්‍රදේශයේ විවිධ ස්ථාන වල භූ දර්ශන ඔප්නැංවීමට ව්‍යාපෘතීන් කිහිපයක්ම මෙහිදී හඳුනාගෙන ඇත.

1. *නාගොඩ හන්දියේ භූ දර්ශන සංවර්ධනය*
2. *රිච්මන්ඩ් මන්දිරයේ භූ දර්ශන සංවර්ධනය*
3. *උසාවි සංකීර්ණයේ ඉදිරිපිට භූ දර්ශන සංවර්ධනය*
4. *කැළිඩෝ වෙරළේ භූ දර්ශන සංවර්ධනය*
5. *අධි ඝනත්ව නේවාසික කලාපය තුළ පවතින කුඩා ජීනවියන්ගල ඇළේ කොටසක් මූලික කර ගනිමින් රේඛීය උද්‍යානයක් ස්ථාපිත කිරීම.*
6. *ළමා හා මාතෘ රෝහල ඉදිරිපිට සිදු කෙරෙන භූ දර්ශන සංවර්ධනය*
7. *මොරොන්තුඩුව හන්දියේ භූ දර්ශන සංවර්ධනය*
8. *නාගරික උද්‍යාන සංවර්ධනය*
9. *ළමා උද්‍යාන භූ දර්ශන සංවර්ධනය*
10. *කළුතර පාලම් ද්වීතත්වය අතර පිහිටි තලාව භූමියේ ගාලු පාරත් දුම්රිය මාර්ගයත් අතර කොටස තුළ භූ දර්ශනය සැකසීම*

මේ පිළිබඳ වැඩිදුර විස්තර සංචාරක සංවර්ධන සැලැස්මේ , තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග සැලැස්මේ හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇත.

## 6.5.3. ආපදා කළමනාකරණ සැලැස්ම

ආපදා වලට ලක්වන ප්‍රදේශ හඳුනා ගැනීමත් එම ආපදා අවම කිරීමට ගතහැකි ක්‍රියා මාර්ග පිළිබඳවත් මේ යටතේ සාකච්ඡා කෙරේ.

### පවතින ආපදා තත්ත්වය

කළුතර සැලසුම් බලප්‍රදේශය තුළ හඳුනාගත හැකි ආපදා තත්ත්ව ලෙස,

I. *ගංවතුර*
II. *පානීය ජල ගැටළුව*
III. *නායයෑම් අවදානම් ප්‍රදේශ*
IV. *සුනාමි*
V. *වැසි ජල ගැටළුව යනාදිය හඳුනා ගත හැකි වේ.*

### i. ගංවතුර

ගංවතුර බලපෑම් තර්ජනයට කළුතර සැලසුම් බලප්‍රදේශය වසර පහකට පමණ වරක් විශාල තර්ජන-යකට ලක්වන අතර කළු ගඟ ආශ්‍රිත පලාතොට ප්‍රදේශයේ ජල මාපාංකය මඟින් ජල ගැලීම් තත්ත්ව පිළිබඳ හඳුනා ගැනීම් සිදුකරනු ලබයි. කළු ගඟ දෙපස ග්‍රාම නිලධාරී කොට්ඨාශ සෘජුවම ජල ගැලීම් ආපදාවට ගොදුරු වන බව වාර්තා වේ. කළු ගඟ ආශ්‍රිතව ඇතිවන ගංවතුර තත්ත්වයන් හැරුණු කොට, අධික වර්ෂාපතනය හේතුවෙන් කාණු ජලයෙන් පිරීයාම නිසා ද ඇතිවන ජලගැලීම් තත්ත්වයන් ද වාර්තා වේ. වගු අංක 6.2 මඟින් 2014 -2018 වර්ෂ වල ගංවතුර ආපදා විස්තර දැක්වේ.

| *වර්ෂය* | *ආපදාවට ලක්වූ පවුල් සංඛ්‍යාව* | *ආපදාවට ලක්වූ පුද්ගලයින් සංඛ්‍යාව* |
|---|---|---|
| *2014.06.02 සිට 2014.06.06 දක්වා* | *1224* | *4054* |
| *2015.09.29* | *160* | *689* |
| *2015.11.15* | *178* | *809* |
| *2016.05.16 සිට 2016.05 28 දක්වා* | *241* | *993* |
| *2017.05.26 සිට 2017.06.24 දක්වා* | *2942* | *11854* |

*වගුව 6.2 : කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වාර්තා වූ ගංවතුර ආපදා පිළිබඳ තොරතුරු.*
*මූලාශ්‍රය : ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය,ආපදා සිද්ධි වාර්තාව - කළුතර දිස්ත්‍රික්කය (2018)*

### ii. පානීය ජල ගැටළුව

කළුතර ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාවය සඳහා වන ප්‍රධාන ප්‍රභවය කළු ගඟ වේ. ඇතැම් වර්ෂ වල වියළි සෘතුවේදී (ජනවාරි, පෙබරවාරි, මාර්තු, අගෝස්තු, සැප්තැම්බර්) කළු ගඟෙහි ජලයට ලවණ ජලය මිශ්‍රවීම තුළින් ප්‍රදේශයේ නළ ජලය භාවිතා කරන ජනතාව ගැටළුවකට මුහුණ දෙන බව වාර්තා වේ. කෙත්හේන ජල පවිත්‍රාගාරයෙන් ජලය බෙදාහැරීම් කටයුතු සිදු කරයි. මෙම කාලය තුළදී ජලයේ පවතින විද්‍යුත් සන්නායකතාව (Electrical conductivity) ඉහළ අගයක් ගනු ලබන අතර මෙම අගය සෙන්ටිමීටරයට මයික්‍රො සීමන් 750 අගයට වැඩි වූ විට මෙම ජලය පුද්ගල පරිභෝජනය සඳහා නුසුදුසු බව ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ දත්ත මඟින් හඳුනාගෙන ඇත. පානීය ජල හිඟය පිළිබඳ විස්තර වගු අංක 6.3 හි සඳහන් වේ.

| වර්ෂය | ආපදාවට ලක්වූ පවුල් සංඛ්‍යාව | ආපදාවට ලක්වූ පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| 2016.03.17 සිට 2016.03.28 දක්වා | 1978 | 8383 |
| 2015.09.29 සිට 2017.02.13 දක්වා | 17,332 | 75,017 |

*වගුව 6.3 : කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වාර්තා වූ පානීය ජල ගැටළුව නිසා ඇති වූ ආපදා පිළිබඳ තොරතුරු | මූලාශ්‍රය : ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය,ආපදා සිද්ධි වාර්තාව - කළුතර දිස්ත්‍රික්කය (2018)*

මෙම ගැටළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමස්ත ජනගහනයෙන් 56% කට බලපාන අතර කළුතර නගර සභා බලප්‍රදේශයේ 99% කට ප්‍රබල ගැටළුවක් වී ඇත. ජල ගැටළුව සිදුවන කාල වලදී පානීය ජලය බෙදාහැරීම සිදු කළද එය ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ වේ. මේ සඳහා කෙටිකාලීන සහ දිගුකාලීන ලෙස විසඳුම් හඳුනාගත යුතුය.

කෙටිකාලීන විසඳුම් ලෙස පානීය ජල ගැටළුව පවතින අවස්ථාවේදී කුඩා ගඟේ ජලය පොල්අතුමෝදර ප්‍රදේශයෙන් කෙත්හේන ජල පවිත්‍රාගාරයට ජලය පොම්ප කර බෙදා හැරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. එසේම දිගු කාලීන විසඳුම් ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ලවණ ජල බාධකයක් ඉදි කිරීම සඳහා යෝජනාවක් ද ඉදිරිපත් වී ඇත.

### iii. නායයාම් ආපදා අවදානම් ප්‍රදේශ

නායයාම් ආපදා අවදානම් ප්‍රදේශ සඳහා දත්ත ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් ලබාගත් අතර නායයාම් අවදානම් කලාප සිතියම් ගත කිරීමේ (Landslide Hazard Zoning mapping, 2012) වාර්තාවට අනුව හඳුනාගත හැකි ග්‍රාම නිලධාරී කොට්ඨාශ පහත දැක්වේ.

a. *මහ ගෝනදුව (701)*
b. *කිතුළාව (723)*
c. *පුලර්ටන් බටහිර (729C)*

### iv. සුනාමි

2004 වර්ෂයේදී ඇතිවූ සුනාමි ව්‍යසනයේදී කළුතර සැලසුම් බලප්‍රදේශය තුළ 8491 ජන සංඛ්‍යාවක් බලපෑමට ලක්වූ අතර නිවාස හානි 1891ක් වාර්තා විය. සුනාමි ව්‍යවසනය සිදුවූ ග්‍රාම නිලධාරී කොට්ඨාශ පහත දැක්විය හැකිය.

I. *දේශාස්ත්‍ර කළුතර බටහිර (717D)*
II. *ඇතගම බටහිර (732A)*
III. *කළමුල්ල උතුර (731)*
IV. *කළමුල්ල දකුණ (731A)*
V. *කළපුව (730A)*
VI. *කළුතර උතුර (717)*
VII. *කළුතර දකුණ (725)*
VIII. *කළුතර දකුණ ඒ (725A)*
IX. *කුඩා වස්කඩුව බටහිර (710B)*
X. *මහ වස්කඩුව උතුර (714A)*
XI. *මහ වස්කඩුව දකුණ (714)*
XII. *පොහොද්දරමුල්ල බටහිර (707A)*
XIII. *පොතුපිටිය බටහිර (708C)*
XIV. *නොටුපොළ (717B)*
XV. *විද්‍යාසාර (717C)*
XVI. *වෙට්ටුමකඩ (730)*

මූලාශ්‍ර :- මූලික වාර්තාව – 2, 2004 සුනාමි ආපදාවට ලක්වූ ගොඩනැගිලි සහ පුද්ගලයින් පිළිබඳ සංගණනය, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, කළුතර දිස්ත්‍රික්කය. ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව – 2005

### v. වැසි ජල ගැටළුව

කුඩා වස්කඩුව හා මහා වස්කඩුව ප්‍රදේශයට වැසිජල කළමනාකරණ සැලැස්මක් හඳුනාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය ව.කි.මී. 1.15 ක භූමි ප්‍රමාණයක සැලසුම් කිරීමට යෝජනා කර ඇති අතර දුම්රිය මාර්ගය සහ ගාලු පාර අතර ඉදි කිරීමට යෝජනා කර ඇත. දැනටමත් මේ සඳහා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් සැලැස්මක් සකස් කර ඇති අතර එය මෙම සැලැස්ම සඳහා අනුකූල කරගෙන ඇත. එය ඇමුණුම් අංක15 න් දැක්වේ.

## 6.5.3.1 ආපදා සැලැස්ම යටතේ හඳුනාගත් කලාපීයකරණය

කළුතර සැලසුම් බලප්‍රදේශය පවතින ආපදා තත්තවයන් අනුව ප්‍රධාන වශයෙන් කලාප තුනකට වර්ගීකරණය කළ හැකිය.

I. *හරිත තීර කලාපය*
II. *අඩු ඝනත්ව නේවාසික කලාපය*
III. *වෙරළ සංරක්ෂණ කලාපය*

### i. හරිත තීර කලාපය

කළු ගඟ රක්ෂිතය (මීටර් 20 ක්), ජීනවියංගල ඇළ රක්ෂිතය (මීටර් 20 ක්), අළුත් ඇළ රක්ෂිතය (මීටර් 20 ක්), බොල්ගොඩ වැව රක්ෂිතය (මීටර් 20 ක්), කැප්පු ඇළ රක්ෂිතය (මීටර් 20 ක්) මීට අයත් වන අතර ඒවා කළුතර කලාපීයකරණ සැලැස්මේ විවිධ කලාප තුළට අන්තර්ග්‍රහණය වී ඇත. ගංවතුර රඳවා තැබීමේ ධාරිතාවය සපුරාලීමට සහ පොදු විවෘත අවකාශ පහසුකම් සැපයීමට මෙම ප්‍රදේශ හරිත තීරයක් ලෙස තබා ගත යුතුය.

### ii. අඩු ඝනත්ව නේවාසික කලාපය

ගංවතුර ආපදාව බලපාන ග්‍රාම නිලධාරී කොට්ඨාශ සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් හඳුනාගෙන ඇති නායයෑම් අවදානම් ප්‍රදේශ මෙම කලාපයට අයත් වන අතර මෙම ප්‍රදේශ කළුතර කලාපීයකරණ සැලැස්මේ අඩු ඝනත්ව නේවාසික කලාපයට හා අඩු ඝනත්ව සංචාරක කලාපයට අන්තර්ග්‍රහණය වී ඇත. ගංවතුර උවදුර අවම කිරීම සඳහා සියලු වගුරු බිම්, කුඹුරු සහ පහත් බිම් ප්‍රදේශ ආරක්ෂා යුතු අතර නායයාම් අවදානම අවම කරගැනීම සඳහා දැනට පවතින වන වගාව ආරක්ෂා කරගත යුතුය.

### iii. වෙරළ සංරක්ෂිත කලාපය

සුනාමි සහ වෙරළ ඛාදන ආපදාවන්ගෙන් සිදු වන හානිය වැළැක්වීමේ උපක්‍රමයක් වශයෙන් , මීටර් 100 ප්‍රදේශයක් වෙරළ තීරය සංරක්ෂිත ප්‍රදේශයක් ලෙස වෙන් කිරීම (වර්ෂ 2011 අංක 49 දරණ සංශෝධිත වෙරළ සංරක්ෂණ පනත අනුව), කඩොලාන වගා ව්‍යාප්ත කිරීම, විනෝද විවේක පහසුකම් වෙරළ තීරයේ ස්ථානගත කිරීම ආදිය සිදු කළ හැක.

මෙම ආපදා කළමනාකරණ සැලැස්ම යටතේ හඳුනාගත් කලාපීයකරණය සිතියම් අංක 6.7 ට අනුව හඳුනාගත හැකි අතර ඊට අදාළ වන නීති රෙගුලාසි වෙළුම II යටතේ විස්තර කෙරේ.




***සිතියම 6.7:*** *කළුතර සැලසුම් බලප්‍රදේශය සඳහා වන ආපදා අවම කිරීමේ කලාපීකරණ සැලැස්ම (2018)*

***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## 6.5.4. පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම

සැළසුම් බලප්‍රදේශය තුළ අපේක්ෂිත ජනගහනයට අවශ්‍ය පොදු එළිමහන් භූමි ප්‍රමාණය නිර්ණය කිරීම මෙහිදී සිදුවේ. මෙහිදී සෘජු හා වක්‍ර විනෝද පහසුකම් යටතේ දැනට පවත්නා භූමි ප්‍රමාණය මෙන්ම අපේක්ෂිත භූමි ප්‍රමාණය ද සලකා බලන අතර පරිසර අලංකරණය සඳහා ද වැඩි ප්‍රවණතාවයක් පවතී.

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රමිති මට්ටම් වලට අනුව ජනගහනය 1000 කට හෙක්ටයාර් 1 ක් අවම වශයෙන් පොදු එළිමහන් පහසුකම් ලෙස සංවර්ධන සැලැස්ම සැකසීමේදී වෙන් කළ යුතුය. කළුතර සැලසුම් බලප්‍රදේශයේ 2017 වසර වන විට ජනගහනය 170,835 ලෙස සංගණන වාර්තාවේ දක්වා ඇත. සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2030 වන විට ජනගහනය 199,854 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට පොදු එළිමහන් විනෝද පහසුකම් සඳහා ඉඩම් හෙක්ටයාර් 200 ක් අවම වශයෙන් වෙන් කළ යුතුය.

කළුතර සැලසුම් බලප්‍රදේශය තුළ වර්තමානයේ පවතින සෘජු සහ වක්‍ර විනෝද පහසුකම්

සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන සංඝටක දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලනු ලැබේ. සෘජු විනෝද කටයුතු පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී විය හැකි පහසුකම් ප්‍රමාණයක් අවශ්‍යය. එනම්,

- *ක්‍රීඩා කිරීම*
- *පිහිනීම*
- *දිවීම*
- *ඇවිදීම*
- *බෝට්ටු පැදීම*
- *සම්ප්‍රදායික මසුන් ඇල්ලීම නිදසුන් ලෙස දැක්විය හැක.*

කළුතර සැලසුම් බලප්‍රදේශයේ ඉහත අවශ්‍යතාවයන් සපුරාගත හැකි ස්ථාන සීමිත අතර එම ස්ථාන පිළිබදව විස්තර වගු අංක 6.4 යටතේ සහ ඊට අදාළ නීති රෙගුලාසි / මාර්ගෝපදේශ වෙළුම II යටතේ දක්වා ඇත.

| *අනු අංකය* | *උද්‍යාන වර්ගය* | *ප්‍රමාණය (ha)* |
|---|---|---|
| *1.* | *ඉතා කුඩා උද්‍යාන – Pocket Parks (EPP)* | *1.06* |
| *2.* | *කුඩා උද්‍යාන – Mini Park (EMP)* | *18.54* |
| *3.* | *මධ්‍යම උද්‍යාන පහළ මට්ටම – Local Parks (ELP)* | *1.45* |
| *4.* | *වෙරළ උද්‍යාන – Beach Park (EBP)* | *19.47* |
| | ***එකතුව*** | ***40.52*** |

*වගුව 6.4 : කළුතර සැලසුම් බලප්‍රදේශයේ සෘජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

වගු අංක 6.4 හි සඳහන් තොරතුරු වලට අනුව කළුතර සැලසුම් බලප්‍රදේශය තුළ දැනට හෙක්ටයාර් 40.52 ක් විවෘත භූමි ලෙස ඇත. වර්තමාන ජනගහනය මත 170,835 සඳහා පොදු එළිමහන් විවෘත භූමි ලෙස හෙක්ටයාර් 170 ක් වෙන්ව තිබිය යුතුය. නමුත් වගු අංක 6.4 ට අනුව වර්තමාන ජනගහනයට ප්‍රමාණවත් පොදු එළිමහන් විවෘත භූමි කළුතර සැලසුම් බලප්‍රදේශයේ නොමැති අතර දැනට පවතින ස්ථාන වල ද පහසුකම් ප්‍රමාණවත් නොවේ.

දැනුම වර්ධනය කර ගැනීම සහ විනෝද පහසුකම් සළසාගත හැකි ස්ථාන පහත පරිදි වේ.

1. *මහජන පුස්තකාල – 6*
    a. *ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල සංඛ්‍යාව – 3*
    b. *නගර සභාවට අයත් පුස්තකාල සංඛ්‍යාව – 2*
    c. *කළුතර බෝධි භාරකාර මණ්ඩලයට අයත් පුස්තකාල සංඛ්‍යාව – 1*

2. *නගර ශාලා – 1*
3. *සිනමා ශාලා – 4*
    a. *ප්‍රිස්කෝ*
    b. *චිත්‍රා*
    c. *නිව් මිනර්වා*
    d. *දොන් ප්ලාසා*

4. *කියවීම් ශාලා – 3*
5. *ප්‍රජාශාලා – 37*

2030 වන විට ජනගහනය 199,854 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට පොදු එළිමහන් විවෘත භූමි ලෙස ඉඩම් හෙක්ටයාර් 200 ක් අවම වශයෙන් වෙන් කළ යුතුය. කළුතර සැලසුම් බලප්‍රදේශය සඳහා 2019 – 2030 වසර සඳහා පොදු එළිමහන් විනෝද පහසුකම් සැලැස්ම සඳහා වන වැඩිදුර විස්තර සිතියම් අංක 6.8 යටතේ ද වගු අංක 6.5 සහ ඇමුණුම 16 හා 17 මඟින් ද දක්වා ඇත.

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය (ha) |
|---|---|---|
| 1. | යෝජිත මධ්‍යම උද්‍යාන පහළ මට්ටම<br>Proposed Local Parks | 1.08 |
| 2. | යෝජිත රේඛීය උද්‍යාන<br>Proposed Linear Park | 118 |
| 3. | යෝජිත වෙරළ උද්‍යාන<br>Proposed Beach Park | 45.01 |
| | **එකතුව** | **164.28** |
| 4. | පවතින පොදු එළිමහන් විවෘත භූමි ප්‍රමාණය | 40.51 |
| | **සමස්ත එකතුව** | **204.79** |

**වගුව 6.5 :** කළුතර සැලසුම් බලප්‍රදේශය සඳහා 2019 – 2030 වසර සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම | **මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## 6.5.4.1. යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම සඳහා උපාය මාර්ග

මෙහිදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ.

- *දැනට පවතින සියළුම ක්‍රීඩා බිම් සහ ක්‍රීඩා කළ හැකි සහ පොදු විවෘත භූමි ලෙස පවතින හිස් ඉඩම් හැකිතාක් දුරට සෘජු විනෝද පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීම, වර්ගීකරණය කිරීම හා ප්‍රතිසංවර්ධනය කිරීම.*
- *ප්‍රදේශයේ පවතින සියළු ක්‍රීඩාංගන පහසුකම් සහිතව ප්‍රතිසංවර්ධනය කිරීම.*
- *පවතින විවෘත භූමි සහ හිස් ඉඩම් පරිසර හිතකාමී ආකාරයට උද්‍යාන සහ ක්‍රීඩා පිටි ලෙස සංවර්ධනය කිරීම.*
- *විවෘත භූමි සම්බන්ධ නීති රෙගුලාසි බලාත්මක කිරීම මඟින් අනවසර ඉදි කිරීම් පාලනය කිරීම.*
- *පවතින ක්‍රීඩාපිටි සහ උද්‍යාන වල නඩත්තු සහ කළමනාකරණ කටයුතු ඉහළ මට්ටමකට ගෙන ඒම.*
- *රුක් හිරු මඟින් භූ දර්ශනය වැඩි කිරීම.*
  - *විවෘත ස්ථානයේ ඇති ඉඩ ප්‍රමාණයට ගැළපෙන අලංකාර ශාක විශේෂ මේ සඳහා යොදා ගත හැකිය. නගරයට අනන්‍යතාවයක් ලැබෙන සේ ශාක වර්ගයක් හෝ කීපයක් භාවිතා කළ හැකිය.*
  - *මාර්ග සංවර්ධන කටයුතු වලදී නගර සංවර්ධන සංකල්පය අනුව භූ දර්ශනය හා රුක් රෝපණ කලාප ඇති කිරීම.*
- *සමාජීය විනෝද කටයුතු පහසුකම් දේශීය සහ විදේශීය සංචාරකයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි සංචාරක අවශ්‍යතා වලට ගැළපෙන ප්‍රමිතියෙන් යුතු ක්‍රීඩා සමාජ, නිවාඩු නිකේතන, බංගලා, සංචාරක හෝටල්, ස්ථාපිත කිරීම.*

## 6.5.4.2. 2030 වන විට උෂ්ණත්වය අඩු කිරීම සඳහා උපාය මාර්ග

මෙහිදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ.

- සියළුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි නිල හරිත ශ්‍රී ලංකා ජාතික ගොඩනැගිලි හරිතකරණය අනුව සිදු කිරීම.
- සියළුම කාර්යාල සහ නිවාස ඉදිකිරීමේදී වහළ මත හරිත පියසි ඉදිකිරීම සහ හරිත පියසි තුළ ජල විහිදුම් ක්‍රම (Water sprinkler) භාවිතයට යොමු කිරීම.
- ගොඩනැගිලි වර්ණ ගැන්වීමේදී ලා වර්ණ යෙදීම පිළිබදව දැනුවත් කිරීම.
- යෝජිත සියළුම වාහන නැවතුම්හල් සඳහා හරිත නැවතුම් සංකල්පය හඳුන්වාදීම සහ පවතින වාහන නැවතුම්පළවල් හරිත නැවතුම්පළවල් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම.
- බිම් ඇතුරුම් ක්‍රම ජලය පොළොවට උරාගන්නා ක්‍රමවේදයන්ට පමණක් සීමා කිරීම (interlocking) සහ ඒවා ලා වර්ණයන්ට පමණක් සීමාකිරීම.
- පවතින ක්‍රීඩාභූමි, උද්‍යාන සහ විවෘත භූමි නඩත්තු කිරීම සහ යෝජිත විවෘත භූමි හරිත සංකල්පයන් මුලික කොට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

දැනට පවතින විවෘත භූමි පිළිබඳ තොරතුරු ඇමුණුම් අංක 17 ට අනුව හඳුනාගත හැකිය.




*සිතියම 6.8 : කළුතර සැලසුම් බලප්‍රදේශය සඳහා වන පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (2019 - 2030)*

*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

## 6.5.5. කෘෂිකාර්මික සැලැස්ම

නාගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දත්ත වලට අනුව සමස්ත සැලසුම් බලප්‍රදේශයේ කෘෂිකාර්මික අංශය කුඹුරු, රබර්, පොල් සහ කුරුඳු යන අංශයන්ගෙන් සමන්විත වේ. එහිදී සමස්ථ සැලසුම් බලප්‍රදේශයේ මුළු භූමි පරිභෝජනයෙන් රබර් 10.5% ක් ද , පොල් 5.22% ක්ද කුරුඳු 0.4% ක්ද කුඹුරු 30.7% ක්ද පවතින බව හඳුනාගෙන ඇත.

සමස්ත ආර්ථිකයෙන් කෘෂිකාර්මික අංශයේ දායකත්වය 4.59 % වැනි සුළු අගයක් ගන්නා අතර නව දුරටත් පවත්නා පහත්බිම් ආරක්‍ෂා කර ගනිමින් කෘෂිකාර්මික අංශය සඳහා දායකත්වය ලබා දීමට කටයුතු සළසා ඇත. මේ පිළිබඳ පාරිසරික සංරක්‍ෂණ සැලැස්මේ එන තෙත් බිම් කෘෂිකාර්මික කලාපය යටතේ විස්තර වන අතර ඒ සඳහා බල පැවැත්වෙන නීති රෙගුලාසි වෙළුම II හි සඳහන් වේ.

ප්‍රධාන වශයෙන් රබර් බෝගය බහුලව ව්‍යාප්තව ඇත්තේ කිතුළාව ග්‍රාම නිලධාරී වසම තුළ වන අතර ප්‍රමාණය මුළු භූමි පරිභෝජනයෙන් 10.5% කි. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින කුඩා රබර් ඉඩම් හිමියන්ගේ ප්‍රමාණය 85 කි.මෙම රබර් වගාව සඳහා පවතින ගැටළු වශයෙන් ,

1. *කර්මාන්ත සඳහා රබර් ඉඩම් යොදා ගැනීම.*
2. *රබර් සඳහා ඇති වෙළඳපොල මිල අඩුවීම හේතුවෙන් කටුපොල් වැනි අතිරේක බෝග සඳහා මෙම භූමි යොදා ගැනීම.*
3. *පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟ බව*
4. *රබර් ඉඩම් නේවාසික කටයුතු සඳහා අනුබෙදුම් වීම.*

මීට අමතරව රබර් නිෂ්පාදනයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා අගලවත්ත රබර් පර්යේෂණ ආයතනය හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේත් යෝජනාවන් ද ක්‍රියාවට නැංවීමට යෝජනා කර ඇත.

ඒ අනුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ යෝජනාවන් වන්නේ,

1. *ජල පෝෂක ප්‍රදේශ වල පාංශු ඛාදනය , නාය යෑම් තත්වයන් ඇති වීම වැළැක්වීම සඳහා ස්වභාවික වන වගාවක් ලෙස රබර් වගාව ව්‍යාප්ත කිරීමට රජයේ ඉඩම් වල බලපත්‍රලාභීන් හා පෞද්ගලික ඉඩම් හිමියන් පෙළඹවීමට ක්‍රියා කිරීම.*
2. *කුඩා රබර් හිමියන්ට රබර් වගාව වෙනුවෙන් ලබා දෙන ආධාරය දෙගුණයකින් වැඩි කර ලබා දීම.*
3. *රබර් වගාව සමඟ නියමිත පරතරයෙන් යුතු අතුරු භෝග යෙදීමත්, වැසි ආවරණ යෙදීමත් තුළින් ඵලදායීතාවය වැඩි කිරීමට ව්‍යාප්ති සේවාවක් මඟින් ගොවීන් උනන්දු කරවීම*

සැලසුම් බලප්‍රදේශයේ පොල් වගාවද ප්‍රධාන වශයෙන් වත්තමුල්ල ග්‍රාම නිලධාරී වසමේ සිදු වන අතර එය ප්‍රමාණයෙන් 5.2% කි. පොල් සංවර්ධන මණ්ඩලය පොල් වගාවේ ඵලදායීතාව වැඩි කිරීම සඳහා සහනාධාර ලබාදීම ක්‍රියාත්මක කරන අතර මෙම සැලැස්ම යටතේද එම යෝජනා ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.

# 6.6. සංස්කෘතික, ආගමික හා උරුමයන් කළමනාකරණ සැලැස්ම

කළුතර සැලසුම් බලප්‍රදේශය විවිධාංගිකරණය වූ සංස්කෘතික උරුමයන් සහිත ප්‍රදේශයක් වන බැවින් එකී සංස්කෘතික උරුමයන් ආරක්‍ෂා කර ගනිමින් හා ඒවායේ අනන්‍යතාවය රැක ගනිමින් එම සංස්කෘතික උරුමයන් කළමනාකරණය කිරීම පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරේ.

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින සංස්කෘතික වැදගත්කමක් ඇති ප්‍රදේශය ආරක්‍ෂා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මෙම උපක්‍රමය තුළින් බලාපොරොත්තු වේ.

ඒ අනුව කළුතර බෝධිය අවට කලාපය පූජා නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර මීටර් 300 ක් කලාපයේ ගොඩනැගිලි වල මුහුණත වර්ණය, ගොඩනැගිලි උස හා අනුමත භාවිතයන් පිළිබඳ විශේෂ රෙගුලාසි වෙළුම II හි සඳහන් වේ.

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය විවිධ සංස්කෘතීන් කිහිපයක සම්මිශ්‍රණයෙන් සැදුම්ලත් ප්‍රදේශයකි. එබැවින් ආගමික හා වෙනත් සංස්කෘතික උරුමයන් රැසක් මෙහි පවතී.

ආගමික සිද්ධස්ථාන අතුරින් බහුලවම පවතින්නේ බෞද්ධාගමික සිද්ධස්ථාන වන අතර එයට හේතුව ලෙස වැඩි වශයෙන් බෞද්ධ ජනතාව මෙහි වාසය කිරීම හඳුනාගත හැක.

## 6.6.1 ප්‍රදේශයේ පවතින බෞද්ධ ආගමික ස්ථාන

1. *ඓතිහාසික කළුතර බෝධිය*
2. *කළුතර උතුරු අශෝකාරාම මහා විහාරය*
3. *ශ්‍රී සුධර්මාකර පුරාණ විහාරය*
4. *වාළුකාරාම මහා විහාරය*
5. *මහී සර්ජනාරාම පුරාණ ශ්‍රී මහා විහාරය*
6. *පුලිනතලාරාම මහා විහාරය*
7. *කන්දේ පුරාණ විහාරය*
8. *ශ්‍රී නිග්‍රෝධාරාම මහා විහාරය*
9. *රාජගුරු ශ්‍රී සුභූති මහා විහාරය*
10. *පුරාණ විවේකාරාම වජ්කොන් විහාරය*
11. *ගනේවත්ත පුරාණ විහාරය*
12. *මල් අස්නේ රජ මහා විහාරය*

## 6.6.2 සංස්කෘතිකාංග

මෙම බෞද්ධ සිද්ධස්ථාන මූලික කරගනිමින් පැවැත්වෙන සංස්කෘතිකාංග රාශියක්ද පවතී. මිහිඳු පෙරහැර එහි මූලික ස්ථානයක් ගනී. ඉහත සඳහන් කළ බෞද්ධ සිද්ධස්ථාන අතුරින් කළපුගම ශ්‍රී සුමංගලාරාමය, උග්ගල්බොඩ මල් අස්නේ රජමහා විහාරය, ඇතගම විජයාරාම විහාරය යනාදී විහාරස්ථාන මිහිඳු මහා පෙරහැර ඉතා අලංකාරව පවත්වනු ලබයි. මීට අමතරව පහත සංස්කෘතික අංග ද ප්‍රදේශයේ සංස්කෘතික උරුමයන්ගේ වටිනාකම ඔප් නංවයි.

1. *හේනවත්ත මුණසිංහ විජයරාජ විහාරයේ වාර්ෂික බිනර මහා පෙරහැර*
2. *කළුතර දකුණ දීපාරාම විහාරස්ථානයේ සම්බුද්ධ ජයන්ති මහා පෙරහැර*
3. *කිතුළාව මිහිකතවත්ත ශ්‍රී සම්බෝධි විහාරයේ වාර්ෂික ඇසළ මහා පෙරහැර*

ඉහත සඳහන් කළ බෞද්ධ ආගමික ස්ථාන වලට අමතරව අන්‍ය ආගමික ස්ථාන කිහිපයක්ද කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත.

මුස්ලිම් දේවස්ථාන

1. *මුස්ලිම් දේවස්ථානය, ද සිල්වා පාර, කළුතර දකුණ.*
2. *මුස්ලිම් දේවස්ථානය, වෙට්ටුමකඩ පාර, කළුතර දකුණ.*
3. *නක්බන්දියා මුස්ලිම් දේවස්ථානය, කළුතර දකුණ.*
4. *මුස්ලිම් දේවස්ථානය, මහ හීනටියන්ගල.*
5. *ඇල්දෝරු පතුල් හසන්යා මුස්ලිම් දේවස්ථානය, ජෝන් වීදිය, කළුතර .*
6. *මුස්ලිම් කුඩා පල්ලිය, නො:269, ගාලු පාර, කළුතර.*

කතෝලික දේවස්ථාන

1. *දේව සභාව, නොටුපල පාර, කළුතර උතුර.*
2. *ශුද්ධ වූ ජුවාම් ශාන්තුවරයාගේ දේවස්ථානය, නොටුපල පාර, කළුතර උතුර*
3. *මොස්ට් රිඩන් කතෝලික දෙව් මැදුර, තේක්කවත්ත, කළුතර දකුණ*
4. *සිරිකුරුස දේවස්ථානනය, කළුතර දකුණ.*
5. *මෙතෝදිස්ත දේවස්ථානය, නො:220, ගාලු පාර, කළුතර*
6. *ශුද්ධ වූ විනය අශුධූත දෙව්මැදුර, විශේෂ කාර්ය බලකාය පාර, නාගොඩ.*
7. *පිලිප් නේරි දේවස්ථානය, නො:17, පිලිප් නේරි පාර, කටුකුරුන්ද, කළුතර*
8. *ශාන්ත අන්තෝනි දෙව්මැදුර, කලමුල්ල, කළුතර.*
9. *ජේසු බිළිඳු පල්ලිය, කලමුල්ල, කළුතර*
10. *මරියා තුමියගේ පල්ලිය (ගල්ලෙන් පල්ලිය) කලමුල්ල පාර, කළුතර.*
11. *ශාන්ත සෙබස්තියන් මුනිතුමන්ගේ දේවස්ථානය*

වෙනත්

1. *කළුතර ශ්‍රී අම්මාන් කෝවිල*
2. *පැරණී කතරගම දේවාලය*
3. *ශාන්ත යොහානා දෙව්මැදුර*
4. *උග්ගල්බඩ මහා දේවාලය*

මෙම ආගමික ස්ථාන අතුරින් කළුතර ශ්‍රී අම්මාන් කෝවිලේ වාර්ෂික වේල් පෙරහැර හා කටුකුරුන්ද, පැරණී කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර, ප්‍රදේශයේ පවත්වන තවත් සංස්කෘතික අංග දෙකකි. මීට අමතරව ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතින කතෝලික පල්ලි වල වාර්ෂික මංගල්‍යයන් ද පැවැත්වේ.

## 6.6.3 සංරක්ෂණය කරන ප්‍රදේශ

මෙම ආගමික ස්ථාන වලට අමතරව සංස්කෘති හෝ ඓතිහාසික වටිනාකමක් ඇති තවත් ස්ථාන කිහිපයක්ම සැලසුම් ප්‍රදේශයේ පවතී. ඒවා වගුව 6.6 හි දැක්වේ.

| සංස්කෘතික | ඓතිහාසික |
|---|---|
| 1. රිච්මන්ඩ් - කාසල් මැදුර<br>2. දියගම පැලුණු ගල | 1. නගර සභා ගොඩනැගිල්ල<br>2. ඥානෝදය විද්‍යාලය<br>3. පොලිස් අධිකාරී කාර්යාලය<br>4. දිසා අධිකරණ කාර්යාලය<br>5. කළුතර ඔරලෝසු කණුව |

*වගුව 6.6 : කළුතර සැලසුම් බලප්‍රදේශයේ සංස්කෘතික හා ඓතිහාසික වටිනාකම් සහිත ස්ථාන*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

මෙම ස්ථාන සංරක්‍ෂණය කිරීමට ගන්නා ලද උපක්‍රම පිළිබඳව සංචාරක සැලැස්ම යටතේ වැඩි දුරටත් විස්තර කෙරෙන අතර ඊට අදාළ නීතිමය රෙගුලාසි වෙළුම II හි සඳහන් කර ඇත.

ඉහත හඳුනාගන්නා ලද සංස්කෘතික ස්ථාන හා සංස්කෘතිකාංග ආරක්‍ෂා කර ගැනීමට විශේෂ සංස්කෘතික ප්‍රදේශයක් මෙම සැලැස්ම යටතේ හඳුනාගෙන නොමැති අතර ඒ සඳහා වෙනම සංස්කෘතික හා ඓතිහාසික උරුම කළමනාකරණ සැලැස්මක් ද සකස් කර නොමැත. නමුත් වෙනත් පිළියෙල කර ඇති සැලසුම් යටතේ එම ස්ථාන ආරක්‍ෂා කර ගැනීමට හා සංරක්‍ෂණය කර ගැනීමට අදාළ උපාය මාර්ග පිළිබඳ සලකා බලා ඇත. තවද පුරා විද්‍යා දෙපාර්තමේන්තුව යටතේ එම සංරක්‍ෂණ ස්ථානයන් අධීක්‍ෂණය වේ.

## 6.7. නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම

2030 වර්ෂය වන විට ඇති කරන ජනගහන කළාප පිළිබඳවත්, ජනගහන ප්‍රවර්ධන න්‍යෂ්ඨි හා එමඟින් යෝජිත නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳවත් මෙහිදී සාකච්ඡා කෙරේ.

කළුතර සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගත් දැක්ම අනුසාරයෙන් කළුතර නගරය වූ කලි නේවාසිකයන් සඳහා ආපදාවකින් තොරව සුවපහසුවෙන් සිටිය හැකි නගරයක් ලෙස සංවර්ධනය කළ යුතු බව හඳුනාගත් අතර, එම දැක්ම කරා ළඟාවීම සඳහා නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇත.

මෙලෙස නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමට හේතු වූයේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ස්වභාවික උවදුරු අතින් හා පාරිසරික සංවේදී කලාප අතින් බහුලව පවත්නා ප්‍රදේශයක් බැවින් එකම ස්ථානයකට ජනගහනය ඒකරාශී කිරීම හා සේවා සැපයීම අපහසු වන බැවිනි. එනිසා විසිරි ආකාරයට සේවා සැපයීමට තීරණය කළ අතර ඒ සඳහා 2030 වන විට වැඩිවන ජනගහනය ව්‍යාප්ත කිරීමේදී ඝනත්වය වැඩිවිය යුතු ප්‍රදේශය හා අඩු විය යුතු ප්‍රදේශය වෙන වෙනම නේවාසික ව්‍යාප්ති යෝග්‍යතා විශ්ලේෂණය (Settlement Suitability analysis ) (ඇමුණුම 18) හරහා හඳුනා ගන්නා ලදී.

ඒ අනුව මෙම සැලැස්ම යටතේ සපුරා ගැනීමට බලාපොරොත්තු වන අරමුණ වන්නේ 2030 වර්ෂය වන විට අසල්වැසි න්‍යෂ්ටි (Neighborhood Nodes) 6ක් ද නේවාසික න්‍යෂ්ටි ( Residential Nodes) 2ක් ද හා සෞඛ්‍ය ප්‍රවර්ධන න්‍යෂ්ඨියක් ( Health service Nodes) ඇති කරමින් ජනගහන කලාප 4ක් ඇති කිරීමයි.

එම අරමුණ කරා ළඟා වීමට උපාය මාර්ග 2ක් භාවිතා කරනු ලැබේ. ඒවා නම්,

1. *ජනගහන කලාපීකරණ රෙගුලාසි (Zoning regulation) භාවිතා කරමින් ආපදා අවදානම ඇති ප්‍රදේශ වල හා ජල සංචලනයට දායක වන පාරිසරික සංවේදී ප්‍රදේශ වල ජනගහන ව්‍යාප්තිය පාලනය කිරීම.*
2. *නාගරික සේවා , යටිතල පහසුකම් විසිරි ආකාරයට සපයමින් හා කලාපීකරණ රෙගුලාසි භාවිතා කරමින් විවිධ නේවාසික ඝනත්ව කලාප 4ක් ඇති කිරීම*

යනාදියයි.

මෙසේ ජනගහන ව්‍යාප්ත කිරීමට අවශ්‍ය සේවා සැලසීම සඳහා එම සේවාවන් සඳහා පහසුවෙන් ළඟාවීමට ඇති හැකියාව , ප්‍රදේශයේ මංසන්ධි සඳහා පවතින මාර්ග සම්බන්ධතාවය හා සංවර්ධන සැලැස්මේ අනාගත දැක්මද යන කරුණු මූලික කර ගනිමින් සේවාවන් සැපයීම සඳහා සුදුසු මංසන්ධි තෝරා ගැනීම සිදු කෙරුණි. එහිදී පළමුවෙන්ම දැනට පවත්නා සේවාවන් හා ඒවා වෙත ළඟා වීමට ඇති හැකියාව ඇමුණුම අංක 19 හි දැක්වෙන පරිදි සේවා පහසුතා විශ්ලේෂණය (Easyness to achieve service) මගින් හඳුනාගත් අතර දෙවනුව මාර්ග සම්බන්ධතාවය අනුව ප්‍රදේශයේ මංසන්ධියකට ලැබෙන ප්‍රමුඛතාවය ඇමුණුම් අංක 20 හි දැක්වෙන පරිදි මංසන්ධි ප්‍රමුඛතා විශ්ලේෂණය අනුව හඳුනා ගන්නා ලදී. ඒ අනුව මෙම විශ්ලේෂණයන්ගේ නිගමනයන්ද සලකමින් සංවර්ධනය කළ යුතු න්‍යෂ්ටි පහත පරිදි හඳුනා ගන්නා ලදී.

- *නේවාසික න්‍යෂ්ටි (Residential Nodes) – සෙන්ට්‍රල් හන්දිය, මොරොන්තුඩුව*
- *අසල්වැසි න්‍යෂ්ටි (Neighborhood Nodes) – පලාතොට, කොලනිය, මල්වත්ත, උග්ගල්බඩ, මිල්ලගස් හන්දිය , ඇළමෝදර*
- *සෞඛ්‍ය ප්‍රවර්ධන න්‍යෂ්ටි ( Health service Nodes) – නාගොඩ*

ඒ අනුව කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා 2030 වර්ෂය වන විට පුරෝකථනය කරන ලද නේවාසික ජනගහනය 199,854ක් වූ අතර එම ජනගහනය විවිධ ඝනත්වයකින් යුතු නේවාසික ඝනත්ව කලාප අතර බෙදී යන ආකාරය පහත පරිදි වේ.

සංවර්ධන සැලැස්ම යටතේ වාණිජ කලාපය සඳහා පුරෝකථනය කර ඇති ජනගහනය එලෙසම සිටින බව අනුමාන කරන ලදී. එය 29626කි. ඒ අනුව සැලසුම් බලප්‍රදේශය සඳහා කරන ලද පුරෝකථනයට අනුව ලද මුළු ජනගහනයෙන් අනතුරුව ප්‍රදේශය තුළ බෙදා හැරිය යුතු ජනගහනය 170228 කි.

මෙම ඉතිරි ජනගහනය හඳුනාගත් නේවාසික කලාප හතරෙහි ඝනත්වයන් තුනක් යටතේ ව්‍යාප්ත කිරීමට අවශ්‍ය විය. මේ සඳහා දැනටමත් කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්නා උපරිම හා අවම ඝනත්ව යොදා ගැනීමට තීරණය කෙරුණි. එයට හේතුව වන්නේ එම පවතින ජනගහන ඝනත්ව වර්තමාන සංවර්ධන මට්ටම් යටතේ වුවද නොනැසි, ගැටළු ඇති නොවන ආකාරයෙන් පවතින බැවින් අනාගත සංවර්ධන මට්ටම් යටතේදී ද නොනැසී පැවතීමේ සම්භාවිතාව ඉහළ බැවිනි.

මේ අනුව දැනට කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින ඉහළම ජනගහන ඝනත්වය වන 21426.6 පුද්/ව.කි.මී ඉහළ ඝනත්ව නේවාසික කලාපයට හා ඉහළ ඝනත්ව උස පාලිත නේවාසික කලාපයට යොදා ගැනුණි. අවම ඝනත්වය වන 903.88 පුද්/ව.කි.මී අඩු ඝනත්ව නේවාසික කලාපයට යොදා ගැනුණි. මධ්‍යස්ථ ඝනත්ව නේවාසික කලාපයට ඉහත ඝනත්ව දෙකෙහි මධ්‍යස්ථ අගය යොදා ගැනුණි. ඉන් මෙම කලාප හතරෙහි ව්‍යාප්ත කළ හැකි උපරිම ජනගහනය ගණනය කර ගන්නා ලදී.

උපරිම ජනගහන = උපරිම ජන ඝනත්වය x භූමි ප්‍රමාණය

එම උපරිම ජනගහන අතර අනුපාතයට අනුව ඉතිරි ජනගහනය (170,228) නේවාසික කලාප හතරට බෙදා වෙන් කෙරුණි. ඉන් එම කලාප සඳහා යෝජිත ජනගහනය ගණනය කර ගන්නා ලදි.

ඉතිරි ජනගහන x ජනගහන ඝනත්ව අනුපාතය = කලාපයට අදාළ යෝජිත ජනගහනය

ඒ අනුව හඳුනාගත් විවිධ ඝනත්වයෙන් යුත් නේවාසික කලාප අතර ජනගහන ව්‍යාප්තිය වගු අංක 6.7 ට අනුව හඳුනාගත හැක.

| නේවාසික කලාපය | ජනගහනය | යෝජිත ජනගහන ඝනත්වය |
|---|---|---|
| ඉහළ ඝනත්ව නේවාසික කලාපය<br>(High Density Residential Zone) | 91568 | 6324.61 |
| ඉහළ ඝනත්ව උස පාලිත නේවාසික කලාපය<br>(High Density Height Control Residential Zone) | 15895 | 6297.27 |
| මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය<br>(Moderate Density Residential Zone) | 57599 | 3281.40 |
| අඩු ඝනත්ව නේවාසික කලාපය<br>( Low Density Residential Zone) | 5166 | 3281.90 |
| **මුළු ජනගහනය** | **170228** | **265.62** |

**වගුව 6.7 :** විවිධ ඝනත්වයෙන් යුතු නේවාසික කලාප අතර ජනගහන ඝනත්වය හා ව්‍යාප්තිය
**මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය (2018)

මෙලෙස නේවාසක සැලැස්ම යටතේ සැළසුම් බලප්‍රදේශය සඳහා පුරෝකථනය කරන ලද ජනගහනය විසිරි ආකාරයට ජනගහන කලාප 04 සඳහා ව්‍යාප්ත කළ අතර එය සිතියම 6.9 මඟින් දැක්විය හැකිය.




**සිතියම 6.9 :** *කළුතර සැලසුම් බලප්‍රදේශයේ නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය (2019 - 2030)* **මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය (2018)*

# 6.8. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංවර්ධන සැලැස්මෙහි "දැක්ම" හා අරමුණු වෙත ළඟාවීම සඳහා උපායමාර්ගික සැලසුම් 05 ක් හඳුනාගෙන ඇත. ඉහත විස්තර කරන ලද මෙම උපායමාර්ගික සැලසුම් 05 වන ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම, තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම හා සංස්කෘතික හා උරුමයන් කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම යටතේ හඳුනාගත් සමස්ත උපායමාර්ගික ව්‍යාපෘති සංඛ්‍යාව 72 ක් වේ. මෙම උපාය මාර්ග 72 ප්‍රමුඛතා ලැයිස්තුගත කිරීම මෙම ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ විස්තර කෙරේ.

## *උපායමාර්ගික ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම*

මෙම උපායමාර්ගික ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීමේ පළමු පියවර ලෙස "දැක්ම වෙත ළඟාවීමට වඩා වැදගත් වන ව්‍යාපෘති" යන පදනම මත හා ව්‍යාපෘති වල සමාජ හා පාරිසරික බලපෑම සළකමින් ද්විත්ත්ව සංසන්දනය (Pairwise Comparison) සිදුකරනු ලැබීය. ඉන් අනතුරුව එසේ පෙළගසා ගත් උපායමාර්ගික ව්‍යාපෘති "අරමුණු වෙත ළඟාවීමට ඇති හැකියාව" යන පදනම මත මෙම සැලැස්මේ අරමුණු 03 ක් යටතේ "බර තබන ලද පිරික්සුම් ලැයිස්තු" (Weighted Cheek List) ක්‍රමය යටතේ පෙළගසා ගන්නා ලදී. එසේ සකස් කරන ලද ව්‍යාපෘති හා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතන පහත පරිදි දැක්විය හැකිය.

මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාවන් 2019 වර්ෂයේ සිට වසර කීපයක් ඇතුළත ද යන්න මේ සමඟ දක්වා ඇත. ඊට අමතරව 2019–2030 කළුතර සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගත් උපායමාර්ගික ව්‍යාපෘති ඇමුණුම 21 යටතේ දක්වා ඇත.

| | *උපායමාර්ගික ව්‍යාපෘතිය* | *ව්‍යාපෘතිය හඳුනාගත් සැලැස්ම* | *ක්‍රියාත්මක කිරීමේ ආයතනය* | *වසර 5ක් ඇතුළත* | *වසර 10ක් ඇතුළත* |
|---|---|---|---|---|---|
| 1. | උසාවි සංකීර්ණය කළුතර දකුණ ගාලු පාරේ වෙට්ටුමකඩ ප්‍රදේශයේ පිහිටි "සරලක්වත්ත ඉඩමේ" ප්‍රතිස්ථාපනය කිරීම | සංචාරක සංවර්ධන සැලැස්ම | අධිකරණ අමාත්‍යාංශය | | |
| 2. | කළුතර දකුණ උසාවි සංකීර්ණය තුළ පිහිටි පැරණි විනිසුරු නිල නිවස ලක්සල ගොඩනැගිල්ලක් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම | සංචාරක සංවර්ධන සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 3. | දැනට පවතින උසාවි සංකීර්ණය සුඛෝපභෝගී වාණිජ සංකීර්ණයක් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම. | සංචාරක සංවර්ධන සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 4. | කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ තෝරාගත් ග්‍රාම නිලධාරී කොට්ඨාස සඳහා මළ හා අපජල කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම | මළ හා අපජල කළමනාකරණ සැලැස්ම | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | | |
| 5. | කළුතර පාලම් ද්විත්ත්වය අතර පිහිටි තලාව භූමියේ ගාලු පාරත් දුම්රිය මාර්ගයත් අතර කොටස තුළ භූමි දර්ශනය සැකසීම | සංචාරක සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | | |

| | උපායමාර්ගික ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය හඳුනාගත් සැලැස්ම | ක්‍රියාත්මක කිරීමේ ආයතනය | වසර 5ක් ඇතුළත | වසර 10ක් ඇතුළත |
|---|---|---|---|---|---|
| 6. | කළුතර පලාතොට මාර්ගයේ ඔරලෝසු කණුව අසළ සිට කළුතර නගර සභාවේ නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානය දක්වාත්, කළුතර නගර ශාලාව දක්වාත්, ග්‍රෙගරි මාර්ගය හමුවන තෙක් ද මාර්ගයන් දෙපස ගස් වැවූ මාර්ග ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. | සංචාරක සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 7. | ආධාෂ මාවත සහ දකුණු ශ්‍රී සුමංගල මාවත කැලිඩෝ වෙරළට ප්‍රවේශ මාර්ග ලෙස සංවර්ධනය කිරීම. | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 8. | කුඩා හීනටියන්ගල ඇළ දෙපස හඳුනාගත් ප්‍රදේශය තුළ යෝජිත රේඛීය උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | සංචාරක සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 9. | කළු ගඟෙහි හඳුනාගත් ස්ථාන තුළ යෝජිත පාවෙන වෙළඳ කුටි ඉදිකිරීම. | සංචාරක සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 10. | නාගොඩ මහරෝහල් පරිශ්‍රය හා දැනට සංවර්ධනය කරමින් පවතින ළමා හා මාතෘ රෝහල සම්බන්ධ කිරීම සඳහා වන අතුරු මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | | |
| 11 | කළුතර බෝධි පරිශ්‍රයට අයත් මල් කඩපෙල ප්‍රතිසංස්කරණය කිරීම | සංචාරක සංවර්ධන සැලැස්ම | කළුතර බෝධි භාරකාර මණ්ඩලය | | |
| 12. | ගංවතුර පාලනය වන ආකාරයට කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 13. | කළුතර චෛත්‍යයේ සිට මීටර් 300ක වපසරියක් තුළ ගොඩනැගිලි උස සහ මුහුණත වර්ණය පාලනය | සංචාරක සංවර්ධන සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය<br>කළුතර නගර සභාව<br>කළුතර ප්‍රාදේශීය සභාව | | |
| 14. | ජල මාර්ග රක්ෂිත කලාප ආරක්ෂා කිරීම | තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය<br>කළුතර නගර සභාව<br>කළුතර ප්‍රාදේශීය සභාව<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | |
| 15. | කළුගඟේ ස්ථිර මෝයක් නිර්මාණය කිරීම හා වැලිපරය සංරක්ෂණය | තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>මෙගා පොලිස් ව්‍යාපෘතියේ වෙරළ ව්‍යාපෘති අංශය | | |
| 16 | කළු ගං මෝය රක්ෂිතයේ කඩොලාන වගාව | තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම | මධ්‍යම පරිසර අධිකාරිය<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | |

| | උපායමාර්ගික ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය හඳුනාගත් සැලැස්ම | ක්‍රියාත්මක කිරීමේ ආයතනය | වසර 5ක් ඇතුළත | වසර 10ක් ඇතුළත |
|---|---|---|---|---|---|
| 17 | කළුතර දකුණ කැළිඩෝ වෙරළ තීරයේ ජල කඩන ඉදිකිරීම | තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>මෙගා පොලිස් ව්‍යාපෘතියේ වෙරළ ව්‍යාපෘති අංශය | | |
| 18 | කළු ගඟෙහි ලවණ බාධකයක් ඉදිකිරීම | තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම හා ජල සැපයුම් සැලැස්ම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | | |
| 19 | ගංවතුර කළමනාකරණ ව්‍යාපෘතිය - දූව පන්සල පාර, කළුතර දකුණ | තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | |
| 20 | ගංවතුර කළමනාකරණ ව්‍යාපෘතිය - නාගොඩ හන්දිය , කළුතර දකුණ | තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | |
| 21 | සැලසුම් බලප්‍රදේශය තුළ නාය යෑමේ තර්ජන සහිත ප්‍රදේශ සංරක්ෂණය | තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | | |
| 22 | වස්කඩුව - වැසි ජල කළමනාකරණ සැලැස්ම | ආපදා කළමනාකරණ සැලැස්ම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | |
| 23 | ගාලුපාරේ නාගස් හන්දියේ සිට වාද්දුව දක්වා මංතීරු 04 මාර්ගයක් ඉදිකිරීම | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 24 | වාඩිය මංකඩ - බණ්ඩාරගම මාර්ගය මන්තීරු 04 මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 25 | කළුතර හොරණ මාර්ගය මංතීරු 02 ක සේවා සැපයුම් මංතීරුවද සහිත මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 26 | ගාලු පාරේ කටුකුරුන්ද සිට දළුවත්ත හන්දිය දක්වා මන්තීරු 04 මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 27 | කැලිඩෝ වෙරළ සංවර්ධන ව්‍යාපෘතිය, කළුතර දකුණ | සංචාරක සංවර්ධන සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 28 | ටැංජරින් හෝටලයේ සිට කැලිඩෝ වෙරළ ඔස්සේ දකුණු දෙසට කි.මීටර් 02 ක භූමි ප්‍රමාණයක ඝන (Bushy) පඳුරු රෝපණය කිරීමේ ව්‍යාපෘතිය | තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම | කළුතර නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 29 | පරණ පාර (ශ්‍රීමත් සිරිල්ද සොයිසා මාවත) මංතීරු 02 ක මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 30 | මාවල - මහරැක්ම පාර මංතීරු 02 ක මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | පලාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 31 | හිල් වීදිය මංතීරු 02 ක මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |

| | උපායමාර්ගික ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය හඳුනාගත් සැලැස්ම | ක්‍රියාත්මක කිරීමේ ආයතනය | වසර 5ක් ඇතුළත | වසර 10ක් ඇතුළත |
|---|---|---|---|---|---|
| 32 | ගාලු පාරේ මගී මංතීරු සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 33 | දුම්රිය පොළ පාරේ මගී මංතීරු සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 34 | බඩු ගබඩා පාරේ මගී මංතීරු සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 35 | සාරානන්ද පාරේ මගී මංතීරු සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 36 | චම්ලි ගුණවර්ධන මාවතේ මගී මංතීරු සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 37 | ඥාණෝදය මාවතේ මගී මංතීරු සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 38 | ග්‍රෙගරි පාරේ මගී මංතීරු සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 39 | පරණ පාරේ මගී මංතීරු සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 40 | කළුතර දකුණ බඩු ගබඩා පාරේ මහල් රථගාල සහිත වෙළඳ සංකීර්ණය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 41 | කළුතර ඔරලෝසු කණුව අසළ මගී උමං මාර්ගය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 42 | කළුතර දකුණ සාරානන්ද මාවතේ පරිපාලන සංකීර්ණය | ආර්ථික සංවර්ධන සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 43 | වෙරළ සමාන්තර පාර හරහා පන්හියේ හෝටල් සඳහා ප්‍රවේශ මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | ප්‍රාදේශීය සභාව - කළුතර | | |
| 44 | පොහොද්දරමුල්ල වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය, කළුතර උතුර | සංචාරක සංවර්ධන සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය<br>ප්‍රාදේශීය සභාව - කළුතර | | |
| 45 | කළුතර දකුණ රිච්මන්ඩ් කාසල් මන්දිරයේ භූ දර්ශන සංවර්ධනය | සංචාරක සංවර්ධන සැලැස්ම | අධිකරණ අමාත්‍යාංශය | | |
| 46 | ගෝනදූව හරිත සංචාරක කලාපය සංවර්ධනය | සංචාරක සංවර්ධන සැලැස්ම | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය<br>නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 47 | ඇළ මෝදර හන්දියේ සිට පැල්පොල අන්තර් භූවමාරු මධ්‍යස්ථානය දක්වා වන අතුරු මාර්ගය මංතීරු 02 ක සේවා සැපයුම් මංතීරුවද සහිත මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම. | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |

| | උපායමාර්ගික ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය හඳුනාගත් සැලැස්ම | ක්‍රියාත්මක කිරීමේ ආයතනය | වසර 5ක් ඇතුළත | වසර 10ක් ඇතුළත |
|---|---|---|---|---|---|
| 48 | කළුතර නගර සභාව, උද්‍යාන ක්‍රීඩාංගනය හා කළුතර නගර ශාලාව ඇතුළත් කළුතර නාගරික උද්‍යානය ප්‍රතිසංස්කරණය | සංචාරක සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව | | |
| 49 | කළුතර මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය | සංචාරක සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>ක්‍රීඩා අමාත්‍යාංශය | | |
| 50 | කළුතර දකුණ දුම්රියපොළ සංවර්ධනය | සංචාරක සංවර්ධන සැලැස්ම | දුම්රිය දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | | |
| 51 | කළුතර බස් නැවතුම්පල ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | සංචාරක සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 52 | කළුතර දකුණ සාරානන්ද මාවත අසළ යෝජිත රථගාල | සංචාරක සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 53 | කටුකුරුන්ද - මතුගම මාර්ගයේ නාගොඩ හන්දියේ සිට ගං ඉම දක්වා සේවා සැපයුම් මංතීරුව ද සහිතව මංතීරු දෙකක මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | කළුතර නගර සභාව<br>නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 54 | කළුතර දකුණ දූව පන්සල පාර සිට ගැමුණු මාවත දක්වා මංතීරු 02 මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 55 | කළුතර දකුණ ගැමුණු මාවත සිට කොළනිය හන්දිය දක්වා මංතීරු 02 මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 56 | කළුතර දකුණ ඔරලෝසු කණුවේ සිට පන්විල හන්දිය දක්වා (ගඟබඩ පාර) මංතීරු 02 මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 57 | කළුතර දකුණ පලාතොට හන්දියේ සිට නාගොඩ හන්දිය දක්වා (පොලිස් අභ්‍යාස විද්‍යාල පාර) මාර්ගය මංතීරු 02 මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 58 | කළුතර දකුණ ගල්ලස්ස පාර (උපාලි සහබන්ධු මාවත) මංතීරු 02 මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 59 | කළුතර වාද්දුව - මොරන්තුඩුව මංතීරු 02 මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 60 | කළුතර දකුණ විලේගොඩ පාර, අළුත් පාර හා එක්ව මංතීරු 02 ක මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |

| | උපායමාර්ගික ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය හඳුනාගත් සැලැස්ම | ක්‍රියාත්මක කිරීමේ ආයතනය | වසර 5ක් ඇතුළත | වසර 10ක් ඇතුළත |
|---|---|---|---|---|---|
| 61 | පොතුපිටිය - පනාපිටිය මාර්ගය මංතීරු 02 ක මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | ප්‍රාදේශීය සභාව - කළුතර | | |
| 62 | ඇටවිල මාර්ගය මංතීරු 02 ක මාර්ගයක් ලෙස සංවර්ධනය | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | ප්‍රාදේශීය සභාව - කළුතර | | |
| 63 | කළුතර මහ රෝහල් චතුරස්‍ර පරිශ්‍රය සංවර්ධන ව්‍යාපෘතිය | ආර්ථික සංවර්ධන සැලැස්ම | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | | |
| 64 | කළුතර බෝධි පරිශ්‍රයට යාබඳ කළු ගඟෙහි උපසම්පදා සීමා මාලකයක් ඉදිකිරීම. | සංචාරක සංවර්ධන සැලැස්ම | කළුතර බෝධි භාරකාර මණ්ඩලය | | |
| 65 | පැල්පොල අන්තර් හුවමාරු මාර්ගයේ විකල්ප මාර්ගය මංතීරු දෙකක මාර්ගයක් ලෙස සංවර්ධනය (මිල්ලගස් හන්දියේ සිට) | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |
| 66 | කළුතර මහා චෛත්‍යයේ දර්ශන පථ ආරක්ෂා කිරීම | සංචාරක සංවර්ධන සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය කළුතර නගර සභාව | | |
| 67 | මොරොන්තුඩුව හන්දිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | නිවාස සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 68 | නාගොඩ හන්දිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | නිවාස සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 69 | කළුතර හොරණ පාරේ මල්වත්ත හන්දියේ වාණිජ මධ්‍යස්ථානය ඉදිකිරීම | නිවාස සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ සැලැස්ම | නාගරික සංවර්ධන අධිකාරිය | | |
| 70 | කළුතර හොරණ පාරේ උග්ගල්බඩ පුස්තකාලයක් සහිත ප්‍රජා ශාලාවක්, වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකිරීම | නිවාස සනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ සැලැස්ම | කළුතර ප්‍රාදේශීය සභාව | | |
| 71 | කළුතර බෝධි භාරකාර මණ්ඩලයට අයත් රථගාල පරිශ්‍රයේ හා රිච්මන්ඩ් කාසල් පරිශ්‍රය අසළ කළු ගඟෙහි යෝජිත බෝට්ටු අංගන ද්විත්ත්වයක් ඉදි කිරීම | සංචාරක සංවර්ධන සැලැස්ම | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | | |
| 72 | කළුතර දකුණ නාගොඩ, බෝම්බුවල මංතීරු 02 මාර්ගය (සේවා සැපයුම් මංතීරුවද සහිතව සංවර්ධනය) | මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලැස්ම | මාර්ග සංවර්ධන අධිකාරිය | | |

## 6.8.1. උපායමාර්ගික ව්‍යාපෘති

<table>
<tr><td colspan="5">ව්‍යාපෘතිය හඳුනාගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="4">කළුතර සුඛෝපභෝගී වාණිජ සංකීර්ණය</td></tr>
<tr><td>ව්‍යාපෘතිය</td><td colspan="4">දැනට පවතින උසාවි සංකීර්ණය සුඛෝපභෝගී වාණිජ සංකීර්ණයක් ලෙස ප්‍රති- සංවර්ධනය කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030හි දැක්ම වනුයේ 'නිරිතදිග වෙරළ තිරයේ අග්‍ර නැවතුම්පළක්' යන්නය. කොළඹ - ගාල්ල මාර්ගයේ පිහිටා ඇති කළුතර නගරය සංචාරකයන්ට, නේවාසිකයන්ට, සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවට හා නගරය හරහා ගමන් කරන්නන් වෙත අවශ්‍ය පහසුකම් සැලසීම මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත. ඒ අනුව කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 යටතේ සකස් කරනු ලැබූ සංචාරක සංවර්ධන සැලැස්ම අනුව කළුතර බෝධි පරිශ්‍රය ආශ්‍රිත සංස්කෘතික සංචාරක කලාපයක් ගොඩනැගීමට අපේක්ෂිතය.<br><br>තවද නගරයේ ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථාන (දුම්රිය හා බස් රථ නැවතුම්පොළ) පිහිටා ඇත්තේද මේ ආශ්‍රිතවය. මෙම භූමි පරිභෝජනයන් සියල්ල කළුතර නගරයේ මධ්‍ය ලෙස හඳුනාගත හැකි ප්‍රදේශයක් කේන්ද්‍රකොට පිහිටා ඇත. ඒ අනුව මෙම කොළඹ - ගාල්ල මහා මාර්ගයේ කළුතර බෝධි පරිශ්‍රය, දුම්රිය හා බස් රථ නැවතුම්පොළ ආශ්‍රිතව ඉඩම් සඳහා ඉතා ඉහළ වානිජ ඉල්ලුමක් පවතී. නමුත් මේ වන විටත් උසාවි සංකීර්ණය වැනි තරගකාරී නොවන වාණිජ භාවිතයන් ඒ අවට දැකගත හැක. ඒ අනුව මෙවැනි ඉඩම් නගරයේ ආර්ථික වර්ධනයට හේතුවන තරගකාරී වාණිජ භාවිතයන් සඳහා යොදා ගැනීමට නියමිතය. එසේ කළුතර නගරයේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම අභිමුඛ කර ගනිමින් දැනට පවතින උසාවි සංකීර්ණය කළුතර කටුකුරුන්ද ප්‍රදේශයේ හඳුනාගෙන ඇති 'සරලක්වත්ත' ඉඩම තුළ ප්‍රතිෂ්ඨාපනය කිරීමට නියමිතය. දැනට පවතින උසාවි සංකිර්ණයේ පිහිටි ගොඩනැගිලි ද්විත්ත්වය සුඛෝපභෝගී වාණිජ මධ්‍යස්ථානයක් ලෙස ප්‍රති-සංවර්ධනය කිරීමට නියමිතය.</td></tr>
<tr><td colspan="5">ව්‍යාපෘතියේ පිහිටීම</td></tr>
<tr><td>පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td>දිස්ත්‍රික්කය</td><td>කළුතර</td></tr>
<tr><td></td><td>ප්‍රාදේශීය ප්‍රා. ලේ. කොට්ඨාසය</td><td>කළුතර</td><td>පළාත් පාලන ආයතනය</td><td>කළුතර නගර සභාව</td></tr>
<tr><td>සීමාවන්</td><td>උතුර</td><td>නැගෙනහිර</td><td>දකුණ</td><td>බටහිර</td></tr>
<tr><td></td><td>ටවුන් කල්බ් පාර</td><td>කොළඹ – ගාල්ල මහා මාර්ගය (A2)</td><td>කළුතර බස් නැවතුම්පොළ</td><td>කළුතර මහජන ක්‍රීඩාංගනය</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">කොළඹ – ගාල්ල මහා මාර්ගය (A2)</td></tr>
<tr><td>පිහිටීම දක්වන සිතියම</td><td colspan="4"></td></tr>
</table>

| | |
|---|---|
| **භූමි පරිහරණ සැලැස්ම** |  |

### ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ස්වභාවය** | නව | √ | දියුණු කළ යුතු | | විස්තීරණය කළ යුතු | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
| | | √ | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතියේ ඉලක්ක** | පාරිසරික | | ආර්ථික | √ | සමාජීය | |

**ව්‍යාපෘති ඉලක්ක**

1. කළුතර නගරය වෙත සුඛෝපභෝගී වාණිජ ව්‍යාපාරයන්හි ආයෝජනයන් ලබා ගැනීම
2. සුඛෝපභෝගී වාණිජ ක්ෂේත්‍රයේ දියුණුව සංචාරක ව්‍යාපාරයේ දියුණුව සඳහා යොදා ගැනීම
3. කළුතර නගර මධ්‍ය තුළ මහජන පොදු අවකාශීය ස්ථාන වර්ධනය කිරීම
4. ව්‍යාපෘතියට අදාළව සිදු කරනු ලබන භූමි දර්ශනය හේතුවෙන් නගර අලංකරණය වීම
5. ව්‍යාපෘති පරිශ්‍රයේ වාහන නැවතුම් පහසුකම් ලබා දීම තුළින් නගරය තුළ පවතින රථවාහන ගාල් කිරීමේ ගැටළුවට යම් සහනයක් ලැබීම

**ව්‍යාපෘතියේ පදනම**

කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය කළුතර නගරයයි. පරිපාලන, සෞඛ්‍ය, ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දිනකට 80,000 අධික ජනගහනයක් කළුතර නගරය වෙත පැමිණේ. තව ද නගරය තුළ පවතින සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන හා තරු පන්ති හෝටල් හේතු කොටගෙන නගරය වෙත දේශීය හා විදේශීය සංචාරකයන්ගේ ද සැලකිය යුතු ආකර්ෂණයක් පවතී. එමෙන්ම කොළඹ - ගාල්ල මහා මාර්ගයේ පිහිටා ඇති නගරයක් වශයෙන් නගරය හරහා අති විශාල දෛනික සංක්‍රමණිකයන් සංඛ්‍යාවක් ගමන් කරයි.

මෙසේ නගරය වෙත පැමිණෙන ජනතාව වෙත අවශ්‍ය සුඛෝපභෝගී වාණිජ අවශ්‍යතා සපුරා ගැනීමට පහසුකම් සැලසීමත්, නගරය වෙත පවතින සංචාරක ආකර්ෂණය වර්ධනය කිරීමත් මෙම ව්‍යාපෘතිය මගින් සිදුවේ . මෙම ව්‍යාපෘතිය හඳුනාගනු ලැබූ කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 අනුව කළුතර නගරය නිරිත දිග වෙරළ තීරයේ අග්‍ර නැවතුම් පළක් කිරීම දැක්ම කොට ගනු ලැබිය. ඒ යටතේ සම්පාදිත සංචාරක සංවර්ධන සැලැස්ම තුළින් කළුතර බෝධි පරිශ්‍රය ආශ්‍රිතව සංස්කෘතික සංචාරක කලාපයක් හඳුනාගනු ලැබිය. ඒ අනුව මෙම මෙම ව්‍යාපෘතිය මගින් කළුතර බෝධි පරිශ්‍රය ආශ්‍රිත කලාපය තුළ සුඛෝපභෝගී වාණිජ මධ්‍යස්ථානයක් ඉදිකිරීම තුළින් එම කලාපය වෙත පවතින සංචාරක ආකර්ෂණය වර්ධනය වේ. තව ද මෙම සුඛෝපභෝගී වාණිජ මධ්‍යස්ථානය පිහිටා තිබෙන ස්ථානය අසළ කළුතර දකුණ දුම්රිය ස්ථානය හා කළුතර බස් නැවතුම්පොළ පිහිටා තිබීම හේතු කොටගෙන කළුතර නගරය වෙත වැඩිම ජන ආකර්ෂණයක් පවතිනුයේ ද ඒ ආශ්‍රිත ප්‍රදේශයටයි . එය මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වයට තවත් ඉවහල් වේ.

**ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා. ස.අ. | | පෞද්ගලික | | රජයේ | √ | වෙනත් | |

| | | | |
|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන තත්වය** | දැනට කළුතර මහාධිකරණ සංකීර්ණය පිහිටා ඇත | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | |
| **ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය** | භූමි පරිශ්‍රය අධිකරණ සේවා කොමිෂන් සභාව සතුය | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මිනින්දෝරු සැලැස්ම** | අංකය | මිනින්දෝරුගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
| | | | | අක්: | රූ. | පර්. |
| | | | | | | |

**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

| | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නාගරික සංවර්ධන අධිකාරිය | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | නාගරික සංවර්ධන අධිකාරියේ භාණ්ඩාගාර අරමුදල් |

| | | | |
|---|---|---|---|
| **කලාපය** | ඉහළ සනත්ව වාණිජ කලාපය | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් |

**වින්‍යාස සැලැස්ම**



| ව්‍යාපෘතිය හඳුනාගැනීම | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | *වෙළඳ සංකීර්ණය II අදියර* | | | |
| **ව්‍යාපෘතිය** | *කළුතර දකුණ බඩු ගබඩා පාරේ මහල් රථගාල සහිත වෙළඳ සංකීර්ණය* | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | *කළුතර නගර සභාව සතු කළුතර බඩු ගබඩා පාරේ වෙළඳ සංකීර්ණය මීට දශක දෙකකට ප්‍රථම ඉදිකරනු ලැබුවකි. එකල පැවති ආර්ථික රටාවන්ට අනුව ඉදි වූ මෙම ගොඩනැගිල්ල මේ වන විට ඉතා අබලන් තත්ත්වයක පවතී. නගර මධ්‍ය තුළ පිහිටි මෙම පරිශ්‍රය පවත්නා භාවිතයට වඩා වඩාත් ඉහළ මට්ටමකට සංවර්ධනය කිරීමේ හැකියාව පවතී. දැනට බිම් මහලකින් හා පළමු මහලකින් සමන්විත මෙම ගොඩනැගිල්ල ගාලු පාර හා බඩු ගබඩා පාරට මායිම්ව පිහිටා තිබේ. මෙම මාර්ග ද්විත්ත්වය ආශ්‍රිතව පවතින වාහන තදබදය හේතුවෙන් මෙම වෙළඳ සංකීර්ණය වෙත පැමිණෙන පාරිභෝගිකයන්ට වාහන නතර කර තැබීමේ පහසුකම් අවම වී ඇත. මෙම සියලු තත්වයන් සලකා බලා දැනට පවතින පැරණි වෙළඳ සංකිර්ණය වෙනුවට රථවාහන ගාල්කිරීමේ පහසුකමක් ද සහිත නව වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට නියමිතය.*<br><br>*මෙම ව්‍යාපෘතිය තුළින් නගර වෙත වෙනත් අවශ්‍යතා ඉටු කරගැනීමට පැමිණෙන ජනතාවට ද සිය රථවාහන ගාල්කර තැබීමේ පහසුකම් සැලසේ. විශේෂයෙන්ම මෙම ව්‍යාපෘති භූමිය කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපිට පිහිටා තිබීම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය වෙත පැමිණෙන රථවාහන ගාල් කර තැබීමට ද මෙමඟින් පහසුකම් සැලසේ. රථවාහන ගාල් කර තැබීමේ පහසුකම් පවතින නිසා මෙම ව්‍යාපෘති ගොඩනැගිල්ල තුළ පවතින ව්‍යාපාරික ස්ථානයන් සඳහා පැමිණෙන පාරිභෝගිකයන් සඳහා ද පහසුකම් සැලසේ.* | | | |
| ව්‍යාපෘතියේ පිහිටීම | | | | |
| **පිහිටීම** | **පළාත** | *බස්නාහිර* | **දිස්ත්‍රික්කය** | *කළුතර* |
| | **ප්‍රාදේශීය ප්‍රා. ලේ. කොට්ඨාසය** | *කළුතර* | **පළාත් පාලන ආයතනය** | *කළුතර නගර සභාව* |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | *බඩු ගබඩා පාර* | *ගාලු පාර ; කෙලින් විදිය* | *පෞද්ගලික කඩ* | *නව නගර සභා වෙළඳ සංකීර්ණය* |
| **ප්‍රවේශය** | *කොළඹ - ගාල්ල මහා මාර්ගය (A2)* | | | |
| **පිහිටීම දක්වන සිතියම** |  | | | |

| | |
|---|---|
| **භූමි පරිහරණ සැලැස්ම** |   |

| ***ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම*** | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ස්වභාවය** | නව | √ | දියුණු කළ යුතු | | විස්තීරණය කළ යුතු | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |

| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| | | √ | | | | | |

| **ව්‍යාපෘතියේ ඉලක්ක** | පාරිසරික | | ආර්ථික | √ | සමාජීය | |
|---|---|---|---|---|---|---|

**ව්‍යාපෘති ඉලක්ක**

1. නගරය තුළ පවතින රථවාහන ගාල්කිරීමේ ගැටළුවට විසඳුමක් ලැබීම
2. නව වෙළඳ සංකීර්ණය තුළින් වාණිජ දියුණුවක් ලැබීම

**ව්‍යාපෘතියේ පදනම**

කළුතර දකුණ බඩු ගබඩා පාරෙහි පිහිටි නගර සභා වෙළද සංකීර්ණය වර්තමානය වන විට ඉතා අබලන් තත්වයක පවතී. කළුතර නගරයේ ගාලු පාර අසළ පිහිටි මෙම පරිශ්‍රය වර්තාමානය වන විට ඉතා ඉහළ වාණිජ වටිනාකමකින් යුක්තය. නමුත් දැනට පවතින වෙළද සංකීර්ණය බිම් මහලකින් හා පළමු මහලකින් පමණක් සමන්විත වන අතර වර්තමානය වන විට එම ගොඩනැගිල්ල ඉතා අබලන් තත්ත්වයක පවතී. මෙම තත්ත්වය යටතේ මෙම පරිශ්‍රයෙන් ලබා ගත හැකි උපරිම වාණිජ වටිනාකම ලබාගෙන නොමැත. ඒ අනුව මෙම පරිශ්‍රය තුළ මහල් රථගාලකින් සමන්විත වාණිජ සංකීර්ණයක් ඉදිකිරීමට යෝජිතය.

විශේෂයෙන්ම කළුතර නගර මධ්‍යයේ ගාලු පාර සකස් වී ඇති ආකාරය හේතුවෙන් (මැද පාර පැවතීම) නගර මධ්‍ය වෙත සිය වාණිජ අවශ්‍යතා සපුරා ගැනීමට පෞද්ගලික වාහන වලින් පැමිණෙන ජනතාව විශාල අපහසුතාවයකට පත්වේ. යෝජිත වෙළඳ සංකීර්ණය තුළ රථවාහන නවතා තැබීමේ පහසුකම් පැවතීම හේතු කොටගෙන පෞද්ගලික වාහන වලින් පැමිණෙන ජනතාවට රථවාහන ගාල් කිරීමේ පහසුකම් උදා වේ. මේ තුළින් ඔවුන්ට සිය පෞද්ගලික රථවාහන නවතා නගරය තුළ අවශ්‍ය ස්ථානයන් වෙත ගොස් සිය අවශ්‍යතා ඉටු කරගැනීමට හැකි වේ.

මෙම ව්‍යාපෘතිය පදික මංතීරු සංවර්ධන සැලැස්ම හා සම්බන්ධ වේ. ගාලු පාර දෙපස පදික මංතීරු සංවර්ධනය කොට සෙවන සඳහා ගස් රෝපණය කිරීමට නියමිතය. ඒ අනුව නගර මධ්‍ය තුළ ගාලු පාර අසළ රථ ගාලේ (යෝජිත ව්‍යාපෘතිය) වාහන නවතා පහසුවෙන් සිය අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අවස්ථාව උදාවේ. ගාලු පාර දෙපස මංතීරු සංවර්ධනය කිරීමටත් මෙම මංතීරු තුළ සෙවන සඳහා ගස් රෝපණය කිරීමත් හේතුවෙන් මෙසේ නගරය වෙත පැමිණෙන්නන්ට පා ගමනින් සිය ගමනාන්තයන් වෙත ගමන් කිරීමට හැකි පරිසරයක් උදා වේ.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය තුළින් නව වෙළඳ මධ්‍යස්ථානයක් නගරයට ලැබීමත්, නගරය තුළ පවතින රථවාහන ගාල් කිරීමේ ගැටළුවට පිළියම් ලැබීමත් සිදු වේ.

| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා. ස.අ. | | පෞද්ගලික | | රජයේ | √ | වෙනත් | |

| | | | |
|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන තත්වය** | කළුතර නගර සභාව සතු පැරණි වෙළඳ සංකීර්ණයක් පවතී | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | |
| **ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය** | කළුතර නගර සභාව සතුය | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මිනින්දෝරු සැලැස්ම** | අංකය | මිනින්දෝරුගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
| | | | | අක්: | රූ. | පර්. |
| | | | | | | |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නාගරික සංවර්ධන අධිකාරිය | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | නාගරික සංවර්ධන අධිකාරියේ භාණ්ඩාගාර අරමුදල් |

| | | | |
|---|---|---|---|
| **කලාපය** | ඉහළ ඝනත්ව වාණිජ කලාපය | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් |

වින්‍යාස සැලැස්ම



<table>
<tr><th colspan="5">ව්‍යාපෘතිය හඳුනාගැනීම</th></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="4">කළුතර මහ රෝහල් චතුරශ්‍ර පරිශ්‍රය සංවර්ධන සැලැස්ම</td></tr>
<tr><td>ව්‍යාපෘතිය</td><td colspan="4">කළුතර මහ රෝහල හා නව ළමා හා කාන්තා රෝහල ඒකාබද්ධ කෙරෙන නව ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">කළුතර නගරය වෙත දෛනික සංක්‍රමණික ජනගහනය ඇදෙන එක් ප්‍රධාන හේතුවක් වනුයේ සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමය. කළුතර දිස්ත්‍රික්කයේ රජයේ ප්‍රධාන මහ රෝහල කළුතර නගරයේ, නාගොඩ ප්‍රදේශයේ පිහිටා තිබීම මෙසේ සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට නගරය වෙත ජනතාව ඇදී ඒමට හේතු වී තිබේ. තව ද මේ වන විට කළුතර මහ රෝහල ආශ්‍රය කර ගනිමින් විශාල වශයෙන් සෞඛ්‍ය අංශයේ ආයෝජනයන් සිදු වේ. මේ සඳහා ප්‍රධාන උදාහරණයක් ලෙස කළුතර නාගොඩ මහ රෝහල ආසන්නයේ ඉදිවන ළමා හා කාන්තා මහ රෝහල පෙන්වා දිය හැක. නව ළමා හා කාන්තා රෝහල කළුතර නාගොඩ ගල්ලස්ස ප්‍රදේශයේ ඉදිවෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය යටතේ කළුතර මහ රෝහල් පරිශ්‍රය හා ඉදිවෙමින් පවතින ළමා හා කාන්තා රෝහල් පරිශ්‍රය එක් රෝහල් චතුරශ්‍රයක් ලෙස සංවර්ධනය කිරීමට නියමිතය. මේ තුළින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට පැමිණෙන ජනතාවට රෝහල් චතුරශ්‍රය තුළ සිය අවශ්‍ය ස්ථානයන් වෙත ළඟා වීමට හැකි වේ. මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත උප ව්‍යාපෘතීන් පහත පරිදි දැක්විය හැක.<br><br>1. කළුතර මහ රෝහල් පරිශ්‍රයත් ළමා හා කාන්තා රෝහල් පරිශ්‍රයත් සම්බන්ධ කෙරෙන නව මාර්ගයක් ඉදි කිරීම.<br>2. පහත් බිම් සංවර්ධනය යටතේ කළුතර මහ රෝහල් පරිශ්‍රය පුළුල් කිරීම.<br>3. පහත්බිම් සංවර්ධනය යටතේ ගංවතුර කළමනාකරණ වැඩපිළිවලක් ක්‍රියාත්මක කිරීම</td></tr>
<tr><th colspan="5">ව්‍යාපෘතියේ පිහිටීම</th></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td>දිස්ත්‍රික්කය</td><td>කළුතර</td></tr>
<tr><td>ප්‍රාදේශීය ප්‍රා. ලේ. කොට්ඨාසය</td><td>කළුතර</td><td>පළාත් පාලන ආයතනය</td><td>කළුතර නගර සභාව, කළුතර ප්‍රාදේශිය සභාව</td></tr>
<tr><td rowspan="2">සීමාවන්</td><td>උතුර</td><td>නැගෙනහිර</td><td>දකුණ</td><td>බටහිර</td></tr>
<tr><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4"></td></tr>
<tr><td>පිහිටීම දක්වන සිතියම</td><td colspan="4">
</td></tr>
</table>

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| භූමි පරිහරණ සැලැස්ම |  | | | | | | | |



**ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ස්වභාවය** | නව | | දියුණු කළ යුතු | | විස්තීරණය කළ යුතු | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | √ |
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් | |
| | | | | | | | √ | |
| **ව්‍යාපෘතියේ ඉලක්ක** | පාරිසරික | | ආර්ථික | | සමාජීය | √ | | |

| | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | 1. කළුතර මහා රෝහල හා ළමා රෝහල කේන්ද්‍ර කොට ගනිමින් සෞඛ්‍ය අංශය පාදක කොටගත් සම්පිණ්ඩිත ආර්ථිකයක් ඇතිකිරීම<br>2. සෞඛ්‍ය සේවා ලබාගන්නා ජනතාවට පහසුවෙන් නව කාන්තා හා ළමා රෝහල වෙත ළඟා වීමට හැකි වීම<br>3. කළුතර මහා රෝහල් පරිශ්‍රය පුළුල් කිරීමට අවස්ථාව උදා වීම<br>4. ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශයේ පවතින ගංවතුර තත්ත්වයට පිළියම් ලැබීම |
| **ව්‍යාපෘතියේ පදනම** | කළුතර නගරය කළුතර දිස්ත්‍රිකයේ ප්‍රධාන සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථානය වේ. දිස්ත්‍රික්කය තුළ පමණක් නොව බස්නාහිර පළාත පිළිබඳව සලකා බැලීමේදී කළුතර නගරය රජයේ ප්‍රධාන පෙළේ සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථානයකි. කළුතර නාගොඩ මහ රෝහල බස්නාහිර පළාත තුළ පිහිටි මහ රෝහල් අතුරින් එකකි. එමෙන්ම මේ වනවිට සෞඛ්‍ය අංශයේ සිදුවන ආයෝජනයන් හේතු කොටගෙන සෞඛ්‍ය අංශය තුළ සීඝ්‍ර දියුණුවක් සිදුවෙමින් පවතී.<br><br>නව ද කළුතර නගරය වෙත දෛනික සේවාවන් ලබා ගැනීමට පැමිණෙන සංක්‍රමණික ජනතාව අතුරින් සැලකිය යුතු සංඛ්‍යාවක් සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට පැමිණෙන අතර මේ වන විට සෞඛ්‍ය අංශයේ සිදුවන ආයෝජනයන් හේතු කොටගෙන ඉදිරියේදී මෙම සංඛ්‍යාව තවත් වර්ධනය වේ. ඒ අනුව මෙසේ සෞඛ්‍ය අංශයේ සිදුවන දියුණුව නගරය තුළ ආර්ථික සංවර්ධනය සඳහා වඩාත් ඵලදායි ලෙස යොදා ගැනීමට කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 ඔස්සේ හඳුනාගෙන තිබුණි. ඒ අනුව කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 යටතේ සකස් කරනු ලැබූ පරිපාලන හා සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම යටතේ 'කළුතර මහ රෝහල් පරිශ්‍රය කේන්ද්‍ර කොටගත් කි.මී.01 ක අරයක වපසරියක් ( කි.මී. 01 Buffer) තුළ තෘතීය මට්ටමේ සියලු සෞඛ්‍ය සේවාවන් සැපයීම' වශයෙන් අරමුණක් සකස් කරනු ලැබිය.<br><br>මෙම අරමුණ සඳහා ප්‍රධාන වශයෙන්ම පාදක වූයේ සම්පිණ්ඩිත ආර්ථිකයේ වාසිය නගරයට ලබා ගැනීමයි. ඒ අනුව සෞඛ්‍ය අංශයට අයත් සේවාවන් එක් ස්ථානයකට කේන්ද්‍රගත කිරීම තුළින් එම අංශයට අදාළ සේවාවන් ක්‍රියාත්මක වීමට අදාළ ප්‍රමාණවත් දේහලීය ජන සංඛ්‍යාවක් ආකර්ෂණය වීම තුළින් කේන්ද්‍රගත ආර්ථිකයේ වාසිය නගරය වෙත ලබා ගැනීමට අවස්ථාව උදාවේ.<br><br>.... |

| | |
|---|---|
| | *ඒ අනුව හඳුනාගත් ව්‍යාපෘතියක් ලෙස කළුතර මහා රෝහල් පරිශ්‍ර සංවර්ධන සැලැස්ම හඳුනාගත හැක. ඒ අනුව කළුතර මහා රෝහල හා අලුතින් ඉදිවන ළමා හා කාන්තා රෝහල සම්බන්ධ කරමින් නව මාර්ගයක් ඉදිකිරීමට නියමිතය. තවද ඒ අතර පිහිටා තිබෙන පහත් බිම සංවර්ධනය කිරීමට නියමිතය. මෙම පහත් බිම් සංවර්ධන සැලැස්ම යටතේ රෝහල් පරිශ්‍රය පුළුල් කිරීම, නව වෛද්‍ය නේවාසිකාගාර ඇති කිරීම හා ගංවතුර පාලනය සඳහා ජල රැදවුම් පොකුණු ඉදිකිරීමට නියමිතය.* |

**ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා. ස.අ. | | පෞද්ගලික | | රජයේ | √ | වෙනත් | |

| | | | |
|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන තත්වය** | පුරන් කුඹුරක් පවතී | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | |
| **ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය** | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මිනින්දෝරු සැලැස්ම** | අංකය | මිනින්දෝරුගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
| | | | | අක්: | රූ. | පර්. |
| | | | | | | |

**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

| | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව<br><br>-සෞඛ්‍ය අමාත්‍යාංශය | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව<br><br>-සෞඛ්‍ය අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| **කලාපය** | ඉහළ ඝනත්ව සෞඛ්‍ය ප්‍රවර්ධන කලාපය | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් |

**වින්‍යාස සැලැස්ම**



<table>
<tr><th colspan="5">වයාපෘතිය හඳුනාගැනීම</th></tr>
<tr><td>වයාපෘති මාතෘකාව</td><td colspan="4">නාගොඩ හන්දිය සංවර්ධන වයාපෘතිය</td></tr>
<tr><td>වයාපෘතිය</td><td colspan="4">නාගොඩ හන්දිය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම</td></tr>
<tr><td>වයාපෘති යෝජනාව</td><td colspan="4">කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 යටතේ සම්පාදිත නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම අනුව නාගොඩ හන්දිය සෞඛ්‍ය ප්‍රවර්ධන න්‍යෂ්ටියක් (Health service Nodes) ලෙස සංවර්ධනය කිරීමට නියමිතය. කළුතර නාගොඩ ප්‍රදේශය ආශ්‍රිතව සිදුවන සෞඛ්‍ය අංශයේ සංවර්ධනයත් සමග එම සේවාවන් ලබා ගැනීමට පැමිණෙන ජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීමට හැකිවන පරිදි නාගොඩ හන්දිය සංවර්ධනය කිරීමට නියමිතය. විශේෂයෙන්ම නාගොඩ හන්දිය ආශ්‍රිතව පවතින රථවාහන තද බදය අවම කිරීමත්, සංවර්ධනය කිරීමට හැකි ඉඩම් හඳුනාගැනීම හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් මෙමගින් හඳුනාගෙන ඇත.<br><br>තවද නාගොඩ හන්දිය වෙතින් අවට නේවාසික ජනතාව සිය මූලික පාරිභෝගික අවශ්‍යතා ඉටු කර ගනී. තව ද මේ වන විට නාගොඩ හන්දිය මූලික කරගත් ප්‍රදේශය තුළ සැලකිය යුතු ජනගහන වර්ධනයක් පවතී. මේ හේතුවෙන් නාගොඩ හන්දිය ආශ්‍රිතව ආර්ථික ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය තරමේ දේහලීය ජනගහනයක් පවතී ඒ අනුව ක්‍රියාත්මක කිරීමට නියමිත වයාපෘති පහත පරිදි දැක්විය හැක.<br><br>1. යෝජිත පදික වේදිකා හා කාණු පද්ධතිය සංවර්ධනය<br>2. විකල්ප මාර්ග සංවර්ධනය<br>3. බස් රැඳවුම් පොළ ඉදිකිරීම<br>4. වට රවුම් සංවර්ධනය (මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද)<br>5. ඇළ මාර්ග සංවර්ධනය<br>6. ව්‍යායාම මංතීරු ඉදිකිරීම</td></tr>
<tr><th colspan="5">වයාපෘතියේ පිහිටීම</th></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td>දිස්ත්‍රික්කය</td><td>කළුතර</td></tr>
<tr><td>ප්‍රාදේශීය ප්‍රා. ලේ. කොට්ඨාසය</td><td>කළුතර</td><td>පළාත් පාලන ආයතනය</td><td>කළුතර ප්‍රාදේශීය සභාව</td></tr>
<tr><td rowspan="2">සීමාවන්</td><td>උතුර</td><td>නැගෙනහිර</td><td>දකුණ</td><td>බටහිර</td></tr>
<tr><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4"></td></tr>
<tr><td>පිහිටීම දක්වන සිතියම</td><td colspan="4">
</td></tr>
</table>

**භූමි පරිහරණ සැලැස්ම**




### ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ස්වභාවය** | නව | | දියුණු කළ යුතු | | විස්තීරණය කළ යුතු | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
| | | | | | | | √ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතියේ ඉලක්ක** | පාරිසරික | | ආර්ථික | | සමාජීය | √ |

**ව්‍යාපෘති ඉලක්ක**

1. නාගොඩ හන්දිය ආර්ථිකමය වශයෙන් වඩාත් ක්‍රියාකාරී හන්දියක් ලෙස සංවර්ධනය කිරීම
2. කළුතර නාගොඩ රෝහල වෙත පැමිණෙන ජනතාවට අවශ්‍ය පහසුකම් සලසන මංසන්ධියක් ලෙස නාගොඩ හන්දිය සංවර්ධනය කිරීම
3. නාගොඩ හන්දියේ පවතින වාහන තදබදයට විසඳුම් ලැබීම

**ව්‍යාපෘතියේ පදනම**

කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරය වන්නේ කළුතරයි. සියළුම රාජ්‍ය ආයතන දිස්ත්‍රික් ආයතන මෙන්ම පරිපාලන ආයතන කළුතර නගර සීමාවට ඒකරාශී වී පිහිටා තිබීම පොදු පහසුකම් සලසන සෞඛ්‍ය ආයතන, අධ්‍යාපන ආයතන කළුතර නගර ආශ්‍රිතව පිහිටා තිබීම හේතුවෙන් දිනකට කළුතර කරා ඇදී එන ජනගහනය 80,000 ක් පමණ වේ. මෙම ප්‍රධාන නගරය කරා ජනගහනය අවතීර්ණ වන ප්‍රධානතම මංසන්ධියක් ලෙස නාගොඩ හන්දිය දැක්විය හැකිය. එසේ වුවද නාගොඩ හන්දිය යටිතල පහසුකම් අතින් නොදියුණු තත්ත්වයක පවතී. නාගොඩ හන්දිය හතරමං හන්දියක් වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් එහි වටරවුමක් සකස් කිරීමටද යෝජනා කර ඇත. එමෙන්ම මෙම ප්‍රදේශය ඉහළ ඝනත්ව නේවාසික කලාපයක් නිසා සෞඛ්‍ය ප්‍රවර්ධන කලාපයක් ලෙස වර්ධනය කිරීමට කළුතර සංවර්ධන සැලැස්ම හරහා කටයුතු කර ඇති අතර මෙම සංවර්ධන කටයුතු හේතු කොටගෙන ආකර්ෂණය වන ජනතාවට ප්‍රවාහන කටයුතු පහසු කර ගැනීම සඳහා බස්නැවතුම්පලක් මෙන්ම පදික වේදිකා හා කාණු පද්ධතිය සංවර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය වේ.

එමෙන්ම මෙම ජනගහනය සඳහා අවශ්‍ය පොදු පහසුකම් සැලසීමේදී නාගොඩ හන්දිය ආශ්‍රිතව සති පොළක් සහ ජනගහනය ඒකරාශී වීම වැඩිවීම නිසා ඇතිවන වාහන තදබදය අවම කිරීම සඳහා අතුරු මාර්ගයක් සහ බස් රැඳවුම්පළක් ද ඇති කිරීමේ ප්‍රවණතාවයක් පවතී. මේ වන විටත් කළුතර නගරයේ සෞඛ්‍ය අංශය ඉහළ ස්ථානයක පවතින අතර සංවර්ධන සැලැස්ම තුළින් ද කළුතර නගරය ඉහළ ඝනත්ව සෞඛ්‍ය ප්‍රවර්ධන කලාපයක් ලෙස දියුණු කිරීමට කටයුතු සලසා ඇත. එමෙන්ම ජනගහන ඝනත්වය ඉහළ කලාපයක් ලෙස නාගොඩ හන්දිය සංවර්ධනය කිරීමත් නිසා වැඩිපුර ජනගහනය සඳහා අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සඳහා ද වැඩි ඉල්ලුමක් පවතී. එබැවින් නාගොඩ හන්දිය ආශ්‍රිත ප්‍රදේශ සඳහා ද සෞඛ්‍ය පහසුකම් දියුණු කිරීමේ ප්‍රවණතාවයක් පවතී. නාගොඩ හන්දිය අවම මුහුදු මට්ටමක පිහිටීම නිසාත් පහත් බිම් රැසක් පිහිටා තිබීම නිසාත් මේ වන විටත් ගංවතුර අවධානමකට මුහුණ දෙමින් පවතී. මෙම ගංවතුර අවධානම අවම කර ගැනීමට මෙන්ම පරිසර අලංකරණය වැඩි කර ගැනීමටත් වැසී පවතින ඇළ මාර්ගය නිරාවරණය කර එය සංවර්ධනය කිරීම යෝග්‍ය වේ. එමෙන්ම කළුතර - මතුගම මාර්ගයේ පසෙක පිහිටා ඇති පහත්බිම් කිහිපයක් ආශ්‍රිතව උද්‍යාන අලංකරණය කිරීමට හා ඇවිදින මංතීරු ඇති කිරීමේ හැකියාවක් ද පවතී.

## ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා. ස.අ. | | පෞද්ගලික | | රජයේ | √ | වෙනත් | |
| **ඉඩමේ වර්තමාන තත්වය** | පුරන් කුඹුරක් පවතී | | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | | | | | |
| **ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය** | | | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මිනින්දෝරු සැලැස්ම** | අංකය | මිනින්දෝරුගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
| | | | | අක්: | රූ. | පර්. |
| | | | | | | |

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

| | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | - ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව<br>- කළුතර ප්‍රාදේශීය සභාව | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව<br>-සෞඛ්‍ය අමාත්‍යාංශය |
| **කලාපය** | ඉහල ඝනත්ව සෞඛ්‍ය ප්‍රවර්ධන කලාපය | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් | | |

## වින්‍යාස සැලැස්ම



| ව්‍යාපෘතිය හඳුනාගැනීම | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | *මොරොන්තුඩුව හන්දිය සංවර්ධන ව්‍යාපෘතිය* | | | |
| **ව්‍යාපෘතිය** | *මොරොන්තුඩුව හන්දිය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම* | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | *කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 යටතේ මොරොන්තුඩුව හන්දිය නේවාසික න්‍යෂ්ටියක් ලෙස සංවර්ධනය කිරීමට නියමිතය. මොරොන්තුඩුව හන්දිය කළුතර නගරය හා මෙන්ම වාද්දුව නගරය, බණ්ඩාරගම නගරය යන නගර අතරද සෘජු සම්බන්දයක් දක්වයි. විශේෂයෙන්ම මොරොන්තුඩුව නගරය කළුතර - බණ්ඩාරගම මාර්ගයේ පිහිටා තිබීම හේතුකොටගෙන එම නගරය සීඝ්‍ර සංවර්ධනයක් ලඟා කර ගනිමින් සිටී. කළුතර - බණ්ඩාරගම මාර්ගය අධිවේගී මාර්ගය සඳහා ප්‍රවේශ වීමට භාවිතා කරන මාර්ගයක් වීමත් කළුතර - බණ්ඩාරගම මාර්ගය බණ්ඩාරගම සිට ශ්‍රී ජයවර්ධනපුර අග නගරය දක්වා සෘජුව විහිදී තිබීමත් මෙම සංවර්ධනයට හේතු වී ඇත. තවද ඒ අවට සිදුවන නේවාසික ජන ගහන වර්ධනය හේතුකොටගෙන මොරොන්තුඩුව නගරයේ ආර්ථික ක්‍රියාකාරීත්වයට අවශ්‍ය දේහලීය ජනගහනය ද වර්ධනය වෙමින් පවතී. ඒ අනුව මොරොන්තුඩුව හන්දිය ආශ්‍රිතව වර්තමාන සාමාජිය හා ආර්ථික රටාවන්ට අනුව සිදුවිය යුතු සංවර්ධනයන් සිදු කිරීමට මෙම මොරොන්තුඩුව හන්දිය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ යටතේ පහත සඳහන් උප ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට නියමිතය.*<br><br>1. *බස් රථ නැවතුම්පොළ, වාණිජ ගොඩනැගිල්ල හා ප්‍රජා ශාලාව*<br>2. *යෝජිත විකල්ප මාර්ගය*<br>3. *විනෝද උයන* | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | *බස්නාහිර* | **දිස්ත්‍රික්කය** | *කළුතර* |
| | **ප්‍රාදේශීය ප්‍රා. ලේ. කොට්ඨාසය** | *කළුතර* | **පළාත් පාලන ආයතනය** | *කළුතර ප්‍රාදේශීය සභාව* |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | | | | |
| **ප්‍රවේශය** | | | | |
| **පිහිටීම දක්වන සිතියම** |  | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **භූමි පරිහරණ සැලැස්ම** |  | | | | | | |
| *ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම* | | | | | | | |
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
| | | √ | | | | | |
| **ව්‍යාපෘතියේ ඉලක්ක** | | පාරිසරික | | ආර්ථික | √ | සමාජීය | |
| **ව්‍යාපෘති ඉලක්ක** | 1. මොරොන්තුඩුව හන්දිය අවට ජනයාට අවශ්‍ය මූලික අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවන පරිදි නේවාසික මංසලක් ලෙස සංවර්ධනය කිරීම | | | | | | |
| **ව්‍යාපෘතියේ පදනම** | නේවාසික න්‍යෂ්ඨියක් ලෙස සංවර්ධනය වීමට යෝජිත හා මේ වන විටත් සිදුවන හා සිදුවීමට යෝජිත යටිතල පහසුකම් වල වර්ධනය හේතුකොට ගෙනත් අනාගතයේදී මොරොන්තුඩුව හන්දිය අතිවිශාල ජනාකර්ෂණයක් හිමිකර ගන්නා ප්‍රදේශයක් වශයෙන් හඳුනාගැනීමට හැකිය. මෙම ඉහළ යන ජනගහනයේ වාණිජ අරමුණු ඉටුකර ගැනීම සඳහා දැනට පවතින වාණිජ සංවර්ධනය ප්‍රමාණවත් නොවන බැවින් වාණිජ මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ අවශ්‍යතාවයක් පවතී. එමෙන්ම මෙම ජනගහනය සඳහා පොදු කටයුතු වලදී ඒකරාශි වීමට ප්‍රජාශාලාවක් ඉදිකිරීම යෝග්‍ය වේ. එමෙන්ම මෙම ජනතාව සඳහා සුවපහසු උද්‍යාන, ඇවිදින මංතීරු ඇති කිරීම ජනතාවට හිතකර මෙන්ම පරිසරය අලංකාරයටද මෙම ප්‍රදේශයට පවතින ගංවතුර අවධානම අවම කිරීමටද හේතුවනු ඇත.<br><br>සංවර්ධන සැලසුම් හරහා සිදුවන වර්ධනය මෙන්ම යටිතල පහසුකම්වල වර්ධනයත් (ගැලනිගම අන්තර් හුවමාරුව කි.මී.8 ක් දුරකින් පිහිටීම, වාද්දුව- මොරොන්තුඩුව මාර්ගයේ දියුණුව) මෙන්ම යෝජිත වාණිජ මධ්‍යස්ථානයද හේතුකොටගෙන මොරොන්තුඩුව හන්දිය කරා විශාල ජනගහනයක් ඒකරාශී විය හැකිය. එම වාණිජ අරමුණු සපුරා ගැනීමට මෙන්ම නගරය කරා ඇදී එන සියළු ජනතාවට පහසුවෙන් වාහන නවතා තැබීමට හා දර්ශනීයත්වය වැඩි කිරීමට ද වාහන නැවතුම් අංගනයක් ඉදිකිරීම යෝග්‍ය වේ. එමෙන්ම ජනතාවට හිතකර ප්‍රවාහන සේවයක් මෙන්ම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා බස් රැඳවුම්පලක් ඉදිකිරීමේ අවශ්‍යතාවයක් පවතී. මෙම යටිතල පහසුකම් සංවර්ධනයත්, වාහන අංගනයක් පිහිටුවීමත්, බස් රැදවුම්පල සංවර්ධනයත් නිසා ඇතිවිය හැකි තදබදය අවම කිරීම සඳහා අතුරු මාර්ගයක් ඉදිකිරීමේ අවශ්‍යතාවයක් පවතී.<br><br>යටිතල පහසුකම් හා අනෙකුත් සංවර්ධන කටයුතු හේතු කොටගෙන මෙන්ම නේවාසික න්‍යෂ්ඨියක් ලෙස සංවර්ධනයක් කිරීමට යෝජනා වී තිබීම නිසා ද ඉහළ යන ජනගහනය සඳහා අවශ්‍ය වාණිජ අරමුණු සපුරා දීමට වාණිජ මධ්‍යස්ථානයක් ද, පොදු කටයුතු ඉටු කර ගැනීම සඳහා ප්‍රජා ශාලාවක් ද ඉදිකිරීමට යෝජනා කර ඇත. එමෙන්ම ගංවතුර අවධානම අඩුකර ගැනීමටත් අලංකරණය සඳහා උද්‍යාන අලංකරණය සඳහා ඇවිදින මංතීරු ඇති කිරීමත් යෝජනා කර ඇත.<br><br>ඉහළ ජනගහනය මෙන්ම පාරිභෝගික ප්‍රජාවට සුවපහසු ලෙස වාහන නවතා තැබීම සඳහා වාහන අංගනයක් ද නේවාසිකයන්ට හා ගමන්කරුවන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපුරා දීම සඳහා බස් නැවතුම්පළක් ද එහිදී ඇති වන වාහන තදබදය අවම කිරීම සඳහා අතුරු මාර්ගයක් ද යෝජනා කර ඇත. | | | | | | |

## ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා. ස.අ. | | පෞද්ගලික | √ | රජයේ | √ | වෙනත් | |
| **ඉඩමේ වර්තමාන තත්වය** | පුරන් කුඹුරක් පවතී | | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | | | | | |
| **ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය** | | | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මිනින්දෝරු සැලැස්ම** | අංකය | මිනින්දෝරුගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
| | | | | අක්: | රූ. | පර්. |
| | | | | | | |

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

| | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව<br>- කළුතර ප්‍රාදේශීය සභාව | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | - ශ්‍රී ලංකා ඉඩම් -ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව<br>- කළුතර ප්‍රාදේශීය සභාව |
| **කලාපය** | මධ්‍යස්ථ ඝනත්ව වාණිජ කලාප 02 | | **කලාපීකරණ අනුකූලතාවය** | ඔව් | |

## වින්‍යාස සැලැස්ම



| | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | | | | |
| **ව්‍යාපෘති මාතෘකාව** | මල්වත්ත හන්දිය සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | මල්වත්ත හන්දිය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | කළුතර - හොරණ මාර්ගයේ පිහිටා ඇති මල්වත්ත හන්දිය කළුතර නගරයේ සිට කි. මී. 4.6 දුරින් පිහිටා තිබේ.  කළුතර උතුරේ විජේරත්න වත්ත, ජාවත්ත, එත්නමඩල වැනි ප්‍රදේශවල සිට කළුතර - හොරණ පාරට ප්‍රවේශ වීම සඳහා මෙම හන්දිය භාවිතා වේ. තවද විශේෂයෙන් ජාවත්ත, එතනමඬල වැනි ප්‍රදේශ වල සිදු වන ඉඩම් සංවර්ධනයන් සමඟ මෙම ප්‍රදේශය ආශ්‍රිතව ජනගහන වර්ධනය ද ඉහළ යමින් පවතී. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 යටතේ මල්වත්ත හන්දිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් සකස් කරනු ලැබිය. ඒ අනුව ක්‍රියාත්මක කිරීමට නියමිත උප ව්‍යාපෘති පහත පරිදි වේ.<br><br>1. වාණිජ  ගොඩනැගිල්ලක් ඉදිකිරීම<br>2. මල්වත්ත පාර අඩි 30' දක්වා පුළුල් කිරීම<br>3. අදිරිකැලේ පාර අඩි 30' දක්වා පුළුල් කිරීම | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කළුතර |
| | **ප්‍රාදේශීය ප්‍රා. ලේ. කොට්ඨාසය** | කළුතර | **පළාත් පාලන ආයතනය** | කළුතර ප්‍රාදේශීය  සභාව |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | | | | |
| **ප්‍රවේශය** | | | | |
| **පිහිටීම දක්වන සිතියම** |   | | | |

| | |
|---|---|
| භූමි පරිහරණ සැලැස්ම |  |

**ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම**

| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| | | √ | | | | | |

| ව්‍යාපෘතියේ ඉලක්ක | පාරිසරික | | ආර්ථික | √ | සමාජීය | |
|---|---|---|---|---|---|---|

| | |
|---|---|
| ව්‍යාපෘති ඉලක්ක | 1. කළුතර හොරණ පාරේ මල්වත්ත හන්දිය ආශ්‍රිත ප්‍රදේශ ජනතාවට පහසුකම් සැලසෙන වාණිජ සංකීර්ණයක් ඉදි කිරීම<br>2. කළුතර හොරණ පාරේ මල්වත්ත හන්දිය ආශ්‍රිතව අනාගතයේ ඇති විය හැකි රථ වාහන තදබදයට විසඳුම් ලැබීම |
| ව්‍යාපෘතියේ පදනම | කළුතර හොරණ මාර්ගය කළුතර නගරය ආශ්‍රිතව පවතින 'A' ශ්‍රේණියේ මාර්ගයකි. යෝජිත නව පැල්පොල අන්තර් භුවමාරු මධ්‍යස්ථානය හා කළුතර හොරණ මාර්ගය සම්බන්ධ කිරීමට හඳුනාගෙන තිබේ. මේ අනුව කළුතර හොරණ මාර්ගය අධිවේගී පිවිසුම් මාර්ගයක් ලෙස ඉදිරියේදී සංවර්ධනය වීමට නියමිතය. මේ අනුව කළුතර හොරණ මාර්ගය සේවා මංතීරු සහිත ද්විත්ත්ව මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 තුළින් හඳුනාගෙන ඇත. තවද කළුතර හොරණ මාර්ගය ආශ්‍රිතව මේ වන විට සීඝ්‍රයෙන් ඉඩම් වෙන්දේසි කිරීම් සිදුවෙමින් පවතී. මේ යටතේ මේ ප්‍රදේශය ආශ්‍රිතව විශේෂයෙන්ම කළුතර හොරණ මාර්ගය ආශ්‍රිතව නව නේවාසික කලාප බිහිවෙමින් පවතී.මෙම කරුණු සැලකිල්ලට ගනිමින් කළුතර - හොරණ මාර්ගයේ පිහිටා ඇති මල්වත්ත හන්දිය සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත .<br><br>මේ යටතේ මල්වත්ත හන්දිය ආශ්‍රිතව නව වාණිජ ගොඩනැගිල්ලක් ඉදි කිරීමට නියමිතය. එය ප්‍රදේශයේ ජනතාවගේ මූලික වාණිජ අවශ්‍යතා ඉටු කර ගැනීමට අවශ්‍ය මූලික පහසුකම් සලසා දෙනු ඇත. මෙයට අමතරව මාර්ග පහසුකම් සංවර්ධනය කිරීමට ද නියමිතය. |

**ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය**

| ඉඩමේ වර්තමාන අයිතිය | නා. ස.අ. | | පෞද්ගලික | √ | රජයේ | | වෙනත් | |
|---|---|---|---|---|---|---|---|---|

| ඉඩමේ වර්තමාන තත්වය | පුරන් කුඹුරක් පවතී | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | |
|---|---|---|---|
| ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය | | | |

| මිනින්දෝරු සැලැස්ම | අංකය | මිනින්දෝරුගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | | | | අක්: | රූ. | පර්. |
| | | | | | | |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව<br><br>- කළුතර ප්‍රාදේශීය සභාව | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | - ශ්‍රී ලංකා ඉඩම් -ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව<br><br>- කළුතර ප්‍රාදේශීය සභාව |
| **කලාපය** | මධ්‍යස්ථ ඝනත්ව වාණිජ කලාප 02 | | **කලාපීකරණ අනුකූලභාවය** | | ඔව් |

වින්‍යාස සැලැස්ම



| | | | | |
|---|---|---|---|---|
| ***ව්‍යාපෘතිය හඳුනාගැනීම*** | | | | |
| ***ව්‍යාපෘති මාතෘකාව*** | *උග්ගල්බඩ හන්දිය සංවර්ධන ව්‍යාපෘතිය* | | | |
| ***ව්‍යාපෘතිය*** | *උග්ගල්බඩ හන්දිය ආශ්‍රිත යටිතළ පහසුකම් සංවර්ධනය කිරීම* | | | |
| ***ව්‍යාපෘති යෝජනාව*** | *කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 යටතේ සකස් කරනු ලැබූ නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම යටතේ උග්ගල්බඩ හන්දිය අසල්වැසි න්‍යෂ්ටියක් (Neighborhood Nodes) ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගනු ලැබීය. කළුතර හොරණ මාර්ගයේ පිහිටි උග්ගල්බඩ හන්දිය වෙතින් අවට ගම්මාන වල ජනතාව සිය දෛනික වාණිජ අවශ්‍යතා ඉටුකරගනු ලබයි. මේ වනවිට අවට සිදුවන සීඝ්‍ර ඉඩම් සංවර්ධනයන් හේතුකොටගෙන මෙම දේහලීය ජනගහනය තවදුරටත් වර්ධනය වීමට නියමිතය.*<br><br>*ඒ අනුව සකස් කරනු ලැබූ උග්ගල්බඩ හන්දිය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිතය.*<br><br>1. *පුස්තකාලයක් සහිත ප්‍රජා ශාලාවක් ඉදිකිරීම*<br>2. *02. වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකිරීම* | | | |
| ***ව්‍යාපෘතියේ පිහිටීම*** | | | | |
| ***පිහිටීම*** | ***පළාත*** | *බස්නාහිර* | ***දිස්ත්‍රික්කය*** | *කළුතර* |
| | ***ප්‍රාදේශීය ප්‍රා. ලේ. කොට්ඨාසය*** | *කළුතර* | ***පළාත් පාලන ආයතනය*** | *කළුතර ප්‍රාදේශීය සභාව* |
| ***සීමාවන්*** | ***උතුර*** | ***නැගෙනහිර*** | ***දකුණ*** | ***බටහිර*** |
| | | | | |
| ***ප්‍රවේශය*** | | | | |
| ***පිහිටීම දක්වන සිතියම*** |  | | | |

| | |
|---|---|
| භූමි පරිහරණ සැලැස්ම |   |

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
| | | √ | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ ඉලක්ක | පාරිසරික | | ආර්ථික | | සමාජීය | √ |

| | |
|---|---|
| ව්‍යාපෘති ඉලක්ක | 1. කළුතර හොරණ පාරේ උග්ගල්බඩ හන්දිය ආශ්‍රිත ප්‍රදේශ ජනතාවට පහසුකම් සැලසෙන වාණිජ සංකීර්ණයක් ඉදි කිරීම<br>2. ජනතාවගේ සමාජීය අපරවයුහ පහසුකම් වර්ධනය වන සේ පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම |
| ව්‍යාපෘතියේ පදනම | කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 යටතේ ඇති නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය පිළිබඳ උපායමාර්ගික සැලැස්ම යටතේ උග්ගල්බඩ හන්දිය සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත. මල්වත්ත හන්දිය සංවර්ධන ව්‍යාපෘතියේ සඳහන් ආකාරයටම කළුතර හොරණ මාර්ගය කළුතර නගරය ආශ්‍රිතව පවතින 'A' ශ්‍රේණියේ මාර්ගයකි. යෝජිත නව පැල්පොල අන්තර් භූමාරු මධ්‍යස්ථානය හා කළුතර හොරණ මාර්ගය සම්බන්ධ කිරීමට හඳුනාගෙන තිබේ. මේ අනුව කළුතර හොරණ මාර්ගය අධිවේගී පිවිසුම් මාර්ගයක් ලෙස ඉදිරියේදී සංවර්ධනය වීමට නියමිතය. මේ අනුව කළුතර හොරණ මාර්ගය සේවා මංතීරු සහිත ද්විත්ත්ව මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 තුළින් හඳුනාගෙන ඇත. නව ද කළුතර හොරණ මාර්ගය ආශ්‍රිතව මේ වනවිට සීඝ්‍රයෙන් ඉඩම් වෙන්දේසි කිරීම් සිදුවෙමින් පවතී. මේ යටතේ මේ ප්‍රදේශය ආශ්‍රිතව විශේෂයෙන්ම කළුතර හොරණ මාර්ගය ආශ්‍රිතව නව නේවාසික කලාප බිහිවෙමින් පවතී.<br><br>මෙම කරුණු සැලකිල්ලට ගනිමින් කළුතර - හොරණ මාර්ගයේ පිහිටා ඇති උග්ගල්බඩ හන්දිය සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත. මෙහිදී අවට ජනතාවගේ සමාජීය අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීමට නියමිතය. ඒ අනුව උග්ගල්බඩ හන්දිය ආශ්‍රිතව පුස්තකාල ගොඩනැගිල්ලක් සහිත ප්‍රජා ශාලාවක් ඉදි කිරීමටත් වාණිජ කටයුතු පවත්වාගෙන යාමට වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමටත් නියමිතය |

| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ඉඩමේ වර්තමාන අයිතිය | නා. ස.අ. | | පෞද්ගලික | √ | රජයේ | | වෙනත් | |
| ඉඩමේ වර්තමාන තත්වය | | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | | | | | |
| ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය | | | | | | | |

| මිනින්දෝරු සැලැස්ම | අංකය | මිනින්දෝරුගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | | | | අක්: | රූ. | පර්. |
| | | | | | | |

**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

| | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | - නාගරික සංවර්ධන අධිකාරිය<br>- කළුතර ප්‍රාදේශීය සභාව | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | - නාගරික සංවර්ධන අධිකාරිය<br>- කළුතර ප්‍රාදේශීය සභාව |

| | | | |
|---|---|---|---|
| **කලාපය** | මධ්‍යස්ථ ඝනත්ව වාණිජ කලාප 02 | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් |

**වින්‍යාස සැලැස්ම**



| ව්‍යාපෘතිය හඳුනාගැනීම | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | *රිචිමන්ඩ් කාසල් පරිශ්‍රය සංවර්ධනය* | | | |
| **ව්‍යාපෘතිය** | *කළුතර දකුණ රිච්මන්ඩ් කාසල් මන්දිරයේ භූ දර්ශන සංවර්ධනය* | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | *මහා භාරකාර දෙපාර්තමේන්තුව සතු කළුතර පලාතොට පිහිටි රිච්මන්ඩ් කාසල් මන්දිරය කළුතර නගරය අවට තිබෙන සංචාරක ස්ථානයන් අතරින් එකකි. කළුගගට මායිම්ව අක්කර 42 පමණ වපසරියකින් යුක්ත භූමියක පිහිටි මෙම මන්දිරය නැරඹීම සඳහා මේ වනවිට දිනකට 100 - 150 අතර සංචාරකයන් පිරිසක් පැමිණේ. කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 යටතේ සකස් කරනු ලැබූ සංචාරක සංවර්ධන සැලැස්ම යටතේ කළුතර බෝධි පරිශ්‍රය, රිච්මන්ඩ් කාසල් මන්දිරය හා කැලිඩෝ වෙරළ තීරය කේන්ද්‍ර කොටගත් සංචාරක සැලැස්මක් සකස් කරණු ලැබිය. ඒ අනුව රිච්මන්ඩ් කාසල් මන්දිරය සංචාරකයන් සඳහා ආකර්ෂණය සහිත ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට නියමිතය. මෙහිදී මෙම භූමි පරිශ්‍රයේ මන්දිරය අවට අක්කර 08 භූමි භාගයක් තුළ භූමි දර්ශනය කිරීමට නියමිතය. එමෙන්ම කළුතර බෝධි පරිශ්‍රයට අයත් රථගාලේ සිට රිච්මන්ඩ් කාසල් මන්දිරය දක්වා කළු ගඟ ඔස්සේ බෝට්ටු සේවාවක් ක්‍රියාත්මක කිරීමට ද නියමිතය.* | | | |
| ව්‍යාපෘතියේ පිහිටීම | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කළුතර |
| | **ප්‍රාදේශීය ප්‍රා. ලේ. කොට්ඨාසය** | කළුතර | **පළාත් පාලන ආයතනය** | කළුතර ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | කළු ගඟ | පෞද්ගලික ඉඩම් | කළුතර - කෙත්හේන මාර්ගය | සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය සතු භූමිය |
| **ප්‍රවේශය** | කළුතර - කෙත්හේන මාර්ගය | | | |
| **පිහිටීම දක්වන සිතියම** |  | | | |

| | |
|---|---|
| **භූමි පරිහරණ සැලැස්ම** |  |

**ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
| | | | √ | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතියේ ඉලක්ක** | පාරිසරික | | ආර්ථික | √ | සමාජීය | |

| | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | 1. කළුතර රිච්මන්ඩ් කාසල් පරිශ්‍රය ආශ්‍රිතව සංස්කෘතික සංචාරක කලාපයක් ගොඩ නැගීම.<br>2. කළුතර රිච්මන්ඩ් කාසල් පරිශ්‍රය අවට ප්‍රදේශ වල වාණිජ සංවර්ධනයක් ඇති කිරීම (විශේෂයෙන් පලාතොට හන්දිය, කළුතර - පලාතොට පාර ආශ්‍රිතව) |
| **ව්‍යාපෘතියේ පදනම** | කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 යටතේ සකස් කරන ලද සංචාරක සංවර්ධන සැලැස්ම යටතේ කළුතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය ආශ්‍රිතව සංචාරක ව්‍යාපාරය විවිධාංගිකරණය කිරීමට හඳුනාගෙන ඇත. ඒ අනුව කළුතර බෝධි පරිශ්‍රය හා කළුතර රිච්මන්ඩ් කාසල් පරිශ්‍රය ආශ්‍රිතව සංස්කෘතික සංචාරක කලාප ද්විත්ත්වයක් ගොඩ නැගීමට හඳුනාගෙන ඇත.<br><br>රිච්මන්ඩ් කාසල් මන්දිරය කළුතර නගරයට කි.මි. 3 පමණ දුරින් කළුතර කෙත්හේන මාර්ගයේ පිහිටා ඇත. මෙම පරිශ්‍රය මහා භාරකාර දෙපාර්තමේන්තුව සතු වේ. මෙම පරිශ්‍රය තුළ පිහිටා ඇති මන්දිරය නැරඹීම සඳහා දිනකට සංචාරකයන් 100 පමණ පැමිණේ. කළුතර සංවර්ධන සැලැස්ම 2019 - 2030 යටතේ සකස් කරන ලද සංචාරක සංවර්ධන සැලැස්ම යටතේ කළුතර බෝධි පරිශ්‍රය හා කළුතර රිච්මන්ඩ් කාසල් පරිශ්‍රය ආශ්‍රිතව සංස්කෘතික සංචාරක කලාප ද්විත්ත්වයක් ගොඩනැගීමට නියමිත වූ පරිදි රිච්මන්ඩ් කාසල් පරිශ්‍රය සඳහා දිනකට සංචාරකයන් 500 - 800 අතර ගෙන්වා ගැනීමට අපේක්ෂිතය. කළුතර බෝධි පරිශ්‍රය වෙත දිනකට සංචාරකයන් හා වන්දනාකරුවන් 1000 - 1500 පමණ පැමිණෙන අතර රිච්මන්ඩ් කාසල් පරිශ්‍රය සංවර්ධන යෝජනාව යටතේ එසේ පැමිණෙන සංචාරකයන් රිච්මන්ඩ් කාසල් පරිශ්‍රය වෙත ද ආකර්ෂණය කර ගැනීමට නියමිතය. ඒ තුළින් සංචාරකයන්ට දිනක් තුළ කළුතර නගරය තුළ රැඳී සිට නැරඹීමට හා සංචාරක ක්‍රියාකාරකම් වල නිරත වීමට අවස්ථාව උදා වේ. |

**ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා. ස.අ. | | පෞද්ගලික | | රජයේ | √ | වෙනත් | |

| | | | |
|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන තත්වය** | පුරන් කුඹුරක් පවතී | **ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය** | |

<table>
